


# ශ්‍රීලංකන් එයාර්ලයින්ස්

වාර්ෂික වාර්තාව
2019/20

SriLankan Airlines
oneworld

# පටුන

## දළ විශ්ලේෂණය

අපගේ දැක්ම සහ මෙහෙවර 2
2019/20 විශේෂ තොරතුරු 3

## කළමණාකරන වාර්තා

සභාපතිවරයාගේ පණිවුඩය 4
ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ විමර්ශනය 6
අධ්‍යක්ෂ මණ්ඩලය 10
ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම 12
ව්‍යාපාර අවදානම් කළමණාකරන ආකෘතික රාමුව 16
කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය 18

## මූල්‍ය ප්‍රකාශ

අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව 44
අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව 2019/20 48
අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශය 49
ස්වාධීන විගණකගේ වාර්තාව 50
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 54
ලාභ අලාභ ප්‍රකාශය 55
විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශය 56
ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය 57
මුදල් ප්‍රවාහ ප්‍රකාශය 58
මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් 59

## ඇමුණුම්

පාර්භාෂික ශබ්ද මාලාව 104
දස අවුරුදු සමාලෝචනය 106
ගුවන් මාර්ග සිතියම 108
විශේෂ කඩඉම් 110
සාංගමික තොරතුරු 112

වාර්ෂික මහා සභා රැස්වීම් නිවේදනය 113
පෙරකලාසි පත්‍රය 114
සටහන් 115

**සටහන:**

මෙම සිංහල වාර්තාව ඉංග්‍රීසි වාර්තාවේ පරිවර්තනයක් වන අතර,
පරිවර්තන ගැටළු පවතින සෑමවිටම ඉංග්‍රීසි වාර්තාව පරිශීලනය කරන්න.

# අපගේ දැක්ම

ආසියාවේ වඩාත්ම පාරිභෝගික කේන්ද්‍රීයගත ගුවන් සේවය බවට පත්වීම.

# අපගේ මෙහෙවර

ශ්‍රී ලාංකීය ක්‍රමයට උණුසුම් ආගන්තුක සත්කාරයෙන් සපිරි විශ්වසනීය වූත් ප්‍රසන්න වූත් ගුවන් ගමන් අත්දැකීමක් තුළින් අපගේ පාරිභෝගිකයන් සංතෘප්තියට පත්කිරීම.

අපි මූල්‍යමය වශයෙන් ස්ථාවර වූ දක්ෂ, දූරදර්ශී සහ කැපවීමෙන් ක්‍රියාකරන සමාගමක් වශයෙන් අපගේ පාර්ශවකරුවන්ගේ අපේක්ෂාවන් සපුරාලීම පිණිස කැපවී සිටින්නෙමු.



# 2019/20 විශේෂ තොරතුරු

| | | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|---|
| | | 2020 | 2019 | 2020 | 2019 |
| **මූල්‍යමය** | | | | | |
| ආදායම | රු. මිලියන | 183,531.82 | 184,097.04 | 180,151.02 | 180,340.32 |
| මෙහෙයුම් වියදම | රු. මිලියන | (188,699.06) | (207,321.53) | (190,321.69) | (209,344.66) |
| බදු වලට පෙර අලාභය | රු. මිලියන | (44,104.72) | (41,626.91) | (47,197.86) | (44,022.67) |
| වසර සඳහා ශුද්ධ අලාභය | රු. මිලියන | (44,139.40) | (41,700.33) | (47,197.86) | (44,022.67) |
| මුළු වත්කම් | රු. මිලියන | 186,428.56 | 82,247.73 | 181,189.60 | 77,339.00 |
| කොටස් හිමිකරුවන්ගේ අරමුදල් | රු. මිලියන | (261,173.54) | (168,111.70) | (273,369.08) | (177,556.23) |
| **ගමනාගමනය** | | | | | |
| මගී ධාරිතාව | ASK මිලියන | | | 18,041.41 | 18,925.40 |
| සමස්ත ධාරිතාව | ATK මිලියන | | | 2,454.30 | 2,577.53 |
| ප්‍රවාහනය කරන ලද මගීන් | RPK මිලියන | | | 5,256.04 | 5,663.01 |
| සමස්ත පැටවුම | RTK මිලියන | | | 1,664.49 | 1,806.58 |
| මගී පැටවුම් සාධකය | % | | | 80.64 | 82.90 |
| සමස්ත පැටවුම් සාධකය | % | | | 67.82 | 70.09 |
| **කාර්ය මණ්ඩල ඵලදායීතාවන්** | | | | | |
| පිරිස් බලයේ සාමාන්‍යය | සංඛ්‍යාව | 7,709 | 7,844 | 6,693 | 6,794 |
| එක් සේවකයෙකුගේ ආදායම | රු. මිලියන | 23.81 | 23.47 | 26.92 | 26.54 |
| **ගුවන්යානා** | | | | | |
| A320-200 | සංඛ්‍යාව | | | 5 | 5 |
| A321-200 | සංඛ්‍යාව | | | 2 | 2 |
| A320neo | සංඛ්‍යාව | | | 2 | 2 |
| A321neo | සංඛ්‍යාව | | | 4 | 4 |
| A330-200 | සංඛ්‍යාව | | | 5 | 7 |
| A330-300 | සංඛ්‍යාව | | | 7 | 7 |
| වසර අවසානය වන විට සේවයේ නියුතු ගුවන් යානා | සංඛ්‍යාව | | | 25 | 27 |

# සභාපතිවරයාගේ පණිවුඩය

## “වසංගතය හමුවේ ගුවන් සේවාව මුහුණ පෑ අනපේක්ෂිත තත්ත්වය කෙසේ වුවද ගුවන් සේවාව මෙන්ම ගුවන් සේවා ක්ෂේත්‍රය 2021 වසර තුළ යළි යථා තත්ත්වයට පත් වනු ඇති බව මාගේ විශ්වාසයයි . . .”

2020 පෙබරවාරි මස මා සහ නව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධිෂ්ඨානශීලී කැපවීමෙන් යුතුව රාජකාරී භාරගනු ලැබුවේ, ලාභ ලබන ආයතනයක් බවට පරිවර්තනය කිරීමට ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සතු නිසග අවස්ථාව පිළිබඳ විශ්වාසයෙන් හා ගුවන් සේවාව ජාතියේ ප්‍රගමනය තුළ ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරන්නා වූ ආයතනයක් බවට පත් කිරීමේ දැක්ම සහිතවය. අප රාජකාරී ඇරඹුවේ 2019 අප්‍රියෙල් මස සිදුවූ බිහිසුනු පාස්කු ප්‍රහාරයෙන් අනතුරුව ගුවන් ප්‍රවාහන හා සංචාරක ක්ෂේත්‍රයන් වෙත දරුණු බලපෑමක් එල්ල වී තිබුණු පසුබිමකය. මෙම අර්බුදකාරී සමය තුළ ප්‍රධාන විධායක නිලධාරීවරයා සහ ඔහුගේ කණ්ඩායම විසින් ගුවන් සේවාව තුළ ක්‍රියාකාරී ව්‍යාපෘතීන් රැසක් දියත් කරමින් දැනටමත් සුබවාදී බලපෑමක් ඇති කොට ඇති බව සඳහන් කරන්නේ ඉමහත් සතුටිනි. කෙසේවුවද ඔබ දන්නා පරිදි ලොව පුරා කොවිඩ් 19 වසංගතය ශීඝ්‍රයෙන් පැතිර යමින් පැවති විමර්ශනයට ලක් වන වසර ගුවන් සේවා ක්ෂේත්‍රය එදාමෙදා තුර බරපතලම අභියෝග යට ලක් වූ වසර වේ.

### මෙහෙයුම් වටපිටාව

2019 වසර ගුවන් සේවා ක්ෂේත්‍රයට අභියෝගාත්මක වසරක් විය. ආදායම් මගීන් කිලෝමීටර (RPKs) වශයෙන් මනිනු ලබන ගුවන් මගී සේවාවන් සඳහා වන ඉල්ලුමෙහි වසරින් වසර වර්ධනය 2018 දී වාර්තා වූ 7.2% සිට 4.2% දක්වා වාර්තාගත අයුරින් පහත වැටිනි. මේ සඳහා බෙහෙවින් හේතු වූයේ ප්‍රධාන වශයෙන් ලොව සුපිරි බලවත් ආර්ථිකයන් දෙක අතර උද්ගත වුනු වෙළඳ අර්බුදය හේතුවෙන් නිර්මාණය වූ අභියෝගාත්මක ආර්ථික වටපිටාවයි. පවතින ආසන කිලෝමීටර (ASKs) මගින් මනිනු ලබන ලෝක ගුවන් සේවා ධාරිතාව 3.2% ක වසර 2009 ට පසු අවම වසරින් වසර වර්ධන අගයක් වාර්තා කලේය. මන්දගාමී ජාත්‍යන්තර වෙළඳාම හේතුවේ ගුවන් භාණ්ඩ ප්‍රවාහනය සඳහා වන ඉල්ලුම 2012 සිට පළමු වරට පහත වැටීමක් පෙන්නුම් කරමින් 2019 දී 3.2% කින් අවප්‍රමාණ විය.

තියුණු තරඟකාරීත්වය හේතුවෙන් 2019 දී මගී එලදාව 3% (yield) ලෙස අඛණ්ඩ 8 වැනි වසරේදීත් අවගමනකාරී ප්‍රවනතාවක් විදහා දැක්වීය. 2018 දී 12% ක කැපී පෙනෙන වර්ධනයකින් අනතුරුව 2019 දී ගුවන් භාණ්ඩ එලදාව (yield) 5% කින් පහත වැටිනි.

IATA මගින් ඇස්තමේන්තුගත කළ පරිදි 2019 දී ගුවන් සේවා ක්ෂේත්‍රයේ මෙහෙයුම් ලාභදායීත්වය ඇ.ඩො. බිලියන 42.5 ක් වන අතර එය 2018 ට වඩා ඇ.ඩො. බිලියන 3 ක පහත වැටීමකි. 2019 දී මෙහෙයුම් තීරුව ආදායමෙන් 5.1% ක් වූ අතර එය 2018 දී පැවති 5.7% ක අගයට සාපේක්ෂව පහළ යාමකි.

තවද 2019 අවසාන භාගයේදී කෝවිඩ් 19 අර්බුදය මධ්‍යයේ පැනවුනු ගමනාගමන සීමාවන් හේතුවෙන් මගී ඉල්ලුම සහ ගුවන්සේවා ආදායම වෙත දැඩි බලපෑමක් එල්ල විය. කෙසේවුවද ලොවපුරා අතරමංව සිටින මගීන් සිය රටවල් වලට රැගෙන යමින්ද, වෛද්‍ය සැපයුම් ඇතුළු අත්‍යාවශ්‍ය ආහාර ප්‍රවාහනය කරමින්ද, ගුවන් සේවා ක්ෂේත්‍රය අඛණ්ඩවම ජාත්‍යන්තර වශයෙන් වැදගත් සේවාවක් ඉටු කරයි.

2019/20 මූල්‍ය වර්ෂය, අප්‍රේල් මාසයේ අවසන් භාගය තුළ සිදුවූ පාස්කු ප්‍රහාරයත් සමඟ අවාසනාවන්ත අයුරින් ආරම්භ වූයේ සමස්ත ජාතියම ශෝකයට පත් කරමින් පමණක් නොව ගුවන් සේවා ක්ෂේත්‍රය ද සම්පූර්ණයෙන් නවතාලීමේ තත්වයකට පත් කරමිනි. පාස්කු ඉරිදා ප්‍රහාරයේ බලපෑම ඒ වන විටත් වෙළඳපොල ආදායම පහළයාම, උච්ඡාවචනය වන ලෝක ඉන්ධන මිල, මුදල් ඒකක අවප්‍රමාණ වීම සහ දැඩි බදු ප්‍රතිසංස්කරණයන් වැනි සාධක රැසක් අභියෝගයට ලක්ව පැවති ගුවන් සේවාව වෙත ප්‍රබල පීඩනයක් එල්ල කලේය.

මෙම සිදුවීම් වලින් අනතුරුව ශ්‍රී ලංකාව වෙත සමස්ත සංචාරක පැමිණීම් කැපී පෙනෙන අයුරින් පහත වැටුනු අතර එය 2018 ට සාපේක්ෂව 18% ක අඩුවීමක් පෙන්නුම් කරමින් 2019 අවසානය වන විට මිලියන 1.9 කරා ළඟ විය. ක්ෂේත්‍රයේ සමස්ත ඉපැයුම් ද 2018 සිට 18% කින් පහළ යමින් ඇ.ඩො. බිලියන 3.6 ක් වශයෙන් වාර්තා විය. කෙසේවුවද 2019 ශීත ඍතුවේදී සංචාරක පැමිණීම කැපී පෙනෙන අයුරින් යථා තත්ත්වයට පත් වන ලකුණු පෙන්නුම් කළ අතර, දෙසැම්බර් සහ ජනවාරි මාස වල පැමිණීම් පිළිවෙලින් පෙර වසරට වඩා 4.5% සහ 6.5% කින් පමණක් පහළ මට්ටමක් වාර්තා කලේය. 2020 මුල් භාගයේදී ආසියානු කළාපය තුළ කෝවිඩ් 19 වසංගතය ශීඝ්‍රයෙන් පැතිර යාමත් සමග සංචාරක පැමිණීම් පෙබරවාරි සිට පහත වැටෙමින් මාර්තු අවසානය වන විට සම්පූර්ණයෙන්ම ඇණ හිටි තත්ත්වයක් උද්ගත විය. කෝවිඩ් 19 වසංගතය හේතුවෙන් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ වසා දැමීමත් සමග මෙහෙයුම් රජයේ අනුමත නැවත පැමිණීම් සහ ගුවන් භාණ්ඩ යානාවන්ට පමණක් සීමා කෙරිණි.

වසංගතය හමුවේ ගුවන් සේවාව මුහුණ පෑ අනපේක්ෂිත තත්ත්වය කෙසේ වුවද කෝවිඩ් 19 පාලන කරමින් ආර්ථිකය යළි ගොඩනැංවීමට රජය විසින් දරනු ලබන ප්‍රයත්නය අනුව ගුවන් සේවාව මෙන්ම ගුවන් සේවා ක්ෂේත්‍රය 2021

වසර තුළ යළි යථා තත්ත්වයට පත් වනු ඇති බව මාගේ විශ්වාසයයි.

## කාර්යසාධනය

පාස්කු ප්‍රහාරය සහ ලෝක වසංගත තත්ත්වය හමුවේ අභියෝගයට ලක් වුවද සමූහයේ කාර්යසාධනය ඇ.ඩො වලින් මනිනු ලබන කල 8% කින් සහ ශ්‍රී ලංකා රුපියල් වලින් මනිනු ලබන කල 0.3% කින් පමණක් පහළ යමින් රුපියල් බිලියන 183.5 ක් වශයෙන් වාර්තාවීම ප්‍රශංසනීය වේ. පසුගිය වසරේ (EBITDAR) පොලිය, බදු, ක්ෂයවීම්, ක්‍රමක්ෂය සහ කුළී පිරිවැයට පෙර ඉපැයුම් අගය වූ රුපියල් බිලියන 9.3 ට සාපේක්ෂව 2019 වසරේ මූල්‍ය ප්‍රතිඵල රුපියල් බිලියන 15.9 ක ධනාත්මක (EBITDAR) පොලිය, බදු, ක්ෂයවීම්, ක්‍රමක්ෂය සහ කුළී පිරිවැයට පෙර ඉපැයුම් අගයක වර්තා කලේය. 2019/20 සඳහා සමූහයේ මෙහෙයුම් අලාභය 2018 වාර්තා වූ රුපියල් මිලියන 23,224 ට සාපේක්ෂව රුපියල් මිලියන 5,167 ක් වූ අතර ශුද්ධ අලාභය පෙර වසරේ වාර්තා වූ රුපියල් මිලියන 41,700 ට සාපේක්ෂව රුපියල් මිලියන 44,139 කි. කෙසේවුවද මෙම අලාභය කෙරෙහි කැපී පෙනෙන දායකත්ව සාධකයන් වූයේ මූල්‍ය පිරිවැය, විනිමය අලාභය හා රඳවාගැනීමේ බදු වැනි මෙහෙයුම් නොවන ස්වභාවයේ කරුනුය. මූල්‍යමය කාර්යසාධනය පිළිබඳ වැඩිදුර විස්තර ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ විමර්ශනයෙහි සහ කළමනාකරණ සාකච්ඡාව හා සමාලෝචනයෙහි දැක්වේ.

## අනාගත ස්වභාවය

ප්‍රධාන විධායක නිලධාරිවරයාගේ නායකත්වයෙන් යුතුව අධ්‍යක්ෂ මණ්ඩලය සමාගමෙහි කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා කෙටි හා දිගු කාලීන පියවර රැසක් ගෙන ඇත.

සම්ප්‍රදායික ක්‍රියාකාරකම් අධික ණය බර තුළින් උද්ගත වන ගැටළු හා ගුවන් යානා සමූහය සම්බන්ධ ගැටළු රැසක් අප විසින් හඳුනාගනු ලැබ ඇත. වර්තමාන තත්ත්වය හමුවේ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයක් පැවතියද ගුවන් සේවාව ප්‍රතිව්‍යුහගත කිරීමේ සැලසුම් මගින් මෙකී සියළුම මූලික ගැටළු නිරාකරණය වනු ඇත. ප්‍රාග්ධන අන්තර්ග්‍රහනය හා වර්තමාන අර්බුදය විසඳාගැනීම සඳහා කෙටි කාලින සහාය සම්බන්ධ යෝජනා ඇතුළුව ප්‍රතිව්‍යුහගත කිරීමේ යෝජනා කැබිනට් මණ්ඩලය වෙත භාර දී ඇත. මෙහිදී කෙටි කාලීන සහාය සඳහා කැබිනට් මණ්ඩල අනුමැතිය හිමි වූ අතර ප්‍රාග්ධන අන්තර්ග්‍රහනය රජයේ පරීක්ෂාවට ලක් වෙමින් පවතී. රඳවාගැනීමේ බදු සහනය ඇතුළු තවත් පියවර වෙත කැබිනට් අනුමැතිය හිමි ව ඇත.

වර්තමාන අභියෝගයන්ට මුහුණදීම සඳහා ආදායම් ඉහළ නැංවීම හා පිරිවැය සීමා කිරීමේ පියවර ආවරනය කෙරෙන්නා වූ කෙටි කාලීන පියවර රැසක් ගනු ලැබ ඇත. වසංගතය වර්ධනය වීම සහ මගී ගමනාගමනය සඳහා දේශසීමා වසා දැමීමත් සමග ගුවන් සේවය වහාම ඉල්ලුම සපුරාලීම පිණිස ගුවන් භාණ්ඩ මෙහෙයුම් ඉහළ නැංවීම කෙරෙහි යොමු විය. පළමු වරට ගුවන් භාණ්ඩ ප්‍රවාහන යානා සඳහා සැළසුම්ගත මෙහෙයුමක් ඇරඹීම සහ ශ්‍රීලංකන් ඉංජිනේරු කණ්ඩායම විසින් මගී ගුවන් යානාවක් ගුවන් භාණ්ඩ ප්‍රවාහන යානාවක් බවට පරිවර්තනය කිරීම සිදු විය.

වෙනත් පිරිවැය අවම කිරීමේ පියවර අතර වැටුප් සහ කොන්ත්‍රාත් හා තාවකාලික සේවකයින් අඩු කිරීම සිදුකෙරිණි. ප්‍රධාන සැපයුම්කරුවන් සමග ගිවිසුම් නැවත සාකච්ඡාවට භාජනය කෙරෙමින් පවතින අතර අප හට දැනටමත් ප්‍රධාන ගුවන් යානා බදු හිමිකරුවකු සමග පවතින ගුවන් යානා බදු ගිවිසුම් සම්බන්ධව වඩාත් යහපත් කොන්දේසි පිළිබඳව සැලකියයුතු මට්ටමේ සාර්ථක සාකච්ඡා පැවැත්වීමට හැකි විය.

රජය හා ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කරනු ලබන නියෝජිතයන් අතර නිසි සම්බන්ධීකරණයක් නොපැවතීම අතීතයේ පටන්ම පවතින ගැටළුවක් වන අතර, මෙය නිරාකරණය කරගැනීමේ අරමුණින් අප විසින් ශ්‍රී ලංකා ටුවරිසම් සමග එක්ව චීනය ඉන්දියා සහ ඕස්ට්‍රේලියාව සඳහා ගමනාන්ත ප්‍රවර්ධනය ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් කැබිනට් පත්‍රිකාවක් භාර දෙන ලදී.

කෝවිඩ් වසංගතයට පෙරාතුව ගුවන් සේවාව මගින් යුරෝපය, ඈත පෙරදිග, ඕස්ට්‍රේලියාව, ඉන්දියාව සහ අප්‍රිකාව වෙත නව ගමනාන්තයන් ඇරඹීමට සැලසුම් සකසනු ලැබුවද, මේ වන විට ඒවා ප්‍රමාදයට ලක් වී සංචාරක ක්ෂේත්‍රයේ ප්‍රගතිය මත ඉදිරි වසර කිහිපය තුළ ක්‍රියාත්මක කෙරෙනු ඇත. ගුවන් යානා සමූහය පසුගිය වසරේදී එකකින් අඩු කෙරුනු අතර මෙම වසරේදී කල්බදු අවසන් වනවිට ආපසු භාරදීම මඟින් එය දෙකකින් පහත දැමීමට නියමිතව ඇත. එමගින් ගුවන් සේවාවෙහි ස්ථාවර පිරිවැය පහත වැටෙනු ඇත ක්ෂේත්‍රය යථා තත්ත්වයට පත්ව අප නව ගමනාන්ත එළිදැක්වීමට හැකි මට්ටමකට පැමිණ පසු 2021 සහ ඉන් ඔබ්බට පමණක් එම ගුවන්යානා නැවත සේවයේ යෙදෙවෙනු ඇත.

වසර ගණනාවක් තිස්සේ විශේෂයෙන්ම අර්බුදකාරී කාල සමයන්හිදී ශ්‍රී ලංකාව සෙසු ලෝකය සමග සම්බන්ධ කරමින් ජාතික ගුවන් සේවාව වශයෙන් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ජාතිය වෙත හිතෛෂීවන්ත සේවයක් සැලසූ බව මෙහිදී පිළිගත යුතු වේ. ඒ අතරම ගුවන් සේවාව ජාතික ධනය කෙරෙහි බරක් නොවී පවත්වා ගෙන යාමට අධ්‍යක්ෂ මණ්ඩලය කැපවී කටයුතු කරන අතර මේ වන විට ඒ සම්බන්ධයෙන් සියළුම අභ්‍යන්තර හා බාහිර පාර්ශ්වකරුවන් සමග අදාළ කටයුතු සිදුකෙරෙමින් පවතී. ගුවන් සේවාව මේ වන විට අනපේක්ෂිත අර්බුදකාරී වාතාවරණයකට මුහුණපාමින් සිටියද කුසලතා පූර්ණ වූද, වෘත්තීයමය වූද කාර්ය මණ්ඩලයක් සමගින් මධ්‍ය කාලීනයට සාර්ථකත්වය කරා පියනැගිය හැකි වනු ඇති බව මාගේ ඒකායන විශ්වාසයයි.

අවසන් වශයෙන් සභාපතිවරයා වශයෙන් මාගේ කෙටි ධූර කාලය තුළ මා වෙත දක්වන ලද නොමසුරු සහයෝගය වෙනුවෙන් අතිගරු ජනාධිපතිතුමන්, සංචාරක හා ගුවන් සේවා අමාත්‍යතුමන්, සංචාරක හා ගුවන් සේවා අමාත්‍යාංශයේ සහ මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන් ඇතුළු අප විසින් කටයුතු සිදු කරන්නා වූ සෙසු සියළු රජයේ ආයතන වෙත මාගේ ප්‍රණාමය පුද කෙරේ. සියළුම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ වටිනා දායකත්වය සහ සහයෝගය වෙනුවෙන් ස්තූති කිරීම සඳහා මම මෙය අවස්ථාවක් කොට ගනිමි. අවසාන වශයෙන්, සමස්ත ශ්‍රීලංකන් කණ්ඩායම සහ වෘත්තීය සමිති විසින් දක්වන ලද සහයෝගය වෙනුවෙන් මාගේ අවංක වූ ස්තූතිය පිරිනමනු කැමැත්තෙමි.

**අසෝක පතිරගේ**
*සභාපති*

2020 ජූලි 31

# ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ විමර්ශනය

**"පසුගිය වසරේ EBITDAR (පොලිය, බදු, ක්ෂයවීම්, ක්‍රමක්ෂය සහ කුළී පිරිවැයට පෙර ඉපැයුම්) අගය වූ රුපියල් බිලියන 9.3 (ඇ.ඩො. මිලියන 89.8) ට සාපේක්ෂව සලකා බලන වර්ෂය තුළ මූල්‍ය ප්‍රතිඵල රුපියල් බිලියන 15.9 (ඇ.ඩො. මිලියන 135.5) ක ධනාත්මක EBITDAR (පොලිය, බදු, ක්ෂයවීම්, ක්‍රමක්ෂය සහ කුළී පිරිවැයට පෙර ඉපැයුම්) අගයක් වාර්තා කළේය. පසුගිය වසරේ වාර්තා වූ රුපියල් බිලියන 3.3 ට සාපේක්ෂව 2019 දී මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ රුපියල් බිලියන 26.1 ක ධනාත්මක වර්ධනයක් පෙන්නුම් කළේය."**

### ක්ෂේත්‍රය පිළිබඳ විමසුම

වසරේ පළමු අර්ධයේදී වෙළඳ අර්බුද නිසාවෙන්, විශේෂයෙන්ම ඇමරිකා එක්සත් ජනපදය සහ චීනය අතර වාණිජමය වශයෙන් පැවති අර්බුධකාරී වාතාවරණය හේතුවෙන් ලෝක ආර්ථිකය වෙත දරුණු බලපෑමක් ඇති විය. වසර 2019 දී ගුවන් මගී සේවාවන් සඳහා වන ඉල්ලුමෙහි වර්ධනය (ආදායම් මගී කිලෝමීටර (RPKs)) 2018 දී වාර්තා වූ 7.2% ට සාපේක්ෂව 4.2% දක්වා පහත වැටුනි. වසර 2012 සිට ප්‍රථම වරට ක්ෂේත්‍රය පුරා ආදායම් මගී කිලෝමීටර (RPKs), IATA මගින් ඇස්තමේන්තුගත ක්ෂේත්‍රයේ දිගු කාලීන වර්ධන සාමාන්‍යය වූ 5% ට වඩා පහත වැටුනි.  තවද 3.2% ක් වශයෙන් ලෝක ව්‍යාප්ත ගුවන් සේවා ධාරිතාව හෙවත් පවතින ආසන කිලෝමීටර (ASKs) ද වසර 2009 සිට ඉහළම මන්දගාමී අගය වාර්තා කළේය. අනපේක්ෂිත අයුරින් Boeing 737 Max ගුවන් යානය හඳුන්වාදීම ගුවන් යානා ධාරිතාවේ සීමිත වූ වර්ධනය කෙරෙහි ප්‍රබල බලපෑමක් ඇති කළේය. ඉල්ලුමෙහි වර්ධනය ධාරිතා වර්ධනය ඉක්මවා යාම හේතුවෙන් 2019 දී මගී ප්‍රමාණ සාධකය (Passenger Load Factor) 0.5% කින් වර්ධනය වූ අතර එය මේ වන විට 82.6% ක් දක්වා නව වාර්තාගත ඉහළ මට්ටමක පවතී.

විමර්ශනයට ලක් වන වසර ගුවන් භාණ්ඩ ප්‍රවාහනයට ඉතා අයහපත් වූවකි. ලෝක ගුවන් භාණ්ඩ ටොන් කිලෝමීටර් (CTKs) 2018 වසර පුරා 3.2% කින් අවප්‍රමාණ වූ අතර 2012 සිට පළමු වරට වාර්තාගත පහළ අගයක් පෙන්නුම් කළේය. වෙළඳ අර්බුදය හේතුවෙන් උද්ගත වූ ආර්ථික මන්දගාමීත්වය 2019 දී ගුවන් භාණ්ඩ පරිමාව අවප්‍රමාණ වීම සඳහා ප්‍රධාන සාධකය විය. ලෝක වෙළඳ අර්බුදය සමනය වන ලකුණු පහළවීමත් සමග 2019 අවසන් භාගය වන විට ගුවන් භාණ්ඩ වෙළඳපොල සුබවාදී පියවර පියවරයන් සමගින් කිසියම් වර්ධනයක් පෙන්නුම් කළේය.

2019 අවසානය වන විට උද්ගත වූ කෝවිඩ් 19 වසංගතය හේතුවෙන් ලෝක ගුවන් භාණ්ඩ ප්‍රවාහනයට ප්‍රබල අභියෝගයක් එල්ල විය. 2020 වසර ගුවන් සේවා  ඉතිහාසයේ දුෂ්කරතම වසර වනු ඇති බවට IATA මගින් අනාවැකි පළ කෙරෙන අතර, එම ආයතනය පවසන පරිදි ගුවන් සේවා ක්ෂේත්‍රය 20% සෘණාත්මක ලාභ තීරුවක් සහ 50% ආදායම් පහළ යාමක් සමගින් ඇමරිකානු ඩොලර් බිලියන 84 ක අලාභයක් අත්කර ගනු ඇත. සමස්ත ක්ෂේත්‍ර අලාභයෙන් ඇමරිකානු ඩොලර් 29 ක අලාභයක් සමගින් වැඩිම කොටස ආසියා ශාන්තිකර කළාපය විසින් හිමිකර ගනු ඇතැයි අනාවැකි පළ කෙරේ. මෙහි චක්‍රීය බලපෑම 2021 කරාද විහිදී යනු ඇති අතර එම වසරේදී ගුවන් සේවාවන් මගින් ඇමරිකානු ඩොලර් බිලියන 15.8 ක අලාභයක් විඳගනු ඇති බවට අපේක්ෂිතය. "ජනතාව තුළ සිය පෞද්ගලික මූල්‍ය තත්ත්වය පිළිබඳ විශ්වාසයක් ගොඩනැගී ඔවුන්ව සුරක්ෂිතව ප්‍රවාහනය කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබුවහොත් මගීන් හට නැවත පියාසර කිරීමේ උවමනාවක් ඇති වනු ඇත" යනුවෙන් IATA ප්‍රධාන විධායක නිලධාරීවරයා ප්‍රකාශ කොට ඇත.

### සමූහයේ කාර්යසාධනය

2019 සැප්තැම්බර් මස සිය 40 වැනි සංවත්සරය සමරමින් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් තවත් සුවිශේෂී සන්ධිස්ථානයක් සනිටුහන් කළේය. විමර්ශනයට ලක් වන වසර ගුවන් සේවයට ඉමහත් වූ අභියෝගාත්මක වසරක්ම විය. පාස්කු ප්‍රහාරය හේතුවෙන් වසරේ පළමු භාගය ආදායම් ඉපැයීම අතින් මන්දගාමී ස්වභාවයක් දැරූ අතර කෝවිඩ් 19 වසංගතය පැතිරීම නිසාවෙන් වසරේ අවසාන කාර්තුව කෙරෙහි බාධා පැමිනුණි. එහි බලපෑම වර්තමාන මූල්‍ය වර්ෂය කෙරෙහිද ඇති වන්නේ වෛරසය පැතිරීම වැළැක්වීම සඳහා විවිධ රටවල් විසින් ජාත්‍යන්තර දේශසීමා වසා දැමීම හේතුවෙන් මගී ඉල්ලුම පහත වැටීමේ ප්‍රතිඵලයක් ලෙසිනි.

පසුගිය වසරේ EBITDAR (පොලිය, බදු, ක්ෂයවීම්, ක්‍රමක්ෂය සහ කුළී පිරිවැයට පෙර ඉපැයුම්) අගය වූ රුපියල් බිලියන 9.3 (ඇ.ඩො. මිලියන 89.8) ට සාපේක්ෂව සලකා බලන වර්ෂය තුළ මූල්‍ය ප්‍රතිඵල රුපියල් බිලියන 15.9 (ඇ.ඩො. මිලියන 135.5) ක ධනාත්මක EBITDAR (පොලිය, බදු, ක්ෂයවීම්, ක්‍රමක්ෂය සහ කුළී පිරිවැයට පෙර ඉපැයුම්) අගයක් වාර්තා කළේය. මූල්‍ය පිරිවැය සහ විනිමය අනුපාතික අලාභයට අනතුරුව වසර අවසානයේදී සමූහයේ අලාභය පෙර වසරේ වාර්තා වූ රුපියල් බිලියන 41.7 (ඇ.ඩො. මිලියන 169) ට සාපේක්ෂව රුපියල් බිලියන 44.1 (ඇ.ඩො. මිලියන 112) ක් වශයෙන් දැක්වුනි. සමූහය මගින් රඳවාගැනීමේ බදු වශයෙන් රුපියල් බිලියන 8.1 ක්ද, මූල්‍ය පිරිවැය වශයෙන් රුපියල් බිලියන 40.7 ක් ද වැය කිරීමෙන් පසු සමස්ත හිඟ ණය මුදල 2020 මාර්තු 31 වන විට රුපියල් බිලියන 352 වශයෙන් වාර්තා විය. පසුගිය වසරේ වාර්තා වූ රුපියල් බිලියන 3.3 ට සාපේක්ෂව 2019 දී මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ රුපියල් බිලියන 26.1 ක ධනාත්මක වර්ධනයක් පෙන්නුම් කළේය.

විමර්ශනයට ලක් වන වසරේදී ගුවන් සේවාවෙහි ධාරිතාව පෙර වසරට වඩා 5% කින් පහත වැටුනු අතර මගී පැටවුම් සාධකය USC 5.55 දක්වා 2% කින් අවප්‍රමාණ විය. පෙර වසරට සාපේක්ෂව සමූහයේ සමස්ත පහත

වැටීම 0.3% කි. අදායම පහත වැටීම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වූයේ පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසුව සහ මූල්‍ය වර්ෂයේ අවසන් කාර්තුවේදී ඇතිවූ කෝවිඩ් 19 වසංගතය හේතුවෙන් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ වෙත අන්තර්ජාතික ගුවන් සේවාවන් මගින් මෙහෙයුම් පහත හෙළීම නිසා මගී පැමිණීම් මඳ වීමයි. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ වෙත මෙහෙයුම් සිදුකරනු ලබන වෙනත් ගුවන් සේවාවන් මගින් ධාරිතාවය පහත දැමීම සහ කැබිනට් තීරණයක් මත සෙසු ගුවන් සේවාවන් වෙත ගුවන් තොටුපළ කටයුතු සඳහා පිරිනමන ලද සහනය හේතුවෙන් ගුවන් තොටුපළ කටයුතු (Ground handling) ආදායම කෙරෙහි රුපියල් බිලියන 1.1 කට අධික සහ ආහාරපාන සැපයුම් ආදායම කෙරෙහි රුපියල් බිලියන 0.4 ක පමණ අහිතකර බලපෑමක් එල්ල විය.

පෙර වසරට වඩා 4.9% ක වර්ධනයක් පෙන්නුම් කරමින් සමූහයේ රඳවාගැනීමේ බදු සහ SLFRS 16 බලපෑම හැර සමස්ත මෙහෙයුම් වියදම් රුපියල් බිලියන 161.1 ක් වශයෙන් වාර්තා විය. අදායම් පහත වැටීම මෙහෙයුම් වියදම් 4% කින් පමණ අවම කිරීම මගින් සමනය කරන ලදී. ඉන්ධන පිරිවැය මත ඉතිරිය රුපියල් බිලියන 5.3 ක් විය. ඉන් 42.5% ක් ඉන්ධන මිළ පහළ යාම නිසාවෙන් සිදුවුවද අහිතකර විනිමය අනුපාතික හේතුවෙන් ඉන් කොටසක් හිලව් විය. ඉතිරි 57.5% කෙරෙහි හේතු වූයේ අනපේක්ෂිත තත්ත්වයන් හමුවේ පහත වැටුනු ගුවන් යානා මෙහෙයුම් ප්‍රමාණයයි. තවද ඉංජිනේරු කටයුතු, සේවා ස්ථානීය ගමනාගමන සහ වෙළඳ ඒකකයන් ආශ්‍රිතව සිදුකරන ලද විවිධ වූ කළමානකරණ ව්‍යාපෘතීන් හේතුවෙන් රුපියල් බිලියන 6.6 ක ඉතිරියත් අත්පත් කරගැනීමට හැකි විය. මෙහිදී ඉංජිනේරු අංශය මගින රුපියල් බිලියන 4.2 ක කැපීපෙනෙන ඉතිරියක් අත් කර ගත් අතර වෙළඳ, ස්ථානීය ගමනාගමන සහ අලෙවි අංශයන්හි දියත් කරන ලද ව්‍යාපෘතීන් ඔස්සේ අත්පත් කර ගත් ඉතිරිය රුපියල් බිලියන 2.4 කි.

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි වඩාත්ම ලාභ උපදවන ව්‍යාපාරික ඒකකය වන ගුවන් තොටුපළ සහ ගුවන් තොටුපළ කටයුතු (Ground handling) රුපියල් බිලියන 11.8 ක (පෙර වසරට වඩා 8% කින් පහත වැටීමකි) ආදායමක් වාර්තා කරන ලද අතර වසර සඳහා සමස්ත සමූහයේ ආදායම රුපියල් බිලියන 183.5 (ඇ.ඩො. බිලියන 1) ඉක්මවන ලදී. පුරෝකථනය කළ ආදායමට එරෙහිව, රුපියල් බිලියන 9.1 ක ආදායම් පහත වැටීමක් 2019 අප්‍රියෙල් පාස්කු ප්‍රහාරයෙන් පසු බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි මෙහෙයුම් සීමා කිරීම හේතුවෙන්ද, රුපියල් බිලියන 9.8 ක ආදායම් පහළ යාමක් වසරේ අවසාන කාර්තුවේදී කෝවිඩ් 19 වසංගතය පැතිර යාම හේතුවෙන් ද සිදුවිය. ඉහත දක්වන ලද රුපියල් බිලියන 19 ක අලාභය හැර විමර්ශනයට ලක් වන වසර සඳහා ප්‍රක්ෂේපිත EBITDAR (පොලිය, බදු, ක්ෂයවීම්, ක්‍රමක්ෂය සහ කුළී පිරිවැයට පෙර ඉපැයුම්) රුපියල් බිලියන 24 ක් විය හැකිව තිබිණි.

අවසනාවන්ත වූ පාස්කු ඉරිදා සිදුවීම සහ කෝවිඩ් 19 වසංගතය අපගේ කාර්යසාධන අනාවැකි කෙරෙහි දැඩි බලපෑමක් එල්ල කරමින් ව්‍යාපාරික සැලසුමෙහි ඇතැම් කෙටි හා මධ්‍ය කාලීන ක්‍රමෝපායන් ක්‍රියාවට නැංවීම අභියෝගයට ලක් කලේය. ගුවන් සේවාව සිය ප්‍රමුඛ වෙළඳපොල වල මගී වෙන්කර ගැනීම් වල ප්‍රබල අඩුවීමක් සහ අවලංගු කිරීම් රැසක් අත්වින්දේය. මගී ඉල්ලුම අවම වීම සහ විවිධ රටවල් විසින් කෝවිඩ් 19 වසංගතය හේතුවෙන් පනවන ලද සීමාවන් නිසාවෙන් ගුවන් ගමන් වාර අවලංගු කිරීම් රැසක් සහ ගුවන් යානා අවශ්‍රේණිගත කිරීම් සිදු කෙරිණි. යථා තත්ත්වට පත්වීමේ පියවරක් වශයෙන් අප විසින් අමතර ධාරිතාව ගුවන් භාණ්ඩ ප්‍රවාහන යානා වෙත යොමුකිරීමට කටයුතු කෙරිණි. කළමනාකාරීත්වය විසින් ක්‍රමෝපායික සැලසුම ගැඹුරින් විමර්ශනයට ලක් කරමින් පවතින අතර පවතින හා අපේක්ෂිත තත්ත්වයන් හමුවේ ඇතැම් ප්‍රායෝගික ප්‍රතිශෝධනයන් සිදු කරනු ලැබ ඇත. සමහර යුරෝපීය, ආසියානු සහ ඕස්ට්‍රේලියානු ගමනාන්ත හඳුන්වාදීමේ කාල පරාසයන් සැලසුම් ජාලයෙන් කල් දැමුනේ වෙළඳපොල තත්ත්වයන් හා මගී විශ්වාසය වර්ධනය වීම තහවුරු වන තෙක්ය.

අර්බුදකාරී තත්ත්වයන් කොපමණ පැවතියද විමර්ශනයට පත්වන වසර ජයග්‍රහන වලින්ද පිරී පැවතිණි.

ස්වකීය නිල අන්තර්ජාලගත පදනම ක්ෂේත්‍රයේ ප්‍රමුඛ ගුවන් සේවාවන්ට සමගාමීව වර්ධනය කිරීමේ උත්සාහය තුළ , ශ්‍රීලංකන් එයාර්ලයින්ස් මගින් Srilankan.com වෙබ් අඩවිය නව විශේෂාංග ගෙවීමේ ක්‍රම හා ප්‍රවාහනයට අවශ්‍ය නව්‍ය විසඳුම් ඔස්සේ වැඩිදියුණු කිරීම සිදු කෙරේ. විමර්ශනයට ලක් වන වසර තුළදී අන්තර්ජාලගත මාධයයෙන් මගීන් වෙත ළඟා වීම ගුවන් සේවාවෙහි සමස්ත ආදායමෙන් පෙර වසරේ පැවති 11% ට සාපේක්ෂව 14% ක් දක්වා ඉහළ නැංවී තිබිණි. ඉදිරි වසර සඳහා ඉලක්කය වනුයේ අන්තර්ජාලගත ආදායම් කොටස 30% දක්වා ඉහළ නැංවීමයි. ගුවන් සේවාව වෙත වන හිතෙතෂීත්වය විදහා දක්වමින් වෙබ් අඩවිය වෙත නැවත නැවතත් පිවිසෙන්නා වූ මගීන් සංඛ්‍යාව පෙර වසරේ පැවති 42% ට සාපේක්ෂව 54% දක්වා ඉහළ ගිය අතර ගුවන් සේවාවෙහි අන්තර්ජාලගත අලෙවි චැනලයෙහි ගනුදෙනුකරුවන් සංඛ්‍යාව ශීඝ්‍රයෙන් වර්ධනය වෙමින් පවතී. මගීන් හට ඉතා පහසුවෙන් ගුවන් ටිකට් පත් මිළ ගණන් දැනගැනීමේ සේවාව වැනි නව අලෙවි විශේෂාංගයන් ඔස්සේ අන්තර්ජාලගත ගුවන් මගී අත්දැකීම සවිමත් කරමින් ලෝකය තවතවත් මගීන්ට සමීප කරවීමට ශ්‍රීලංකන් එයාර්ලයින්ස් කටයුතු කරයි. එයට අමතරව Alipay, WeChat, PayPal, Paytm, Apple Pay, PoLi, වැනි ගෙවීම් ක්‍රම රැසක් හඳුන්වාදීමත් සමග වැඩිදියුණු කරන ලද අගය එකතු කළ විශේෂාංගයන් ඔස්සේ ශ්‍රීලංකන් එයාර්ලයින්ස් වෙත ලබාදෙනු ලබන සිය ආදායම ඉහළ නැංවීමට, Srilankan.com කටයුතු කරයි. නවීන තාක්ෂණය යොදාගනිමින් මගී අත්දැකීම ක්‍රමවත් කරමින් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි පෝලිම් වල රැඳීසිටීමේ ගැටළුව නිරාකරණය කිරීමේ අරමුණින් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් මගින් අන්තර්ජාලගත සහ කියෝස්ක් පැමිණීමේ (check-in) සේවාව ප්‍රචලිත කරනු ලැබේ. ගනුදෙනුකරුවන්ගේ හිතෛෂීභාවය වර්ධනය කිරීමේ අරමුණින් යුතුව FlysmiLes මගින් සිය හිතෛෂී සාමාජිකයින් වෙත රිඩෙම්ප්ෂන් ටිකට්පත් සඳහා වෙන් කරවා ගැනීම් සුපුරුදු සේවා ස්ථාන, ඇමතුම් මධ්‍යස්ථානය, FFP සේවාව සහ සියළුම විදේශ ශ්‍රීලංකන් කාර්යාල මගින් හැරුනු විට වෙබ් අඩවිය හා මොබයිල් ඇප් එක් ඔස්සේද සිදුකිරීමේ පහසුකම පිරිනමයි.

Skylights සමග එක්ව අපගේ විශේෂිත සෙරන්ඩිබ් ව්‍යාපාරික පන්තිය වෙත වර්චුවල් රියැලිටි සිනමා හඳුන්වාදෙන පළමු දකුණු ආසියානු ගුවන් සේවාව බවටද ශ්‍රීලංකන් පත් විය. MAS හෝල්ඩින්ග්ස් හි නව්‍යතා අංශය වන

# ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ විමර්ශනය ඉතිරි කොටස.

Twinery සමග සහයෝගීතාවයෙන් යුතුව ලොව උසස්තම පේෂි සමනය කිරීමේ මෙවලම වන Spryng හඳුන්වාදීමටද අපි කටයුතු කලෙමු. මෙම පැළඳිය හැකි තාක්ෂණික මෙවලම මගින් රුධිර සංසරණ උත්තේජනය කරමින් දිගු ගුවන් ගමන් වාර වලදී දෙපා වල රුධිරය එක්රැස් වීමෙන් සිදුවන අපහසුතා මගහරවයි.

ගුවන් සේවාවෙහි කල්බදු පිරිවැය සහ නඩත්තු පිරිවැය පහත හෙළීමේ අරමුණින් අපගේ බදු හිමියන් සමග බදු නැවත සාකච්ඡා ක්‍රියාකාරකම් රැසක් දියත් කෙරුනු අතර එමගින් ගුවන් සේවාවට ඩොලර් මිලියන ගණනක් ඉතිරි කර ගත හැකි විය. තවද එක් A330-300 ගුවන් යානාවක් ඕමාන් එයාර් වෙත කෙටි කාලීන ගිවිසුමක් අනුව බදු පදනමින් ලබාදෙමින් මාස හතරක් පුරා සැළකිය යුතු ලාභයක් ලබාගත හැකි විය.

ගුවන් සේවාවෙහි ගුවන් යානා නඩත්තු අංශය වන ශ්‍රීලංකන් ඉංජිනියරින් විසින් යුරෝපියන් ඒවියේෂන් සේෆ්ටි ඒජන්සි වෙතින් Type 145 සහතිකත්වය හිමි කර ගන්නා ලද අතර තෙවන පාර්ශ්වීය ගුවන් යානා නඩත්තු කටයුතු වලින් සමාගමට අමතර ආදායමක් හිමි විය. එයාර් චයිනා, එයාර් ඉන්ඩියා, ඕමාන් එයාර් සහ මැලේසියන් එයාර්ලයින්ස් සමග ගුවන් සේවා නඩත්තු කටයුතු සිදුකරන ලද අතර එයාර් බ්ලූ සහ එයාර් සීෂේල්ස් සමග පදනම් නඩත්තු කටයුතු සිදු කෙරිණි.

ශ්‍රීලංකන් කාර්ය මණ්ඩලයේ නව නිර්මාණාත්මක ප්‍රයත්නයන් හේතුවෙන් ගුවන් සේවාව වෙත එයාර්ලයින් පැසෙන්ජර් එක්ස්පීරියන්ස් ඇසෝසියේෂන් මගින් 'විශිෂ්ටතම අලෙවි නව්‍යතාවය' (APEX) සම්මානය හිමි විය. ශ්‍රීලංකන් වෙත අඛණ්ඩ තෙවන වසරටත් 'ප්‍රධාන ගුවන් සේවා' කාණ්ඩයේ තරු- හතර ශ්‍රේණිය හිමි විය.

සිය අලෙවි සන්නිවේදන විශිෂ්ටත්වය උදෙසා ගුවන් සේවාව වෙත 'Two Cities, One Spirit' ප්‍රචාරණ ව්‍යාපෘතිය වෙනුවෙන් 'අලෙවි ගුවන් සේවාව' කාණ්ඩයේ PATA ස්වර්ණ සම්මානය හිමි විය.

ශ්‍රීලංකන් පසුගිය මාස 12 තුළ දෙවරක් 'Most Punctual Airline of the World' වශයෙන් නම් කෙරුනු කෙරුණි. ශ්‍රීලංකන් ගුවන් තොටුපළ සේවාවන් විසින් ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමය මගින් සිදුකරන ලද IATA මෙහෙයුම් සුරක්ෂිතතා විගණනයද සම්පූර්ණ කරන ලදී.

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ඉන්දීය උප මහාද්වීපයේ ප්‍රමුඛතම ගුවන් සේවාව වශයෙන් ස්වකීය දැවැන්තභාවය යළි තහවුරු කරමින්, වර්ල්ඩ් ට්‍රැවල් අවෝර්ඩ්ස් ඒෂියා ඇන්ඩ් ඕෂනියා හිදී 'ලොව ප්‍රමුඛතම ගුවන් සේවාව' සහ 'ඉන්දියානු සාගරය තුළ ආසියාවේ ප්‍රමුඛතම ගුවන් සේවාව' යන සම්මානයන්ගෙන් පිදුම් ලැබීය.

2020 බර්ලින් - ගෝල්ඩන් සිටි ගේට් සම්මාන උළෙලේදී කාණ්ඩයන් තුනකින් ("Airline International", "Music International", "Campaign") පළමු තරු සම්මාන දිනා ගනිමින් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ශ්‍රී ලාංකේය අභිමානය ඔප් නැංවීය.

කොළඹ පවතින ආයතනික කාර්යාල කටුනායක පවතින පරිශ්‍රයන්හි ප්‍රතිස්ථාපනය කිරීමට ගන්නා ලද තීරණය මගින් සැළකිය යුතු මූල්‍යමය ඉතිරියක් සහ මෙහෙයුම් කාර්යක්ෂමතාවයක් අත් කර ගැනිනි. කොළඹ නගර මධ්‍යයේ පිහිටි අපගේම ප්‍රාදේශීය කාර්යාලයද ප්‍රතිසංස්කරණය කිරීමට සැලසුම් කොට ඇත. ශ්‍රීලංකන්හි ඉංජිනේරු අංශය මගින් සාර්ථකව Airbus A320, A330 ගුවන් යානා සඳහා EASA පදනම් නඩත්තු අනුමැතිය නැවත ලබා ගත් අතර Boeing 737 NG ගුවන් යානාව සඳහා ගුවන් සේවා නඩත්තු සහතිකත්ව අනුමැතිය හිමි කර ගන්නා ලදී. මෙමඟින් MRO (නඩත්තු, අලුත්වැඩියා සහ මෙහෙයුම්) සංවිධානයක් ලෙස අපගේ ධාරිතාව සැලකියයුතු ලෙස ඉහළ දැමුණු අතර තෙවන පාර්ශවීය ගුවන්යානා නඩත්තු සේවා මගින් ආදායම ලබාගැනීමේ අවස්ථාව සැලසිනි.

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි ප්‍රජා සත්කාරක අංශය මගින් ළමා, පෞද්ගලික සහ කුසලතා යන ක්ෂේත්‍රයන් යටතේ ප්‍රජාවෙහි සමාජයීය, අධ්‍යාපනික හා සෞඛ්‍ය ආශ්‍රිත ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා විවිධ ව්‍යාපෘතීන් දියත් කෙරිණි. මනා දිවිපැවැත්ම, උසස් අධ්‍යාපන තත්ත්වය සහ පිරිසිදු ජලය හා සනීපාරක්ෂාව අරමුණු කර ගනිමින් මෙරට තිරසාර අරමුණු වෙනුවෙන් වැඩසටහන් රැසක් දියත් කෙරිණි.

අපි ගුවන් සේවාවක් වශයෙන් කෝවිඩ් 19 වසංගතයේදී කටයුතු කල ආකාරයෙන්ම ජාතිය වෙත සේවය සළසන්නෙමු. මේ වන විට මෙම වසංගතය හේතුවෙන් පනවන ලද දේශසීමා තහංචි හේතුවෙන් විදේශයන්හි අතරමංව සිටි ශ්‍රී ලාංකිකයින් 15,000 ක් නැවත මෙරටට රැගෙන ඒමට අප විසින් කටයුතු කොට ඇත. මෙමෙහෙයුම් ගුවන් නියමුවන්, ගුවන් කාර්ය මණ්ඩලය, ගුවන් තොටුපල සේවකයින් ඇතුළු බොහෝ පිරිසක් වාණිජමය අරමුණකින් තොරව මෙම මානව හිතවාදී සත්කාරය ඉටුකිරීම සඳහා සිය දිවි පරදුවට තබමින් කටයුතු කළ ආකාරය පැසසුම් කටයුතු වේ.

### නව සාමාන්‍ය තත්ත්වය සමගින් ඉදිරිය කරා

කෝවිඩ් 19 වසංගතය මගින් සියළුම ගුවන් සේවාවන් වෙත මඟී සෞඛ්‍ය සහ යහ පැවැත්ම ප්‍රමුඛතාවය කොට ගත් 'නව සාමාන්‍ය' තත්ත්වයක් නිර්මාණය කෙරිණි. සුරක්ෂිත ගුවන් ගමනක් තහවුරු කරනු වස් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් මගින් කොළඹ අපගේ පදනම් ගුවන් තොටුපළින් සාමාන්‍ය මෙහෙයුම් අරඹන විටම ප්‍රවාහන සනීපාරක්ෂක පැකේජයක් අප විසින් සියළුම මඟීන් වෙත නිකුත් කෙරේ. මෙම පැකේජය තුළ ශල්‍ය මුහුණු අවරන තුනක් සහ විෂබීජ නාශක දියර බෝතලයක් වේ.

ඵලදායක ධාරිතා කළමනාකරණය ඔස්සේ ආදායම් වර්ධනය කිරීම ආදායම් කළමනාකරණය සහ වියදම් අවම කිරීමේ ක්‍රමෝපායන් ගුවන් සේවාව ව්‍යාපාරික සැලසුමට අනුව, තිරසාර මූල්‍ය පැවැත්මක් වෙත රැගෙන යාමේදී කළමනාකරණයේ අඛණ්ඩ අවධානය යොමු කෙරෙන්නා වූ ක්ෂේත්‍රයන් වේ. අලාභ අවම කරගැනීමේ අරමුණින් කළමනාකාරීත්වය විසින් ලබන වසරේදී සමාගම පුරා විහිදුනු පිරිවැය ඉතිරි කිරීමේ හා අමතර අදායම් ඉහළ නැංවීමේ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය. තවද අප විසින් වසංගත සමය තුළ, ශ්‍රී ලංකාවේ අපනයන කර්මාන්තයන් හට ලෝක ආර්ථිකය සමග සම්බන්ධ වීමේ පහසුකම් සළසමින් පුළුල් බඳ සහිත මඟීන් ගුවන් යානාවක් මෙට්‍රික් ටොන් 45 ක බර ප්‍රමාණයක් රැගෙන යා හැකි විශේෂිත ගුවන් භාණ්ඩ ප්‍රවාහන යානාවක් බවට පරිවර්තනය කරන ලදී. අප විසින් දැනට ගුවන් භාණ්ඩ චාට සේවාවන් සපයනු ලබන අතරතුර යුරෝපය, මැදපෙරදිග, ඕස්ට්‍රේලියාව, ඉන්දියාව සහ ඈත පෙරදිග රටවල් වෙත සෙසු යානාවන් උපයෝගී කරගනිමින් මෙහෙයුම් සිදු කෙරේ. ජාතික ගුවන් සේවාවෙහි ද්‍රවශීලතාවය සුරැකීමේ අරමුණින් යුතුව පියවර කිහිපයක් ගෙන ඇති අතර එහිදී විලම්බිත ගෙවීම් සැලසුම් සහ ගුවන් සේවාවෙහි ප්‍රමුඛ සැපයුම්කරුවන් සමග අඩු කිරීම් පිළිබඳව සාකාච්ඡා කොට මේ වන විට ඇ.ඩො. මිලියන 46 ක ප්‍රතිඵල ලබා ගෙන ඇත.

තවද බදු අඩු කිරීම්ද සාකච්ඡා මට්ටමේ පවතින අතර ගුවන් සේවාව ප්‍රධාන බදු හිමිකරුවකු සමග බදු ප්‍රතිව්‍යුහගත කිරීමක් අවසන් කරමින් මීළග වසර 6 කාලය තුළ ඇ.ඩො. මිලියන 104 කට අධික මුදල් ඉතිරියක් අත් පත් කොට ගෙන ඇත. සෙසු ප්‍රධාන බදු හිමිකරුවන් සමගද සාකච්ඡා සිදු කෙරෙමින් පවතී.

අතිශය අසීරු අවස්ථාවන්හිදී දක්වන ලද සහයෝගය වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලය, කළමනාකරණ කණ්ඩායම, සේවක මණ්ඩලය, ව්‍යාපාරික සහකරුවන් සහ සෙසු සියළු පාර්ශ්වකරුවන් වෙත මාගේ ප්‍රණාමය හිමි වේ.

ලොව පුරා ගුවන්සේවා බොහොමයක් නුබුන්වත්භාවයට පමුණුවමින් පැතිරුනු කෝවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ අප ගුවන් සේවාව වෙත සපයන ලද මූල්‍යමය හා ප්‍රතිපත්තිමය සහයෝගය වෙනුවෙන් අපගේ කොටස් හිමිකරු වන ශ්‍රී ලංකා රජය වෙත මාගේ අවංක ස්තුතිය පිරිනැමේ.

මෙම වසංගත තත්ත්වයට නොසැලී ඔරොත්තු දෙමින් අපගේ අප්‍රතිහත කැපවීමෙන් යුතු ප්‍රයත්නයන් සමගින්, ආසියාවේ වඩාත් ගනුදෙනුකාර කේන්ද්‍රගත ගුවන් සේවාව බවට පත්වීමේ අපගේ දර්ශනය යථාර්තයක් බවට පත් කර ගනු හැකි වෙතැයි මම විශ්වාසය පළ කරමි.

**විපුල ගුණතිලක**
*ප්‍රධාන විධායක නිලධාරි*

2020 ජූලි 31

# අධ්‍යක්ෂ මණ්ඩලය

## 01

### අසෝක පතිරගේ මහතා (සභාපති)

2019 දෙසැම්බර් 16 වැනි දින සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කෙරුනු අසෝක පතිරගේ මහතා පසුව සීමාසහිත ශ්‍රීලංකන් කේටරින්හි අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කෙරිණ. හෙතෙම සොෆ්ට්ලොජික් හෝල්ඩින්ග්ස් පීඑල්සී, ආසිරි හොස්පිට්ල් හෝල්ඩින්ග්ස් පීඑල්සී, ආසිරි සර්ජිකල් හොස්පිට්ස් පීඑල්සී සහ ඔඩෙල් පීඑල්සීහි සභාපති/කළමනාකාර අධ්‍යක්ෂවරයා වේ. පතිරගේ මහතා සමූහයේ සෙසු සමාගම් වලට අමතරව සොෆ්ට්ලොජික් කැපිටල් පීඑල්සී සහ සොෆ්ට්ලොජික් ලයිෆ් ඉන්ෂුවරන්ස් පීඑල්සී හි සභාපතිවරයා වශයෙන් සේවය කරයි. ඒ මහතා සීමාසහිත එන්ඩීබී කැපිටල් හෝල්ඩින්ග්ස් හි සභාපතිරවරයාද වේ.

ශ්‍රී ලංකාවේ ආයතනික ක්ෂේත්‍රය තුළ පැහැදිලි දර්ශනයක් සහිත ව්‍යාපාරික නියමුවකු වශයෙන් ඇගයුමට පාත්‍ර වන ඒ මහතා ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම සමූහ ව්‍යාපාරයක් වන සොෆ්ට්ලොජික් සමූහයේ නිර්මාතෘවරයා ද වේ. ඔහු සතු නිවැරදි ප්‍රායෝගික දැනුම් සම්භාරය තුළින් ඒ මහතා විසින් සේවකයින් 10,000 කට අධික පිරිසක් වෙත රැකියා අවස්ථා උදාකරමින් සමාගම් 50 ක අධික සංඛ්‍යාවක් කළමනාකරණය කරනු ලබයි. සිල්ලර වෙළඳ, විදුලි සංදේශ සෞඛ්‍යාරක්ෂණ සේවා මූල්‍ය සේවා හා තොරතුරු තාක්ෂණය  සංචාරක හා මෝටර් රථවාහන යන සමගාමී ක්ෂේත්‍රයන් හතරක් පුරා පැතිරුනු නියෝජනයක් සහිත සමූහ සමාගමක් වෙත හෙතෙම ක්‍රමෝපායික මගපෙන්වීම ලබාදෙයි.

## 02

### අෂ්රොෆ් ඕමාර් මහතා

2020 ජනවාරි 08 වැනි දින සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කෙරුනු අෂ්රොෆ් ඕමාර් මහතා පසුව සීමාසහිත ශ්‍රීලංකන් කේටරින්හි අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කෙරිණ. හෙතෙම ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සහ ශ්‍රීලංකන් කේටරින් යන සමාගම් දෙකෙහිම මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු සභාපතිවරයා වේ.

සීමාසහිත බ්‍රැන්ඩික්ස් ලංකා හි සමූහ ප්‍රධාන විධායක නිලධාරීවරයා වන අෂ්රොෆ් මහතා දශක හතරක කාලයක් තිස්සේ ශ්‍රී ලාංකේය ඇඟළුම් ක්ෂේත්‍රය දැවැන්ත පරිවර්තනීය වෙනසකට ලක් කිරීමෙහිලා ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කලේය.  හෙතෙම එක්සත් රාජධානිය, කාම්බෝජය, හයිටි, ශ්‍රී ලංකාව, ඉන්දියාව හා බංග්ලාදේශය ඇතුළු ටෝකියෝ සිට එක්සත් ජනපදය දක්වා ලොව ප්‍රකට වෙළඳ නාමයන් වෙත නිෂ්පාදන හා නිෂ්පාදන සංවර්ධන සේවා සපයන්නා වූ සමූහ සමාගමක ප්‍රධානත්වය දරයි.

පරිසර හිතකාමී ඇඟළුම් නිෂ්පාදන සම්බන්ධ පුරෝගාමියකු වන හෙතෙම ලොව පළමු LEED ප්ලැටිනම් නිෂ්පාදනාගාරයද ස්ථාපනය කළේය. ඔහුගේ හසළ අත්දැකීම් සහ නිර්මාණශීලී චින්තනය හේතුවෙන් අෂ්රොෆ් මහතා ශ්‍රී ලංකාවේ ගෞරවනීය සමාගම් රැසක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකත්වය උසුලයි. ඒ මහතා ශ්‍රී ලංකාවේ ඇඟළුම් ක්ෂේත්‍රයේ අග්‍රගන්‍ය ආයතනය වන ජොයින්ට් ඇපරල් ඇසෝසියේෂන් ෆෝරම් හි නිර්මාතෘ සභාපතිවරයාද වේ.

## 03

### මලික් ජේ. ප්‍රනාන්දු මහතා

2020 ජනවාරි 08 වැනි දින සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කෙරුනු මලික් ප්‍රනාන්දු මහතා පසුව සීමාසහිත ශ්‍රීලංකන් කේටරින්හි අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කෙරිණ.

ප්‍රනාන්දු මහතා ඩිල්මා ටී සහ ශ්‍රී ලංකාවේ ප්‍රථම සුඛෝපභෝගී නිකේතන සන්නාමය වන 'රෙස්ප්ලෙන්ඩන්ට් සිලෝන්' හි කළමනාකරණ අධ්‍යක්ෂවරයෙකි. එමගින් සංචාරකයින් වෙත නියම දේශීය අත්දැකීමක් ලබාදෙමින් එම්ජේඑෆ් පදනම සහ ඩිල්මා කොන්සවේෂන් ඔස්සේ දේශීය ප්‍රජාවන් හා පරිසරය වෙත දායකත්වය සපයයි. පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසු ඒ මහතා 'ලව් ශ්‍රී ලංකා' තේමාව යටතේ පෞද්ගලික සංචාරක ක්ෂේත්‍රය නගා සිටුවීම සඳහා දැවැන්ත කාර්යභාරයක් ඉටු කලේය. ප්‍රනාන්දු මහතා එක්සත් ජනපදයේ බැබ්සන් විද්‍යාලයේ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිධරයෙකි.

## 04

### ජනාධිපති නීතීඥ මනෝහර ආර්. ද සිල්වා මහතා

ජනාධිපති නීතීඥ මනෝහර ආර්. ද සිල්වා මහතා, 2020 ජනවාරි 8 වන දින ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත්කෙරුණු අතර පසුව හෙතෙම සීමාසහිත ශ්‍රීලංකන් කේටරින්හි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත්කෙරුණි.

මනෝහර ආර්. ද සිල්වා මහතා ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ සේවයෙහි නියුතු ජනාධිපති නීතීඥවරයෙකි. 1988 දී නීතීඥයෙකු වශයෙන් දිවුරුම් දුන් ඒ මහතා 2006 දී ජනාධිපති නීතීඥවරයෙකු වශයෙන් පත්කෙරිණි. ඒ මහතා නීති කොමිසුමෙහි සහ නීති ආධාර කොමිසුමෙහි සාමාජිකයෙකි. හෙතෙම වසර කීපයක් නීති අධ්‍යාපනය පිළිබඳ සංස්ථාපිත කවුන්සිලයේ සේවය කළේය. 2006 දී රජය මගින් ඒ මහතා ව්‍යවස්ථාව සම්බන්ධ සර්ව පාක්ෂික නියෝජිත කමිටුවෙහි විශේෂඥ මණ්ඩලයෙහි සේවය සඳහා පත්කරන ලදී.

ජනාධිපති නීතීඥ ද සිල්වා මහතා මොරටුව විශ්වවිද්‍යාලයේ, විශ්වවිද්‍යාල කවුන්සිල සාමාජිකයෙකු වන අතර හෙතෙම ඊට පෙරාතුව එම විශ්වවිද්‍යාලයේ බාහිර කථිකාචාර්යවරයෙකු වශයෙන් සේවය කළේය. වසර ගණනාවකට පෙර ඒ මහතා නීතීඥ සංගමයෙහි සාමාජිකයෙකු වශයෙන් ද ශ්‍රී ලංකා නීතීඥ සංගමයෙහි විධායක කමිටු සාමාජිකයෙකු වශයෙන් ද, එමෙන්ම SAARC Law හි සේවය කළේය. ජනාධිපති නීතීඥ ද සිල්වා මහතා ව්‍යවස්ථාව සම්බන්ධ ග්‍රන්ථ හා පත්‍රිකා කීපයක් රචනා කොට ඇත.

05

## ජනාධිපති නීතිඥ සමන්ත රත්වත්ත මහතා

ජනාධිපති නීතිඥ සමන්ත රත්වත්ත මහතා 2020 ජනවාරි 8 වන දින ශ්‍රීලංකන් එයාර්ලයින්ස්හි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත් කරන ලදී.

හෙතෙම සිවිල් නීතිය සම්බන්ධ මනා පරිචයක් සහිත ජනාධිපති නීතිඥවරයෙකි. ඒ මහතා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පාලක මණ්ඩලයේ සාමාජිකයෙකු වන අතර එහි නීති පීඨයේ බාහිර කථිකාචාර්යවරයෙකු වශයෙන් ද සේවය කොට ඇත. හෙතෙම ශ්‍රී ලංකා නීති කොමිසමෙහි සාමාජිකයෙකු ද වේ.

ඔහුගේ සේවාවන් පුද්ගලික නීතිය, ඉඩම් නීතිය සහ වාණිජමය අර්බුද සම්බන්ධ පුළුල් පරාසයක පැතිරුණු සේවාදායක පිරිසක් වෙත සැලසුනි. ඒ මහතා දිවයින පුරා මූලික අධිකරණ සහ අභියාචනාධිකරණ වල හසල අත්දැකීම් ඇති ප්‍රකට නීතිඥවරයෙකු වේ.

සිවිල් ගැටළු සම්බන්ධයෙන් වන සංකීර්ණ නීතිමය තත්වයන් සම්බන්ධව ඔහුගේ විශේෂිත නිපුණත්වය හේතුවෙන් ආයතන සහ පුද්ගලයින් බොහෝමයක් එම මහතාගේ සේවාවන් ලබාගැනීම කෙරෙහි යොමුවේ. හෙතෙම සිය ප්‍රාථමික හා ද්වීතික අධ්‍යාපනය මහනුවර ත්‍රිත්ව විද්‍යාලයෙන් හදාරණ ලදී.

06

## ආචාර්ය හංස විජයසූරිය මහතා

ආචාර්ය හංස විජයසූරිය මහතා, 2020 ජනවාරි 23 වන දින ශ්‍රීලංකන් එයාර්ලයින්ස්හි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත්කෙරිණි.

ඒ මහතා දැනට ආසියාටා සමූහයේ විදුලි සංදේශ ව්‍යාපාරයෙහි ප්‍රධාන විධායක නිලධාරිවරයා වශයෙන් කටයුතු කරන අතර මැලේසියාව, ඉන්දුනීසියාව, බංග්ලාදේශය, නේපාලය, ශ්‍රී ලංකාව සහ කාම්බෝජයේ වෙළඳපොළ පුරා පැතිරුණු සමූහයේ කලාපීය විදුලි සංදේශ මෙහෙයුම් වල ප්‍රධානත්වය උසුලයි. ආසියාටා, ආසියාවේ දෙවන විශාලතම විදුලි සංදේශ සමූහය වේ.

ආසියාටා සමූහයේ කලාපීය පරිපාලිතයන් කීපයක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් කටයුතු කිරීමට අමතරව, ආචාර්ය විජයසූරිය ඩයලොග් ආසියාටා පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් ද කටයුතු කරයි. වසර 2016 දක්වා, ආචාර්ය විජයසූරිය ඩයලොග් ආසියාටා පීඑල්සී හි සමූහ ප්‍රධාන විධායක නිලධාරිවරයා වශයෙන් කටයුතු කළේය. ආචාර්ය විජයසූරිය ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු වශයෙන් ජෝන්කීල්ස් හෝල්ඩින්ස් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවය කරයි.

2016 දී, "ආසියානු ජංගම සන්නිවේදන ක්ෂේත්‍රය වෙත විශිෂ්ඨ දායකත්වය" සම්මානයෙන් පිදුම් ලද ප්‍රථමයා වශයෙන් ආචාර්ය විජයසූරිය GSM සංගමයෙහි ගෞරවයට පාත්‍රවිය. ආචාර්ය විජයසූරිය GSM සංගමයෙහි කලාපීය කණ්ඩායම වන GSM ඒෂියා පැසිෆික් හි හිටපු සභාපතිවරයෙකු වේ. ආචාර්ය විජයසූරිය 2008 දී 'ප්‍රීමියර් බිස්නස් ජර්නර්', LMD සඟරාව මගින් "වසරේ ශ්‍රී ලාංකිකයා" වශයෙන් නම් කෙරිණි. ආචාර්ය විජයසූරිය මේ වනවිට ශ්‍රී ලංකා වාණිජ මණ්ලයේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරයි.

එක්සත් රාජධානියේ කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයේ ආදි ශිෂ්‍යයෙකු වන ආචාර්ය විජයසූරිය එක්සත් රාජධානියේ බ්‍රිස්ටල් සරසවියෙන් ආචාර්ය උපාධිය හිමිකර ගත්තේය. වරලත් ඉංජිනේරුවරයෙකු සහ ඉංජිනේරු තාක්ෂණ ආයතනයෙහි අධි සාමාක සාමාජිකයෙකු වන ආචාර්ය විජයසූරිය වොරික් විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනවේදී උපාධිධරයෙකි.

07

## සංජය මොහොට්ටාල මහතා

සංජය මොහොට්ටාල මහතා 2020 පෙබරවාරි 1 වන දින ශ්‍රීලංකන් එයාර්ලයින්ස්හි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ද ඉන් අනතුරුව ශ්‍රී ලංකා කේටරින්හි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ද පත්කෙරිණි. හෙතෙම ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සහ ශ්‍රීලංකන් කේටරින් යන ආයතන දෙකෙහිම තාවකාලික විගණන කමිටු සභාපතිවරයා වේ.

සංජය මොහොට්ටාල මහතා බොස්ටන් කන්සල්ටින් සමූහයේ ප්‍රවාහන සහ නැව් බඩු ප්‍රවාහන ක්ෂේත්‍රයන්හි ආසියා ශාන්තිකර සම්බන්ධීකාරකවරයා විය. හෙතෙම දකුණු ආසියානු ආයතනික සංවර්ධන හා ප්‍රධාන ආයෝජකයින් සහ පෞද්ගලික ස්කන්ධ ක්‍රියාකාරකම් වල ප්‍රමුඛ සාමාජිකයෙකු ද වේ. ඒ මහතා සතුව ක්‍රමෝපාය, ගනුදෙනු, ප්‍රතිව්‍යුහගතකරණය, මෙහෙයුම් වැඩිදියුණු කිරීම, විකුණුම් සහ අලෙවි, විශ්ලේෂණ සහ සංවිධානමය සැකසුම් සම්බන්ධ මනා පරිචයක් පවතී.

මොහොට්ටාල මහතා විසින් බහුවිධ ඒකාබද්ධකරණ සාකච්ඡා සහ පශ්චාත් ඒකාබද්ධකරණ ප්‍රයත්නයන් සඳහා නායකත්වය ලබාදෙන ලදී. මහා පරිමාණ පරිවර්තනීය සමාගම් වල සේවය කළ ඒ මහතා ජාත්‍යන්තර සමාගම් කීපයක් සඳහා සංකීර්ණ විශ්ලේෂණාත්මක මෙවලම් නිපදවීමෙහිලා දායක වී ඇත.

මොරටුව විශ්වවිද්‍යාලයේ විද්‍යාවේදී ගෞරව උපාධිධරයෙකු වන ඒ මහතා, ඇමෙරිකා එක්සත්ජනපදයේ, UCLA ඇන්ඩර්සන් කළමනාකරණ විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනවේදී උපාධිධරයෙකි. එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ආයතනයේ සුදුසුකම්ලත් අයෙකි. අලෙවිකරණ ඩිප්ලෝමාලාභියෙකු වන හෙතෙම "ෆුල්බ්‍රයිට්" ශිෂ්‍යත්ව ලාභියෙකි.

# ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම

**විපුල ගුණතිලක මහතා**
*ප්‍රධාන විධායක නිලධාරී*

විපුල ගුණතිලක මහතා 2018 අගෝස්තු මස සිට ශ්‍රීලංකන් ගුවන් සේවයේ ප්‍රධාන විධායක නිලධාරීවරයා වශයෙන් සේවය කරන අතර, හෙතෙම ශ්‍රී ලංකාවේ ජාතික ගුවන් සේවයේ සමස්ත කළමනාකරණය කෙරෙහි වගකිවයුතු වේ.

ශ්‍රීලංකන් සමග එක්වීමට පෙරාතුව, ගුණතිලක මහතා TAAG ඇන්ගෝලා එයාර්ලයින්ස් හි ප්‍රධාන මූල්‍ය නිලධාරීවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් කටයුතු කළේය. ඒ මහතා ඇන්ගෝලාවේ ජාතික ගුවන් සේවය ප්‍රතිව්‍යුහගත කිරීමේදී එමිරේට්ස් ගුවන් සේවාව මගින් පත්කරන ලද වෘත්තීය කළමනාකරණ කණ්ඩායමක් සමග කැපීපෙනෙන කාර්යභාරයක් ඉටුකළේය.

ගුණතිලක මහතා ගුවන් සේවාව එමිරේට්ස් මඟින් කළමනාකරණය කරනු ලබන කාලසීමාවේදී ශ්‍රීලංකන් ගුවන්සේවයේ ප්‍රධාන මූල්‍ය නිලධාරී තනතුර හෙබවූ අතර එමිරේට්ස් ගුවන්සේවාව වෙතින් ශ්‍රී ලංකා රජය වෙත කළමනාකරණය මාරුවීමේදී, වැඩබලන ප්‍රධාන විධායක නිලධාරීවරයා වශයෙන් දැවැන්ත කාර්යභාරයක් ඉටුකළේය.

ඒ මහතා ශ්‍රී ලංකාව, සිංගප්පූරුව සහ ඕස්ට්‍රේලියාවේ සමාගම් රැසක ප්‍රධාන පෙළේ තනතුරු හොබවා ඇති අතර ගුවන්සේවා, තොරතුරු තාක්ෂණ, විදුලි සංදේශ, බැංකුකරණ හා සේවා ක්ෂේත්‍රයන්හි වසර 25 කට අධික අත්දැකීම් ඒ මහතා සතුවේ.

හෙතෙම ශ්‍රී ලංකා සංචාරක උපදේශන මණ්ඩලයෙහි සාමාජිකයෙකු වන අතර 'oneworld' එකමුතුවෙහි සාමාජිකයෙකු හා එයාර් ෆයිනෑන්ස් සඟරාවෙහි උපදේශක සාමාජිකයෙකු ද වේ.

ගුණතිලක මහතා CIMA ශ්‍රී ලංකා කලාපීය අධ්‍යක්ෂ මණ්ඩලයේ හිටපු සභාපතිවරයෙකු වන අතර ශ්‍රී ලංකා විගණන හා ගිණුම්කරණ ප්‍රමිති අධීක්ෂණ මණ්ඩලයේ සමාජිකයෙකු ද විය.

හෙතෙම එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරීවරයෙකු ද ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරයෙකු ද වන අතර ඕස්ට්‍රේලියාවේ සහතිකලත් මහජන ගණකාධිකාරීවරයෙකු හා කොළඹ විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනවේදී උපාධිධරයෙකි.

**ඩී.ඒ.පී. ජයසූරිය මහතා**
*ප්‍රධාන තාක්ෂණික නිලධාරී*

ඩී.ඒ.පී. ජයසූරිය මහතා 2018 සැප්තැම්බර් 1 වන දින ශ්‍රීලංකන් ගුවන්සේවාව සමඟ සම්බන්ධවීමෙන් අනතුරුව එහි ප්‍රධාන තාක්ෂණික නිලධාරියා වශයෙන් පත්කෙරිණි.

හෙතෙම ප්‍රථමයෙන් 1982 දී එවකට 'එයාර්ලංකා' ලෙස හැඳින්වූ ශ්‍රීලංකන් ගුවන්සේවාව වෙත ජ්‍යෙෂ්ඨ බලපත්‍රලත් ඉංජිනේරුවරයෙකු වශයෙන් බැඳුණු අතර ඉන් අනතුරුව 2000 දක්වා සමාගමේ විවිධ කළමනාකාරිත්ව තනතුරු දැරීය. ඉන්අනතුරුව ඒ මහතා 'ඕමාන් එයාර්' හි තාක්ෂණික ගිවිසුම් සම්බන්ධ ජ්‍යෙෂ්ඨ කළමනාකාර ධූරය දැරීය.

2016 දී ඒ මහතා ගුවන් යෝග්‍යතාව පිළිබඳ අධ්‍යක්ෂවරයා වශයෙන් ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය සමඟ එක්විය.

එක්සත් රාජධානියේ සිවිල් ගුවන්සේවා අධිකාරියෙන් ගුවන්යානා නඩත්තු ඉංජිනේරු බලපත්‍රයක් සහ CAA පාකිස්ථාන ගුවන්සේවා නඩත්තු ඉංජිනේරු බලපත්‍රය මෙන්ම CAA ශ්‍රී ලංකා ගුවන්යානා නඩත්තු බලපත්‍රය ද ඒ මහතා සතුවේ.

**ශමින්ද සමරවීර මහතා**
*ප්‍රධාන මූල්‍ය නිලධාරී*

ශමින්ද සමරවීර මහතා සතුව විදුලි සංදේශ, නිෂ්පාදන, දුම්කොළ, නාවික කටයුතු සහ බැංකුකරණය ඇතුළු ක්ෂේත්‍ර රැසක වසර 15 කට අධික ජ්‍යෙෂ්ඨ මට්ටමේ අත්දැකීම් පවතී. 2019 අප්‍රේල් මස ශ්‍රීලංකන් සමූහය වෙත පිළිගනු ලැබීමට පෙරාතුව හෙතෙම එටිසලාට් ලංකා පුද්ගලික සමාගමෙහි, ප්‍රධාන මූල්‍ය නිලධාරී ධූරය දැරීය.

ඒ මහතා ලංකා දුම්කොළ සමාගම, ඩයලොග් ඒෂියාටා සහ එක්සත් ජනපදයේ, NAVTEQ North America ඇතුළු ප්‍රධාන පෙළේ ආයතන රැසක ප්‍රමුඛ තනතුරු දැරීය. ආයතනික ක්‍රමෝපාය සහ සංවර්ධනය සම්බන්ධ විශේෂඥභාවයක් උසුලන ඒ මහතා මෙයට පෙර සේවය කළ ආයතන වලදී නායකත්ව සම්මාන රැසකින් පිදුම් ලබා ඇත.

මොරටුව විශ්ව විද්‍යාලයේ ඉලෙක්ට්‍රොනික් සහ විදුලි සංදේශ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිධරයෙකු වන හෙතෙම නෝර්ත් ඩකෝටා රාජ්‍ය විශ්ව විද්‍යාලයෙන් විද්‍යාපති උපාධි කීපයක් හිමි කරගෙන ඇත. ඒ මහතා එක්සත් ජනපදයේ වරලත් ජාත්‍යන්තර කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයෙහි සාමාජිකයෙකු හා එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයෙහි අධි සාමාර්ථ සාමාජිකයෙකි.

**ඩැල්රීන් තිරුකුමාර් මිය**
*සමාගම් ලේකම්/*
*ආයතනික ලේකම් සේවා ප්‍රධානී*

ඩැල්රීන් තිරුකුමාර් මිය 2013 දී සමාගමෙහි සේවයට එක්විය. ඇය සමාගම් ලේකම්වරිය සහ ආයතනික ලේකම් සේවා ප්‍රධානී වශයෙන් සේවය කරයි. මෙම අංශය මඟින් ශ්‍රීලංකන් ගුවන්සේවාවට, සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් වෙත ආයතනික ලේකම් සේවාවන් සපයනු ලබන අතරම ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ වැටුප් ලැයිස්තු සම්බන්ධ පහසුකම් ද සලසයි. ඇය 'ශ්‍රීලංකන් cares' භාරයේ භාරකාරිනියකි.

ක්ෂේත්‍රයේ වසර 20 කට අධික අත්දැකීම් සහිත ඇයගේ සේවා කාලය තුළ අතිශය ජ්‍යෙෂ්ඨ සහ වගකිවයුතු තනතුරු රැසක් හොබවා ඇත. ඇයගේ සේවා කාලය තුළ ශ්‍රී ලංකාවේ දැවැන්ත සමූහ සමාගම්වල අතිශය ජ්‍යෙෂ්ඨ හා වගකිවයුතු තනතුරු රැසක් හොබවා ඇත.

ඇය එක්සත් රාජධානියේ වරලත් ලේකම්වරුන් සහ පරිපාලකවරුන්ගේ ආයතනයෙහි සාමාජිකාවක වන අතර ඕස්ට්‍රේලියාවේ ව්‍යාපාර පරිපාලනවේදී උපාධිධාරිනියකි. එතුමිය ශ්‍රී ලංකා අධ්‍යක්ෂවරුන්ගේ ආයතනයෙහි සාමාජිකාවක ද වේ.

**යසන්ත දිසානායක මහතා**
*මූල්‍ය කළමනාකරණ ප්‍රධානී*

2004 දී සමාගමෙහි සේවයට බැඳුණු යසන්ත දිසානායක මහතා එහි මූල්‍ය කළමනාකරණ ප්‍රධානී ධුරය දරයි. සමාගමේ මූල්‍ය හා වාණිජ, ප්‍රසම්පාදන අංශයන් ඔහු වෙත වාර්තා කරයි.

ආසියාතික කලාපයේ සම්මාන දෙකකින් පිදුම් ලැබීමට හේතුවූ ප්‍රථම ජාත්‍යන්තර බැඳුම්කර නිකුතුව සහ ඉස්ලාමීය මූල්‍යකරණය ඇතුළු සමාගමේ බොහොමයක් පුරෝගාමී මූල්‍ය ගනුදෙනු ගණනාවක් සඳහා හෙතෙම මූලිකත්වය ගෙන කටයුතු කර ඇත.

A330-300 ගුවන්යානා සමූහය සඳහා පූර්ව ලබාදීමේ මූල්‍යකරණ ගනුදෙනු සැකසීමේදී කැපීපෙනෙන කාර්යභාරයක් ඉටුකරන ලද අතර එම ගනුදෙනුව 'එයාර්ෆයිනෑන්ස්' සඟරාව මගින් 2014 දී 'වසරේ පූර්ව ලබාදීම් මූල්‍යකරණ ගනුදෙනුව' වශයෙන් ඇගයුමට පාත්‍ර විය. සමාගම හා සම්බන්ධවීමට පෙරාතුව දිසානායක මහතා ආයෝජන බැංකුකරණය සහ විදුලි සංදේශ ක්ෂේත්‍රයන්හි ජ්‍යෙෂ්ඨ තනතුරු රැසක් හෙබවීය. හෙතෙම, වෘත්තියෙන් ගණකාධිකාරීවරයෙකු, එක්සත් රාජධානියේ වරලත් කළමනාකාර ගණකාධිකාරීවරුන්ගේ ආයතනයෙහි අධි සාමාර්ථ සාමාජිකයෙකු සහ කාර්ඩිෆ් හි වේල්ස් සරසවියේ ව්‍යාපාර පරිපාලනවේදී උපාධිධාරියෙකි.

**ප්‍රදීප කැකුලාවල මහතා**
*දේපළ හා සැපයුම් ප්‍රධානී*

ප්‍රදීප කැකුලාවල මහතා ආයතනික ක්ෂේත්‍රයේ දශක 3 කට අධික කළමනාකාරීත්ව අත්දැකීම් සහිත කළමනාකරණ වෘත්තිකයෙකි. මෙයට වසර 20 කට පමණ පෙර මානව සම්පත් සංවර්ධන ක්ෂේත්‍රයට පිවිසීමට පෙරාතුව ඒ මහතා ව්‍යාපෘති කළමනාකරණය, සාමාන්‍ය කළමනාකරණය, තාක්ෂණික පරිපාලනය, අලෙවිකරණය හා ව්‍යාපාර ප්‍රවර්ධන ක්ෂේත්‍රයන්හි ප්‍රමුඛ තනතුරු හෙබවීය. ඒ මහතා අධ්‍යාපන, කාර්යාල සියැයුම්, ඉංජිනේරු සහ ඇඟළුම් ක්ෂේත්‍රයන්හි සාමාන්‍යාධිකාරී, අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී සමූහ මානව සම්පත් ප්‍රධානී ධුරයන් දැරීමෙන් අනතුරුව 2011 අගෝස්තු මාසයේදී මානව සම්පත් ප්‍රධානී වශයෙන් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමඟ සේවයට එක්විය. එම තනතුරේ වසර 8 ක් සේවය කිරීමෙන් අනතුරුව ඒ මහතා 2019 ජනවාරි මාසයේදී දේපළ හා සැපයුම් ප්‍රධානී වශයෙන් වැඩ භාර ගත්තේය.

කැකුලාවල මහතා කළමනාකරණ පශ්චාත් උපාධි සුදුසුකම් ලාභියෙකු, පොදු රාජ්‍ය මණ්ඩලීය අධ්‍යයන ආයතනයේ ව්‍යාපාර කළමනාකාරණවේදී උපාධිධරයෙකු සහ ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ, තොරතුරු කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිධරයෙකි. හෙතෙම සිංගප්පූරුවේ ජාතික විශ්ව විද්‍යාලයෙන් සහ ශ්‍රී ලංකා කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයෙන් මානව සම්පත් කළමනාකරණය පිළිබඳ විධායක මට්ටමේ පුහුණුව ලබා ඇත. ඒ මහතා එක්සත් ජනපදයේ මානව සම්පත් කළමනාකරණ සංගමයෙහි වෘත්තීය සමාජිකයෙකු, ශ්‍රී ලංකා මානව සම්පත් වෘත්තිකයින්ගේ සංගමයේ හිටපු සභාපතිවරයෙකු සහ වෘත්තීය සාමාජිකයෙකු, එක්සත් රාජධානියේ ව්‍යාපාර විධායකයින්ගේ සංගමයෙහි සාමාජිකයෙකු සහ ජූනියර් චේම්බර් ඉන්ටර්නැෂනල් හි සහතිකලත් ජාතික පුහුණුකරුවෙකි.

**මයුක රණසිංහ මහතා**
*සමූහ නීති කටයුතු ප්‍රධානී*

මයුක රණසිංහ මහතා ශ්‍රීලංකන් සමූහයේ, සමූහ නීති කටයුතු ප්‍රධානී තනතුර හොබවයි. නඩු කටයුතු ආශ්‍රයෙන් සිය වෘත්තීය ජීවිතය අරඹන ලද ඒ මහතා පසුව ගුවන්සේවාව හා සම්බන්ධවීමට පෙරාතුව විදුලි සංදේශ ක්ෂේත්‍රයේ සේවය කළේය. 2009 දී ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි සේවයට එක්වුනු තැන් පටන් ඒ මහතා සංකීර්ණ, ව්‍යුහගත හා ජාත්‍යන්තර වාණිජ ගිවිසුම් රැසක් ගුවන්සේවාව වෙනුවෙන් ක්‍රියාවට නංවන ලදී. හෙතෙම බහු නීතිමය නඩු කටයුතු සහ අර්බුද විසඳීම්, නියාමන කටයුතු, බුද්ධිමය දේපළ සහ සේවා නියුක්ති ගැටළු සම්බන්ධයෙන් ද සමාගම වෙනුවෙන් කටයුතු කරයි.

වෘත්තියෙන් නීතිඥයෙකු වන ඒ මහතා, කොළඹ විශ්ව විද්‍යාලයේ නීතිවේදී උපාධිධරයෙකි. හෙතෙම කොළඹ විශ්ව විද්‍යාලයේ නීතිය පිළිබඳ ද්විතික උපාධිධරයෙකු සහ වේල්ස් විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනවේදී උපාධිධරයෙකි.

**චාමර පෙරේරා මහතා**
*තොරතුරු තාක්ෂණ ප්‍රධානී*

ගුවන් සේවා තාක්ෂණය හා ව්‍යාපාරික ක්‍රියාවලි සියැයුම පිළිබඳ හසළ දැනුමක් සහිත චාමර පෙරේරා මහතා ගුවන් සේවා ක්ෂේත්‍රයේ පරිණත වෘත්තිකයෙකි. හෙතෙම සමූහය සහ ගුවන් සේවාව වෙත තොරතුරු තාක්ෂණ හා ඩිජිටල් පරිවර්තනයන් සම්බන්ධයෙන් ක්‍රමෝපායික නායකත්වය ලබාදෙයි.

1999 වර්ෂයේදී ගුවන්සේවා ක්ෂේත්‍රයට එක්වූ චාමර පෙරේරා මහතා දශක දෙකක කාලයක් පුරා ජාතික ගුවන් සේවය සමඟ කටයුතු කරයි. ඔහු විසින් ගුවන් සේවයේ විවිධ කළමනාකරණ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු රැසක් දරා ඇති අතර 2012 වර්ෂයේදී තොරතුරු තාක්ෂණ ප්‍රධානී වශයෙන් පත්කරන ලදී. ගුවන් ප්‍රවාහනයෙහිලා වේගවත් ගුවන් ගමන් නවෝත්පාදක විසඳුම් අන්තර්ගත ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමයට අයත් ව්‍යාපාර සරල කිරීමේ වැඩසටහන ස්ථාපිත කිරීම සඳහා චාමර මහතා මූලිකත්වය ගෙන ක්‍රියා කරන ලදී. ගුවන් සමාගම් ආශ්‍රිත තොරතුරු තාක්ෂණ පාලන වේදිකාවක් සහතික කරමින් ජාත්‍යන්තර වශයෙන් පිළිගත් තොරතුරු තාක්ෂණ ප්‍රමිතීන් හා අනුකූලව කටයුතු කිරීම සඳහා චාමර මහතා කටයුතු කර ඇත. තොරතුරු ආරක්ෂණ කළමණාකරනය සඳහා ISO/IEC270001:2013 සහතිකකරණයද, මෘදුකාංග තත්ත්ව කළමණාකරණය සඳහා ISO 9001:2015 සහතිකකරණය, තොරතුරු තාක්ෂණ සේවා කළමණාකරනය සඳහා ISO/IEC20000:2018 සහතිකකරණය වැනි ප්‍රමිත තුළින් ශ්‍රීලංකන් තොරතුරු තාක්ෂණය සහතික කර ඇත. මනාව ඒකාබද්ධ වූ ගුවන් සේවා තොරතුරු තාක්ෂණ පාරිසරික පද්ධති ගණනාවක් සහිතව සමාගමේ ව්‍යාපාර හා මෙහෙයුම් කටයුතු පිළිබඳ ඩිජිටල් පරිණාමණයට චාමර මහතා නායකත්වය සලසයි.

මොරටුව විශ්ව විද්‍යාලයේ ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ විද්‍යාවේදී උපාධියක් සහිත චාමර මහතා වෘත්තියෙන් ඉංජිනේරුවෙකි. තවද එක්සත් රාජධානියේ ලිසෙස්ටර් විශ්ව විද්‍යාලයෙන් තොරතුරු තාක්ෂණ කළමණාකරණ විශේෂ ව්‍යාපාර පරිපාලනපති උපාධියද ලබා ගෙන ඇත.

# ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම සබැඳේ.

**චාමර රණසිංහ මහතා**
*ගුවන් භාණ්ඩ අංශ ප්‍රධානී*

චාමර රණසිංහ මහතා 2013 දී ගුවන් භාණ්ඩ ප්‍රධානී වශයෙන් සමාගමෙහි සේවයට එක්විය. ඒ මහතා සතුව පාරිභෝගික සේවා, භාණ්ඩ වෙන්කිරීම්, භාණ්ඩ විකිණුම්, අලෙවි හා ගුවන් තොටුපළ භාණ්ඩ මෙහෙයුම් පිළිබඳ වසර 20 කට අධික අත්දැකීම් වේ.

සමාගම හා සේවයට එක්වීමට පෙරාතුව, ඒ මහතා ශ්‍රී ලංකාව වෙත මෙහෙයුම් සිදුකරනු ලබන ප්‍රකට ජාත්‍යන්තර ගුවන් සේවාවන්හි ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු හෙබවීය.

**සුමුදු උපතිස්ස මහතා**
*ආදායම් කළමනාකරණ, සැලසුම්කරණ සහ වාණිජමය සහාය ප්‍රධානී*

2000 දී පුහුණු විධායක නිලධාරියෙකු වශයෙන් සමාගමෙහි සේවයට බැඳුණු සුමුදු උපතිස්ස මහතා අදාළ වැඩසටහන සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් පසුව, 2001 දී වාණිජ අංශය වෙත අනුයුක්ත කෙරිණි. ඒ මහතා සතුව ජාත්‍යන්තර සබඳතා, වැඩසටහන් සැලසුම්කරණ, ජාල හා ආදායම් සැලසුම්කරණ, ආදායම් කළමනාකරණ ක්ෂේත්‍රයන්හි වසර 12 කට වැඩි කළමනාකරණ අත්දැකීම් සහ වසර 18 ක ආයතනික අත්දැකීම් ද වේ. ඒ මහතා 2017 දී සමාගමෙහි ආදායම් කළමනාකරණ, සැලසුම්කරණ සහ වාණිජමය සහාය ප්‍රධානී වශයෙන් පත්කෙරිණි.

ඒ මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ අලෙවි කළමනාකරණය පිළිබඳව විද්‍යාවේදී උපාධිධරයෙකි. එයට අමතරව හෙතෙම ගුවන්සේවා අධ්‍යයන පිළිබඳ IATA ඩිප්ලෝමාලාභියෙකු සහ එක්සත් රාජධානියේ චරලත් අලෙවිකරණ ආයතනයෙහි, අලෙවිකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාලාභියෙකි.

**දිමුතු තෙන්නකෝන් මහතා**
*ලෝක ව්‍යාප්ත විකිණුම් සහ බෙදාහැරීම් ප්‍රධානී*

2017 අප්‍රේල් මස වර්තමාන ධුරයට පත්කරන ලද දිමුතු තෙන්නකෝන් මහතා ලෝක ව්‍යාප්ත මගී විකිණුම්, බෙදාහැරීම් චැනල කළමනාකරණ සහ ගුවන්සේවාවේ සියළු විකිණුම් සහ අලෙවි මෙහෙයුම් වල ප්‍රධානියා වශයෙන් කටයුතු කරයි. තෙන්නකෝන් මහතා ගුවන්සේවා විකිණුම් මෙහෙයුම් සම්බන්ධව වසර 15 කට අධික අත්දැකීම් සහ ක්ෂේත්‍රයේ 25 වසරකට අධික අත්දැකීම් සහිත පරිණත වෘත්තිකයෙකි. ඒ මහතා කලක් 'ඕමාන් එයාර්' හිද ඉහළ තනතුරක් දැරීය. ඒ මහතා ආසියා ශාන්තිකර, ඈත පෙරදිග, මැදපෙරදිග, ඉන්දියානු උප මහද්වීපය සහ උතුරු ඇමෙරිකානු කලාපයන්හි දේශීය හා කලාපීය කළමනාකාර තනතුරු හෙබවීය. ඉන් අනතුරුව ඒ මහතා වර්තමාන ධුරයට පත්වීමට පෙරාතුව ජාතික ගුවන්සේවයේ වාණිජමය මෙහෙයුම් සම්බන්ධ සාමාන්‍යාධිකාරීවරයා වශයෙන් පත්විය. විකිණුම් ක්ෂේත්‍රයේ අත්දැකීම් වලට අමතරව, ඒ මහතා විසින් ආදායම් සැලසුම්කරණය, ආදයම් කළමනාකරණය සහ කළමනාකරණ ගණකාධිකරණය සම්බන්ධව ද වගකිවයුතු ධුරයන් රැසක් දරණ ලැබ ඇත.

ඒ මහතා මේ වනවිට සමාගමෙහි අලෙවි, ඊ-කොමර්ස්, ජාත්‍යන්තර බෙදාහැරීම් චැනල, ගනුදෙනුකාර සබඳතා කළමනාකරණය (FlySmiLes වැඩසටහන ද ඇතුළුව), අනුශාංගික ආදායම් අංශ මෙන්ම ගුවන්සේවාවේ ශ්‍රීලංකන් හොලිඩේස් ව්‍යාපාරික අංශයේ කටයුතු අධීක්ෂණය කරයි.

කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨයේ උපාධිධරයෙකු වන ඒ මහතා ශ්‍රී ලංකා ගුවන්සේවා නියෝජිතයින්ගේ මණ්ලයේ සභාපති ධුරය උසුලන අතර ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයෙහි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් ද කටයුතු කරයි.

**බුද්ධිකා මානගේ මහත්මිය**
*ගුවන් මැදිරි සේවා ප්‍රධානී*

2003 වර්ෂයේදී කළමණාකරන පුහුණු සේවිකාවක ලෙස සමාගමට සම්බන්ධ වූ බුද්ධිකා මානගේ මිය 2004 වර්ෂයේදී වාණිජ ප්‍රසම්පාදන විධායක නිලධාරිනියක ලෙස සිය වෘත්තිය ආරම්භ කරන ලදී. ජ්‍යෙෂ්ඨ යානාස්ථ සේවා විධායක (පරිපාලන සහ ගුවන් මැදිරි සේවක සේවා), යානාස්ථ සේවා කළමණාකරු (පරිපාලන සහ ගුවන් මැදිරි සේවක යෙදවීම්), මානව සම්පත් සංවර්ධන හා ව්‍යාපාර හවුල්කාරීත්ව කළමණාකරු, මානව සම්පත් සංවර්ධන හා ව්‍යාපාර හවුල්කාරීත්ව ජ්‍යෙෂ්ඨ කළමණාකරු සහ අවසාන වශයෙන් ගුවන් මැදිරි සේවා ප්‍රධානී ලෙස වසර 16 පමණ ගුවන් සේවයේ පළපුරුද්දක් ඇය සතුවේ. එමෙන්ම, ගුවන් මැදිරි සේවා ප්‍රධානී තනතුරට අමතරව 2020 ජනවාරි මස සිට වැඩබලන මානව සම්පත් ප්‍රධානී ලෙසද ඇයව පත්කරනු ලැබිණි. 2020 ජූලි මස සිට බලාත්මක වන පරිදි ඇය විසින් මානව සම්පත් සහ ගුවන් මැදිරි ප්‍රධානී තනතුරද හොබවනු ලබයි.

කොළඹ විශ්ව විද්‍යාලයේ සංඛ්‍යානය පිළිබඳ විශේෂ විද්‍යාවේදී උපාධිධාරිනියක වන ඇය මොරටුව විශ්ව විද්‍යාලයේ කළමණාකරන විද්‍යාපති උපාධිධාරිනියක සහ මානව කළමණාකරන ආයතනයේ වෘත්තීය සුදුසුකම් ලාභිනියකි. තවද ඇය කම්කරු නීති, සැපයුම් දාම කළමණාකරන සහ තොරතුරු තාක්‍ෂණ යන ක්ෂේත්‍රයන්හිද සුදුසුකම් සපුරා ඇත.

**කපිතාන් ප්‍රවීන් වෙත්තමුනි මහතා**
*ගුවන් මෙහෙයුම් ප්‍රධානී*

කපිතාන් වෙත්තමුනි මහතා තරුණ ශිෂ්‍යභට ගුවන් නියමුවෙකු ලෙස 2001 දී ශ්‍රීලංකන් ගුවන් සමාගමට එක්විය. ඔහු නියෝජ්‍ය ප්‍රධාන නියමුවරයා ලෙස පත්වීමෙන් පසු වසර පහකට වැඩි කාලයක් ක්‍රියාකාරීව කළමනාකරුවෙක් ලෙස සේවයේ නිරත විය. උසස් කළමණාකරුවෙක් ලෙස ඔහුගේ කාර්යභාරයට අමතරව, කපිතාන් වෙත්තමුනි මහතා A330/A320 ගුවන් යානා වල වත්මන් ගුවන් නියමුවරයකු හා ඒ සඳහා පත්කළ පිරික්සුම් ගුවන් නියමුවරයෙක් ද වේ.

ඒ මහතා එක්සත් රාජධානියේ ඩර්හැම් විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර ආර්ථික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිධාරයෙකි.

**ලුතිනන් කර්නල් බන්දුල වේරගම මහතා**
*සාමාන්‍යාධිකාරී ගුවන් තොටුපළ හා ගොඩබිම් සේවා*

ශ්‍රී ලංකා යුද හමුදාවේ වසර 23 ක සේවා කාලයකින් පසුව වර්ෂ 2012 දී වේරගම මහතා සමාගමේ සේවයට එක් විය. ත්‍රිවිධ හමුදා පරිසරය ආශ්‍රිත පුහුණුව සහ අණ දීමේ පළපුරුද්දට අමතරව ඒ මහතා එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම්

දෙපාර්තමේන්තුවෙහි ද සේවය කර ඇත. සමාගමේ මානව සම්පත්, ගුවන් යානාස්ථ හා ආරක්ෂක අංශවලට සේවා සැපයූ වේරගම මහතා ගුවන් තොටුපල හා ගොඩබිම් සේවා අංශයේ ප්‍රධානියා ලෙස 2016 පෙබරවාරි මාසයේදී පත් කරන ලදී.

කැළණිය විශ්ව විද්‍යාලයේ ආරක්ෂක අධ්‍යයන පිළිබඳ පශ්චාත් උපාධිය හිමි බන්දුල වේරගම මහතා පකිස්ථානයේ ක්වෙට්ටා විශ්ව විද්‍යාලයේ විද්‍යාපති උපාධියක්ද ලබාගෙන ඇත.

**ප්‍රිමාල් ද සිල්වා මහතා**
*සාමාන්‍යාධිකාරී, ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යාතනය*

1988 දී සමාගමේ ගුවන් මැදිරි සේවක මණ්ඩලයේ සාමාජිකයකු ලෙස සේවයට එක්වූ සිල්වා මහතා 2006 වන තුරු ජ්‍යෙෂ්ඨ ගුවන් කාර්යය මණ්ඩල සමාජිකයෙකු ලෙස කටයුතු කර ඇත. දැනට ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යාතනයෙහි සාමාන්‍යාධිකාරී තනතුර දරන අතර වගකීම් කළමණාකරු (147 කොටස), ගුවන් යානා නඩත්තු සහ පුහුණු සංවිධානය සඳහා වගකීම් දරනු ලැබේ. මෙම පත්වීමට පෙර ගුවන් මැදිරි ආරක්ෂක කළමණාකරු සහ යානාවන් තුළ මෙහෙයුම් හා පුහුණු කටයුතු කළමණාකරු යන පදවියන්ද සිල්වා මහතා දරන ලදී.

ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විධායක පරිපාලනපති උපාධියක් ලබා ඇති අතර ශ්‍රී ලංකා පුහුණු හා සංවර්ධන ආයතනයෙන් පුහුණු හා සංවර්ධනය පිළිබඳ ජාතික ඩිප්ලෝමාවක් හිමිකර ගෙන ඇත.

# ව්‍යාපාර අවදානම් කළමණාකරන ආකෘතික රාමුව

**ක්‍රියාවලිය සමාලෝචනය**

ශ්‍රීලංකන් ගුවන් සමාගමේ ව්‍යාපාර අවදානම් කළමණාකරන ආකෘතික රාමුව එහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන අතර සහතික කිරීම් හා උපදේශන සේවා අංශය විසින් මධ්‍යගතව පහසුකම් සලසනු ලැබේ. ව්‍යාපාර අවදානම් හඳුනාගැනීමේ සහ එම අවදානම් මත ශ්‍රීලංකන් ගුවන් සමාග මට ඇතිවන බලපෑම් අවම කිරීම සඳහා ක්‍රියාකාරී සැලසුම් සැකසීම යන කාර්යයන් සඳහා වූ කර්මාන්ත නියාමන සහ මනා පරිචය අවශ්‍යතාවයන් ඉටු කිරීම සඳහා ශ්‍රීලංකන් ගුවන් සමාග මේ ව්‍යාපාර අවදානම් කළමණාකරන ආකෘතික රාමුව ස්ථාපනය කරන ලදී. මූල්‍ය, මෙහෙයුම්, තොරතුරු තාක්ෂණය, ආරක්ෂාව, අලෙවිකරණය, මානව සම්පත්, සාර්ව පාරිසරික අවදානම් ඇතුලත් ක්‍රමෝපායික, ක්‍රියාවලි සහ ව්‍යාපෘති මට්ටම් වලදී අවදානම් හඳුනාගැනේ. යහ පාලනයේ ප්‍රමුඛ අංගයක් ලෙස ඵලදායී ව්‍යාපාර අවදානම් කළමණාකරනය සඳහා ශ්‍රීලංකන් ගුවන් සමාගම බැඳී සිටින අතර ශ්‍රීලංකන් ගුවන් සමාගමේ අවදානම් ආශ්‍රිත  හැඩගැස්ම මගින් අවදානම් මත පාදක වූ තීරණවලට එළඹීම සඳහා සියළුම සේවක සේවිකාවන් දිරිගන්වනු ලැබේ.

**අවදානම් කළමනාකරණ සංවිධාන ව්‍යුහය**




ශ්‍රීලංකන් ගුවන් සමාගම තුළ ව්‍යාපාර අවදානම් කළමණාකරනය ක්‍රියාත්මක කිරීමේ වගකීම පවතිනුයේ  අවදානම් කළමණාකරන හැසිරවීමේ කමිටුව (ජ්‍යේෂ්ඨ කළමණාකරන කණ්ඩායම), අවදානම් කළමණාකරන සම්බන්ධීකාරකවරුන් සහ ක්‍රියාකාරකම් කළමණාකරණය (අවදානම් හිමිකරුවන්) යන පාර්ශ්වයන් මතය. සමාගමේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තියට අනුකූලව එක් එක් අංශයන්හි කටයුතු මෙහෙයවීම සහ අවදානම් පිළිබඳ දැනුවත් කිරීමේ සංස්කෘතියක් ගොඩනැගීම සඳහා අවදානම් කළමනාකරණ හැසිරවීමේ කමිටුව වගකීම දරයි. අවදානම් හඳුනා ගැනීම සහ ඇගයීම, සුදුසු අවදානම් නිරාකරණ සැලසුම් සකස් කිරීම සහ ප්‍රගතිය



අධීක්ෂණය කිරීම සඳහා ක්‍රියාකාරීත්ව කළමනාකරණය වගකිව යුතු වේ.

### අවදානම් කළමණාකරන ක්‍රියාවලිය

ශ්‍රීලංකන් ගුවන් සමාගමේ අවදානම් කළමණාකරන ක්‍රියාවලිය අවදානම් හඳුනාග ැනීම, අවදානම් විශ්ලේෂණය, අවදානම් නිරාකරණය සිදු කිරීම සහ අවදානම් වාර්තාකරණය හා නිරීක්ෂණය යන ප්‍රධාන අංග හතරකින් සමන්විත වේ.

#### *අවදානම් හඳුනාගැනීම*

ක්‍රියාකාරීත්ව හා සාංගමික අරමුණු අත්පත් කරගැනීම සඳහා අවහිරයක් විය හැකි අභ්‍යන්තර හා බාහිර සාධක ශ්‍රීලංකන් ගුවන් සේවය විසින් හඳුනාගනු ලබයි. අවදානම් හඳුනාගැනීමේ මෙවලම් භාවිතා කිරීමෙන් සහ ප්‍රධාන ක්‍රියාදාමයන්, ව්‍යාපෘති සහ ව්‍යාපාර අරමුණු විශ්ලේෂණය කිරීමෙන් අවදානම් හිමිකරුවන් විසින් අවදානම් හඳුනා ගනු ලැබේ. අවදානම් ලේඛනයන් යාවත්කාලීන කිරීමට අවශ්‍ය සියලු තොරතුරු ක්‍රියාකාරීත්ව කළමණාකරනය විසින් ආංශික/දෙපාර්තමේන්තු සම්බන්ධීකාරකවරුන් වෙත සපයනු ලබයි.

#### *අවදානම් විශ්ලේෂණය*

හඳුනාගන්නා ලද අවදානම් සම්භාවිතාව හා එම අවදානම් හි බලපෑම පදනම් කරගනිමින් විශ්ලේෂණය කරනු ලබන අතර අවදානම් අය ගණන මත පදනම්ව සැලකිය යුතු, ඉහළ, මධ්‍ය හා පහළ යනුවෙන් ශ්‍රේණිගත කරනු ලබයි. සම්භාවිතා අනුපාතය සමඟ බලපෑම් අනුපාතය ගුණ කිරීමෙන් අවදානම් අය ගණන ගණනය කරනු ලැබේ.

#### *අවදානම් නිරාකරණය*

අවදානම් ශ්‍රේණීන් හා අවදානම් සාධකය මත පදනම් ව ක්‍රියාකාරී සැලසුම් සැකසීමෙහිලා වගකීම ක්‍රියාකාරීත්ව කළමණාකරනය විසින් දරනු ලබයි. අවදානම් නිරාකරණය වෙනුවෙන් ශ්‍රීලංකන් ගුවන් සමාගම විසින් හඳුනාගත් අවදානම් ප්‍රතිචාර තුළ අවම කිරීම, මාරු කිරීම, වැලැක්වීම සහ පිළිගැනීම යන කාරණා ඇතුලත් වේ. සැලකිය යුතු අවදානම් නිරාකරණය පිළිබඳ ක්‍රියාමාර්ග ප්‍රධාන විධායක නිලධාරී/අදාළ ජ්‍යේෂ්ඨ කළමණාකරන කණ්ඩායම විසින් සමාලෝචනය කර අනුමත කරනු ලබයි. ඉහළ අවදානම් නිරාකරණය පිළිබඳ ක්‍රියාමාර්ග ජ්‍යේෂ්ට කළමණාකරන කණ්ඩායම විසින් විමර්ශනය කරනු ලබයි. මධ්‍ය අවදානම් නිරාකරණය පිළිබඳ ක්‍රියාමාර්ග දෙපාර්තමේන්තු කළමණාකරුවන් විසින් විමර්ශනය කරනු ලබයි. පහළ මට්ටමේ අවදානම් පවතින පාලන ක්‍රම මගින් කළමණාකරනය කෙරෙන අතර අවදානම් ශ්‍රේණීන් වල වෙනස්කම් සමීපව නිරීක්ෂණය කරනු ලබයි.

#### *අවදානම් වාර්තාකරණය සහ නිරීක්ෂණය*

ක්‍රියාකාරකම් අයිතමයන් නිසි කලට ක්‍රියාත්මක වන්නේදැයි නිරීක්ෂණය කිරීම සඳහා ආංශික/දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් කාර්තුමය පදනමක් මත අවදානම් කළමණාකරන ලේඛන විමර්ශනයට කරනු ලැබේ. අවදානම් කළමණාකරන හැසිරවීමේ කමිටුව විසින් ප්‍රධාන අවදානම් විමර්ශනය කොට අර්ධ වාර්ෂිකව විගණන කමිටුව වෙත වාර්තා කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය සැනෙකින් යොමු කළ යුතු අවස්ථාවන්හිදී හැර අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් ප්‍රධාන සාංගමික අවදානම් අර්ධ වාර්ෂිකව සමාලෝචනය කරන අතර අර්ධ වාර්ෂික පදනමක් මත අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරනු ලැබේ.

# කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය



**"පාස්කු ඉරුදින ප්‍රහාරයේ සහ දැනට පවතින කෝවිඩ් 19 වසංගතයෙහි ප්‍රතිඵල වශයෙන් උද්ගත වුනු අනපේක්ෂිත බාධාවන් හමුවේ වුවද, සමූහය මගින් ආදායම වර්ධනය කරගැනීමේ විවිධ ව්‍යාපෘතීන් ඔස්සේ ශ්‍රී ලංකා රුපියල් වලින් සුළු අඩුවීමක් සහිතව හෝ පෙර මූල්‍ය වර්ෂයෙහි ආදායම් තත්ත්වයන්ට සමාන වෙමින් රුපියල් මිලියන 183,532 ක ආදායමක් වාර්තා කරන ලදී. (සාපේක්ෂව 2018/19 රුපියල් මිලියන 184,097)."**

## මූල්‍යමය විමර්ශනය

පාස්කු ඉරුදින ත්‍රස්ත ප්‍රහාරයෙන් ඇරඹී ලෝක ව්‍යාප්ත වසංගතයකින් අවසන් වූ 2019/20 මූල්‍ය වර්ෂය ගුවන් සේවාවේ ඉතිහාසයේ අතිශය අභියෝගාත්මක වූ වසර වලින් එකකි.

මෙම අනපේක්ෂිත සිදුවීම් නිසාවෙන් අස්ථාවරත්වය ඉහළ ගිය සහ ජාත්‍යන්තර ගුවන් ගමන් සඳහා වන ඉල්ලුමෙහි දැඩි පහත වැටීමක් සහිත වූ දීප ව්‍යාප්ත ඇඳිරිනීති පැනවීම්, ගුවන් තොටුපළ වසා දැමීම්, ජාත්‍යන්තර දේශසීමා වසා දැමීම්, දැඩි ගමනාගමන සීමාවන් හා සම්පූර්ණයෙන්ම අඩාල වූ සංචාරක කර්මාන්තයක් මධ්‍යයේ අසීරු කාල පරිච්ඡේදයක් ගෙවා දැමීමට ගුවන් සේවාවට සිදු විය. තවද ආදායම් අහිමිවීම් හමුවේ ව්‍යාපාරික ඉලක්ක අත්පත් කරගැනීම අතර මනා සමතුලනයක් පවත්වා ගැනීමද, පනවන ලද අදාළ මෙහෙයුම් ක්‍රියාපටිපාටීන් රජයේ නියෝගයන් ඔස්සේ අපගේ මගීන්ගේ හා සේවකයින්ගේ සෞඛ්‍ය හා සුරක්ෂිතතාව සැලසීමද අතිශය බැරෑරුම් කර්තව්‍යයක් විය.

එමෙන්ම ඉහළ ගිය තරඟකාරීත්වය, අධිධාරිතාව, ඉහළ නැංවුනු මූල්‍ය පිරිවැය, ඇමරිකානු ඩොලරය හා සෙසු ජාත්‍යන්තර මුදල් ඒකකයන් ශ්‍රී ලංකා රුපියලට සාපේක්ෂව තවදුරටත් ශක්තිමත්වීම වැනි දිගින් දිගටම පැවති අයහපත් සාර්ව ආර්ථික සාධක හේතුවෙන් ආදායම වෙත දැඩි බලපෑමක් එල්ල වූ අතර, එහිදී ජෙට් ඉන්ධන මිල පහළ යාමෙන් අත්වූ ප්‍රතිලාභයද අර්ධ වශයෙන් හිලව් කෙරිනි.

2020 මාර්තු 31 අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා සමූහය රුපියල් මිලියන 44,139.40 ක ශුද්ධ අලාභයක් (එය පෙර මූල්‍ය වර්ෂයට සාපේක්ෂව 5.8% ක ඉහළ යාමකි) වාර්තා කලද ඉහත සඳහන් කරන ලද අලාභය සඳහා ප්‍රමුඛ දායකත්ව සාධකයන් වූයේ පහත දැක්වෙන ආකාරයේ මෙහෙයුම් - නොවන අයිතමයින්ය.

| | 2019/20 රු. මිලියන | 2018/19 රු. මිලියන | වර්ධනය % |
|---|---|---|---|
| මූල්‍ය පිරිවැය | 40,667 | 19,483 | 108.7 |
| විනිමය අලාභය | 5,270 | 2,328 | 126.4 |
| රඳවාගැනීමේ බදු වියදම | 8,062 | 6,972 | 15.6 |

මූල්‍ය පිරිවැය දෙගුණයකින් ඉහළ යාම කෙරෙහි හේතු වූයේ SLFRS 16 ගිණුම්කරණ ප්‍රමිතිය ආදේශ කරගැනීමයි. එහිදී මේ වන තෙක් කුලී වියදම් (මෙහෙයුම් කල්බදු) වශයෙන් ගිණුම්ගත කෙරුනු, පාදක වූ වත්කමක් සහිත සියළුම ප්‍රධාන මෙහෙයුම් කල්බදු, මූල්‍ය ප්‍රකාශයේදී අනුරූපී වගකීම් සහිත වත්කමක් වශයෙන් හඳුනාගැනේ. සියළුම ගුවන් යානා කල්බදු මෙහෙයුම් ඇමරිකානු ඩොලර් වලින් සිදුකෙරෙන බැවින්, අදාළ වගකීම ප්‍රත්‍යාගණනයෙහි ප්‍රතිඵලයක් වශයෙන් රුපියල් මිලියන 12960 ක විනිමය අලාභයක් උද්ගත විය. ඒ හේතුවෙන් මූල්‍ය පිරිවැය රුපියල් මිලියන 10,683 ක් වශයෙන් වාර්තා විය.

රඳවාගැනීමේ බදු වියදම, නේවාසික නොවන පර්ශ්වයන් වෙත ගෙවනු ලබන රඳවාගැනීමේ බද්දට යටත් වන විදේශ ගෙවීම් මත වන බදු වගකීම් සඳහා සිදුකරන ලද වෙන්කිරීමෙන් සමන්විත වේ. 2018 අප්‍රියෙල් 01 වැනි දින සිට අතීතයට බලපාන පරිදි, විදේශ ගෙවීම් රඳවාගැනීමේ බද්දෙන් නිදහස් කිරීම සඳහා මේ වන විට කැබිනට් අනුමැතිය හිමි වී ඇත. කෙසේවුවද, ඉහත අනුමැතිය ලද කරුණ මුදල් අමාත්‍යාංශය සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් විධිමත් ලෙස ක්‍රියාවට නංවා, කිසියම් කලකදී රඳවාගැනීමේ බදු වියදම නැවත ලියා තබන තුරු ඒ දක්වා අදාළ රඳවාගැනීමේ බදු සඳහා සිදුකරන ලද වෙන්කිරීම පවතිනු ඇත.

### විනිමය අනුපාත සංචලනයෙහි බලපෑම




කෝවිඩ් 19 වසංගතය හේතුවෙන් මාර්තු මාසයේදී සිදුවූ තියුණු අවප්‍රමාණ වීමක් සමගින්, 2019/20 මූල්‍ය වර්ෂයේදී ශ්‍රී ලංකා රුපියලෙහි අගය ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව දිගින් දිගටම අවප්‍රමාණ වෙමින් පැවතිණි. මාර්තු මාසයේදී ශ්‍රී ලංකා රුපියලෙහි අගය අවප්‍රමාණ වීම 4.5%ක් වූ අතර මුළු වසර පුරා අවප්‍රමාණ වීම 7.8% ක් විය.

මෙම අහිතකර මුදල් ඒකක වටිනාකම් සංචලනය, ගුවන් සේවාවෙහි ශුද්ධ ආදායම කෙරෙහි දැඩි බලපෑමක් එල්ල කල අතර එමගින් වසරේ ශුද්ධ අලාභයෙන් 52.3% ක් නියෝජනය කෙරෙන්නා වූ රුපියල් මිලියන 23,076 ක සමස්ත විනිමය අලාභයක් (මෙහෙයුම් හා මූල්‍ය පිරිවැය) සිදුවිය.

### සමූහයේ ඉපැයුම්

පාස්කු ඉරු දින ප්‍රහාරයේ සහ දැනට පවතින කෝවිඩ් 19 වසංගතයෙහි ප්‍රතිඵල වශයෙන් උද්ගත වුනු අනපේක්ෂිත බාධාවන් හමුවේ වුවද, සමූහය මගින් ආදායම වර්ධනය කරගැනීමේ විවිධ ව්‍යාපෘතීන් ඔස්සේ ශ්‍රී ලංකා රුපියල් වලින් සුළු අඩුවීමක් සහිතව හෝ පෙර මූල්‍ය වර්ෂයෙහි ආදායම් තත්ත්වයන්ට සමාන වෙමින් රුපියල් මිලියන 183,532 ක ආදායමක් වාර්තා කරන ලදී. (සාපේක්ෂව 2018/19 රුපියල් මිලියන 184,097).

# කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය සබැඳේ.

### ආදායම් ප්‍රවණතාව




### සංයුතිය




### ප්‍රවාහනය කරන ලද මගී සංඛ්‍යාව




| භූගෝලීය ආදායම රුපියල් මිලියන වලින් | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| වසර | ශ්‍රී ලංකාව | ආසියාව (ශ්‍රී ලංකාව හැර) | යුරෝපය සහ අප්‍රිකාව | මැද පෙරදිග | උතුරු හා දකුණු ඇමරිකාව | නිරිතදිග පැසිෆික් | එකතුව |
| 2020 | 48,478 | 63,318 | 18,715 | 36,857 | 4,491 | 11,673 | 183,532 |
| 2019 | 48,412 | 67,267 | 21,112 | 32,909 | 4,642 | 9,755 | 184,097 |
| % වෙනස | (0.1) | (5.9) | (11.4) | 12.0 | (3.3) | 19.7 | (0.3) |

2019/20 වර්ෂයේ අනපේක්ෂිත සිදුවීම් හේතුවෙන් ආදායම් අහිමිවීම පහත දැක්වෙන ආකාරයෙන් ඇස්තමේන්තු ගත කොට ඇත.

| | රු. මිලියන |
|---|---|
| පාස්කු ප්‍රහාරය හේතුවෙන් | 9,147 |
| COVID-19 හේතුවෙන් | 9,765 |

### සමාගමෙහි ඉපැයුම්

සමාන ආකාරයෙන්ම විමර්ශනයට ලක් වන වසර සඳහා, සමාගමෙහි ඉපැයුම් ද  රුපියල් මිලියන 180,151 ක් වශයෙන් නම්‍යශීලී ස්වභාවයක පැවතිණි. මෙම තත්ත්වය අත් පත් කරගනු ලැබුවේ, ඉල්ලුම පහළ යාම හේතුවෙන් මගී හා භාණ්ඩ ප්‍රවාහන කටයුතු පහත වැටී ගුවන් ගමන් කෙරෙහි එල්ල වූ අනපේක්ෂිත බාධාවන් රැසක් මධ්‍යයේය.

### ආදායම් ප්‍රවණතාව රුපියල් මිලියන වලින්




### ආදායම් මගී කිලෝමීටරයකට ආදායම රුපියල්




### රැගෙන යන ලද භාණ්ඩ ප්‍රමාණය




### ලාභ අලාභ ප්‍රකාශය ඇ.ඩො. වලින්

අපගේ වියදම් වලින් 75% ක් ඇමරිකානු ඩොලර් මගින් සිදුකෙරෙන බැවින් ද අපගේ ආදායම් වලින් 84% ක් ශ්‍රී ලංකා රුපියල් හැර වෙනත් මුදල් ඒකකයන් ඇසුරින් උපයනු ලබන බැවින් ද සමාගමෙහි කළමනාකරණ ගිණුම් ඇමරිකානු ඩොලර් වලින් සිදුකෙරේ. තොරතුරු දැනගැනීමේ අරමුණු වෙනුවෙන් පමණක් ලාභ අලාභ ප්‍රකාශයෙහි සංක්ෂිප්ත පිටපතක් (විගණනය නොකල) ඇමරිකානු ඩොලර් වලින් පහත දැක්වේ (ඇමරිකානු ඩොලර් ලාභය හෝ අලාභය විනිමය අනුපාත වල බලපෑමට ලක් නොවේ).

| මාර්තු 31 දිනට | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|
| | 2020 ඇ.ඩො. මිලියන | 2019 ඇ.ඩො. මිලියන | 2020 ඇ.ඩො. මිලියන | 2019 ඇ.ඩො. මිලියන |
| **ආදායම** | 1,029.0 | 1,112.6 | 1,010.2 | 1,090.2 |
| **වියදම** | | | | |
| ගුවන්යානා ඉන්ධන පිරිවැය | (309.1) | (361.8) | (309.1) | (361.8) |
| සේවක පිරිවැය | (128.0) | (130.8) | (118.5) | (121.5) |
| වෙනත් මෙහෙයුම් වියදම් | (476.1) | (544.8) | (495.1) | (562.0) |
| SLFRS 16 වෙත ගැළපුමට පෙර මෙහෙයුම් ලාභය | 115.8 | 75.3 | 87.4 | 45.0 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වෙත SLFRS 16 ආදේශ කරගැනීමේ බලපෑම | (109.2) | (184.4) | (108.9) | (183.5) |
| මෙහෙයුම් ලාභය/අලාභය | 6.6 | (109.2) | (21.4) | (138.5) |
| වෙනත් ආදායම් සහ ලැබීම් | 7.6 | 5.7 | 17.0 | 25.2 |
| මූල්‍ය ආදායම | 2.1 | 0.8 | 1.8 | 0.5 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වෙත SLFRS 16 ආදේශ කරගැනීමේ බලපෑම | (59.7) | (0.6) | (59.0) | (0.6) |
| මූල්‍ය පිරිවැය (වෙනත්) | (68.0) | (65.4) | (67.3) | (64.6) |
| බදු වලට පෙර අලාභය | (111.5) | (168.8) | (128.9) | (178.0) |
| ආදායම් බදු වියදම | (0.2) | (0.4) | - | - |
| වසර සඳහා අලාභය | (111.7) | (169.2) | (128.9) | (178.0) |
| පොලිය, බදු, ක්ෂයවීම්, ක්‍රමක්ෂය සහ කුළී පිරිවැයට පෙර ඉපැයුම් (EBITDAR) | 135.5 | 89.8 | 113.6 | 79.0 |
| පොලිය, බදු, ක්ෂයවීම්, ක්‍රමක්ෂය සහ කුළී පිරිවැයට පෙර ඉපැයුම් (රඳවාගැනීමේ බදු හැර) | 180.6 | 131.3 | 158.7 | 120.6 |

ඉහත ඇ.ඩො. වලින් ප්‍රකාශිත ආදායම් ප්‍රකාශය කොටස් හිමියන්ගේ තොරතුරු දැනගැනීම පිණිස ඉදිරිපත්කොට ඇත. එය ශ්‍රී ලංකා රුපියල් වලින් පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශයන්හි සෘජු පරිවර්තනයක් නොවන අතර විනිමය අලාභ ඇතුළත් කොට නැත.

2019/20 මූල්‍ය වර්ෂය තුළදී සමූහයේ ආදායම ඇමරිකානු ඩොලර් වශයෙන් ඇ.ඩො. මිලියන 1,029.0 දක්වා 7.5% ක පහත වැටීමක් පෙන්නුම් කළේය. කෙසේවුවද, පිරිවැය අවම කිරීම හා ආදායම් වර්ධන පියවර ඇතුළුව පහළ ගිය ජෙට් ඉන්ධන මිළ සහ කළමනාකාරීත්වයේ ව්‍යාපෘතීන් හේතුවෙන්, සමූහය මෙහෙයුම් ප්‍රතිඵල වල 106.0% ක වර්ධනයක් වාර්තා කළ අතර, එහිදී පෙර වසරේ ලද ඇ.ඩො. මිලියන 109.2 ක මෙහෙයුම් අලාභය මෙම වසරේදී ඇ.ඩො. මිලියන 6.6 ක මෙහෙයුම් ලාභයක් බවට පරිවර්තනය කිරීමට හැකි විය.

තවද සමූහයේ පොලිය, බදු, ක්ෂයවීම්, ක්‍රමක්ෂය සහ කුළී පිරිවැයට පෙර ඉපැයුම් (EBITDAR) පෙර වසරට සාපේක්ෂව ඇ.ඩො. මිලියන 135.5 දක්වා 50.9% ක වර්ධනයක් වාර්තා කළේය. ඒ අනුව එහි ප්‍රතිඵලයක් වශයෙන් රඳවාගැනීම් බදු හැර සමූහයේ පොලිය, බදු, ක්ෂයවීම්, ක්‍රමක්ෂය සහ කුළී පිරිවැයට පෙර ඉපැයුම් (EBITDAR) ඇ.ඩො. මිලියන 180.6 දක්වා 37.6% ක වර්ධනයක් වර්තා කළේය.

### වියදම

2019/20 මූල්‍ය වර්ෂයේදී සමූහයේ මුළු වියදම රුපියල් මිලියන 229,366 ක් වශයෙන් දැක්වුනු අතර එය 2018/19 සමූහයේ මුළු වියදමට වඩා 1.1% ක සුළු ඉහළයාමකි. කෙසේවුවද නව්‍ය වූ තිරසාර පිරිවැය ඉතුරුම් ව්‍යාපෘතීන් සහ ජෙට් ඉන්ධන මිල පහළ යාම හේතුවෙන් විමර්ශනයට ලක් වන වසර තුළදී සමූහයට සිය මෙහෙයුම් වියදම (රඳවාගැනීමේ බදු වියදම සහ SLFRS-16 හි මෙහෙයුම් ක්‍රියාකාරකම් වල බැලපෑම හැර) රුපියල් මිලියන 161,094 දක්වා 4.9% කින් පහත හෙළීමට හැකි විය. (2018/19 රුපියල් මිලියන 169,420).

# කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය සබැඳේ.

සමූහයේ මුළු වියදම් වල සංයුතිය පහත දැක්වේ:

| වියදම ශ්‍රී ලංකා රුපියල් වලින් | 2020 | | 2019 | | වෙනස-හිතකර (අහිතකර) | |
|---|---|---|---|---|---|---|
| | වටිනාකම | % මුළු වියදමෙහි | වටිනාකම | % මුළු වියදමෙහි | වටිනාකම | % |
| ගුවන්යානා ඉන්ධන පිරිවැය | 55,328 | 24.2 | 60,673 | 26.7 | 5,345 | 8.8 |
| සේවක පිරිවැය | 22,903 | 10.0 | 21,928 | 9.7 | (975) | (4.4) |
| ගුවන් තොටුපළ අතරමැදි සහ මගී වියදම් | 25,277 | 11.0 | 25,813 | 11.4 | 536 | 2.1 |
| ගුවන්යානා නඩත්තු හා අළුත්වැඩියා පිරිවැය | 22,820 | 9.9 | 26,333 | 11.6 | 3,513 | 13.3 |
| ක්ෂය/ක්‍රමක්ෂය | 1,545 | 0.7 | 1,568 | 0.7 | 23 | 1.5 |
| විකිණුම්, අලෙවි හා ප්‍රචාරණ වියදම් | 14,550 | 6.3 | 15,786 | 7.0 | 1,236 | 7.8 |
| ගුවන් සේවක වියදම් | 6,557 | 2.9 | 6,582 | 2.9 | 24 | 0.4 |
| විනිමය අලාභය (මෙහෙයුම්) | 5,270 | 2.3 | 2,328 | 1.0 | (2,942) | (126.4) |
| වෙනත් මෙහෙයුම් වියදම් (SLFRS 16 බලපෑම හා රඳවාගැනීමේ බදු වියදම් හැර) | 6,844 | 3.0 | 8,409 | 3.7 | 1,565 | 18.6 |
| **මෙහෙයුම් වියදම්** | 161,094 | 70.2 | 169,420 | 74.7 | 8,326 | 4.9 |
| SLFRS 16 හි බලපෑම - මෙහෙයුම් ක්‍රියාකාරකම් | 19,543 | 8.5 | 30,931 | 13.6 | 11,388 | 36.8 |
| SLFRS 16 හි බලපෑම - මූල්‍ය ක්‍රියාකාරකම් | 23,643 | 10.3 | 165 | 0.1 | (23,478) | (14,229.1) |
| රඳවාගැනීමේ බදු වියදම | 8,062 | 3.5 | 6,972 | 3.1 | (1,090) | (15.6) |
| මූල්‍ය පිරිවැය (වෙනත්) | 17,024 | 7.4 | 19,318 | 8.5 | 2,294 | 11.9 |
| **මුළු වියදම්** | 229,366 | 100.0 | 226,805 | 100.0 | (2,561) | (1.1) |

ත්‍රස්තවාදී ප්‍රහාර සහ ලෝක කෝවිඩ් 19 වසංගතය නිසා පහත වැටුනු ගුවන් ගමන් සංඛ්‍යාවෙහි ප්‍රතිඵලයක් වශයෙන්, පහත වැටුනු ඉන්ධන පරිභෝජනය සහ මිළ ගණන් වල පහළ යාම හේතුවෙන් පසුගිය මූල්‍ය වර්ෂය පුරා ගුවන්යානා ඉන්ධන පිරිවැය 8.8% කින් පහත වැටුනි. 2019 වාර්තා වූ ඇ.ඩො. ශත 227 ට සාපේක්ෂව 2020 දී ඉන්ධන මිල ඇ.ඩො. ශත 203 දක්වා පහත වැටීමේ ප්‍රතිඵලයක් වශයෙන් රුපියල් මිලියන 6,415 ක පිරිවැය ඉතිරියක් සිදුවිය. තවද, ඉන්ධන පරිමාව අඩුවීමෙන් අත්පත් කරගත් පිරිවැය ඉතිරිය රුපියල් මිලයන 3,072 ක් විය. කෙසේවුවද, ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණ වීමේ අහිතකර බලපෑමෙහි ප්‍රතිඵලයක් වශයෙන් සමාගමෙහි ඉන්ධන පිරිවැය රුපියල් මිලියන 4,142 කින් ඉහළ ගියේය.

**ඉන්ධන මිළට එදිරිව පිරිවැය**




ඇමරිකානු ඩොලර් හුවමාරු අනුපාතය සහ ඉන්ධන පරිභෝජනය නියතව පවතින විට, එක්සත් ජනපද ගැලුමකට එක්සත් ජනපද ශත එකක වෙනස සමූහයේ ඉන්ධන පිරිවැය සම්බන්ධයෙන් රුපියල් මිලියන 298 ක බලපෑමක් ඇති කරයි.

ගුවන්යානා නඩත්තු හා අළුත්වැඩියා පිරිවැය 2019 දී වාර්තා වූ රුපියල් මිලියන 26,333 ට සාපේක්ෂව 2020 දී රුපියල් මිලියන 22,820 දක්ව පහත වැටුනි. මෙය මූලිකවම A330-200 ගුවන්යානාවක් කල්තබා ආපසු ලබාදීම හා එන්ජින් හුවමාරුවක් ඇතුළු පිරිවැය පහත හෙළීමේ ව්‍යාපෘතීන් ඔස්සේ අත්පත් කරගැනිනි.

විකිණුම්, අලෙවි හා ප්‍රචාරණ වියදම් වල 7.8% ක අඩුවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් අධි කොමිස් පහත වැටීම, විශේෂ ව්‍යාපෘතීන් හා අනපේක්ෂිත සිදුවීම් මධ්‍යයේ විකිණුම් පහළයාම හේතුවෙන් ලොවපුරා බෙදාහැරීම් පද්ධති පිරිවැය අඩුවීම හේතු විය.

ගුවන් කාර්ය මණ්ඩල වියදම් නියතව පැවති අතර, සාමූහික කේවල්කරණ ගිවිසුම් මත පදනම්ව සංශෝධන ගෙවීම හේතුවෙන් සේවක පිරිවැය 4.4% කින් ඉහළ ගියේය.

මෙහෙයුම් විනිමය අලාභයෙහි සැළකිය යුතු ඉහළයාම කෙරෙහි හේතු වූයේ ඇමරිකානු ඩොලර් වලින් නම් කෙරන වෙළඳ වගකීම් ඉහළයාම හමුවේ, ප්‍රධාන වශයෙන් ගුවන්සේවාවෙහි ප්‍රමුඛ ඉන්ධන සැපයුම්කරු වන ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාව වෙත සිදුකරන ලද ගෙවීම්ය.

SLFRS 16 ආදේශ කොට ගැනීමත් සමග කල්බදු සඳහා ගිණුම් තැබෙන ක්‍රමවේදය සැළකිය යුතු වෙනසකට ලක් වූ අතර, එහිදී කල්බදු කුලී වියදම්, භාවිත වත්කම් (ROU) ක්ෂයවීම් සහ ඒවායේ වගකීම් වල මූල්‍ය පිරිවැය මගින් ප්‍රතිස්ථාපනය කෙරිණි. ප්‍රධාන වශයෙන් ප්‍රධාන වශයෙන් ඇමරිකානු ඩොලර් වලින් නම් කෙරුනු රුපියල් මිලියන 176,327 ක කල්බදු වගකීමක් පරිවර්තනය තුළින් හේතුවෙන්, මෙහෙයුම් සහ මූල්‍යකරණ ක්‍රියාකාරකම් ද්විත්වයම මත මෙම වෙනසෙහි ශුද්ධ බලපෑම රුපියල් මිලියන 12,090 ක් බවට පත් විය.

2018/19 පැවති 13.1% ට සාපේක්ෂව 2019/20 දී 7.8% ක් දක්වා ඩොලරයට සාපේක්ෂව රුපියල අවප්‍රමාණය වීම හේතුවෙන් මූල්‍ය වියදම් (වෙනත්) වල 11.9% ක පහත වැටීමක් සිදුවිය.

### මුදල් ස්ථාවරය

ප්‍රධාන වශයෙන් SLFRS 16 ආදේශ කරගැනීමේ ප්‍රතිඵලයක් ලෙස, පෙර වසරේ සෘණාත්මක රුපියල් මිලියන 12,699 ක් වශයෙන් වර්තා වූ සමූහයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ, ධනාත්මක රුපියල් මිලියන 23,724 ක් දක්වා වර්ධනය විය.

### මූල්‍යමය ස්ථාවරය

නව කල්බදු ගිණුම්කරණ ප්‍රමිතිය SLFRS 16 ආදේශ කරගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන්, විමර්ශනයට ලක් වන වසර තුළ සමූහයේ සමස්ත වත්කම් රුපියල් මිලියන 186,428 ක් දක්වා 126.7% කින් වර්ධනය විය. මෙයට හේතු වූයේ වාර්තාකරණ දින වන විට 2019 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි ඇතුළත් නොකල, මේ වන විට භාවිත හිමිකම් වත්කම් වශයෙන් ඇතුළත් කෙරෙමින් පවතින රුපියල් මිලියන 176,327 ක අනුරූප වගකීමක් සමගින් ගුවන්යානා සහ වෙනත් වත්කම් (ඉඩම්,ගොඩනැගිලි සහ රථවාහන) රුපියල් මිලියන 119,084 ක් වශයෙන් පැවතීමයි.

**වත්කම්**




හැකි සෑමවිටම ප්‍රාග්ධන වියදම් බරපතල මෙහෙයුම් අවශ්‍යතාවන් වෙත සීමා කරමින් වසර තුළදී ඒවා විලම්බනය කරමින් සිය ප්‍රාග්ධන වියදම් රුපියල් මිලියන 759 ක් දක්වා 30.5% කින් කැපී පෙනෙන අයුරින් පහත දැමීමට සමූහය සමත් විය.

**ප්‍රාග්ධන වියදම් රුපියල් මිලියන වලින්**




## මෙහෙයුම් විමර්ශනය

### වාණිජ මෙහෙයුම්

#### *ගමන් මාර්ග ජාලය සහ ගුවන්යානා සමූහය*

2019/20 මූල්‍ය වර්ෂය තුළදී, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ජාලය ඉන්දියානු උප මහාද්වීපයේ ප්‍රබල නියෝජනයක් සමගින් රටවල් 20 ක ගමනාන්ත 37 ක් වෙත සේවා සැලසීය. කෝඩ්ෂෙයාර් සහකරුවන් සමග සහයෝගීතාවයෙන් යුතුව, ගුවන්සේවාව මගින් සිය මගීන් වෙත උතුරු ඇමරිකාව, යුරෝපය, මධ්‍යම ආසියාව, අප්‍රිකාව, කැනඩාව හා ඕස්ට්‍රේලියාව ආවරනය කරමින් රටවල් 51 ක ගමනාන්ත 116 ක් වෙත පුළුල් සේවාවක් ලබාදෙන ලදී.

වසර තුළදී, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් මගින් දැනට පවතින කෝඩ්ෂෙයාර් සහකරුවන් වන කටාර් එයාර්වේස් හා ජෙට්ස්ටාර් ඒෂිය එයාර්වේස් සමග වන ස්වකීය සහායෝගීතාවයන් ව්‍යාප්ත කරමින්, යුරෝපයේ හා එක්සත් ජනපදයේ සේවා ස්ථාන 8 ක් වෙත ගමනාගමන සේවාවන් වැඩිදියුණු කරමින් එක්සත් ජනපදය, යුරෝපය සහ ආසියාව තුළ නව සේවා ස්ථාන 7ක් එක් කරන ලදී. එයට අමතරව, මැදපෙරදිග, යුරෝපය සහ අප්‍රිකාවේ සමස්ත සේවා ස්ථාන 3ක වෙත වැඩිදියුණු කල ගමනාගමන සේවාවන් ලබාදෙමින් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් මගින් ගල්ෆ් එයාර් සමග කෝඩ්ෂෙයාර් සහයෝගීතාවයක් අරඹන ලදී. ඒ අනුව, විමර්ශනයට ලක් වන වසර තුළ, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් මගින් සිය කෝඩ්ෂෙයාර් සහකරුවන් සමග එක්ව රටවල් 31 ක ගමනාන්ත 77 ක් වෙත සිය මගීන් වෙත ගමනාගමන සේවාවන් සපයන ලදී.

#### *ජාලගත ප්‍රශස්තීකරණය සහ ආදායම*

පාස්කු ප්‍රහාරයෙන් පසු චීනය, එක්සත් රාජධානිය, ජපානය, ඉන්දියාව සහ ඕස්ට්‍රේලියාව වැනි ප්‍රමුඛ වෙළඳපළ රැසකින් මගී වෙන්කිරීම් පහළයාම් සහ අවලංගු කිරීම් අත්විඳීමට ගුවන්සේවාවට සිදු විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඉන් අනතුරුව එළැඹුනු මාස හතරක් පුරා ගුවන් ගමන් අවලංගු කිරීම් හා අවශ්‍රේණිගත කිරීම් රැසක් සිදුකිරීමට ගුවන් සේවාව මගින් කටයුතු කෙරිණි.

යථා තත්ත්වයට පත්වීමේ පියවරක් වශයෙන්, අතිරේක ධාරිතාව අනාගත අවස්ථා සහිත ''6th Freedom" වෙළඳපොල වෙත යොදවමින්

# කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය සබැඳේ.

කොළඹ හරහා අතරමැදි හුවමාරු ගමන්වාර ඉහළ නැංවීමට කටයුතු යෙදිණි. මෙම ක්‍රමෝපාය සාර්ථක බවට තහවුරු වූයේ විශේෂයෙන්ම ඉන්දියාවේ සහ මැදපෙරදිග මෙමගින් මුල් අනාවැකි වලට වඩා සමස්ත ආදායමක් අත්කර ගත් බැවිනි. මුදල් ඒකක උච්ඡාවචනයන්හි අහිතකර බලපෑම හේතුවෙන්, මගී ආදායම 2019 වසර හා සැසඳීමේදී අපේක්ෂිත මට්ටමට වඩා ඩොලර් මිලියන 4 කින් පමණද 2019 සමග සැසඳීමේදී ඩොලර් මිලියන 24.4 කට අධික ප්‍රමාණයකින්ද අවප්‍රමාණ විය.

පාස්කු ප්‍රහාරයේ දිගුකාලීන බලපෑම හේතුවෙන්, වසර 2019/20 සඳහා පුරෝකථන කරන ලද ආදායම විමර්ශනයට ලක් වන වසර තුළදී අත්පත් කරගත නොහැකි විය. ගුවන් සේවාව මගින් ඇ.ඩො. මිලියන 807.7 ක (රුපියල් බිලියන 147.7) මුළු මගී ආදායමක්ද, ඇ.ඩො. මිලියන 88.6 ක (රුපියල් බිලියන 15.7) භාණ්ඩ ආදායමක්ද වාර්තා කරන ලද අතර, 2018/19 ට සාපේක්ෂව ඇමරිකානු ඩොලර් වලින් 7.4% ක පහළයාමක් සමගින් සමස්ත ගුවන් ප්‍රවාහන ආදායම ඇ.ඩො. මිලියන 919.8 ක් (රුපියල් බිලියන 164.7) ක් වශයෙන් දැක්වුනි.

### *"වන්වර්ල්ඩ්" (Oneworld)*

2014 මැයි මස 1 වැනි දින වන්වර්ල්ඩ් එකමුතුව සමග එක් වුනු ශ්‍රීලංකන් එයාර්ලයින්ස් 2019 දී 5 වන සංවත්සරය සැමරීය. මෙම එකමුතුවෙහි සාමාජිකයකු වශයෙන් ගුවන් සේවාව මගින් ලොව පුරා විසිරුනු වන්වර්ල්ඩ් ගමනාන්තයන් 1,100 වෙත පියාසර කිරීමේ අවස්ථාව මගීන් වෙත පිරිනමනු ලැබේ. මේ ඔස්සේ ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ලෝක ගුවන් සේවා ක්ෂේත්‍රයෙහි කීර්තිමත් සන්නාමයන් වන ඇමරිකන් එයාර්ලයින්ස්, බ්‍රිටිෂ් එයාර්වේස්, කැතේ පැසිෆික්, ෆින්නෙයාර්, අයිබීරියා එයාර්ලයින්ස්, ජපෑන් එයාර්ලයින්ස්, LATAM, මැලේෂියා එයාර්ලයින්ස්, ක්වන්ටාස්, කටාර් එයාර්වේස්, රෝයල් ජෝර්දානියන් සහ S7 එයාර්ලයින්ස් ආදිය සමග සිය සාමාජිකත්වය බෙදාහදා ගනී.

මෙම එකමුතුවෙහි සාමාජිකයකු වශයෙන් ශ්‍රීලංකන් එයාර්ලයින්ස්, සිය සේවා ජාලය වර්ධනය කරගනිමින් ද වෙළඳනාම වටිනාකම ඉහළ නංවං ගනිමින්ද සිය හිතෛෂීත්ව වැඩසටහන දැනුම හුවමාරු කරගැනීමේ ක්‍රියාවලියෙහි කොටසක් බවට පත් කර ගැනීමට සමත් විය. ''වන්වර්ල්ඩ්'' වෙත එහි පිවිසුමක් සමග ශ්‍රීලංකන් එයාර්ලයින්ස් වන්වර්ල්ඩ් සාමාජික ගුවන් සේවා හතරක් ඇතුළුව, ගුවන්සේවා හයක් සමග කෝඩ්ෂෙයාර් සහයෝගීතාවයන්ට එළැඹුනි.

වන්වර්ල්ඩ් ''frequent flyer'' සාමාජිකයින් හට ව්‍යාපාරික පංති ඇතුල්වීම, පොරොත්තු ලේඛණයේ ප්‍රමුඛත්වය, අමතර ගමන් මළු දීමනාව සහ ලොව පුරා විවේකාගාර 550 කට අධික සංඛ්‍යාවක් වෙත පිවිසීමේ අවස්ථාවද හිමිවේ. මෙම එකමුතුව මගින් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් මගීන් වෙත පිරිනමනු ලබන කැපී පෙනෙන ප්‍රතිලාභයක් වනුයේ එහි සියළුම සාමාජික ගුවන්සේවා සමගින් ''frequent flyer'' සැතපුම් උපයා ගැනීමේ හා වැය කිරීමේ අවස්ථාව සැළසීමයි.

### ලොව පුරා විකිණුම් සහ බෙදාහැරීම්

මූලය වර්ෂය ලොවපුරා විකිණුම් කණ්ඩයමට හා සමස්ත ගුවන් සේවයටම අභියෝගාත්මක වූවකි. අනපේක්ෂිත මෙහෙයුම් බාධාවන් මධ්‍යයේ වුවද, ගුවන් සේවය විසින් වර්ෂය තුළ දී මිලියන 5.26 ක මගීන් ප්‍රවාහනය කරමින්, 80.6% ක සමස්ත මගී පැටවුම් සාධකයක් පවත්වා ගන්නා ලදී. ව්‍යාපාරික පන්තියේ විකුණුම් කෙරෙහි ඇති දැඩි විකුණුම් අවධාරණය හේතුවෙන්, වසර පුරා ව්‍යාපාර පන්තියේ යානා මගී පැටවුම් සාධකය 55.3% ක සාමාන්‍යයකට ළඟාවිය. සමස්ත විකුණුම් ආදායමට 21.5% ක සහ 24.7% ක දායකත්වයක් ලබා දෙමින් පිළිවෙලින් ඈත පෙරදිග කලාපය සහ මැදපෙරදිග කලාපය වඩාත් ලාභදායී කලාපය ලෙස අඛණ්ඩව පැවතුණි.තවද ඉන්දියාව ජාල ව්‍යාප්ත ආදායමෙන් 17.2% ක් සඳහා දායකත්වය සපයමින් ප්‍රධාන වෙළඳපොළක් ලෙස දිගටම පැවතුණි.

කෙසේවුවද, වර්ෂය තුළ, ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම හේතුවෙන්, මගී විකිණුම් ආදායම කෙරෙහි ඇති වූ බලපෑම කැපී පෙනුනි. 2019 ජූලි 15 දින සිට බලපැවැත්වෙන පරිදි, ශ්‍රී ලංකාවේ මගී ප්‍රවේශපත් ගාස්තු දැන් ඇමරිකානු ඩොලරවලින් මිල කෙරෙන අතර, අනාගතයේ දී මුදල් අවප්‍රමාණය වීමෙන් ඇති වන බලපෑම වැළැක්වීමට එය දායක වනු ඇත.

විකුණුම් උපාය මාර්ගයට අනුකූලව, සාමාන්‍ය විකුණුම් නියෝජිතයින්ගේ (GSA) ජාලය සඳහා වන ලෝක ව්‍යාප්ත විකුණුම් වලට අදාළ අධි කොමිස් ව්‍යුහය (overriding commission) යන කොමිස් ව්‍යුහය නවීකරණය කිරීමෙන් සැලකිය යුතු වෙනසක් සිදු කරන ලදී. නිසි පහසුකම් සමගින් ඉහළ කාර්ය සාධනයක් සහිත මගීන් දිරිමත් කිරීම සඳහා ඒ හි ක්‍රියාකාරීත්වයන් මත නිර්මාණය කරන ලද, කාර්යසාධනය මත පදනම් වූ දිරිගැන්වීමේ යෝජනා ක්‍රමයක් පිළිබඳව ශ්‍රී ලංකා ගුවන් සේවය අවධානය යොමු කරමින් සිටී. මීට අමතරව, සෘජු නාලිකා ප්‍රශස්තිකරණය සහ නවීකරණය කරන ලද සහායක දීමනා අඛණ්ඩව වර්ධනය වෙමින් සමස්ත මගී අත්දැකීම වැඩිදියුණු කර ඇත.

බාහිර මෙහෙයුම් වටපිටාව ජාත්‍යන්තර වශයෙන්, ක්ෂේත්‍රය හා ව්‍යාපාරය වෙත දිගින් දිගටම බලපෑම් ඇති කල පසුබිමක් තුළ අඩු වියදම් ගුවන් සේවාවන්හි ශීඝ්‍ර වර්ධනය, විවිධ වූ අනුශාංගික සේවාවන් හා විචක්ෂණශීලී ගුවන්යානා විශේෂාංග හේතුවෙන් ගුවන් සේවාව සඳහා වන වෙළඳපොල තුළ තරඟකාරීත්වය තවදුරටත් වර්ධනය විය.

### විද්‍යුත් වාණිජ්‍යය

කර්මාන්තයේ ප්‍රමුඛ පෙළේ ගුවන් සමාගම් සමඟ සමගාමීව සිය නිල මාර්ගගත විකුණුම් ක්‍රියාවලිය ඉදිරියට ගෙන ඒමේ ප්‍රයත්නයේ දී, ශ්‍රී ලාංකන් ගුවන් සේවය පරිශීලක අතුරුමුහුණත සහ අත්දැකීම් වැඩිදියුණු කරමින් srilankan.com වෙබ් අඩවිය වැඩිදියුණු කරමින් අඛණ්ඩව සිය ගනුදෙනුකාර භවතුන් වෙත වර්ධනය වෙමින් පවතින සංචාරක අවශ්‍යතා සපුරාලීම සඳහා නව්‍ය විසඳුම් ලබා දීම සිදු කරයි.

අපගේ බැංකු හවුල්කරුවන් සමඟ නව හවුල්කාරීත්වයක් ඇති කර ගැනීම සඳහා කටයුතු කරමින් srilankan.com මැලේසියාවේ මේ බැංකුව, තායිලන්තයේ කෘං තායි බැංකුව සහ ශ්‍රී ලංකාවේ සෙලාන් බැංකුව ඇතුළු බැංකු ගණනාවක් සමඟ සහයෝගීව විකුණුම් ප්‍රවර්ධන මාලාවක් පවත්වන ලදී. එපමණක් නොව, ශ්‍රී ලංකාවේ NTB බැංකුව සමඟ srilankan.com හවුල් වී සිය ඇමරිකානු එක්ස්ප්‍රස් කාඩ්පත් හිමියන්ට ආකර්ෂණීය ගාස්තු ලබා දීමට හා srilankan.com ඔස්සේ සුවිශේෂී වට්ටම් ලබා දීමට කටයුතු තිබේ.

අන්තර්ජාලය හරහා වෙන්කරවා ගැනීමේ පහසුව තව දුරටත් වැඩි කරමින් srilankan.com විසින් "සිතීමට කාලය" යන සුවිශේෂී අංගය ද ක්‍රියාවට නංවා ඇති අතර එමඟින් srilankan.com හි නාමික ගාස්තුවක් ගෙවා ගනුදෙනුකරුවන්ට කිසියම් ගාස්තුවක් වෙන් කර තබාගත හැකිය. මීට අමතරව,

එළඹෙන නියෝජිතායතන වෙත හඳුන්වා දී ඇති වෙන්කිරීමේ ද්වාරය ඔස්සේ, සංචාරක නියෝජිතායතනවලට srilankan.com සමඟ හවුල් වී අන්තර්ජාලය හරහා විකුණුම් වැඩි කර ගැනීමට හැකියාව ලබා දෙන අතර පිරිවැය සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු කර දෙනු ලැබේ.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ, අන්තර්ජාල ඔස්සේ කටයුතු ඉටු කර ගැනීම සඳහා ගුවන් මගීන්ගේ ප්‍රවේශය පසුගිය වසරේ 14% මට්ටමේ සිට 15.5% දක්වා ඉහළ ගොස් ඇති අතර එහි ආදායම ඇමරිකානු ඩොලර් මිලියන 118 දක්වා ගෙන එනු ලැබීය. වෙබ් පුනර්ජීවනය කිරීමේ ව්‍යාපෘතිය සමඟ වෙබ් අඩවියට වැඩි දියුණු කළ පෙනුමක් සහ කාර්ය සාධන අලෙවිකරණ අංගයක් එක් කිරීම මඟින් මගීන්ට එකවර ගතික ගුවන් ටිකට්පත් මිල ගණන් ලබා ගැනීමේ පහසුව සලසා දෙන අතර, පාරිභෝගික අත්දැකීම් ශක්තිමත් කිරීමේ අරමුණු ඇති ව ශ්‍රීලංකන් එහි මාර්ගගත නාලිකාව ඔස්සේ ලොව ම ඇඟිලි තුඩට සමීප කරවීමට කටයුතු කරයි.

**සහායක සේවා**

සමාලෝචිත වර්ෂය තුළ සහායක සේවා ආදායම අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කළ අතර, අභියෝගාත්මක මෙහෙයුම් පරිසරය මධ්‍යයේ, පෙර වසරට සාපේක්ෂව වසරක ආදායම් වර්ධනය 41% ක් ලෙස පෙන්නුම් කළේය. අගය එකතු කළ සේවාවන් කෙරෙහි පාරිභෝගික විශ්වාසය තහවුරු කරමින් වාර්ෂික ධාරිතා වර්ධනය පහසුවෙන් ඉක්මවා යෑමට සමත් විය. ගෝලීය ගුවන් සේවා කර්මාන්තය තුළ, බොහෝ ගුවන් සමාගම් තම ආදායම් උත්පාදනයේ ප්‍රධාන අංගයක් ලෙස සහායක ආදායම හඳුනාගෙන ඇති අතර සමාලෝචනය කරන ලද වර්ෂය තුළ එය සමස්ත මගී ආදායමෙන් 10% ඉක්මවා ඇත. මෙම කාල සීමාව තුළ ගුවන් සමාග මේ ගාමක මූලධර්මය වූයේ පාරිභෝගික අවශ්‍යතා අඛණ්ඩව හඳුනා ගැනීම සහ අගය එකතු කිරීමක් ලෙස එවැනි සහායක සේවාවන් සැපයීමයි.

දැනට පවතින ආසන යාවත්කාලීන කර ගැනීම, පෙරගෙවුම් ගමන් මලු, අමතර නිදන කාමර ආසන, අත්තිකාරම් ආසන වෙන් කිරීම, විශේෂ ආහාර ඇණවුම් සහ මෝටර් රථ කුලී සේවා වලට අමතරව, ව්‍යාපාරික පන්තියේ ආසන සඳහා සජීවී ලංසු තැබීමේ පහසුකම සහ ගතික දීමනා, ගුවන්තොටුපලේ ව්‍යාපාරික පන්තියේ ආසනයකට උසස් කිරීම සඳහා මිල නියම කිරීම වැනි නව සේවාවන් ද ගුවන් සමාගම විසින් හඳුන්වා දෙන ලදී.තවද, ඉදිරි මූල්‍ය වර්ෂය තුළ මගීන්ගේ පහසුව සඳහා නව විශේෂාංග කිහිපයක් හඳුන්වා දීමට ගුවන් සමාගම සැලසුම් කරයි.

සහායක ආදායම් වෙතින් ලැබෙන ඉහළ ආදායම් පිළිබඳ සැලකිල්ලට ගනිමින්, අන්තර්ජාල වෙන්කිරීමේ පහසුකම්, ජංගම යෙදවුම්, ඇමතුම් මධ්‍යස්ථාන, ටිකට් කාර්යාල සහ සංචාරක නියෝජිතයන් වැනි නාලිකා හරහා ආධාරක සේවා මිලදී ගැනීමට පහසුකම් සැලසීම තුළින් ජාලය පුරා සහායක සේවා ප්‍රවර්ධනය කිරීමට ශ්‍රීලංකන් ගුවන් සමාගම පියවර ගෙන තිබේ.

වැඩිදුර සැලසුම් අතරට ගුවන්යානය තුළ දී මිලදී ගැනීම සඳහා ආකර්ෂණීය හා නව්‍ය සහායක නිෂ්පාදන ඉදිරිපත් කිරීම සහ සන්නාම පිළිබඳ දැනුවත්භාවය ඇති කිරීම ඇතුළත් වන අතර ඒ තුළින් අන්තර් ජාල අත්දැකීම් පුළුල් කිරීම ඇතුළත් වේ.

**FlySmiLes නිතර පියාසර කරන පාරිභෝගික විශ්වාසවන්තභාවය**

දශකයකට වැඩි කාලයක් තිස්සේ ශ්‍රීලංකන් ගුවන් සමාගමේ ගුවන් මගීන්ගේ පක්ෂපාතී හවුල්කරු වන FlySmiLes සිය සාමාජික සංඛ්‍යාව, ආදායම සහ සාමාජිකයින්ගේ සහභාගීත්වය අඛණ්ඩව වර්ධනය කර ගැනීමට සමත් වී තිබේ. පසුගිය කාල සීමාව තුළ අභියෝග රැසක් තිබියදීත්, FlySmiLes හි සාමාජිකත්වය 10% කින් වර්ධනය වී මූල්‍ය වර්ෂය අවසානයේ සාමාජිකයන් 615,000 කට ළඟා විය.

මෙම වැඩසටහන සමස්ත ආදායමෙන් 8% ක වර්ධනයක් අත්කර ගත් අතර අපගේ සාමාජිකයෝ ගුවන් ගමන්, අතිරික්ත ගමන් මලු, හෝටල් නවාතැන්, තීරුබදු රහිත සාප්පු සවාරි, භෝජන සහ ජීවන රටා අත්දැකීම් මෙන් ම ගමන් ගත් සැතපුම් සඳහා වරප්‍රසාද ලබා ගත්හ.

FlySmiLes මූල්‍ය වර්ෂය ආරම්භ කළේ සිය සාමාජිකයන් වෙනුවෙන් “Travel Pass˜ එකක් හඳුන්වා දෙමින් වන අතර එමඟින් FlySmiLes සාමාජිකයන් වෙත විවිධ හවුල්කරුවන්ගෙන් ආකර්ෂණීය වට්ටම් රැසක් ඔස්සේ ප්‍රතිලාභ ලබා ගැනීමට සමස්ත සාමාජික පදනමට හිමිකම් ඇත. “Travel Pass˜ හි පරමාර්ථය වූයේ රට තුළට පැමිණෙන සංචාරකයෙකුට ශ්‍රී ලංකාවේ රැඳී සිටින කාලය තුළ හඳුනාගත් ස්ථාන කිහිපයකදී සම්පූර්ණ සංචාරක අත්දැකීමක් ලබා දීමයි.

සංචාරකයින්ගේ පහසුව වැඩි දියුණු කිරීම සඳහා තාක්ෂණික දියුණුව සමඟ වේගයෙන් ජංගම යෙදුම යාවත්කාලීන කෙරුණු අතර FlySmiLes සම සන්නාමය සහිත ක්‍රෙඩිට් කාඩ් සාමාජිකයින්ගේ විවේකාගාරය භාවිතා කිරීමේ ක්‍රියාවලිය ස්වයංක්‍රීය කිරීම සඳහා කටයුතු කරන ලදි. මෙහි දී කඩදාසි භාවිතය ඉවත් කර විවේකාගාරය භාවිතා කිරීමේ පහසුව ඇඟිලි තුඩුවලට ගෙන එන ලදි. ගුවන්තොටුපල සේවා කවුන්ටරය වසා දැමීම හරහා පොදු කාර්ය අවම වූ අතර ජංගම යෙදුම සහ 24x7 ඇමතුම් මධ්‍යස්ථානය හරහා එම සේවාවන් සැපයීම සිදු වෙයි.

එම වැඩපිළිවෙළේ ම තවත් පියවරක් ලෙස, FlySmiLes විසින් කෑෂ් ප්ලස් මයිල්ස් ස්ලයිඩර් නමින් නව අංගයක් එක් කර ඇති අතර තමන් උපයාගත් සැතපුම් සංඛ්‍යාව උපාය ගැනීම සහ උපරිම නම්‍යශීලීත්වයක් දක්වමින් සාමාජිකයින්ට වඩාත් ගතික ලෙස ප්‍රතිලාභ ලබා ගැනීමේ ඉඩ සලසයි. සාර්ථක අත්හදා බැලීම් වලින් පසුව, srilankan.com වෙබ් අඩවියේ වෙන්කරවා ගැනම් සඳහා ක්‍රියාකාරී පහසුකම් වඩාත් ශක්තිමත් කිරීමට කටයුතු කරමින් සිටී.

FlySmiLes මෙම වැඩසටහන අඛණ්ඩව වැඩිදියුණු කිරීම කෙරෙහි විශ්වාසය තබන අතර මගීන්ට බාධාවකින් තොරව, පහසු සහ වටිනා සුහදශීලී අත්දැකීමක් ලබා දීම කෙරෙහි අපි මෙහි දී සතුටින් කටයුතු කරන්නෙමු. වැඩසටහනේ ගතික පැතිකඩ වැඩිදියුණු කිරීම සඳහා ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කිරීමට නියමිත ව ඇත. ඊට අමතරව, උපචිත හා ප්‍රතිලාභ ලබා ගැනීමේ ක්ෂේත්‍රය වැඩි දියුණු කිරීම සඳහා හවුල්කරුවන්ගේ පරාසය සහ හවුල්කරුවන්ගේ සංඛ්‍යාව පුළුල් කිරීමට FlySmiLes කණ්ඩායම බලාපොරොත්තු වේ. FlySmiLes තවත් ලැදියා වැඩසටහනක් කරනු වෙනුවට අපගේ සාමාජිකයන්ගේ ජීවන රටාවක් ලෙස වර්ධනය කිරීමට බලාපොරොත්තු වෙමු.

# කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය සබැඳේ.

**ගෝලීය සම්බන්ධතා මධ්‍යස්ථානය**
ගෝලීය සම්බන්ධතා මධ්‍යස්ථානය විසින් අපගේ ගෝලීය පාරිභෝගික ජාලය වෙත ඉංග්‍රීසි, සිංහල, දෙමළ සහ මැන්ඩරින් ආදී විවිධ භාෂා ඔස්සේ දිනයේ පැය 24 පුරා සේවා ලබා දෙයි. සම්බන්ධතා මධ්‍යස්ථානය හරහා, ලෝක ව්‍යාප්ත ගනුදෙනුකරුවන්ට සහ FlySmiLes සාමාජිකයින්ට ආසන වෙන් කිරීම්, ප්‍රවේශපත්‍ර මිළ දී ගැනීම්, දින වෙනස් කිරීම්, සංචාරක ආශ්‍රිත විමසීම්, සහායක සහ වෙනත් සේවාවන් ඇතුළු සේවාවන් රාශියක් එක් ස්ථානයකින් ලබා දීම සිදු වේ.

රටේ අනපේක්ෂිත අර්බුදවලදී ගෝලීය සම්බන්ධතා මධ්‍යස්ථානය පැය 24 පුරාම ක්‍රියාත්මක වූ අතර ඔවුන්ගේ ගමන් සැලසුම් නැවත සකස් කිරීමට හා අතරමං වූ මගීන්ට අවශ්‍ය සහාය පැය 24 මුළුල්ලේ ලබා දීම සිදු විය. පාස්කු ප්‍රහාරයෙන් සහ COVID-19 හේතුවෙන් ඇති වූ පසුබෑමෙන් පසුව, අභ්‍යන්තරගත ඇමතුම් පරිමාව 100% කින් වැඩි වූ අතර විකල්ප සංචාරක විධිවිධාන ලබා දීමෙන් එවැනි ගනුදෙනුකරුවන් හැසිරවීමට උපරිම උත්සාහයක් ගන්නා ලදී.

විදේශීය ගනුදෙනුකරුවන්ට රටවල් 12 කින් ඔවුන්ගේ දේශීය අංක හරහා සම්බන්ධතා මධ්‍යස්ථානය වෙත සම්බන්ධ වීමේ පහසුකම සලසා ඇති අතර එම පහසුකම සෙසු මාර්ගගත ගමනාන්තයන් වෙතද ව්‍යාප්ත කිරීමට නියමිතයි.

ගුවන් සමාගමේ ඩිජිටල් මූලෝපායික වැඩපිළිවෙළ සමග අනුගත වෙමින්, ෆේස්බුක්, ට්විටර් සහ ලයිව්චැට් ඔස්සේ ද ගුවන් සමාග මේ සමාජ මාධ්‍ය හැසිරවීමට සම්බන්ධතා මධ්‍යස්ථානය දැන් සන්නද්ධව ඇත. සමාජ මාධ්‍ය විමසීම්, පැමිණිලි සහ ප්‍රතිපෝෂණය කළමනාකරණය කිරීම සහ ඒවාට ප්‍රතිචාර දැක්වීම සඳහා කැපවූ කණ්ඩායමක් පැය 24 මුළුල්ලේ යොදවා තිබේ. ගෝලීය සම්බන්ධතා මධ්‍යස්ථානය විසින් අපගේ ගනුදෙනුකරුවන්ට බාධාවකින් තොරව සුවපහසු අත්දැකීමක් ලබා දීමට කටයුතු කරන අතර පාරිභෝගික තෘප්තිය සහතික කිරීමට කේන්ද්‍රීය තොරතුරු කේන්ද්‍රස්ථානයක් ලෙස ක්‍රියා කර තිබේ. ඉදිරියේ දී එහි සේවාවන් වෙනත් අන්තර්ජාල පාදක නාලිකා වෙත ව්‍යාප්ත කිරීමට ද තවදුරටත් සැලසුම් කර ඇත.

**ශ්‍රීලංකන් හොලිඩේස්**
ශ්‍රීලංකන් හොලිඩේස් සිය ව්‍යාප්ති උපාය මාර්ගයේ වැදගත් සන්ධිස්ථානයක් අත්කර ගනිමින් 2019 ජූලි මාසයේදී ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියෙන් ජාත්‍යන්තර වෙළඳපොලේ බලයලත් සංචාරක ක්‍රියාකරුවෙකු ලෙස කටයුතු කිරීම සඳහා බලපත්‍රය ලබා ගන්නා ලදී. සුඛෝපභෝගී නිවාඩු නිකේතන, ගොල්ෆ් පිට්ටනි, කිමිදුම් වැඩසටහන්, තේ මංපෙත්, ආයුර්වේද වෛද්‍ය විද්‍යාව, වනජීවී කලාප සහ සොබාදහම ඇතුළු ශ්‍රී ලංකාවේ හොඳම අත්දැකීම් ලබා ගැනීමට මගීන්ගේ ප්‍රයෝජනය සඳහා සෘජුවම ආකර්ශනීය මිල ගණන් ලබා දීමට ශ්‍රීලංකන් හොලිඩේස් සඳහා මෙම බලපත්‍රය මගින් දොරටු විවර කරයි.

පිටතට යොමු වූ මෙහෙයුම් වල කොටසක් ලෙස, ශ්‍රීලංකන් හොලිඩේස් විසින් ඩිජිටල් පසුම්බි සන්නාම සහ ශ්‍රී ලංකාවේ බැංකු හරහා නිෂ්පාදන ව්‍යාප්ත කරමින්, පිටත හා තදාසන්න ප්‍රදේශවල වෙළඳපල පුළුල් කිරීම සඳහා ශක්තිමත් උපායමාර්ගික වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළේය. රොමැන්ටික් නිවාඩු, පවුල් නිවාඩු පැකේජ, සංචාරක පැකේජ ආදිය ඔස්සේ සිය වෙළඳ නාමය තහවුරු කර ගෙන සිටි ශ්‍රීලංකන් හොලිඩේස්, නැගී එන වෙළඳපල සඳහා ආකර්ෂණය මත පදනම් වූ පැකේජ නිර්මාණය කිරීමට සමත් වූ අතර පුද්ගලයන් පදනම් වූ සේවාවන් ලබා දීමට කටයුතු කළේය.

ගෝලීය වශයෙන් ඩිජිටල් දැනුමක් ඇති නිවාඩු සංචාරකයින් ආකර්ෂණය කර ගැනීමේ අරමුණ ඇති ව, ශ්‍රීලංකන් හොලිඩේස් විසින් හෝටල්, විනෝද චාරිකා, පෞද්ගලිකත්වය මත පාදක වූ පැකේජ, සෘජුව සිදු කෙරෙන සෙවුම් පෙරහන්, පාරිභෝගික සමාලෝචන, නම්‍යශීලී ගෙවීම් විකල්ප සහ වෙන්කරවා ගැනීමේ කවුළු ආදිය ඇතුළත් කිරීම ඔස්සේ වෙබ් අඩවිය නවීකරණය කරන ලද අතර එය පුළුල් සංචාරක ප්‍රජාවක් කරා ළඟා වන අලෙවිකරණ වේදිකාවක් බවට පත් කර ඇත. ලොව පුරා නිවාඩු පැකේජ ආවරණය කරමින් සියලුම විශේෂාංග ලබන මූල්‍ය වර්ෂයේදී වෙළඳපොළ වෙත ලබා දීමට නියමිතය.

ව්‍යාපාරික සංචාරක ව්‍යාපාරය ශක්තිමත් කිරීම සඳහා, වඩාත් අභ්‍යන්තර මෙහෙයුම් සඳහා ශ්‍රීලංකන් හොලිඩේස් MICE, අනුබද්ධිත වූ අතර පිටතට යොමු වූ MICE වැඩසටහන් පරාසය පුළුල් කර ගැනීම සඳහා ශ්‍රී ලංකාව තුළට සහ ඉන් පිටත MICE ගමනාගමනය ප්‍රවර්ධනය කිරීම සඳහා සැපයුම්කරුවන් සහ වෙළෙඳ ආයතන සමඟ ගිවිසුම් ඇති කර ගෙන තිබේ. 2019 අප්‍රේල් මාසයේ පාස්කු ප්‍රහාරයෙන් පසු සංචාරකයින්ගේ විශ්වාසය නැවත ගොඩනැංවීම සහ සංචාරක කර්මාන්තය පුනර්ජීවනය කිරීම සඳහා ද ශ්‍රීලංකන් හොලිඩේස් වැදගත් කාර්යභාරයක් ඉටු කරන ලදී. සැලකිය යුතු සංචාරකයින් සංඛ්‍යාවක් බිහි කරමින් ඉන්දියාවේ සහ චීනයේ ප්‍රවර්ධන ව්‍යාපාරයක්. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය (SLTB) සහ සංචාරකයන් ගෙන්වන්නන්ගේ ශ්‍රී ලංකා සංගමය (SLAITO) සමඟ එක්ව ඉන්දියාවේ සහ චීනයේ ප්‍රවර්ධන ව්‍යාපාරයක් ක්‍රියාත්මක කළ අතර ඒ ඔස්සේ සැලකිය යුතු සංචාරකයින් සංඛ්‍යාවක් ආකර්ෂණය කර ගැනීමට හැකි විය.

**අලෙවිකරණය**
සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ ශ්‍රීලංකන් ගුවන් සමාගම සිය ලෝක ව්‍යාප්ත ජාලය සහ දේශීය ජාලය වන ශ්‍රී ලංකාව හරහා සිය සන්නාමය තහවුරු කර ගැනීම සඳහා සාර්ථක ව්‍යාපාරික මූලෝපායයන් සහ ක්‍රියාකාරකම් රාශියක් දියත් කළේය.

ස්ථාවර හා උපායමාර්ගික සන්නාමයක් ගොඩනැගීම සඳහා ගුවන් සමාගම ගත් උත්සාහයන් ගෝලීය වශයෙන් පිළිගැනීමට ලක් වූ අතර සියලු සාමූහික උත්සාහයන් සඳහා අපගේ වටිනා ගනුදෙනුකරුවන්ගේ සහ සාමාන්‍ය ජනතාවගේ පිළිගැනීමට ලක් විය.

PATA රන් සම්මාන උළෙලේදී “To Cities, One Spirit” යන තේමාව ඔස්සේ “හොඳම අලෙවිකරණය සතු ගුවන්සමාගම” සඳහා ශ්‍රීලංකන් විසින් මැල්බර්න් නුවර ගමනාන්ත ආරම්භ කිරීමට අදාළ ව ක්‍රියාත්මක කළ වැඩපිළිවෙළට රන් සම්මානය හිමි විය.

“ලොකේෂන්” පින් සංකල්පය භාවිතා කිරීමෙන් බාධාවකින් තොරව මෙල්බර්න් සහ කොළඹ යන නගර දෙක අතර දෛනික සම්බන්ධතා පවත්වා ගෙන යෑම සහ ගුවන් සමාගමේ සෙසු ජාලයට පහසුවෙන් සම්බන්ධ විය හැකි තත්ත්වයක් ඇති කර තිබේ.

ශ්‍රීලංකන් ගුවන් සමාගම සිය සන්නාම වීඩියෝ වන “Serendipity Right Next Door” සහ “Ode to Paradise” සඳහා ගෝලීය පිළිග ැනීමක් දිනා ගත්තේය. 2020 වසරේ පෙබරවාරි 17 සහ 27 වන විට එම වීඩියෝ දෙකම අන්තර්ජාලය හරහා ඉතා හොඳ ප්‍රතිචාරයක් ලබා ගත් අතර, මෙම ලිපිය ලියන අවස්ථාව වන විට මිලියන 20 කට අධික ප්‍රේක්ෂක




දර්ශන ප්‍රමාණයක් ලබා තිබුණි. මෙම වීඩියෝ දෙක බොහෝ වෙළඳ ප්‍රදර්ශන, සම්මාන වේදිකා සහ වෙනත් උත්සවවල දී ඉහළ ධනාත්මක පිළිගැනීමක් ලැබීය.

වීඩියෝ දෙකම විවේචනාත්මකව ඉතා හොඳ ප්‍රතිචාරයක් ලැබූ අතර 2020 බර්ලිනයේ ගෝල්ඩන් සිටි ගේට් සම්මාන උළෙලේදී "එයාර්ලයින්-ඉන්ටර්නැෂනල්" කාණ්ඩයේ පළමු තරු සම්මාන දිනා ගැනීමට සමත් විය. විශේෂයෙන් "Serendipity Right Next Door" සමාජ මාධ්‍යවල ඉතා වේගයෙන් සංසරණය පටන් ගත් අතර මිලියන 1 ක ප්‍රේක්ෂක දර්ශන ප්‍රමාණයක් පැය 11 ක් තුළ සහ දින 2 ක් තුළ ප්‍රේක්ෂක දර්ශන මිලියන 5 ක් ලබා ගැනීමට හැකි විය. මෙවැනි අවධානයක් දිනා ගත් පළමු සහ එකම වෙළෙඳනාමය බවට එය පත් විය.

"Ode to Paradise" ද ඉතා ඉහළ සාර්ථකත්වයක් ලබා ගත් අතර දින 14 ක් තුළ මිලියන 35 කට අධික ජනතාවක් වෙත ළඟා විය. මෙම වීඩියෝවල මූලික පරමාර්ථය වූයේ වෙළඳ නාම දෘශ්‍යතාව සහ පැවැත්ම වැඩි දියුණු කිරීමයි.

"Serendipity Right Next Door" වීඩියෝව මගින් වෙන කවරදාකටත් වඩා වෙනස් ආකාරයකින් ශ්‍රී ලංකාව අත්විඳීමට ශ්‍රීලංකන් ගුවන් සමාගම ඉන්දියානු ජනතාවට ආරාධනා කළ අතර ශ්‍රී ලංකාවේ ඉහළ පෙළේ කීර්තිමත් පුද්ගලයන් වන ජැකලින් ෆර්නැන්ඩස් සහ කුමාර් සංගක්කාර යොදා ගනිමින් ශ්‍රී ලංකාවේ කාලානුරූපී සුන්දරත්වය එමගින් ප්‍රදර්ශනය කෙරිණ.

"Ode to Paradise" මගින් ශ්‍රී ලංකාවේ ස්වාභාවික සුන්දරත්වය, එහි ජනතාව සහ සංස්කෘතිය ප්‍රදර්ශනය කෙරිණ. මෙම වීඩියෝ පටයේ ජැකලින් ෆර්නැන්ඩස්, කුමාර් සංගක්කාර, මහේල ජයවර්ධන, පීටර් කුරුවිට සහ භාතිය සහ සන්තුෂ් ඇතුළු ජනප්‍රිය ශ්‍රී ලාංකික තරු පෙළක් ඇතුළත් විය. ඔවුන් එක්ව ශ්‍රී ලංකාවේ සම්පත් සහා දායාදයන් ලොවට ප්‍රදර්ශනය කළ අතර, ශ්‍රී ලංකාව පිළිබඳ හැඟීමක් ලොවට ගෙන යන පණිවිඩකරුවෙකු ලෙස ශ්‍රීලංකන් ගුවන් සේවය එම වීඩියෝ ස්ථානගත කර ඇත.

ජාතික ගුවන් සමාගම ලෙස ශ්‍රීලංකන් ගුවන් සේවාව මෙරට වටිනාකම් සිය ලෝක මට්ටමේ සේවාව සමගින් සම්මිශ්‍ර කිරීමට සමත් වී ඇත. ඒ ඔස්සේ ශක්තිමත් ශ්‍රී ලාංකික මූලයන් සහිත ගෝලීය සන්නාමයක් ලෙස ශ්‍රීලංකන් සිය කීර්තිනාමය තහවුරු කර ඇති අතර එය සිය සියලු සන්නිවේදනයන් හරහා මෙම පණිවිඩය ඉදිරිපත් කිරීමට උත්සාහ කරයි.

ඕස්ට්‍රේලියාව තුළ සිය පැවැත්ම තහවුරු කර ගනිමින් ශ්‍රීලංකන් ගුවන් සමාගම, තෙවන වසර සඳහාත් ඕස්ට්‍රේලියාවේ ප්‍රමුඛතම මැරතන් ඉසව්ව වන ඓතිහාසික මෙල්බර්න් මැරතන් උළෙලේ දී අර්ධ මැරතන් තරගය සඳහා 2019 වසරේ දීත් ප්‍රධාන අනුග්‍රාහකයා විය. මීට අමතරව, ඕස්ට්‍රේලියාවේ තවත් ප්‍රධාන ක්‍රීඩා ඉසව්වක් වන 2019 මහා සාගර මාර්ග ධාවන උළෙල සඳහා ද ප්‍රමුඛතම ගුවන් සේවා අනුග්‍රාහකයා වූයේ ශ්‍රීලංකන් ගුවන් සමාගමයි. එපමණක් නොව, ලෝක සර්ෆින් ලීග් සුදුසුකම් ලැබීමේ 'SO SRI LANKA PRO 2019' 3000 ශ්‍රේණියේ තරඟයට මෙන් ම 'CINNAMON FUTURE OF TOURISM' ආදී සහයෝගීතා වැඩසටහන් රැසක් සඳහා ගුවන් සමාගම සහයෝගීතාව දක්වා ඇති අතර ශ්‍රී ලංකා සංචාරක හා කුරුළු හෝටල් සහ නිකේතන වැනි ප්‍රමුඛතම සන්නාමයන් අතර Sri Lanka Tourism සහ Cinnamon Hotels and Resorts වැනි ප්‍රබල සන්නාම මධ්‍යයේ සන්නාම දෘශ්‍යතාවයක් සහ අවධානයක් ලබා ගැනීමට සමත් විය.

# කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය සබැඳේ.

**ශ්‍රීලංකන් ගුවන් භාණ්ඩ (Cargo)**

2019/20 මූල්‍ය වර්ෂය තුළ දී 2009 වසරේ සිට අඩුම ගෝලීය ගුවන් භාණ්ඩ ඉල්ලුම් කාලපරිච්ඡේදයක් අත්විඳි අතර, වසරක් පාසා පසුබැසීම නාවික ටොන්-කිලෝමීටර (FTK) 3.3% ක් වන අතර, ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමය (IATA) ප්‍රකාශයට පත් කර ඇති දත්ත අනුව පවතින භාණ්ඩ ධාරිතාව 2019 වසරේ දී 2.1% දක්වා ඉහළ ගොස් තිබේ. ප්‍රධාන වෙළෙඳපොළවල් වන චීනය, ඇමරිකා එක්සත් ජනපදය සහ යුරෝපය අතර වෙළඳ ආතතීන් 0.9% ක ගෝලීය වෙළඳාමේ දුර්වල වර්ධනයට මූලික හේතුව ලෙස හඳුනා ගත හැකි වන අතර නිෂ්පාදන තීව්‍ර ආර්ථිකයන්හි දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය මන්දගාමී වීම, මෘදු ව්‍යාපාර සහ පාරිභෝගික විශ්වාසය පහත වැටීම 2018 වසරට සාපේක්ෂව අපනයන ඇණවුම්වල පහත වැටීමට හේතු විය.






පාස්කු ත්‍රස්ත ප්‍රහාර සහ COVID-19 වසංගතය හේතුවෙන් ගුවන් සමාගමේ ජාලයට ඇති වූ අහිතකර බලපෑම හේතුවෙන් සමූහයේ මෙහෙයුම් භාණ්ඩ ප්‍රවාහන ධාරිතාවය වසරින් වසර 9% කින් අඩුවී ඇති අතර එය මිලියන කිලෝග්‍රෑම් 12 ක අඩුවීමක් පෙන්නුම් කරයි. කෙසේ වෙතත්, COVID-19 ව්‍යාප්තිය හේතුවෙන් ගෝලීය මගී මෙහෙයුම් පහත වැටීමත් සමගම, ශ්‍රීලංකන් ගුවන් සේවයේ මගී ගුවන් යානා භාවිතය අඩුවීම නිසා එම ගුවන්යානා භාවිත කරමින් භාණ්ඩ ප්‍රවාහනය සඳහා විශේෂිත වූ ගුවන්යානා සකස් කර ගැනීමෙන් නවෝත්පාදනයේ නව පියවරක් තබමින් අභියෝගය අවස්ථාවක් කර ගැනීමට සමත් විය. මෙම විශේෂ සේවාවන් ෂැංහයි, මාලේ, ඩුබායි සහ රියාද් ඇතුළු ලොව පුරා ගමනාන්ත ගණනාවකට ක්‍රියාත්මක වූ අතර, 2020 මාර්තු මස අග භාගයේදී ඉක්මණින් විනාශ විය හැකි ද්‍රව්‍ය සහ විවිධ නිෂ්පාදන සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 282 ක අමතර ධාරිතාවයක් ගනුදෙනුකරුවන්ට ළඟා කර දීම සඳහා කටයුතු කිරීමට සමත් විය.

කෝවිඩ් වසංගතය හේතුවෙන් උදා වූ අවස්ථාව ප්‍රයෝජනයට ගනිමින් මගී ප්‍රවාහනය සඳහා අඩු වශයෙන් භාවිත කෙරුනු ගුවන් යානා හි මගී ආසන ඉවත් කිරීම සිදු වූ අතර එය ගුවන් යානා නිෂ්පාදනය සම්බන්ධයෙන් වන යුරෝපා සංගම් ගුවන් සේවා ආරක්ෂණ ඒජන්සියේ ප්‍රමිතීන්ට මෙන් ම ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන් සේවා අධිකාරියේ ප්‍රමිතීන්ට අනුව සිදු කෙරිණ. එම ප්‍රතිප්‍රදානයන් හා සහතික කිරීම් යටතේ A330 ගුවන් යානයක ප්‍රධාන තට්ටුවට භාණ්ඩ පැටවීමට හැකි පරිදි පරිවර්තනය කිරීමේ කළමනාකරණ තීරණයක් ගන්නා ලදී. 100% ක් ගෘහස්ථව ගුවන් සමාගම විසින් සිදුකරන ලද මෙම පරිවර්තනය මගින් ගුවන් යානයකට සීබීඑම් 170 ක ධාරිතාවයක් ලබා ගත හැකි අතර උපරිම ටොන් 45 ක බරක් ගෙන යෑමට හැකි වේ.
පාරිභෝගිකයන්ට වඩාත් ශීඝ්‍රයෙන් සිය සේවා සපයා ගැනීමේ පහසුව මේ ඔස්සේ ලැබෙයි.

9% ක ධාරිතාව පහත වැටීමක් ඇතුළුව මූල්‍ය වර්ෂය පුරාම අත්විඳින ලද අභියෝග ගණනාවක් තිබිය දී, ශ්‍රීලංකන් විසින් ඇමරිකානු ඩොලර් මිලියන 88.5 ක අලෙවි ආදායමක් අත්කර ගත් අතර එය වසරින් වසර 7% ක පහත වැටීමක් පමණක් පිළිබිඹු කළේය. වෙළඳපල තත්ත්වයන් පහත වැටී තිබියදීත්, වර්ෂය පුරා අනුගමනය කරන ලද දැඩි ප්‍රතිඵල මත පදනම් වූ උපාය මාර්ග හේතුවෙන්, පෙර මූල්‍ය වර්ෂයට සාපේක්ෂව, ඇ.ඩො. 1.06ක් වූ ස්ථානීය අලෙවි දර්ශකය අඩු වී තිබුණේ සියයට 1කින් පමණි. මෙම කාල සීමාව සඳහා මුළු භාණ්ඩ ප්‍රවාහනය මෙට්‍රික් ටොන් 113,971 කි. ශ්‍රීලංකන් ගුවන් භාණ්ඩ අලෙවිය සහ ගුවන් තැපැල් 2019/20 මූල්‍ය වර්ෂය සඳහා වන ශ්‍රීලංකන් ගුවන් සමාගමේ සමස්ත ගුවන් ගමනාගමන ආදායමෙන් 10% ක් වන අතර එමගින් සමස්ත ගුවන් ගමනාගමන ආදායමට මෙම අංශයේ දායකත්වය අඛණ්ඩව පවත්වා ගෙන ගොස් තිබේ.

ඉන්දියානු උප මහද්වීපික කලාපයේ ආදායම ඇමරිකානු ඩොලර් මිලියන 42 ක් වූ අතර එය පෙර වසරට වඩා 3% ක අඩුවීමකි. ඊට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ චෙන්නායි, බැංගලෝර් සහ මුම්බායි යන මාර්ගවල භාණ්ඩ ප්‍රවාහනය පහත වැටීමයි. ඇමරිකානු ඩොලර් මිලියන 23 ක් වූ ශ්‍රී ලංකාවේ ගුවන් භාණ්ඩ අලෙවිය 5% කින් ඉහළ යාමෙන් ආදායම් අලාභය පියවා ගත් අතර ප්‍රතිඵල මත පදනම් වූ උපාය මාර්ගික වැඩපිළිවෙළ හේතුවෙන් වසරකට 19% ක වර්ධනයක් ලබා ගත හැකි වේ. චීනය පාදක වූ ආදායම ඇමරිකානු ඩොලර් මිලියන 13 ක් වන අතර එය වසරින් වසර අත් කර ගත් කාර්ය සාධනයෙන් 35% ක අඩුවීමකි. මෙම කාලසීමාව තුළ ගුවන් භාණ්ඩ ප්‍රවාහනයේ සිදු වූ 39% ක බිඳ වැටීම අයහපත් ලෙස බලපෑවේය. මැදපෙරදිග වෙළඳපල වලින් උපයන ලද ආදායම ඇමරිකානු ඩොලර් මිලියන 8 ක් වූ අතර ඩුබායි වෙතින් මාලදිවයින වෙත එවන ලද භාණ්ඩ හේතුවෙන් එම ආදායමෙන් 50% ක් පමණ උපයා ඇත. ඉහළ ප්‍රතිඵල සහිත චලනයන් ඕස්ට්‍රේලියාවට ගෙන යාම සඳහා බෙදා හැරීමේ උපාය මාර්ග අනුගමනය කිරීමෙන් යුරෝපය මගින් ඇමරිකානු ඩොලර් මිලියන 6 ක ආදායමක් වාර්තා කර ඇත. එය 2% ක වර්ධනයකි.

හවුල්කාර ගුවන් සමාගම් සහ ගොඩබිම් ප්‍රවාහන ගිවිසුම් ඇතුළු ව විශේෂ ප්‍රක්ෂේපිත ගිවිසුම් (SPAs) මගින් ශ්‍රීලංකන් ගුවන් භාණ්ඩ පාරිභෝගිකයින් සඳහා සම්බන්ධතා විකල්පයන් වැඩිදියුණු කළ අතර මූල්‍ය වර්ෂය තුළ වැඩිදියුණු කළ මූලාරම්භ 138 සිට ගමනාන්ත 360 දක්වා සාර්ථකව සම්බන්ධ වීමට හැකි වී තිබේ. චීනය සහ ඇමරිකා විශේෂ ප්‍රක්ෂේපිත ගිවිසුම් මගින් එක්සත් ජනපදයේ ගමනාගමන ජාලයේ ගමනාන්ත වෙත සම්බන්ධ කිරීම තුළින් මාලදිවයින සහ මැදපෙරදිග වැනි දිශානුගත භාණ්ඩ ප්‍රවාහනය කරන මාර්ගවල ආදායම් විභවය සහ උපයෝජනය වැඩි දියුණු කිරීමට ද හැකි වී තිබේ.

මූල්‍ය වර්ෂය පුරා 99.95% හැසිරවීමේ විශ්වසනීයත්වයක් පවත්වා ගනිමින් ගුවන් භාණ්ඩ ගොඩබෑමේ මෙහෙයුම් මෙට්‍රික් ටොන් 249,000 ක් (පාස්කු ප්‍රහාර සහ COVID-19 වසංගතය මධ්‍යයේ ශ්‍රීලංකන් ගුවන් සේවයේ සහ පාරිභෝගික ගුවන් සමාගම්වල මෙහෙයුම් අවලංගු කිරීම හේතුවෙන් වසරකට 9% ක අඩුවීමක් පෙන්නුම් කර තිබිණ) සම්පූර්ණ කර තිබේ. භාණ්ඩ මෙහෙයුම් වලින් ලැබුණු මුළු ආදායම මූල්‍ය වර්ෂයේදී ඇමරිකානු ඩොලර් මිලියන 25.6 ක් විය. කාර්යක්ෂමතාව කෙරෙහි අවධානය යොමු කරමින් ගුවන් භාණ්ඩ කර්මාන්තයේ ඩිජිටල් වැඩිදියුණු කිරීම්වලට යොමු වූ අතර, භාණ්ඩ මෙහෙයුම් e-AWB චලනයන් දිරිගැන්වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස කොළඹ කොටස් වෙළඳපොලේ විනිවිදයාම 65% ක් වූ අතර 2021 වන විට 100% විනිවිදයාමක් අපේක්ෂා කෙරේ.

2019/20 වර්ෂය තුළදී ගුවන් සේවය සඳහා අභියෝගාත්මක වසරක් වූ අතර, ගුවන් භාණ්ඩ කර්මාන්තය වෙතත් මෑතකදී ගෝලීය ගුවන් සේවා කර්මාන්තය වෙතත් අභියෝග රැසක් පැමිණි අතර එය ගුවන් සමාගමේ ව්‍යාපාරික ආකෘතියට විශාල අභියෝගයක් වී තිබේ. පශ්චාත් වසංගත තත්වය ලෝකයේ අන්තර්ජාල සාප්පු සවාරි සඳහා වැඩි කැමැත්තක් දැක්වීම සම්බන්ධව පුරෝකථනය කරන ලද සමාජීය හැසිරීම් සමඟ ඊ-වාණිජ්‍යය අංශය ඉදිරි මූල්‍ය වර්ෂයේ දී ලාභදායී අංශයක් ලෙස දිගටම පවතිනු ඇත. විකාශනය වෙමින් පවතින භාණ්ඩ ප්‍රවාහන (Logistic) අංශය සේවා සම්පාදන අංශ කෙරෙහි දිගින් දිගටම අභියෝගයක් වීමේ හැකියාවක් ඇති අතර පාරිභෝගික
අපේක්ෂාවන් සපුරාලීම සඳහා ගතික උපායමාර්ගවල අවශ්‍යතාවය ගෝලීය ගුවන් ඉතිහාසයේ වෙන කවරදාටත් වඩා ඉදිරිය පැමිණ ඇත.

## පියාසැරි මෙහෙයුම් (Flight Operations)

### *ආරක්ෂාව*

ආරක්ෂාව යනු ශ්‍රීලංකන් ගුවන් සමාගමේ මෙහෙයුම් පරිසරය තුළ සෑම අතකින් ම අවධාරණය කෙරෙන අංශයක් වන අතර එහි ප්‍රධානතම ආයතනික සංස්කෘතියකි. සැමට සුරක්ෂිත පරිසරයක් පවත්වා ගැනීම සඳහා අවශ්‍ය කුසලතා සඳහා සියලු මෙහෙයුම් පාර්ශවකරුවන් යාවත්කාලීනව තබා ගැනීම උදෙසා සමීප අධීක්ෂණ ක්‍රියාවලියක් මගින් අනිවාර්ය හා වරින් වර පුහුණුවීම් සිදු කරනු ලැබේ. COVID-19 වසංගතයේ බලපෑමත් සමග වර්තමාන පසුබිම තුළ, ශ්‍රීලංකන් ගුවන් සමාගම විසින් නව රටවලට මෙන් ම සිය ජාලයෙන් පිටත ගමනාන්තයට පුද්ගලයන් ආපසු ගෙන්වා ගැනීමේ ගුවන් ගමන් තාවකාලිකව ක්‍රියාත්මක කරනු ලබන අතර, සියලු මෙහෙයුම් සමඟ අනුකූල වන අනුකූලතා සහ ආරක්ෂිත කළමනාකරණ පද්ධති (SMS) ක්‍රියාවලියක් හරහා සවිස්තරාත්මක අවදානම් තක්සේරු කිරීම් එහි දී සිදු කරනු ලැබේ. මෙහි දී දේශීය හා විදේශීය පාර්ශවකරුවන් මගින්, කාර්ය මණ්ඩල සහ වත්කම්වල ආරක්ෂාව සහතික කෙරේ.

### *නියමිත කලට කාර්යන් ඉටු කිරීම (OTP)*

ශ්‍රීලංකන් ගුවන් සමාගම ඉතා ස්ථාවර කාලීන කාර්යසාධන (OTP) ශ්‍රේණිගත කිරීමේ ජාලයක් පුරා පැතිර ඇති අතර, කර්මාන්ත ප්‍රමිතියෙන් මිනිත්තු 15 ක් ඇතුළත පිටත්ව යාමේ සාමාන්‍යය 85% ක් සහ සියලුම ගුවන් ගමන් සඳහා 86% පැමිණීම පවත්වා ගෙන යාමෙන් විශිෂ්ට කාර්ය සාධනයක් පෙන්නුම් කර ඇත.

### *ගුවන් මෙහෙයුම් පාලන මධ්‍යස්ථානය - AOCC*

ප්‍රකාශිත කාලසටහන කළමනාකරණය කිරීම සඳහා ගුවන් මෙහෙයුම් පාලන මධ්‍යස්ථානය (AOCC) පූර්වගාමී කාර්යක් සිදු කරන අතර එහි කේන්ද්‍රස්ථානයක් ලෙස ක්‍රියා කරයි. මෙම ක්‍රියාවලියේදී, සියලු පාර්ශවකරුවන් සමඟ සම්බන්ධතා පැවැත්වීම මගින් ඉතා වැදගත් තීරණ ගැනීමෙන් අනපේක්ෂිත සිදුවීම් කළමනාකරණය කිරීම AOCC විසින් සිදු කරනු ලබන අතර මගීන්ට මෙන්ම මෙහෙයුමට අවම අපහසුතාවයන් සහ බලපෑමක් ඇති වන පරිදි සිය කාර්යයන් සම්පූර්ණ කරයි. විශේෂයෙන් වර්තමාන වසංගත පසුබිම තුළ, මෙහෙයුම් කාර්යක්ෂමතාවයට කිසිදු ආකාරයකින් බාධාවක් නොවන බව සහතික කිරීම සඳහා සම්පත් හා සැපයුම් ප්‍රශස්ත මට්ටම්වල පිරිවැය ඵලදායී ලෙස කළමනාකරණය කිරීමේ විශේෂ විධිවිධාන සකස් කරන ලදී. AOCC යනු පැය 24x7 ක්‍රියාත්මක වන විධාන මධ්‍යස්ථානයක් වන අතර එය බණ්ඩාරනායක ගුවන් තොටුපොළ වෙතින් සහ ජාලයෙන් පිටවීමට පෙර ගුවන් ගමන් වල ආරක්ෂිත ක්‍රියාකාරීත්වයට බලපෑම් කළ හැකි සියලුම ගෝලීය සිදුවීම් පිළිබඳව දැඩි විමසිල්ලෙන් සිටී.

### *පියාසර යැවුම් මධ්‍යස්ථානය - FDC*

ප්‍රශස්ත වාසිදායක මාර්ගවල ගුවන් ගමන් සැලසුම් කිරීම, ගුවන් ගමන් සඳහා ඉන්ධන භාවිතය සහ ගුවන් යානයක උපරිම බර සැලකිල්ලට ගනිමින් උපරිම අවසර ලත් බර (Pay load) ගණනය කිරීම පියාසර යැවුම් මධ්‍යස්ථානයේ මූලික කාර්යය වේ. ගුවන් යානයක ආරක්ෂිත හා කාර්යක්ෂම ක්‍රියාකාරීත්වය සඳහා මාර්ග නිෂ්කාශනය ලබා ගැනීමේදී මෙම ක්‍රියාවලීන් දේශීය හා ජාත්‍යන්තර වශයෙන් නියාමන අනුකූලව සිදු කිරීම ඉතා වැදගත් වේ. මෙම මධ්‍යස්ථානයට පැවරෙන තවත් කාර්යයක් නම් ගෝලීය ඉන්ධන මිල පිළිබඳව නිරන්තරයෙන් හා සමීපව අධීක්ෂණය කිරීමයි. ලාභදායී ස්ථානවලින් ඉන්ධන වැඩි වශයෙන් පුරවා ගැනීමෙන් පිරිවැය වාසියක් ලබා ගැනීම සිදු කෙරෙන අතර ඉන්ධන පිරිවැය අවම කර ගැනීම සිදුකරන මෙම ක්‍රියාමාර්ගය අධිධාරිතාකරණය (tankering) වශයෙන් ද හැඳින්වේ. විදේශීය

# කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය සබැඳේ.

ගුවන් සමාගම් වෙත සේවාවන් සපයමින් මෙම මධ්‍යස්ථානය මගින් අතිරේක ආදායමක් උපයා ගන්නා අතර COVID-19 වසංගතය හේතුවෙන් 2020 මාර්තු මාසයේදී එම ආදායම් මාර්ගවලට බරපතළ පහරක් එල්ල විය.

ගුවන් සමාගමේ මෙහෙයුම් පිරිවැයට විශාලතම දායකත්වය සපයන්නේ ඉන්ධන වන බැවින්, ඉන්ධන භාවිතය සඳහා දැඩි අධීක්ෂණ යාන්ත්‍රණයක් පියාසර යැවුම් මධ්‍යස්ථානය මගින් ක්‍රියාත්මක වේ. මෙම ක්‍රියාවලිය මඟින් ගුවන් ගමන් සඳහා ප්‍රශස්ථ ඉන්ධන භාවිතය, අමතර ඉන්ධන දහනය අඩු කිරීම සහ ඉන්ධන භාවිතය පිළිබඳ හොඳම භාවිතයන් පිළිබඳ දැනුවත් කිරීම ආදිය සිදු කෙරේ. ඒ අනුව, බර ගණනය කිරීම ඉන්ධන දහනය තීරණය කරන සාධකයක් වන අතර එය අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා මෙම මධ්‍යස්ථාන මගින් සියුම් ලෙස සැලසුම් කෙරේ. මෙය, නියමුවන්ගේ දක්ෂ පියාසර ශිල්පීය ක්‍රම සමඟ ප්‍රශස්ත කාර්ය සාධන ප්‍රමිතියක් ළඟා කර ගැනීමට හේතු වන ගුණාංගයක් වේ.

### යානාස්ථ සේවා *(Inflight Service)*

ශ්‍රීලංකන් සන්නාමයේ වටිනාකම තහවුරු කරමින්, ආගන්තුක සත්කාරය සම්බන්ධයෙන් විශිෂ්ට අත්දැකීමක් ගුවන් මගීන් වෙත තිළිණ කිරීමට යානාස්ථ සේවා අඛණ්ඩව කටයුතු කරයි. යානාස්ථ සේවා කණ්ඩායම අඛණ්ඩව ගුවන්යානය අභ්‍යන්තර සේවාවන්හි විශිෂ්ටත්වය කරා ළඟා වීමට කටයුතු කර ඇති අතර එය ව්‍යාපාරික පන්තියේ යානාස්ථ අත්දැකීම් සඳහා 90% ක සාමාන්‍ය ශ්‍රේණිගත කිරීමක් ලැබීම තුළින් පිළිබිඹු විය.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ ප්‍රධාන මුලපිරීම් රාශියක් සිදු කරන ලද අතර එහි දී එහිදී ගුවන් මැදිරි කාර්ය මණ්ඩල චාරිකා වාර්තාව සහ නිවාඩු චාරිකා සැලසුම්කිරීමේ කාර්යයන් පරිගණක ඔස්සේ ස්වයංක්‍රීය ලෙසින් සිදු කර ගැනීම ඇතුළත් වූ අතර එමඟින් කඩදාසි රහිත වැඩ පරිසරයක් කරා ගමන් කිරීමට පියවර ගන්නා ලදී. තවද, චාරිකා වාර්තාවේ ස්වයංක්‍රීයකරණය මගින් වෙනත් යෙදුම් ස්ථාපනය කිරීමට මග සලසා ඇති අතර, එමගින් ගුවන් ගමනකට පෙර නිතර පියාසර කරන්නන් පිළිබඳ තොරතුරු ලබා දීම, ආහාර හා පාන වර්ග පිළිබඳ පාර්භෝගික අදහස් ලබා ගැනීම මෙන් ම ඉංජිනේරු ආශ්‍රිත සේවා සම්බන්ධයෙන් තොරතුරු දෘශ්‍ය ආකෘතියකින් ඉදිරිපත් කිරීම සිදු කළ හැකි වේ.

එලදායිතාව ඉහළ නැංවීමේ පරමාර්ථය ඇතිව, කැබින් කාර්ය මණ්ඩලය සහ යානාස්ථ සේවා කාර්ය මණ්ඩලය සමඟ නිරන්තර සම්බන්ධතා සැසි පවත්වන ලදී. කාර්යාල කාර්ය මණ්ඩලය සමඟ සතිපතා රැස්වීම් සහ කාර්ය මණ්ඩලය සමඟ ඵලදායී ලෙස මැදිහත් වීම සඳහා මසකට වරක් පැවැත්වෙන "කැබින් කාර්ය මණ්ඩල විවෘත දිනය" ද මෙයට ඇතුළත් විය. ජයග්‍රහණ, සැමරුම් සහ වර්ධනයන් පිළිබඳ දැනුවත්භාවය වැඩි දියුණු කිරීම සඳහා මාසික "යානාස්ථ පුවත් හසුන" සියලු යානාස්ථ කාර්ය මණ්ඩලය අතර බෙදා හරින ලද අතර කළමණාකාරීත්වය විසින් ප්‍රධාන ගුවන් සේවක නිලධාරීන් වෙන් වෙන් වශයෙන් රැස්වීම් පැවැත්වීම සිදු කෙරිණ.

ගුණාත්මකභාවය පිළිබඳ කිසිදු අඩු කිරීමක් නොමැතිව පිරිවැය ඉතිරිකිරීමේ වැඩසටහන් කිහිපයක් යානාස්ථ සේවාවන් සඳහා ක්‍රියාත්මක කරන ලදී. එවැනි මුලපිරීම් අතරට පෙර ඇසුරුම් කළ නිෂ්පාදන සෘජුවම නිෂ්පාදකයාගෙන් ලබා ගැනීම, ආහාර සැපයුම් උපකරණ සහ ඇතැම් වියළි ද්‍රව්‍ය නැවත ඇසිරීම සහ සංවිධානය කිරීම, ගුවන් යානය අභ්‍යන්තරයේ සේවාවන් කෙරෙහි අවධානය යොමු කිරීම ආදී උපායමාර්ගයන් මගින් ඉන්ධන දහනය අඩු කිරීම ඇතුළත් වේ. නඩත්තු සේවා සඳහා යොමු කිරීමට නොහැකි මීල් කාර්ට්, වේස්ට් කාර්ට් සහ බහාලුම් ආදිය සමාගම අභ්‍යන්තරය තුළ දී ම අලුත්වැඩියා කිරීම සිදු විය. එපමණක් නොව, ගුවන්යානය අභ්‍යන්තරයේ භාවිත කෙරෙන සියළුම අත්පොත් ඉලෙක්ට්‍රොනික ආකෘතියට පරිවර්තනය කරන ලද අතර කාර්ය මණ්ඩලයට පරිගණක පද්ධතිය ඔස්සේ පහසුවෙන් ඊට ප්‍රවේශ විය හැකිය. කැබින් කාර්ය මණ්ඩල සාමාජිකයින් 1,100 ක් සඳහා එම අත්පොත් මුද්‍රණය කිරීමේ පිරිවැය ඉතිරි කර ගැනීමට කටයුතු කෙරිණ.

දිගු දුර ගුවන් ගමන් වලදී ආනයනය කරන ලද චොකලට් වෙනුවට දේශීය රසකැවිලි වර්ග රාශියක් ගුවන් මගීන් සඳහා ලබා දී ඇති අතර එමඟින් මගීන්ට ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් හැඟීමක් ගෙන දීමට කටයුතු කෙරිණ. මීට අමතරව, පාර්භෝගික තෘප්තිය තක්සේරු කිරීම හා කාර්ය මණ්ඩලයේ චිත්ත ධෛර්යය ඉහළ නැංවීම සඳහා කාර්ය මණ්ඩල ක්‍රියාකාරකම් මාලාවක් සිදු කරන ලදී.

COVID-19 හි ඇති වූ පසුබෑම නොතකා ඉදිරි වර්ෂයේදී යානාස්ථ සේවා දියුණු කිරීම සඳහා උපායමාර්ගික ප්‍රමුඛතාවයක් ලබා දෙනු ඇත. පිරිවැය ප්‍රශස්ත කරන අතරම, අවශ්‍ය පුහුණුව, නියැලීම සහ සේවා වැඩි දියුණු කිරීම් සඳහා අඛණ්ඩ ව ආයෝජන සිදු කරනු ඇත.

### යානාස්ථ තීරුබදු රහිත මිළදී ගැනීම් *(Inglight Duty Free)*

ගමනේ අවසාන මොහොතේ සිදු කෙරෙන සාප්පු සවාරියක් හෝ ආදරණීයෙකුට දෙන තෑග්ගක් වුව ද ශ්‍රීලංකන් ගුවන්සේවය ඉහළ අහසේ දී උසස් පාර්භෝගික අත්දැකීමක් තිළිණ කරමින් පුළුල් පරාසයක සන්නාමගත සුවඳ විලවුන්, ස්වර්ණාභරණ, ඔරලෝසු, මත්පැන්, තේ, ආලේපන, සම ආරක්ෂණ නිෂ්පාදන සහ තවත් බොහෝ දේ සඳහා පුළුල් නාමාවලියක් ඔස්සේ නිෂ්පාදන මිළ දී ගැනීමේ සුවිශේෂී අවස්ථාවක් හිමි කර දෙනු තිබේ. FlySmiLes සාමාජිකයින්ට ද ඔවුන් උපායගත් මයිල්ස් ප්‍රමාණය අනුව ගුවන් යානය තුළ දී සිදු කරන මිළ දී ගැනීම් සඳහා වරප්‍රසාදය හිමි වේ.

අතිරේක ආදායම් උත්පාදනය සඳහා ප්‍රමුඛ දායකයෙකු ලෙස කටයුතු කරන යානාස්ථ තීරුබදු රහිත මිළදී ගැනීම්, සමාලෝචනයට භාජනය වන කාල සීමාව තුළ ආදායම ප්‍රශස්ත කිරීම, වැඩි දියුණු කිරීම සහ පිරිවැය කළමනාකරණය කිරීම සඳහා වැදගත් උපාය මාර්ග ක්‍රියාත්මක කරන ලදී. 2019 අප්‍රේල් මාසයේ දී මුහුණ දුන් අභියෝග මධ්‍යයේ වුවද, අභ්‍යන්තර මෙහෙයුම් ආරම්භ කිරීමෙන් පසු 2019 දෙසැම්බර් සහ 2020 ජනවාරි මාසවලදී වාර්තා වූ ඉහළම විකුණුම් ලබා ගැනීමට යානාස්ථ තීරුබදු රහිත මිළදී ගැනීමේ අංශය සමත් විය. මෙම ජයග්‍රහණය සඳහා දායක වූ සාධක වූයේ මගීන්ට පිරිනමන ප්‍රවර්ධන පරාසය සහ විවිධාකාර සන්නාමගත භාණ්ඩ එකතුවක් තිබීමයි. කණ්ඩායමක් ලෙස වඩා හොඳ කාර්ය සාධනයක් සඳහා ඔවුන් පෙළඹවීමට යානාස්ථ තීරුබදු රහිත මිළදී ගැනීම් අංශයේ ඉහළම විකුණුම් අනුව හොඳම කාර්ය සාධනයක් පෙන්නුම් කළ අතර ඒ සඳහා නිසි පිළිගැනීමක් ලබා දෙනු ලැබිණ.



## ව්‍යාපාර ඒකක සමාලෝචනය

### ශ්‍රීලංකන් ගුවන්තොටුපල සහ ගොඩබිම් සේවා

ගුවන්තොටුපල සහ ගොඩබිම් සේවා අංශය විසින් ආරක්ෂාව, නිරවද්‍යතාවය සහ සේවය ආදී එහි මූලික සාරධර්ම තහවුරු කරමින් තවත් අභියෝගාත්මක වසරක් සම්පූර්ණ කළේය. පාස්කු ඉරිදා ප්‍රහාරය සහ COVID-19 ව්‍යාප්තිය හේතුවෙන් ශ්‍රීලංකන් ගුවන් සේවාවේ මෙන්ම සහයෝගීතා ගුවන් සමාගම්වල මෙහෙයුම් අඩුවීම මූල්‍ය වර්ෂයේ ආරම්භය හා අවසානය තුළ ආදායම සැලකිය යුතු ලෙස අඩු කිරීමට හේතු විය.

කෙසේ වෙතත්, සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ හැසිරවීමේ විශ්වසනීයත්වය 99.7% ක් සහ නියමිත වේලාවට දැක් වූ කාර්ය සාධනය 87% ක් වූ එමඟින් ගුවන් සේවය IATA ප්‍රමිතිය ලබා ගැනීමට සමත් විය.

හසුරුවන ලද ගුවන් යානා සංඛ්‍යාව




හසුරුවන ලද මගීන් සංඛ්‍යාව




වර්ෂය තුළදී, ගුවන්තොටුපල සහ ගොඩබිම් සේවා අංශය විසින් ශ්‍රීලංකාවෙන් පිටත්වීම් 15,800 ක් මෙහෙයවා ඇති අතර ඒ හා සමාන පැමිණීම් සංඛ්‍යාවක් ද සිදු කර ඇත. එම කාලය තුළ දී මගීන් මිලියන 5.3 ක් කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ හරහා ගමන් කර ඇති අතර ඔවුන්ගේ ගමන් මලු මිලියන 7.2ක් ද හැසිරවීමට ගුවන්තොටුපළ හා ගොඩබිම් සේවා අංශ මගින් සිදු වී ඇත. මීට අමතරව, සහයෝගීතා මගී ගුවන් ගමන් වාර 12,900 ක මගීන් මිලියන 4 දෙනෙක් හැසිරවීමට ද මෙම අංශය සමත් විය.

වැරදි ලෙස ගමන් මලු යොමු වීමේ අනුපාතය 0.78% ක් ලෙස වාර්තා කළ අතර සමස්ත කර්මාන්තය තුළ දක්නට ලැබෙන අනුපාතය වන 1.2% ට වඩා බෙහෙවින් අඩු මට්ටමක පවතී. මගීන්ගේ ගමන් මලු පිළිබඳ දැනුවත්භාවය සහ අඛණ්ඩ විගණන පැවැත්වීම තුළින් ආරක්ෂිත අංශය හොඳින් පවත්වා ගෙන ගිය අතර අතිරික්ත ගමන් මලු ආදායම ද වැඩි විය.

මූල්‍ය වර්ෂය අවසානයේදී, COVID-19 වසංගතය නිසා ගුවන්තොටුපල සහ භූමි සේවා සඳහා එල්ල කළ ආතතිය අන් සියලු ක්ෂේත්‍රවල මෙන් ම ඉතා බරපතළ ලෙසින් දැනෙන්නට විය. හැකි සෑම ආකාරයකින්ම පිරිවැය අඩු කිරීම අත්‍යවශ්‍ය වන අතර ආයෝජන සැලසුම් අත්හිටුවා ඇතත්, ගුවන්තොටුපල සහ ගොඩබිම් සේවා සඳහා වඩා හොඳ අනාගතයක් ලබා සඳහා ඉහළ බලාපොරොත්තුවක් හා උද්යෝගයකින් යුතුව සැලසුම් සකස් කර තිබේ. අනාගත අභියෝගයන්ට මුහුණ දීම සඳහා මානව සම්පත සංවර්ධනය කිරීමේ අරමුණින්, මන්දගාමී කාලවලදී ඉවත දැමිය හැකි කාලය විවිධ පුහුණු සඳහා යොදා ගැනීම සිදු විය.

ඉදිරි මූල්‍ය වර්ෂයේදී ශ්‍රීලංකන් විසින් නැවත ලියාපදිංචි කිරීම සිදු කළ අතර ගොඩබිම් මෙහෙයුම් සඳහා වන IATA ආරක්ෂිත විගණනය (ISAGO) සහ IATA මෙහෙයුම් ආරක්ෂණ විගණනය (IOSA) සඳහා වන සහතික ලබා ඇති බැවින් ශ්‍රී ලාංකා ගුවන්තොටුපල සහ ගොඩබිම් සේවා කොළඹ හරහා පියාසර කරන සියලුම ගුවන් සමාගම් වලට සියලු ආරක්ෂක ප්‍රමිතීන් පවත්වා ගෙන යන අතරම, වැඩි ඵලදායිතාවක් පවත්වා ගනිමින් සේවය කිරීමට සූදානම් බව සහතික කෙරේ.

### ඉංජිනේරු අංශය

වර්ෂය තුළ මුහුණ දුන් අභියෝගාත්මක සිදුවීම් වලින් පසුව, ශ්‍රීලංකන් ඉංජිනේරු අංශය සමාගමේ ව්‍යාපාර වැඩිදියුණු කිරීමේ මූලාරම්භයන්හි ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කළේය.

මෙම අංශය එහි සැපයුම්කරුවන් සහ නඩත්තු හවුල්කරුවන් සමඟ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සහ ගාස්තු නැවත සමාලෝචනය කිරීම තුළින් ගුවන් යානා නඩත්තු පිරිවැය අඩු කිරීමට උත්සාහ කළ අතර සමාගමේ ගුවන් යානා නඩත්තු පිරිවැය වසරින් වසර අගය අනුව 15% කින් අඩු කළේය. එහි රේඛීය නඩත්තු හා පදනම් නඩත්තු සේවා පිරිනැමීම පුළුල් කිරීම තුළින් ද ආදායම් උත්පාදනය වැඩි දියුණු කරන ලදී.

වර්ෂය තුළදී, ශ්‍රීලංකන් ගුවන් සමාගමේ රේඛීය නඩත්තු මෙහෙයුම මගින් බෝයිං 737 සහ 787 ගුවන් යානා සහතික කිරීම සඳහා අනුමැතිය ලබා ගන්නා ලද අතර සමාගමේ එයාර්බස් සහ බෝයිං ගුවන් යානාවලට අමතර ව කොළඹ, ශ්‍රී ලංකාව සහ මාලදිවයිනේ නඩත්තු මධ්‍යස්ථාන දැනටමත් අවසර ලබා ඇත. කලාපයේ පාරිභෝගික ගුවන් සමාගම් සඳහා නඩත්තු වැඩසටහන් කිහිපයක් සාර්ථකව නිම කිරීමත් සමඟ බාහිර ගනුදෙනුකරුවන් සඳහා පදනම් නඩත්තු කටයුතු නැවත ආරම්භ කරන ලදී.

කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ වැඩසටහනේ කොටසක් ලෙස, ඉංජිනේරු අංශය සිය වැඩමුළු අනුමත කිරීම් සහ ප්‍රතිතනයන් සාර්ථකව පුළුල් කළ අතර, කලින් බාහිරින් ලබාගත් නඩත්තු කාර්යයන් ගණනාවක් අභ්‍යන්තර වශයෙන් ඉටු කර ගැනීමට හැකි විය. මෙම අංශය මගින් ගුවන් යානා ආසන ආවරණ ගෘහස්ථව නිෂ්පාදනය කිරීම ආරම්භ කළ අතර එමඟින් විදේශීය සැපයුම්කරුවන්

# කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය සබැඳේ.

වෙතින් ගෙන්වා ගැනීමට වැය කළ යුතු වූ පිරිවැය සැලකිය යුතු ලෙස ඉතිරි කර ගත හැකි විය.

ශ්‍රී ලංකාව ප්‍රමුඛ ගුවන් යානා නඩත්තු මධ්‍යස්ථානයක් බවට පත්කිරීමේ ප්‍රයත්නයේ දී ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ ගුවන් යානා නඩත්තු මධ්‍යස්ථානයක් බවට පත්කිරීමේ ප්‍රයත්නයේ දී තෝරාගත් ගුවන් යානා කොටස් අළුත්වැඩියා කිරීමේ ක්‍රියාකාරකම් හඳුන්වාදීමත් සමඟ අභ්‍යන්තර හැකියාවන් පුළුල් කිරීම සඳහා තවදුරටත් වැඩසටහන් ක්‍රියාත්මක වේ.

මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපලේ ගුවන් යානා නඩත්තු, අළුත්වැඩියා සහ පිළිසකර කිරීමේ (MRO) නව අංශයක් නිර්මාණය කිරීම සඳහා මූලික සැලසුම් කටයුතු සිදු කරන ලද අතර, ගුවන් සේවය විසින් සිදු කරනු ලබන බාහිර පාරිභෝගික නඩත්තු කටයුතු පුළුල් කිරීම සහ කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේ දැනට පවතින අවකාශ සීමාවන් ගැටලුව නිරාකරණය කර ගැනීම මෙහි අරමුණයි.

පාස්කු ප්‍රහාරයෙන් පසුව ඉල්ලුමේ යම් පසුබෑමක් දක්නට ලැබුණු හෙයින්, ගුවන් සමාගම සිය අතිරික්ත ධාරිතාව අනෙකුත් ගුවන් මෙහෙයුම්කරුවන් සමඟ නැවත යෙදවීමට උත්සාහ කළේය. ගුවන් යානා කල්බදු කළමනාකරණයේ වගකීම ද දරන ඉංජිනේරු අංශය, ඕමාන් එයාර් සමඟ සාර්ථක ලෙස කාර්ය මණ්ඩලය සමඟ උපකල්බදු ගිවිසුමක් ක්‍රියාත්මක කිරීමට සමත් විය.

ගුවන් සමාගමේ ගුවන් යානා කල්බදු පිරිවැය සහ නඩත්තු පිරිවැය අඩු කිරීම සඳහා, වසර 19ක් පැරණි එයාර් බස් ඒ 330 ගුවන් යානයක මෙහෙයුම් බද්ද අවසන් කර ගුවන් යානය නැවත එහි බදුකරුට භාර දෙන ලදී. මෙම ක්‍රියාකාරකම ගුවන් සමාගමේ නඩත්තු පිරිවැය අවම කිරීමටත්, මූල්‍ය වර්ෂයේ සිදුවීමට නියමිත ප්‍රධාන නඩත්තු කටයුතු සඳහා පිටතට මුදල් ගලා යාම වළක්වා ගැනීමටත්, නැවුම් ගුවන් යානා සමූහයක් කරා යොමු වීම මගින් විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීමටත් උපකාරී විය. ඩොලර් මිලියන කිහිපයක් ගුවන් සමාගමට ඉතිරි කර දෙමින් ගුවන් සමාගමේ බදුකරුවන් සමඟ නැවත සාකච්ඡා කිරීම් ගණනාවක් ද සිදු කරන ලදී.

COVID-19 වසංගතය සැලකිල්ලට ගනිමින්, සියළුම ගුවන් යානා නඩත්තු සේවකයින්ගේ ආරක්ෂාව සහතික කිරීමට පියවර ගත් අතර නඩත්තු නඩත්තු අංගනවල සනීපාරක්ෂාව තහවුරු කිරීම සඳහා රජයේ රෙගුලාසි ක්‍රියාත්මක කරන ලදී. අපගේ මගීන්ගේ සහ මෙහෙයුම් කාර්ය මණ්ඩලයේ ආරක්ෂාව සහතික කිරීම සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානය සහ අනෙකුත් නියාමන මාර්ගෝපදේශයන්ට අනුකූලව ගුවන් යානා නිරන්තරයෙන් ධූමකරණය හා විෂබීජ නාශක සඳහා යොමු කිරීමේ නව ක්‍රියාවලීන් හඳුන්වා දෙන ලදී. අත්‍යවශ්‍ය සේවා සැපයුම්කරුවෙකු ලෙස, අපගේ නඩත්තු වෘත්තිකයන් ශ්‍රී ලංකාව සහ මාලදිවයින වෙත ක්‍රියාත්මක වන ශ්‍රීලංකන් මෙන් ම බාහිර යානා එම රටවල ඇඳිරි නීතිය සහ අගුලු දැමීමේ කාලපරිච්ඡේදයන් සඳහා අනුගත වෙමින් ඔවුන්ගේ කාර්යයන් ඉටු කළ අතර, ශ්‍රීලංකන් ඉංජිනේරු අංශය සිය විශ්වාසදායක හා කැපවූ සේවාව ලබා දීම සාර්ථක ලෙස සම්පූර්ණ කෙළේය. එක් එයාර් බස් A330 ගුවන් යානයක් කෙටිකාලීන ගුවන් භාණ්ඩ සඳහා විශේෂිත ගුවන්යානයක් බවට පරිවර්තනය කිරීම ද මෙම අංශය විසින් සම්පූර්ණ කරන ලදී.

වර්ෂය තුළ සිදු කරන ලද පුහුණු හා අතිරේක සංවර්ධන වැඩසටහන් තුළින් තම සේවකයින්ගේ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා අභියෝගාත්මක වෙළඳපල තත්වයන් සහ මූලපිරීම් තිබියදීත් ශ්‍රීලංකන් ඉංජිනේරු අංශය ක්‍රියාකරමින් එහි කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව වැඩි දියුණු කිරීමට පියවර ගත්තේය. මෙම අංශයේ පළමු කණ්ඩායමේ වෘත්තිකයන් සේවාස්ථ ඵලදායීතා කළමණාකරණ මූලධර්ම පිළිබඳ පුහුණුව සාර්ථකව නිම කළ අතර ඊළඟ වසරේ දී අවධානය යොමු කරනුයේ ඔවුන්ගේ ඩිජිටල් කුසලතා වර්ධනය කිරීම සඳහා යි.

### ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යායතනය (SLAC)

ශ්‍රීලංකන් ගුවන් සමාගමේ පුහුණු ආයතනය වන්නේ ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යායතනයයි. සමාලෝචනයට බඳුන් කළ වර්ෂය තුළදී එම විද්‍යායතනය ඉතා වැදගත් කාර්ය සාධනයක් පෙන්නුම් කිරීමට සමත්විය. මෙම විද්‍යායතන විසින් ඉතා ඉහළ පිළිගැනීමක් ඇති පුහුණු සහ ශාස්ත්‍රීය ආයතන රැසක් සමග සහයෝගිතා වැඩසටහන් සඳහා යොමු වීමට සමත් විය. ඒ ඔස්සේ ශිෂ්‍යයන්ට සහ වෘත්තිකයන්ට ඉහළ දැනුමක් සහ පුහුණු අවස්ථාවක් ලබා ගැනීමට ඉඩ සැලසිණ. 2019/2020 වර්ෂයේ දී ආසියා පැසිපික් කලාපයේ ඉහළම කාර්යසාධනයක් ඇති ආයතනයක් වශයෙන් ශ්‍රී ලන්කන් ගුවන් සේවා විද්‍යායතනයේ IATA ආයතනය මගින් පිළිගැනීමට ලක්විය.

ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යායතනය මගින් පවත්වනු ලබන ඉහළම පුහුණු පාඨමාලාව වන්නේ ගුවන් යානා නඩත්තුව සහ ගුවන් ඉංජිනේරු විද්‍යාවයි. මෙම පාඨමාලාව සඳහා ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ (CAASA) මෙන්ම යුරෝපීය ගුවන් සේවා ආරක්ෂණ නියෝජිතායතනයේ (EASA) මාලදිවයින් සිවිල් ගුවන් සේවා අධිකාරියේ (MCAA) සහ පාකිස්තානු සිවිල් ගුවන් සේවා අධිකාරියේ (PCAA) අනුමැතිය ලැබී ඇත. තවද ශ්‍රීලංකන් ගුවන්සේවා විද්‍යායතනය ISO 9001:2015 (තත්ව කළමනාකරණ පද්ධතිය) තත්ව සහතිකයෙන් තහවුරු කර ඇත.

### රාජ්‍ය නොවන උපාධි පිරිනමන උසස් අධ්‍යාපන ආයතනයක තත්ත්වය ලබා ගැනීම

රාජ්‍ය නොවන උපාධි පිරිනමන උසස් අධ්‍යාපන ආයතනයක තත්ත්වය ලබා ගැනීම සඳහා ශ්‍රී ලන්කන් ගුවන් සේවා විද්‍යායතනය මේ වන විට විශ්ව විද්‍යායතනය ප්‍රතිපාදන කොමිෂන් සභාව සමග සාකච්ඡා කරමින් සිටී. ශ්‍රී ලන්කන් ගුවන් සේවා විද්‍යාලය මේ වන විට සිය ආයතනික සමාලෝචන වාර්තාව (IRR) හා විෂය සමාලෝචන වාර්තාව (SRR) අවසන් කරමින් සිටී. සත්කාරක සේවා සහ සංචාරන කළමනාකරණය පිළිබඳව (ගුවන් සේවා) මූලික උපාධියක් සඳහා විෂය නිර්දේශ සකස් කිරීම බොහෝ දුරට අවසන් කර තිබේ. ඊට අමතරව ගුවන් සේවා කළමනාකරණය සම්බන්ධයෙන් විද්‍යාවේදී උපාධියක් පිරිනැමීම සඳහා ද විෂය නිර්දේශ සකස් කරමින් පවතී. උපාධි ආයතනයක තත්ත්වය ලබා ගැනීමෙන් පසු එම උපාධි යුගල මුලින්ම හඳුන්වා දීමට නියමිතයි ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යායතනය සංචාරක සහ ගුවන් සේවා අමාත්‍යාංශය සමඟ සම්බන්ධ වෙමින් විශ්ව විද්‍යාලයේ අධ්‍යයන සංවිධාන සැලැස්ම මේ වන විට නිම කරමින් සිටින අතර ඊට අදාළ වන නෛතික ආකෘති ද සකස් කරමින් සිටියි.

### ජාතික ගුවන් සේවා පුහුණු වැඩපිළිවෙලක් නිර්මාණය කිරීම

සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා (DGCA) විසින් අන්තර්ජාලය මත පදනම් වූ ජාතික ගුවන් සේවා පුහුණු වැඩපිළිවෙළක්

ගොඩනැඟීම සඳහා ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යායතනයේ පත්කරනු ලැබීය. ඒ සඳහා ශ්‍රී ලංකා තොටුපළ සහ ගුවන් සේවා අධිකාරියේ CAASL සහයෝගය ලබා ගැනේ. අන්තර්ජාලය මත පාදක වූ මෙම නිමැවුම ගුවන් සේවා සම්බන්ධයෙන් පුහුණුවීම් සපයන නියාමන කරන ලද සියලුම සේවාදායකයන්ට ද්වාරයක් බවට පත් වන අතර එය තුළින් ඔවුනට ජාත්‍යන්තර වශයෙන් අවධානයක් දිනා ගැනීමට ඉඩ සැලසේ එසේම ගුවන් සේවා ක්ෂේත්‍රය සම්බන්ධයෙන් පුහුණු කිරීම් සිදු කරන ජනප්‍රිය රටක් බවට ශ්‍රී ලංකාවට පත්වීමේ ඉඩකඩ ද එමගින් සැලසේ.

### අනුමත පුහුණු සංවිධාන (ATO) තත්ත්වය ලබා ගැනීම

CAASL වෙතින් අනුමත පුහුණු සංවිධානක (ATO) තත්ත්වය ලබා ගැනීම සඳහා ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යායතනය කටයුතු කරමින් සිටී. මෙම අනුමැතිය ලබා ගැනීමෙන් පසු, ශ්‍රීලංකන් ගුවන් සේවාවිද්‍යායතනයට ගුවන් පුහුණුව පිළිබඳ ඉහළ තලයකට පැමිණීමට හැකි වනු ඇති අතර, විශේෂයෙන් ජාත්‍යන්තර ගුවන් සමාගම් සහ විදේශීය සිසුන් ආකර්ෂණය කර ගනිමින් කලාපයේ වඩාත් සුදුසුකම් ලත් පුහුණු සැපයුම්කරුවෙකු බවට පත්විය හැකිය. අනුමත පුහුණු සංවිධානයක් මගින් කැබින් ආරක්ෂාව, ගුවන්තොටුපල මගීන් හැසිරවීම, අන්තරාදායක භාණ්ඩ හා භාණ්ඩ ප්‍රවාහනය, Ramp සම්බන්ධීකරණය පිළිබඳ පදනම් පාඨමාලාව සහ ICAO 201 ෆ්ලයිට් ඩිස්පැච්ර් වැඩසටහන් ආවරණය කරනු ඇත.

### ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) ලබා ගැනීම

වෘත්තීය අධ්‍යාපන ආයතනය යටතේ ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යායතනය සහ ශ්‍රීලංකන් කාර්මික පුහුණු (STT) ආයතනය තෘතීයික අධ්‍යාපන අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) යටතේ ලියාපදිංචි කර ඇත.

- මූලික ගුවන් යානා නඩත්තු වැඩසටහන සඳහා NVQ තත්ත්වය ලබා ගැනීමට ද ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යායතනය කටයුතු කරමින් සිටී. TVEC සමඟ මූලික සාකච්ඡා පවත්වා ඇති අතර ආයතනය ජාතික නිපුණතා ප්‍රමිතිය (NCS) දක්වා සංවර්ධනය කරමින් සිටින අතර උසස් අධ්‍යාපන සුදුසුකමක් (උපාධි / විද්‍යාපති උපාධි) ලබා ගැනීම සඳහා අවස්ථාව හිමි කර දෙයි.
- ශ්‍රීලංකන් ගුවන් සේවාවිද්‍යායතනය ICAO 201 ගුවන්යානා පිටත්කර හරින්නන් (Flight Dispatcher) වැඩසටහන සඳහා NVQ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් සිටින අතර, ක්ෂේත්‍රයේ සේවය කරන ගුවන්යානා පිටත් කරුවන්ට හැදෑරීමට හැකි වන පරිදි NVQ LEVEL 6 (උසස් ජාතික ඩිප්ලෝමාව) හි ස්ථානගත කිරීමට නියමිතයි. විශ්ව විද්‍යාල විෂය මාලාවට පාර්ශ්වීය ප්‍රවේශයක් ලබා දීමෙන් උසස් අධ්‍යාපන සුදුසුකම් (උපාධි, විද්‍යාපති උපාධි) ලබා ගැනීමට ද මෙහි දී හැකි වේ. ක්‍රියාවලිය දැන් එහි අවසාන සත්‍යාපන අදියරෙහි පවතී.
- ශ්‍රීලංකන් ගුවන් සේවාවිද්‍යායතනය සංචරණ හා සංචාරක වැඩසටහන සඳහා NVQ ප්‍රතීතනය ලබා ගැනීමට කටයුතු කරමින් සිටින අතර, විශ්ව විද්‍යාල විෂය මාලාවට පාර්ශ්වීය ප්‍රවේශයක් ලබා ගැනීම සඳහා සංචාරක විධායක / සංචරණ හා සංචාරක මෙහෙයුම් විධායක / සංචාරක නියෝජිත / සංචාරක සහකාර වෘත්තිකයින්ට NVQ මට්ටම 4 ලබා දීමට මෙහි දී අපේක්ෂා කෙරේ. ඔවුන්ගේ වෘත්තීය පළපුරුද්ද තුළින් උසස් අධ්‍යාපන සුදුසුකමක් ලබා ගැනීමට මෙහි දී දොරටු විවෘත වේ.

### එම්බ්‍රි රිඩල් විශ්ව විද්‍යාලය සමඟ යෝජිත හවුල්කාරිත්වය

ලෝක ප්‍රකට එම්බ්‍රි-රිඩල් ගුවන්නාවික විශ්ව විද්‍යාලය (ERAU) සමගින් ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යාලය කටයුතු කරන අතර ගුවන් සේවා ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාපති (MBAA) ගුවන්යානා විද්‍යාව පිළිබඳ විද්‍යාපති (MSA) සහ ගුවන් නඩත්තු පිළිබඳ විද්‍යාපති (MAM) ආදී උපාධි පිරිනැමීම සඳහා අවශ්‍ය පියවර ගනිමින් සිටී. සියලුම වැඩසටහන් ශ්‍රී ලංකාවේදී පිරිනැමෙන අතර ඉහළ පිරිවැයකින් විදෙස් ගත වීමට බරක් නොවීමෙන් සිසුන්ට ඉමහත් ප්‍රයෝජන අත් වේ.

### ගුවන් යානා නඩත්තු ප්‍රායෝගික පුහුණු ව්‍යාපෘතිය

ගුවන් යානා හා යාන්ත්‍රික ක්ෂේත්‍ර යටතේ ගුවන් යානා නඩත්තු පුහුණු පාඨමාලා හදාරන සිසුන්ට ප්‍රායෝගික පුහුණුව වැඩි දියුණු කිරීම හා සංවර්ධනය කිරීම විද්‍යාලය අඛණ්ඩව සිදු කරයි. යෝජිත වැඩසටහන යටතේ පියාසර කිරීම සඳහා එතරම් සුදුසු නොවන ආයු කාලය අවසන් වෙමින් ඇති ගුවන් යානයක් යෙදවීමෙන් ප්‍රායෝගික අත්දැකීම් ලබා දීම ඔස්සේ තවදුරටත් අගය එකතු කරයි. ව්‍යුහ වැඩමුළු සහ විදුලි රැහැන් අන්තර් සම්බන්ධතා පද්ධතිය (EWIS) සඳහා ප්‍රායෝගික පහසුකම් මෙහි දී ලබා දෙනු ඇත.

### භූගෝලීය විවිධාංගීකරණය

බංග්ලාදේශය සහ මාලදිවයින වැනි විදේශ වෙළෙඳපොළවල ශක්‍ය පුහුණු අවස්ථා ගවේෂණය කිරීමට අමතරව, උතුරු හා නැගෙනහිර පළාත්වල බලයලත් පුහුණු ආකෘතියක් ස්ථාපිත කිරීමට ද ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යායතනය සැලසුම් කර ඇත.

### කිංස්ටන් විශ්වවිද්‍යායතනය සමඟ හවුල්කාරිත්වය

ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යාලය, ලන්ඩනයේ කිංග්ස්ටන් විශ්ව විද්‍යාලය සමඟ එක් ව ඉංජිනේරු උපාධිය (ගෞරව) හැදෑරීම සඳහා කණ්ඩායම් දෙකක් බඳවා ගැනීම සාර්ථකව සිදු කළේය. රාජකීය ගගනගාමී සංගමය විසින් ප්‍රතීතනය කර ඇති EASA කාණ්ඩයේ බී බලපත්‍ර සහතිකයක් දක්වා සුදුසුකම් ලබන සිසුන්ට ගෞරව උපාධියක් ලබා ගැනීමට මෙම වැඩසටහන යටතේ හැකි වෙයි. තවද, කිංග්ස්ටන් විශ්ව විද්‍යාලය වෙනුවෙන් ශ්‍රී ලංකා කථිකාචාර්යවරුන් සේවයේ යොදා ගනිමින් ඉහළම උපාධිය ලබා දීම සඳහා අදාළ වන වලංගු කිරීමේ ක්‍රියාවලිය සාර්ථකව නිම කරන ලදී. කිංග්ස්ටන් විශ්ව විද්‍යාලයේ දේශන මණ්ඩලයේ සාමාජිකයෙකු වීමට නිවැරදි සුදුසුකම් සහිත රටේ ඕනෑම කථිකාචාර්යවරයකුට හැකි වන අතර එය සමස්තයක් ලෙස විශාල ජයග්‍රහණයක් වනු ඇත.

පූර්ණ ගුවන් ප්‍රවාහන නියමු බලපත්‍රය (ATPL) සහිත ගුවන් නියමුවන්ට වාණිජ නියමු පුහුණුව සඳහා වන ගුවන් අධ්‍යයන පිළිබඳ ගෞරව උපාධියක් (ගෞරව) පිරිනැමීමට ද විද්‍යාලය කටයුතු කර ඇත. මෙහි ඇති අමතර වාසිය නම්, මෙම වැඩසටහන අන්තර්ජාලය මඟින් ලබාදෙන අතර පියාසර කිරීමේ රාජකාරිවල නිරත වන අතරතුර නියමුවන්ට ගෞරවනීය සුදුසුකමක් ලබා ගැනීමට ඉඩ සැලසීමයි.

### ශ්‍රීමත් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය (KDU) සමඟ හවුල්කාරිත්වය

ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය (KDU) ඒකාබද්ධව පිරිනමන ගුවන් යානා නඩත්තු ඉංජිනේරු උපාධි පාඨමාලාව හදාරන විද්‍යායතනයේ සිසුන්ට මෙම සිව් අවුරුදු උපාධි වැඩසටහන මඟින් ගුවන් යානා නඩත්තු ඉංජිනේරුවන් ලෙස ඔවුන්ගේ අනාගත කාර්යභාරය සිදු කිරීමට හැකි පරිසරයක් නිර්මාණය වේ. ඒ සඳහා සිසුන් වඩාත් නිපුණතාවකින් හා විශ්වාසයෙන් යුතුව

# කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය සබැඳේ.




සූදානම් කිරීම කෙරෙහි අවධානය යොමු කරයි. ගුවන් යානා ආශ්‍රිත සුදුසුකම් ඒකාබද්ධව ලබා දීම සඳහා ඇති තවත් අවස්ථාව සහ හැකියාවන් සෙවීම සඳහා ආයතන දෙක අතර තවදුරටත් සාකච්ඡා ආරම්භ කරනු ලැබේ. ගුවන් යානා ඉංජිනේරු සහ ගුවන් යානා නඩත්තු ඉංජිනේරු උපාධි අපේක්ෂකයින්ට ශ්‍රීලංකන් ගුවන් සේවයේ කාර්මික පුහුණුව සාර්ථකව නිම කිරීම සඳහා ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යායතනය විසින් අවස්ථාව ලබා දීමෙන් කොතලාවල ආරක්ෂක විද්‍යාලයට සහාය දක්වයි.

### *යුරෝපීය ආරක්ෂක ඒජන්සිය (EASA) බලයලත් විභාග මධ්‍යස්ථානය*

විදේශයන්හි හෝ දේශීයව සිටින ඕනෑම බාහිර සිසුවෙකු සඳහා EASA 66 වන කොටසට අදාළ විභාග පැවැත්වීම සඳහා ශ්‍රීලංකන් ගුවන් සේවා විද්‍යාය සුදුසු බවට EASA විසින් අනුමත කර ඇත.

### *ගුවන් යානා නඩත්තු පුහුණු පාඨමාලා අන්තර්ගතයන් යාවත්කාලීන කිරීම*

SLAC හි ගුවන් යානා නඩත්තු පුහුණු අංශය වන ශ්‍රීලංකන් කාර්මික පුහුණු (STT) ආයතනය ගුවන් යානා නඩත්තු පුහුණු පාඨමාලා සඳහා (EASA) හා අනුමැතිය ලබා ගැනීමේ ප්‍රධාන ව්‍යාපෘතියක් සාර්ථකව නිම කළේය. මෙම ව්‍යාපෘතිය මාස හතරක් ඇතුළත නිම කරන ලදී. දැනට යාවත්කාලීන කරන ලද සටහන ලෝකයේ හොඳම එකක් ලෙස සැලකිය හැකි අතර නියාමකයින්ගෙන් ද යහපත් ප්‍රතිචාරයක් ලැබී ඇත.

### *අන්තර්ජාලය හරහා පුහුණුව දියත් කිරීම*

SLAC, ශ්‍රීලංකන් තොරතුරු තාක්ෂණ අංශය සමඟ එක්ව මයික්‍රොසොෆ්ට් ටීම් මෘදුකාංගය එහි මාර්ගගත පුහුණු වේදිකාව ලෙස භාවිතා කරමින් සමකාලීන දුරස්ථ ඉගෙනුම් ක්‍රියාවලියක් (අන්තර්ජාලය හරහා පුහුණුව) වර්ධනය කළේය. මෙම ක්‍රියාවලිය යුරෝපීය සංගමයේ ගුවන් සේවා ආරක්ෂණ ඒජන්සිය (EASA), ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන් සේවා අධිකාරිය (CAASL) සහ මාලදිවයින් සිවිල් ගුවන් සේවා අධිකාරිය (MCAA) විසින් පිළිගනු ලැබේ. අන්තර්ජාල පුහුණුව දියත් කිරීම වර්තමාන COVID-19 වසංගය හේතුවෙන් කඩිනමින් සොයා ගන්නා ලද විසඳුමක් වන අතර සපයනු ලබන ඕනෑම ආකාරයක ගුවන් යානා පුහුණුවක් සඳහා විකල්පයක් ලෙස එය තවදුරටත් සංවර්ධනය කෙරේ. අන්තර්ජාලය ඔස්සේ ඉදිරිපත් කරන ලද පළමු වැඩසටහන වූයේ ගුවන් යානා නඩත්තු පුහුණුව පිළිබඳ මූලික පාඨමාලාවයි.

### *පරිසර හිතකාමී පුහුණුව*

පුහුණුවීමේදී වගකිවයුතු පාරිසරික භාවිතයන් ප්‍රවර්ධනය කිරීම මගින් විද්‍යාලයේ හරිත මූලාරම්භයන් සඳහා අඛණ්ඩව සහයෝගයක් දක්වන අතර පුහුණු ආධාරක භාවිතා කිරීම, අත්පොත් සකස් කිරීම සහ විභාග පැවැත්වීම සම්බන්ධයෙන් කඩදාසි රහිත වීමට දරන උත්සාහයන් කෙරෙහි අවධානය යොමු කර ඇත. SLAC පොලිතින් රහිත කලාපයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත.

### ශ්‍රීලංකන් කේටරින් සමාගම

ශ්‍රීලංකන් කේටරින් සමාගම යනු ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමෙහි පූර්ණ හිමිකාරිත්වය දරන ආයතනයක් වන අතර එය බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ යානාස්ථ ආහාර සපයන එකම සැපයුම්කරු වන අතර ශ්‍රීලංකන් සමාගම වෙනුවෙන් ඉහළ

දායකත්වයක් ලබා දෙමින් තවත් සාර්ථක වසරක් වාර්තා කළේය. කෙසේ වෙතත්, 2019 අප්‍රේල් මාසයේ පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාර සහ 2020 මාර්තු මාසයේ COVID-19 වසංගතය හේතුවෙන්, සමාලෝචනයට භාජනය වූ මූල්‍ය වර්ෂය තුළ ශ්‍රීලංකන් කේටරින් කාර්ය සාධනය අඩුවී තිබේ. එසේ වුවද, පසුගිය වසර 10 තුළ එහි කාර්යසාධනය, එහි ශක්තීන් හා විභවයන් පිළිබඳ ඉතා පැහැදිලි කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබේ.

යානාස්ථ ආහාර සැපයීමේ ප්‍රධාන මෙහෙයුමට අමතරව, බණ්ඩාරනායක සහ මත්තල ජාත්‍යන්තර ගුවන්තොටුපලේ (MRIA) සංක්‍රමණික මගීන් සඳහා අවන්හල් සහ විවේකාගාර කළමනාකරණය ක්‍රියාත්මක කිරීම ද මෙම අංශය මගින් සිදු කෙරේ. එහි අතිරේක ව්‍යාපාරික කටයුතුවල කොටසක් ලෙස ශ්‍රීලංකන් කේටරින් සෙරින්ඩිවා ට්‍රාන්සිට් හෝටලය (Serendiva Transit Hotel) සහ කාර්මික රෙදි සේදීමේ සේවාව ක්‍රියාත්මක කරයි.

### ආදායම

සමාලෝචනයට භාජනය වූ වර්ෂයේ පරිපාලිත සමාගමේ ආදායම 7.4% කින් එනම් රු. මිලියන 9,026 කින් අඩුවිය (2018/19 දී රු. මිලියන 9,750). මෙම පහත වැටීම සියළුම අංශවලින් දැකගැනීමට හැකිවිය. මෙම පහත වැටීමට මූලික හේතුව වූයේ යානාස්ථ ආහාරසැපයීමේ ආදායම සහ සංක්‍රමික මගීන් සඳහා අවන්හල් ආදායම අනුපිළිවෙලින් 7.9% කින් සහ 6% කින් අඩුවීමයි.

**ආදායමට එදිරව ආදායම් වර්ධනය**




**ආහාර වේල් සංඛ්‍යාව**




**ආදායම් සංයුතිය**



| | | |
|---|---|---|
| ගුවන් යානා මුළුතැන්ගෙය | - | 79.9% |
| BIA ආපන ශාලාව | - | 13.5% |
| ලොන්ජ් | - | 2.5% |
| සෙරින්ඩිවා ට්‍රාන්සිට් හෝටලය | - | 1.9% |
| එමිරේට්ස් විවේකාගාරය | - | 1.4% |
| වෙනත් සහාක ව්‍යාපාර | - | 0.7% |

පසුගිය මූල්‍ය වර්ෂයට සාපේක්ෂව සමස්ත ගුවන්යානා මුළුතැන්ගෙයෙහි නිෂ්පාදිත ආහාර ප්‍රමාණය 12.3% කින් අඩු වූ අතර වාර්ෂිකව ආහාර වේල් සංඛ්‍යාව සටහන් වූයේ මිලියන 6.6 ක් ලෙසයි. 2019 වර්ෂය තුළ සමස්ත ආහාර නිෂ්පාදිතයෙන් 76.1% ක් ආහාර සැපයීමේ ප්‍රධාන පාර්භෝගිකයා වන ශ්‍රීලංකන් ගුවන් සේවාවට සපයන ලද අතර ආදායම සඳහා ශ්‍රීලංකන් ගුවන් සමාගමෙන් ලැබුණු දායකත්වය වර්ෂය තුළ 12.0% කින් අඩු විය.

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල අවන්හලෙන් (පොදු සහ සංක්‍රමණ) ලැබුණු ආදායම 13.5% ක් වන අතර එම ආදායම පසුගිය මූල්‍ය වර්ෂයට සාපේක්ෂව 3.7% කින් අඩු වී තිබේ. තවද, අනෙකුත් සහායක ව්‍යාපාර පිරිවැටුම ද 9.3% කින් අඩු විය.

**EBIT ප්‍රවණතාව**




### පොලී සහ බදු වලට පෙර ඉපැයීම් (EBIT)

2018/19 දී වාර්තා වූ රු. මිලියන 4,704 ක ආදායම සමග හා සසඳන විට විශාල පහත වැටීමක් වාර්තා වූ අතර අනෙකුත් වියදම්වල වැඩිවීම හේතුවෙන් පොලී සහ බදු වලට පෙර ඉපැයීම් 11.5% කින් එනම් රු. මිලියන 4,162 දක්වා අඩු විය.

### ලාභදායීතාවය

සමාලෝචනයට භාජනය වූ වර්ෂය සඳහා ශ්‍රීලංකන් කේටරින් විසින් බදු ගෙවීමෙන් පසු ලැබූ ලාභය රු. මිලියන 4,760 ක් වූ අතර එය පසුගිය මූල්‍ය වර්ෂයට සාපේක්ෂව 15.1% ක අඩුවීමකි (2018/19 දී රු. මිලියන 5,602කි). ඒ හා සමානව, පාස්කු ඉරිදා ප්‍රහාරය සහ COVID-19 වසංගතය පැතිරීම හේතුවෙන් එහි මෙහෙයුම් ලාභය සහ ශුද්ධ ලාභය ද අඩුවිය.

# කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය සබැඳේ.

ශුද්ධ ලාභ ප්‍රවණතාව




***වැඩිදියුණු කිරීම්***

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළදී, ශ්‍රීලංකන් කේටරින් විසින් A380 හයි-ලෝඩරයක් මිලදී ගැනීම, නව සම්මත හයි-ලෝඩර් ඒකක දෙකක් සහ කටාර් එයාර්වේස් වෙතින් සම්මත හයි-ලෝඩර් ඒකක 4 ක් මිල දී ගැනීම වැනි ප්‍රාග්ධන ආයෝජන සිදු කරන ලදී.

ශ්‍රීලංකන් කේටරින් හි විශිෂ්ට කාර්යසාධනය වෙනුවෙන් සම්මාන කිහිපයක් දිනා ගත් අතර එයට ජනාධිපති අපනයන සම්මානය 2018/19 - "සැකසූ ආහාර හා පාන වර්ග" කාණ්ඩය යටතේ හොඳම අපනයනකරු සම්මානය, සීඑන්සීඅයි අචිවර් සම්මානය 2019 (CNCI Achiever Award) - රාජ්‍ය අංශය යටතේ ජාතික රන් සම්මානය සහ ජාතික ව්‍යාපාර විශිෂ්ටත්වය සම්මාන 2019 - රිදී සමස්ත ජයග්‍රාහකයා, රාජ්‍ය අංශය යටතේ ජයග්‍රාහකයා, "මහා පරිමාණ" කාණ්ඩයේ ව්‍යාපාර හා මූල්‍ය ප්‍රතිඵලවල විශිෂ්ටත්වය සඳහා දෙවන ස්ථානය දිනා ගැනීම ද සිදු විය. තවද, සූපශාස්ත්‍ර ප්‍රදර්ශනයේදී 2019 වසරේ රන් පදක්කම් 7 ක්, රිදී 10 ක් සහ ලෝකඩ පදක්කම් 10 ක් දිනා ගැනීමට ශ්‍රීලංකන් කේටරින් කණ්ඩායම සමත් විය.

## උපකාරක සේවා

**ශ්‍රීලංකන් තොරතුරු තාක්ෂණ පද්ධති**

ශ්‍රීලංකන් තොරතුරු තාක්ෂණ පද්ධති ප්‍රධාන අංශ තුනක් යටතේ ක්‍රියාත්මක වන අතර ඩිජිටල් පරිවර්තනය සහ තාක්ෂණය අනුවර්තනය, ව්‍යාපාර අඛණ්ඩතාව සහ කෘතිම බුද්ධිය සහ තොරතුරු තාක්ෂණ වියදම් සහ ආදායම යනු එම අංශ තුනයි. තොරතුරු තාක්ෂණ උපායමාර්ගය අර්ථ දක්වා ඇත්තේ ගුවන් සමාගමේ තාක්ෂණික දැක්ම අගය එකතු කිරීම සහ ගුවන් සේවා ව්‍යාපාර මෙහෙයුම් සහ මගී අත්දැකීම් නවීන තාක්ෂණයන් සමඟ වැඩිදියුණු කිරීම යටතටය.

ඩිජිටල් පරිවර්තනය යටතේ ඇති ප්‍රධාන අරමුණ වනුයේ කලක් පැවති ව්‍යාපාර ක්‍රියාවලීන් ඩිජිටල්කරණය කිරීම හා පරිවර්තනය කිරීමයි. නව ඩිජිටල් ව්‍යාපාර සමඟ මාර්ගගත හා සේවා විකුණුම් පුළුල් කිරීම, මගී සේවය පුද්ගලාත්මක අත්දැකීමක් ලැබෙන සේ සකස් කිරීම සහ ඩිජිටල් මගී ගමන් සිතියම මත එහි අනාගත අරමුණු සාක්ෂාත් වන පරිදි ශීඝ්‍රයෙන් කටයුතු කිරීම ද මීට ඇතුළත් වේ. එසේම කර්මාන්තය තුළ ඉහළ පිළිගැනීමක් ලබා ගැනීම සහ ඩිජිටල් නායකත්වය ලබා ගැනීම ද ඊට අයත් වේ.

තොරතුරු තාක්ෂණ පද්ධති ඉතා ඉහළ නිරවද්‍යතාවකින් යුතුව පවත්වා ගෙන යැම ඔස්සේ ව්‍යාපාර සහ මෙහෙයුම් අඛණ්ඩතාවක් පැය 24 x 7 මුළුල්ලේ සැපයීම, තථ්‍යකාලීන ව්‍යාපාරික බුද්ධිය සමඟ තීරණ ගැනීම සක්‍රීය කිරීම සහ සවිබල ගැන්වීම මෙන් ම අනුකූලතාව, පෞද්ගලිකත්වය සහ දත්ත පාලන නියමයන් සහතික කිරීම ද ගුවන් සමාගමේ තොරතුරු තාක්ෂණ උපාය මාර්ගය දෙවැනි කොටස යටතට අයත් වේ.

ඊට අමතරව, ශ්‍රීලංකන් තොරතුරු තාක්ෂණ පද්ධති ආදායම් උත්පාදකයක් ලෙස ගුවන් සමාගමේ ඉහළ පෙළේ ආදායමට දායක වේ. 2019/20 මූල්‍ය වර්ෂය තුළදී, තොරතුරු තාක්ෂණ පද්ධති බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ සහ ගුවන් සමාගමේ ආයතනවලට පිටතට ගොස් වෙනත් පාරිභෝගික ගුවන් සමාගම් වෙත ලබා දෙන තොරතුරු සන්නිවේදන තාක්ෂණ සේවාවන් හරහා ඇමරිකානු ඩොලර් මිලියන 2 ක අමතර ආදායමක් උපයා ගැනීමට දායක විය. ආදායම් උත්පාදනය කරන ප්‍රධාන ගුවන් සේවා අංශයක් වන ශ්‍රීලංකන් තොරතුරු තාක්ෂණ පද්ධති ඉදිරි වසර 5 තුළ තොරතුරු තාක්ෂණ හවුල් සේවා වලින් ලැබෙන ආදායම දෙගුණ කිරීම අරමුණු කර ගෙන ඇති අතර ගුවන් සමාගමේ තොරතුරු තාක්ෂණ වියදම ගුවන් සමාගමේ මුළු ආදායමෙන් 2% ට වඩා අඩු මට්ටමක උපාය මාර්ගයේ තුන්වන කොටස යටතේ පවත්වා ගෙන යනු ඇත.

2019/20 මූල්‍ය වර්ෂය තුළදී සමාගමේ තොරතුරු තාක්ෂණ අංශය 'ශ්‍රීලංකන් තොරතුරු තාක්ෂණ පද්ධති' ලෙස සන්නාම ගත කෙරුණු අතර ඊළඟ පරම්පරාවේ තාක්ෂණය හා නවෝත්පාදනයන් සමඟ ජාතික ගුවන් සේවය ඔසවා තැබීම සඳහා ඔවුන්ගේ තොරතුරු තාක්ෂණ උපායමාර්ගය නැවත අර්ථ දැක්වූ අතර ගුවන් සේවය සඳහා තොරතුරු තාක්ෂණ අංශයේ ඇති වටිනාකම සඳහා නිසි පිළිගැනීමක් හිමි කර දෙනු ලැබිය.

***වැඩිදියුණු කළ මගී අත්දැකීම් සහ ස්මාර්ට් (SMART) මගීන් දක්වා දියුණුවීම***

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ ශ්‍රීලංකන් තොරතුරු තාක්ෂණ පද්ධති විසින් ගුවන් තොටුපළ හා ගොඩබිම් සේවා සඳහා ඩිජිටල් මාර්ග සිතියමක් නිර්මාණය කරන ලද අතර, එමඟින් ශ්‍රීලංකන් ගුවන් සේවාව භාවිත කරන මගීන්ට nextGen ගුවන් තොටුපළ අත්දැකීම ලබා දීමට කටයුතු කෙරිණ. ස්මාර්ට් මගී සංකල්පය තුළින් මගීන්ගේ අත්දැකීම් ඉහළ නැංවීම සඳහා මගීන් වෙත ස්වයං සේවා ලබා ගැනීමේ වැඩි ප්‍රමුඛතාවයක් ලබා දෙන අතරම, බණ්ඩාරනායක ගුවන්තොටුපළේ මගී ස්පර්ශක ස්ථාන තක්සේරු කිරීම සහ කර්මාන්තයේ නවතම තාක්ෂණික වැඩිදියුණු කිරීම් යොදා ගැනීමට පුළුල් සැලැස්මක් මෙහි දී සකස් කර තිබේ.

## ගුවන් සමාගමේ තොරතුරු තාක්ෂණ උපායමාර්ගය සැකෙවින්

**ඩිජිටල් පරිණාමනය සහ තාක්ෂණ අනුවර්තනය**

- ගුවන් සේවා ක්‍රියාවලීන් ඩිජිටල්කරණය කිරීම
- සෘජු මාර්ගගත විකුණුම් පුළුල් කිරීම සහ නව ඩිජිටල් ව්‍යාපාරවලින් ආදායම් උත්පාදනය කිරීම
- "මගී සේවා පුද්ගල ඇත්දැකීම් ප්‍රවර්ධනය" සහ CRM පද්ධතියක් හඳුන්වාදීම.
- බණ්ඩාරනායක ගුවන් තොටුපළේ සහ සියලුම විදේශීය ගුවන් තොටුපළ හරහා වේගවත් සංචාරක තාක්ෂණයන් සක්‍රීය කිරීම
- ඩිජිටල් නායකත්වය සඳහා කර්මාන්තය තුළ පිළිගැනීමක් ලබාදීම
- නව වෙළඳපල වෙත ළඟා වීමට ජංගම යෙදුම වැඩි දියුණු කිරීම සහ IBE හි තවත් විශේෂාංග කරා ප්‍රවේශවීම

**ව්‍යාපාර අඛණ්ඩතාව සහ කෘතිම බුද්ධිය**

- තීරණාත්මක තොරතුරු තාක්ෂණ සේවාවන්හි 99.9% ක අඛණ්ඩ කාලයක් සහිතව පැය 24x7 ව්‍යාපාර සහ මෙහෙයුම් අඛණ්ඩතාවක් ලබා දීම.
- තත්‍ය කාලීන ව්‍යාපාර බුද්ධිය (BI) සක්‍රීය කිරීම
- තොරතුරු සුරක්ෂිතතාව / රහස්‍යතා නියාමනය සහ දත්ත පාලන නියමයන්ට අනුකූල වීම

**තොරතුරු තාක්ෂණ වියදම් සහ ආදායම**

- තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය ගුවන් ගමන් ආදායමෙන් ප්‍රතිශතයක් ලෙස වර්ධනය කිරීම සහ සහ එය 2% ට වඩා අඩු මට්ටමක පවත්වා ගැනීම
- තොරතුරු තාක්ෂණ හවුල් සේවා ආදායම වැඩි කිරීම



# කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය සබැඳේ.

***විස්තෘත අන්තර්ජාලය පාදක ගෙවීම් විකල්ප***

ශ්‍රීලංකන් තොරතුරු තාක්ෂණ පද්ධති විසින් ඇමඩියස් ගෙවීම් වේදිකාව අන්තර්ජාල වෙන්කිරීමේ එන්ජිම (IBE) ඔස්සේ පුළුල් ගෙවීම් විකල්පයන් සමඟ හඳුන්වා දුන් අතර සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළදී ශ්‍රීලංකන් ජංගම වෙබ් අඩවියට ද එය ඉදිරිපත් කරනු ලැබීය. මෙය අලිපේ (Alipay), වෙචැට් (Vchat), පෝලි (Poli), පේපෑල් (Paypal), ඇපල් පේ (Apple pay) වැනි නව විකල්ප ගෙවීම් ක්‍රම සඳහා සහාය වන විස්තෘත අන්තර්ජාල පාදක නිමවුමකි. මෙම වැඩි දියුණු කිරීමත් සමඟ, මගීන්ට වඩාත් නම්‍යශීලී බවක් පහසුවක් ලබා දෙමින්, ගෙවීම් සැකසීමේ දෝෂයන් අඩු කෙරෙනු අතර IBE සහාය දක්වන ගෙවීම් මුදල් වර්ග සංඛ්‍යාව 40 (මීට පෙර 19) දක්වා වැඩි කරන ලදී.

***ස්වයං ගමන් මලු බාර දීම / මගී ගමන් සරල කිරීම***

ශ්‍රීලංකන් තොරතුරු තාක්ෂණ පද්ධති විසින් "ස්වයං සේවා ගමන් මලු බාර දීමේ " සංකල්පය ලන්ඩනයේ හීත්‍රෝ ගුවන්තොටුපලේදී හඳුන්වා දුන් අතර ශ්‍රීලංකන් ජාලය තුළ ගමන් මලු බාර දීමේ පහසුකම ස්වයංක්‍රීය කළ පළමු ගුවන් තොටුපළ බවට එය පත්විය. මගීන්ගේ පහසුව සහ මගී ගමන් සරල කිරීම සඳහා දැන් මස්කට් ජාත්‍යන්තර ගුවන්තොටුපලේ KIOSK පිරික්සුම් පහසුකම සක්‍රීය කර ඇත. තවද, ස්කයිඅප් (Skype) ගුවන් සේවය සහ සලාම් එයාර් (Salam Air) සඳහා මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීම සඳහා ශ්‍රීලංකන් තොරතුරු තාක්ෂණ පද්ධති විසින් ගොඩබිම් හැසිරවීමේ තොරතුරු පද්ධති පහසුකම් සපයන ලදී.

***කඩදාසි රහිත භාණ්ඩ නිෂ්කාශන ක්‍රියාවලියක් ඔස්සේ ආනයනකරුවන් සක්‍රීය කිරීම***

කඩදාසි රහිත භාණ්ඩ නිෂ්කාශනය සඳහා පහසුකම් සැලසීම සඳහා ලෝක රේගු සංවිධානය විසින් හඳුන්වා දී ඇති ඩිජිටල්කරණ වැඩසටහනේ අවශ්‍යතා අනුව භාණ්ඩ ආනයන දත්ත විද්‍යුත් හුවමාරුව ශ්‍රීලංකන් ගුවන් සමාගම විසින් ක්‍රියාත්මක කරන ලදී. ශ්‍රී ලංකා රේගුවේ රේගු දත්ත සඳහා ස්වයංක්‍රීය පද්ධතිය (ASYCUDA) පද්ධතිය සමඟ ශ්‍රී ලංකාවේ භාණ්ඩ විකුණුම් හා මෙහෙයුම් කළමනාකරණ පද්ධතිය ඒකාබද්ධ කිරීමෙන් මෙය පහසු විය.

***ගුවන් සේවා සහායක ආදායම ඉහළ නැංවීම***

ශ්‍රීලංකන් තොරතුරු තාක්ෂණ පද්ධති මගින් පුළුල් ආසන වෙන් කිරීමේ (ASR) පහසුකම ඉහළ නැංවූ අතර ක්‍රමයෙන් පිරිවැය පාලනය කරමින් අමතර පාද අවකාශයක් ඇති ආසන ලබා ගැනීමේ හැකියාව පුළුල් කිරීම, ආදී නව ආධාරක ආදායම් මාර්ගයක් විවෘත කිරීම සිදු කළේය.

තවද, "එක් බෑගයක්" සංකල්පය අන්තර්ජාලය ඔස්සේ හඳුන්වා දී ප්‍රවර්ධනය කරන ලද අතර එය අතිරේක ආදායම වැඩි කිරීමට දායක විය. "පෙරගෙවුම් ගමන් මලු" ප්‍රවර්ධනය කිරීම සඳහා අන්තර්ජාල පිරික්සුම් ප්‍රවාහය වැඩි දියුණු කිරීම සහ පිටත්වීමේ දොරටුවල "අතිරික්ත ගමන් මලු රැගෙන යාම" සංකල්පය හඳුන්වා දීම ද සිදු විය. මීට අමතරව, ගෝලීය බෙදාහැරීමේ පද්ධති (GDS) හරහා සිදුකරන ලද වෙන් කිරීම්, "Manage My Booking" ප්‍රවාහය යටතේ අන්තර්ජාල පහසුකම් සපයන ලද අතර, මගීන්ට ඔවුන්ගේ පහසුව අනුව තෝරා ගැනීමට අවස්ථාව ලබා දී ඇත.

***තොරතුරු මත පාදක වූ ගුවන් සේවයක්***

උපායමාර්ගික හා උපායශීලී තීරණ ගැනීමේ ප්‍රධාන තොරතුරු ප්‍රභවය වන්නේ "එයාර්ලයින් ඉන්සයිට්", නමැති ශ්‍රීලංකන් ගුවන් සේවයේ කළමනාකරණ තොරතුරු පද්ධතියයි (MIS). එයාර්ලයින් ඉන්සයිට් විසින් සියළුම මගීන්ගේ ආසන වෙන් කිරීම්, ප්‍රවේශපත්‍ර සහ ගමන් සම්බන්ධ තොරතුරු හැසිරවීම සිදු කරන අතර ජ්‍යෙෂ්ඨ සහ මධ්‍යම මට්ටමේ කළමනාකාරීත්වය සඳහා ඩෑෂ් බෝඩ් , වාර්තා සහ විද්‍යුත් තැපැල් ඔස්සේ ගුවන් සේවාවේ කේපීඅයි භාවිත කරමින් සමඟ ගුවන් සේවාවේ කාර්ය සාධනය සහ පාරිභෝගික සම්බන්ධතා පිළිබඳ අදහසක් ලබා ගැනීමට ක්‍රියාකාරී තොරුතුරු සමුදායක් ලබා දෙයි.

මීළඟ මූල්‍ය වර්ෂයේදී එයාර්ලයින් ඉන්සයිට්හි අවධානය යොමු වී ඇත්තේ ශ්‍රීලංකන් ගුවන් සේවය පූර්ණ තොරතුරු මත පදනම් වූ මගී කේන්ද්‍රීය ගුවන් සමාගමක් බවට පත්කිරීමේ හැකියාවන් සහිත අභ්‍යන්තර පාරිභෝගික සම්බන්ධතා කළමනාකරණ (CRM) පද්ධතියක් ක්‍රියාත්මක කිරීමෙන් මගීන් කේන්ද්‍රගත කර ගැනීම වැඩිදියුණු කිරීමයි.

***හරිත ශ්‍රීලංකන් ගුවන් සේවයක් - කඩදාසි රහිත ලේඛන කළමනාකරණය***

පෘථිවියේ පැවැත්මට හිතකාමී ලෙස ගමන් කරමින්, BIA මෙහෙයුම් ඒකක විසින් නඩත්තු කරනු ලබන බොහෝ අත්පොත විද්‍යුත් ලේඛන කළමනාකරණ පද්ධති භාවිතා කිරීම සඳහා පරිවර්තනය කර ඇති අතර, කඩදාසි වාර්තා පවත්වා ගැනීමේ අවශ්‍යතාවය ඉවත් කර ක්‍රමයෙන් සම්පූර්ණ ඉලෙක්ට්‍රොනික වාර්තා නඩත්තු මෙහෙයුම් ඒකක වෙත ගමන් කරයි. මෙම අඛණ්ඩ කටයුතු 2019/20 මූල්‍ය වර්ෂය තුළ ආරම්භ වූ අතර අනාගතයේ දී බොහෝ ගුවන් සේවා අංශ වෙත ශූන්‍ය කඩදාසි වාර්තා සහිතව ව්‍යාප්ත වනු ඇත. එහෙත් ලේඛන රඳවා තබාගැනීමේ නියාමන අදාළ ආයතනික කොන්දේසි වලට අනුකූල වේ.

***කණ්ඩායම් දත්ත ආරක්ෂාව, අනුකූලතාවය සහ පාලනය***

ශ්‍රීලංකන් ගුවන් සමාගමේ තොරතුරු තාක්ෂණ පද්ධති 2019/20 මූල්‍ය වර්ෂය තුළ ජාත්‍යන්තර ප්‍රමිති හා සහතික කිරීම් වලට අනුකූලව කටයුතු කළ අතර ISO/IEC 27001: 2013 ශ්‍රීලංකන් සමූහය සඳහා තොරතුරු ආරක්ෂණ කළමනාකරණය, ISO/IEC 20000:2018 තොරතුරු තාක්ෂණ අංශය සඳහා තොරතුරු තාක්ෂණ සේවා කළමනාකරණය සහ ISO 9001:2015 මෘදුකාංග සංවර්ධනය සඳහා තත්ත්ව කළමනාකරණ පද්ධතිය. එපමණක් නොව, මගී ගමන පුරාම දත්ත සුරක්ෂිතතාව සහ පෞද්ගලිකත්වය අවධාරණය කරමින් යුරෝපීය සංගමයේ සාමාන්‍ය දත්ත ආරක්ෂණ රෙගුලාසි (GDPR) හි නිර්දේශ සහ මාර්ගෝපදේශ සපුරාලීම සඳහා ගුවන් සමාගමේ මෙහෙයුම් අඛණ්ඩව වැඩිදියුණු කරන ලදී.

***තාක්ෂණය ගුවන් සේවකයින්ට බලය ලබා දී ඇත***

ශ්‍රී ලංකාවේ තොරතුරු තාක්ෂණ පද්ධතිවල ඩිජිටල් පරිවර්තන කණ්ඩායම විසින් ඉදිරිපත් කරන ලද තවත් සන්ධිස්ථානයක් BIA හි මගී සේවා සඳහා භාෂා පරිවර්තන සේවා. BIA හි මගී සේවා කණ්ඩායම දැන් මගීන්ගේ ස්වදේශීය සන්නිවේදන භාෂාව තත්‍ය කාලීනව පරිවර්තනය කිරීම සඳහා පහසු තාක්ෂණයෙන් සවිබල ගැන්වී ඇති අතර එමගින් මගීන් සමඟ වඩා හොඳ අන්තර් ක්‍රියාකාරිත්වයක් සඳහා භාෂා බාධක අවම කිරීමෙන් සේවා විශිෂ්ටත්වය තවදුරටත් ඉහළ නංවා ඇත.

KIOSK හරහා වීසා සත්‍යාපන සේවාව පිළිබඳ පළමු අත්හදා බැලීම දියත් කිරීම.

බණ්ඩාරනායක ගුවන් තොටුපළෙහි KIOSKs හරහා වීසා සත්‍යාපන සේවාව පිළිබඳ පළමු අත්හදා බැලීම දියත් කිරීම මගින්

පවත්නා වීසා බලපත්‍ර සත්‍යාපන ක්‍රියාවලිය පරිවර්තනය කිරීමකට දායක වූ අතර, පිරික්සුම් ක්‍රියාවලියේදී මගීන්ට ගත වන කාලය අඩු කෙරිණ. මෙය සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ පිළිගත නොහැකි (INAD) මගී චෝදනා සංඛ්‍යාව සහ INAD මගීන්ට අදාළ දඩ මුදල් ගෙවීම් සැලකිය යුතු ලෙස අඩු කිරීමට දායක විය.

### සම්මාන සහ කීර්ති පැසසුම්

SriLankan IT Systems 2020 ශ්‍රී ලංකා ටෙලිකොම් සීරෝ වන් සම්මාන උළෙලේදී එහි කණ්ඩායමේ දක්ෂතා හා නව්‍යකරණයන් අගය කරන ලදී. "හොඳම ජංගම තාක්ෂණ භාවිතය" කාණ්ඩයේ සමස්ත ජයග්‍රාහකයා ලෙස ඔවුන් පිළිගැනීමට ලක් වූ අතර, "හොඳම ජංගම තාක්ෂණ භාවිතය" කාණ්ඩයේ ජයග්‍රාහකයා බවට කැබින් කෲ වොයේජ් රිපෝට් ජංගම යෙදුම ද , "හොඳම ජංගම තාක්ෂණ භාවිතය" කාණ්ඩයේ අනුශූරතාව i-FleetMobileApp යෙදුම සහ චාරිකා යෙදුම "හොඳම ඩිජිටල් සක්‍රිය නිෂ්පාදන" කාණ්ඩයේ අනුශූරතාව ද දිනා ගැනීමට සමත් විය. මෙම නිෂ්පාදන සියල්ලම තොරතුරු තාක්ෂණ කණ්ඩායම විසින් අභ්‍යන්තරව සංවර්ධනය කරන ලද නවෝත්පාදනයන් වූ අතර ශ්‍රී ලංකාවේ තොරතුරු තාක්ෂණ කණ්ඩායම ශ්‍රී ලංකා ටෙලිකොම් සීරෝ වන් සම්මාන තරඟ මාලාවේදී පිළිගැනීමට ලක්වූ දෙවන අවස්ථාව මෙය විය.




*සම්මානලාභී 'අයි-ෆ්ලීට්' ජංගම යෙදුම*



*'කැබින් කෲ වොයේජ් රිපෝට්' ජංගම යෙදුම*

මීට අමතරව, ගෘහස්ථ තොරතුරු සන්නිවේදන තාක්ෂණ විසඳුම් දෙකක් සඳහා "ගෘහස්ථ යෙදුම්" කාණ්ඩයේ ලෝකඩ හා කුසලතා සම්මාන දිනා ගනිමින් ශ්‍රීලංකන් තොරතුරු තාක්ෂණ පද්ධති ජාතික තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සම්මාන උළෙලේදී පිළිගැනීමට ලක්විය. අයි-ෆ්ලීට් පරිගණක යෙදුමට ලෝකඩ සම්මාන පිරිනමන ලද අතර එය ශ්‍රීලංකන් වෙත අංශක 360 ක දෘශ්‍යතාවයක් ගෙන ඒම සඳහා ඉවහල් විය. චාරිකා පරිගණක යෙදවුම සඳහා කුසලතා සම්මානයක් ද පිරිනමන ලද අතර, කාර්ය මණ්ඩලය සඳහා ස්වයං සේවා ටිකට් පත් නිකුත් කිරීමේ කාර්යය මේ ඔස්සේ සිදු කෙරුණු අතර සහ ගුවන් සේවක ටිකට් පත් නිකුත් කිරීමේ ක්‍රියාවලිය පැය විසි හතර පුරා ලබා ගත හැකි පරිදි සම්පූර්ණ ස්වයංක්‍රීය ඩිජිටල් සේවාවක් බවට පරිවර්තනය කෙරිණ.

### මානව සම්පත් කළමනාකරණය

ශ්‍රීලංකන් ගුවන් සමාගමේ මානව සම්පත් අංශය තවත් අභියෝගාත්මක වසරක් තුළ සාර්ථක සන්ධිස්ථාන හා ජයග්‍රහණ රැසක් අත්කර ගෙන ඇති අතර එය සමාගමේ ස්ථාවරය හා නව දැක්ම සහ මෙහෙවර ඉදිරියට ගෙන යමින් සිටී.

ශ්‍රීලංකන් ගුවන් සමාගම 2019 වසරේ දී වසර 40 ක සේවා කාලයක් සනිටුහන් කරන අවස්ථාවේ දී එහි, ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලයේ දිගුකාලීන සේවාව ඇගයීම සහ ඔවුන්ගේ අප්‍රතිහත කැපවීම මෙන් ම ඉදිරි දශකය දක්වා ඔවුන් ලබා දුන් උරුමය ඉස්මතු කිරීම සඳහා සන්නිවේදන ව්‍යාපාරයක් දියත් කරන ලදී.

pULse, නමින් ක්‍රියාත්මක වූ, සන්නිවේදන හා සම්බන්ධතා කණ්ඩායම විසින් මෙහෙයවනු ලබන ශ්‍රීලංකන් ප්‍රසාංගික කලා සමාජය විශේෂයෙන් 2019 අප්‍රේල් මාසයේ පාස්කු බෝම්බ ප්‍රහාරයෙන් පසුව ඇති වූ ආර්ථික අභියෝගයන් ජය ගැනීම සඳහා සියලු අංශයන්හි කාර්ය මණ්ඩලය තුළ චිත්ත ධෛර්යය ඉහළ නැංවීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කළේය. කාර්ය මණ්ඩලය අතර පමණක් නොව අපගේ ප්‍රජාව අතර සමගිය හා ශුභවාදී බව ඉහළ නැංවීමේ වැඩසටහන් ක්‍රියාත්මක වූ අතර ගෝලීය සාමය පිළිබඳ පණිවුඩයක් පතුරුවා හැරීම සඳහා වෙසක් පොහොය සැමරුම් වැනි ජාතික වැදගත්කමක් ඇති සිදුවීම් ප්‍රවර්ධනය කිරීමට ද සන්නිවේදන හා සම්බන්ධතා කණ්ඩායම ශ්‍රීලංකන් සමාගමේ ම අලෙවිකරණ හා සන්නිවේදන කණ්ඩායම සමග එක් ව කටයුතු කළේය. මෙහි දී සංවිධාන කෙරුණු වෙසක් බැති ගී වැඩසටහන බොහෝ දෙනෙකුගේ සිත් ඇඳ ගත්තේය.

මීට අමතරව, නව දැක්ම සහ මෙහෙවර සඳහා කාර්ය මණ්ඩලය සම්බන්ධ කර ගැනීම සඳහා අන්තර්ජාල පාදක ව්‍යාපාරයක් සහ පෝස්ටර් ව්‍යාපාරයක් ද දියත් කළේය. එපමණක් නොව, පසුගිය කාර්තුවේ අවසාන භාගයේදී, අර්බුද සන්නිවේදනය වෙනුවෙන් පෙලගැසී COVID-19 වසංගතයට එරෙහිව සටන් කිරීම සඳහා විශේෂ දැනුවත් කිරීම් සහ අධ්‍යාපන වැඩසටහන් පැවැත්වීම ද මෙම අංශය මගින් සිදු කෙරිණ.

# කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය සබැඳේ.

COVID-19 වසංගතය නිසා දුෂ්කරතාවන්ට මුහුණ පා ඇති පිරිස් සඳහා මනෝවිද්‍යාත්මක සහාය  ලබා දීම සඳහා අපගේ සේවකයින්ගේ මානසික යහපැවැත්මේ වැදගත්කම හඳුනා ගනිමින් මාර්ගගත උපදේශන වැඩසටහනක් ද හඳුන්වා දෙන ලදී.

නවෝත්පාදන හා ප්‍රතිනිර්මාණය බලාත්මක කිරීම සඳහා කළමනාකාරිත්වය වෙනුවෙන් බ්ලූ ඕෂන් හෙවත් නිල් සාගර ක්‍රමෝපාය පිළිබඳ වැඩමුළුවක් පවත්වන ලදී. අවම වශයෙන් දශක දෙකක පමණ කාලයක් තිස්සේ ශ්‍රීලංකන් ගුවන් සමාගම රෙඩ් ඕෂන් වෙළෙඳපොළ තත්වයන් තුළ තරඟ වදින්නේ වඩාත් ශක්තිමත් ගුවන් සමාගම් සමගයි. ඔවුන් අපගේ වෙළඳපල අවකාශය තුළට ඇතුළු වී ඇති අතර අපට ඇති අවස්ථා ද උකහා ගෙන තිබේ. මෙම වැඩසටහන යටතේ, ශ්‍රීලංකන් ගුවන් සමාග මේ  ව්‍යාපාර උපාය මාර්ග සම්බන්ධයෙන් නිල් සාගර ප්‍රවේශය  ක්‍රියාත්මක කිරීමේ දැඩි අවශ්‍යතාවය හඳුනාගෙන ඇති අතර, සමාග මේ වටිනාකම වැඩි කිරීම සඳහා "තිරසාර නිල් සාගර අදහස්" ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලදී.

ලීන් සික්ස් සිග්මා කළමණාකරණ සංකල්ප සහ ශිල්පීය ක්‍රම උපයෝගී කරගනිමින් ව්‍යවසාය විශිෂ්ටතා මුලපිරීමට පහසුකම් සැලසීම සඳහා ඉංජිනේරු අංශයේ කළමණාකරුවන් සංවර්ධනය කිරීම සඳහා ඉංජිනේරු අංශයේ කාර්යයන් නව පරිවර්තනයකට යොමු කෙරිණ. පිරිවැය අඩු කිරීම, වැයවන වේලාවන් අඩු කිරීම සහ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම තුළින් තරඟකාරී වාසි අත්කර ගැනීම සඳහා සමාගමේ සෑම පුද්ගලයෙකුම මේ සඳහා යොමු කෙරිණ.

ගුවන්තොටුපලේ කළමණාකරණ ස්ථරයන් සඳහා"අභියෝගාත්මක කාලවලදී නායකත්වය දීම" වැඩසටහන යටතේ සීමිත සම්පත් සහිත අභියෝගාත්මක කාලවලදී පවා පරිපූර්ණ පාරිභෝගික සේවාවක් ලබා දීම සඳහා අවශ්‍ය වන නායකත්ව නිපුණතා ගොඩනැගීම සිදු කෙරුණු අතර අපහසුතා නොසලකා අපගේ ගුවන් මගීන්ට දෝෂ රහිත පාරිභෝගික සේවාවක් සැපයීම කෙරහි මෙහි දී අවධානය යොමු විය.

ඊ-3/එල්-3 මට්ටම්වල ඉංජිනේරු කළමණාකරුවන් සඳහා පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනය සමඟ එක් ව ඉංජිනේරු කළමනාකරණ වැඩසටහන් සඳහා නිපුණතා සංවර්ධනය සිදු කරන ලද අතර, ඊළඟ මට්ටමේ නායකත්වය ලබා ගැනීම සඳහා ආයතනය තුළින් විශේෂඥයින් නිර්මාණය කර ගැනීම මෙහි දී සිදු වේ.

ගුවන්තොටුපල සහ ගුවන් භාණ්ඩ අංශවල නායකත්ව හිඟය පියවීම සඳහා නායකත්ව සංචිතයක් සකස් කිරීම සඳහා එයාර්පෝට් ඇන්ඩ් කාගෝ ටැලෙන්ට්පූල් නිර්මාණය කෙරිණ. විවිධ අංශ සඳහා නව ශක්තියක් එක් කිරීම අත්‍යවශ්‍ය බැවින් නිපුණතා සංචිත සාමාජිකයින් සමාගමේ සෑම අංශයකින් ම තෝරා ගන්නා ලදී. ඔවුන් මාස 08 ක කාලයක් තුළ තාක්ෂණික කුසලතා, මෘදු කුසලතා සහ රැකියා පුහුණුව ආවරණය වන පරිදි පුළුල් පුහුණු වැඩසටහනක් කරා යොමු කෙරුණු අතර, ඔවුන්ගේ අවසාන ඇගයීම ලෙස ව්‍යාපෘති ඉදිරිපත් කිරීමක් සිදු කෙරිණ. එම ව්‍යාපෘති විවිධ අංශ මුහුණ දෙන සමකාලීන අභියෝගයන්ට විසඳුම් යෝජනා කිරීම සඳහා අරමුණු වී තිබිණ.

මීට අමතරව, මානව සම්පත් අංශය මගින් කාර්ය මණ්ඩල යහ භාවිතය සහ ප්‍රශස්තකරණය සඳහා කටයුතු කෙරුණු අතර, පාස්කු ඉරිදා පශ්චාත් ප්‍රහාරයෙන් පසු ගුවන් සමාගම මුහුණ දුන් ආර්ථික බලපෑම හේතුවෙන් සීමිත සම්පත් ප්‍රමාණයක් සමඟ ක්‍රියාත්මක වීමට සමාගමට සිදු විය. අන්‍යෝන්‍ය ඵලදායිතාවය මත පදනම් ව මානව සම්පත් ප්‍රශස්ත කිරීමේ වගකීම මෙම අංශය විසින් භාර ගන්නා ලදී. මෙම සන්දර්භය තුළ, "මානව සම්පත් යහ භාවිතය සහ ප්‍රශස්තකරණය" යන තේමාව යටතේ පහත සඳහන් පියවර ගනු ලැබීය.

- ආයතනයේ කාර්ය මණ්ඩලයේ කුසලතා තුළින් ම සේවා අවශ්‍යතා සපුරාලීම කෙරෙහි අවධානය යොමු කරමින්  බාහිර බඳවා ගැනීම් සීමා කිරීම
- ජ්‍යේෂ්ඨ කළමණාකරුවන් සමඟ සම්බන්ධ වීම සහ සේවක සංඛ්‍යා ප්‍රශස්ත කිරීම සඳහා රැකියා ප්‍රතිනිර්මාණය, ඒකාබද්ධ කිරීම, ස්වයංක්‍රීයකරණය සහ නව වැඩ රටාවන් හඳුන්වාදීම .
- ස්වාභාවික ගෙවී යාම ඵලදායී ලෙස කළමනාකරණය කිරීම

### දේපළ හා සැපයුම්

දැඩි අයවැය පාලනයන් සහ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කරගැනීම අතර පැවති අසමතුලනය හේතුවෙන වසර 2019/20 දේපළ හා සැපයුම් අංශය වෙත තවත් අභියෝගාත්මක වූවක් විය. සලකා බලන වර්ෂය තුළදී උපායශීලී ව්‍යාපාර දර්ශනයකින් යුතුව සමගාමී ව්‍යාපෘති 3 ක් ක්‍රියාත්මක කරන ලදී. එය රුපියල් මිලියන 54 ක ඉතිරියක් සමගින් කොළඹ කාර්ය මණ්ඩලය කටුනායක ප්‍රති ස්ථානගත කිරීම, ලංකා බැංකු පරිශ්‍රයේ සිට කොළඹ ප්‍රාදේශීය කාර්යාලය වෙත තොරතුරු තාක්ෂණික උපකරණ නැවත ස්ථානගත කිරීම, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ ව්‍යාප්තීකරණ ව්‍යාපෘතිය වෙත පහසුකම් සැළසීම සඳහා තොග ගබඩා වෙනත් ස්ථානයකට රැගෙනයාම වශයෙනි. මෙහෙයුම් කටයුතු අතින් බලන කල, සේවා තත්ත්වය පහත හෙළීමකින් තොරව පිරිවැය සීමා කරමින් අපතේ යෑම් අවම කිරීම මඟින් සමස්ත මෙහෙයුම් පිරිවැය 24% ක් එනම් රු. මිලියන 270 කින් අඩුවිය. මෙම තත්ත්වය අත්පත් කරගනු ලැබුවේ විදුලි පරිභෝජනය පහත දැමීම, ප්‍රවාහනයෙහි මෙහෙයුම් මාදිලි ප්‍රතිශෝධනය කිරීම සහ පිටතින් ලබාගත ශ්‍රමය ආසන්න වශයෙන් පහත හෙළීම තුළිනි.

භාවිත කළ නොහැකි තොග සහ චංචල වත්කම් වෙන්කිරීම සහ බැහැරකිරීම මඟින් ආංශික ආදායම් ලබාගැනීමේ උත්සාහයන් තුළින් රු. මිලියන 15 ක් උපයා ගන්නා ලදී.

## ප්‍රජා සහභාගීත්වය

### ශ්‍රීලංකන් කෙයා(ර්)ස්

දරුවා, මිහිතලය සහ හැකියාව (Child, Planet & Talent) යන අංශයන් යටතේ ශ්‍රීලංකන් එයාර්ගයින්ස්හි ආයතනික් සමාජ වගකීම් අංශය වන ශ්‍රීලංකන් කෙයා(ර්)ස් මගින් සමස්ත ප්‍රජාවෙහි සමාජ, අධ්‍යාපනික හා සෞඛ්‍ය ආශ්‍රිතව ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා කටයුතු කෙරේ. එමගින් 'යහපත් සෞඛ්‍ය හා මනා දිවි පැවැත්ම', 'උසස් මට්ටමේ අධ්‍යාපනය' සහ ' පිරිසිදු ජලය හා සනීපාරක්ෂාව' වැනි තේමාවන් ආශ්‍රිතව මෙරට තිරසාර සංවර්ධන ඉලක්ක ස්පර්ශ කරමින් සත්කාර්යයන් දියත් කෙරේ.

'උසස් මට්ටමේ අධ්‍යාපනය' යන තිරසාර සංවර්ධන ඉලක්කය ආශ්‍රිතව 2019 සැප්තැම්බර් 13 සිට 15 දක්වා දිඹුලාගල අරගංවිල මහ විදුහලේ දරුවන් වෙත පාසැල් පරිශ්‍රයේදී 'දිවි ජය මඟ' යනුවේ විශේෂ අධ්‍යාපනික වැඩසටහනක් සංවිධානය කෙරිණි. මෙහිදී නායකත්ව පුහුණු, අත්කම්, අත්‍යාවශ්‍ය සන්නිවේදනය, පාරිසරික යහ ක්‍රියාකාරකම් සහ ප්‍රථමාධාර වැනි කණ්ඩායම් ක්‍රියාකාරකම් රැසක්

8, 9 සහ 10 ශ්‍රේණිවල දරුවන් 100 ට අධික සංඛ්‍යාවක් වෙනුවෙන් පැවැත්විනි.

මීළඟ පරපුරේ ගුවන් සේවා වෘත්තිකයින් සවිබල ගැන්වීමේ උදාර අරමුණින් යුතුව, 'පාසැලෙන් ලෝකයට' නැමති ගුවන් සේවා ආශ්‍රිත දැනුවත් කිරීමේ වැඩසටහන පැවැත්විනි.

මෙයට අමතරව ශ්‍රීලංකන් කෙයා(ර්)ස් මගින් ෂැංග්‍රි ලා හි හම්බන්තොට ගොල්ෆ් සමාජය හා එක්ව එම ප්‍රදේශයේ අසරණ ප්‍රජාව වෙත අඛණ්ඩ තෙවන වරටත් 2019 ජූනි 9 වැනි දින වෛද්‍ය කඳවුරක් පවත්වන ලදී.

'යහපත් සෞඛ්‍ය හා මනා දිවි පැවැත්ම' යන තිරසාර සංවර්ධන ඉලක්කය ආශ්‍රිතව ශ්‍රීලංකන් කෙයා(ර්)ස් මගින් එක්සත් රාජධානියේ ඩැනියල් ලින්සේ පදනම හා එක්ව ශ්‍රී ලංකාවේ රෝහල් 9 ක් වෙත ''රෝගීන් මාරු කළ හැකි ට්‍රොලි ඇඳන්' 100 ක් පරිත්‍යාග කිරීම සිදු විය.

ශ්‍රීලංකන් කෙයා(ර්)ස් කණ්ඩායම විසින් සිදුකරන ලද බොහොමයක් ප්‍රජා සේවාවන් අතර, ගුවන් සේවා කාර්ය මණ්ඩලය සමග එක්ව සිදුකරන ලද ''සත්කාරක වැඩසටහන්'' මගින් වැලිසර දෙව්සිරි සෙවන වැඩිහිටි නිවාසය, කළාන වින්සන්ට් ද පෝල් වැඩිහිටි නිවාසය, මීගමුව ශාන්ත ජෝශප් ළමා සංවර්ධන මධ්‍යස්ථානය සහ මොරටුව ජනාදර වැඩිහිටි නිවාසය ආවරනය කෙරිණි.

2019 ඔක්තෝබර් 1 වැනි දින ශ්‍රීලංකන් කෙයා(ර්)ස් මගින් ගාලු මුවදොර හෝටලය සහ රිබට් සිල්වා හොලිඩේස් ආයතනයෙහි සහයෝගීතාවයෙන් යුතුව ලෝක ළමා දිනයේදී පාස්කු ප්‍රහාරයෙන් පීඩාවට පත් මීගමුව කටුවපිටිය ප්‍රදේශයේ දරුවන් 115 ක් දෙනෙකු වෙත සහන සැළසීමට කටයුතු කෙරිණි.

## පරිසරය කෙරෙහි නිසි අවධානය

වගකිව යුතු ගුවන් සේවයක් ලෙස, ශ්‍රීලංකන් ගුවන් සේවය සැම විටම පාරිසරික සංරක්ෂණය උදෙසා පුරෝගාමී ආයතනයක් වශයෙන් කටයුතු කොට ඇත. 2009 වර්ෂයේ දී ආරම්භ කරන ලද, 'ග්‍රහලොවට හිතකර ශ්‍රීලංකන්' නම් වූ ශ්‍රීලංකන් ගුවන් සේවයේ පාරිසරික ආදර්ශ පාඨය පෙරදැරි කරගනිමින් සිදුකරන ලද පරිසර හිතකාමී කාර්යයන් හේතුවෙන් කලාපනය තුල වඩාත්ම පරිසර සංරක්ෂණය කෙරෙහි යොමුවූ ගුවන් සේවාව වශයෙන් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් නිරතුරුව IATA හි පැසසුමට ලක්ව ඇත. පාරිසරික යහ ක්‍රියාකාරකම් සිය එදිනෙදා මෙහෙයුම් වෙත ඇතුළත් කරගනිමින් ද පාරිසරික ප්‍රතිපත්ති මතින් සවිමත් වෙමින් ද ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සිය පාරිසරික න්‍යාය පත්‍රය සම්බන්ධයෙන් අභිමානයට පත් වන්නේ, හරිතාගාර වායු විමෝචනය අවම කිරීම වැනි එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණු සහ ජාතික වශයෙන් තීරණය කරන ලදඅරමුණු වෙත දායකත්වයන් සපයමිනි.

විමර්ශනයට ලක්වන වසර තුළ, දේශීය හා ජාත්‍යන්තර පාර්ශ්වකරුවන් සමග එක්වෙමින් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් කණ්ඩායම මගින් උදක්ම පරිසර සංරක්ෂණය කෙරෙහි යොමු වූ ව්‍යාපෘතීන් රැස්ක දියත් කරන ලදී. ඉන් එක් ව්‍යාපෘතියක් වනුයේ කොකා කෝලා ශ්‍රී ලංකා සමග එක්ව දියත් කරන ලද 'නැවත ජීවය දෙන්න' නැමති ප්ලාස්ටික් බෝතල් ප්‍රතිචක්‍රීකරණ වැඩසටහනයි. එයට අමතරව ගුවන් සේවය කොළඹ විශ්ව විද්‍යාලය සමග එක්ව සංරක්ෂණ ප්‍රයත්නයක් මෙන්ම සිසුන් සඳහා ක්ෂේත්‍ර පුහුණු වැඩසටහනක් වශයෙන් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි පොලිතීන් සහ ප්ලාස්ටික් භාවිතය පිළිබඳ අධීක්ෂණ ව්‍යාපෘතියක් දියත් කරයි. තවද, මෙම ව්‍යාපෘතීන් දෙකම ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි 'ප්ලාස්ටික් පිටුදැකීමේ' වැඩසටහන හා සමගාමීව පැවැත්වේ.

සිය මෙහෙයුම් වලට අමතරව ශ්‍රීලංකන් එයාර්ලයින්ස්, පාරිසරික ව්‍යාපෘතීන් සම්බන්ධයෙන් IATA සහ වන්වර්ල්ඩ් එකමුතුවෙහි කණ්ඩායම් සමග සමීපව කටයුතු කරයි. මෙහිදී ජනප්‍රිය පාරිභෝගික සහභාගීත්වයක් සහිත ව්‍යාපෘතියක් වශයෙන් 'ෆ්ලයිග්‍රීන්' හැඳින්විය හැක. එය ගුවන් සේවාවේ කාබන් පියසටහන් අවම කිරීම සම්බන්ධ ව්‍යාපෘතිය වන අතර එහිදී ගුවන් සේවාවෙහි ගුවන්යානා ආශ්‍රිත කාබන් විමෝචනය හිලව් කිරීම සඳහා මගීන්ගේද දායකත්වයෙන් යුතුව කුඩා පරිමාණ ජල විදුලි බලාගාර ව්‍යාපෘතියක් සංවිධානය කෙරේ.

ජාතික කාර්යභාරයන් වෙනුවෙන් සෑමවිටම දායකත්වය සපයන ශ්‍රීලංකන් එයාර්ලයින්ස් 2019 ලෝක පරිසර දිනයේදී 'විල්පත්තුවට පැළයක්' යන ව්‍යාපෘතිය අරඹමින්, ශ්‍රී ලංකා යුද හමුදායේ 'තුරුලිය වෙනුවෙන් අපි, වැඩසටහන වෙත පූර්ණ සහයෝගය පළ කර සිටියි.

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් දේශීය හා ජාත්‍යන්තර මට්ටම් දෙකෙහිදීම සියළුම අදාළ පාරිසරික නීතිරීති හා කොන්දේසි වෙත අනුගත වීම සඳහා කැප වී ක්‍රියාකරයි. ලොව කාළගුණ ක්‍රියාකාරකම් වැඩසටහන් 100 අතරට ශ්‍රේණිගත කෙරුනු ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි කාබන් පිටුදැකීම් යාන්ත්‍රණය 'ෆ්ලයිග්‍රීන්' මගින් විමර්ශනයට ලක් වන වසර තුළ කාබන් ඩයොක්සයිඩ් ටොන් 1352 ක් පමණ හිලව් කර ඇත. මෙම වැඩසටහන නිශ්චය කිරීමේ ආයතනයක් වන QAS මගින් එහි තත්ත්වය හා විනිවිදභාවය සම්බන්ධයෙන් ඇගයුමට පාත්‍ර විය. තවද, 'ෆ්ලයිග්‍රීන්' මගින් හරිතාගාර වායු විමෝචනයන් ටොන් 13,000 කින් පමණ වළකා ගනිමින් වසරකට ජාතික පද්ධතිය වෙත ගිගාවොට් පැය 20 ක විදුලි ධාරිතාවක් උත්පාදනය කරන්න වූ අඩවිකන්ද කුඩා පරිමාණ ජල විදුලි බලාගාර වෙත ආයෝජන සිදු කෙරේ.


A330-300
SriLankan



# මූල්‍ය ප්‍රකාශ


අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව 44

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව 2019/20 48

අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශය 49

ස්වාධීන විගණකගේ වාර්තාව 50

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 54

ලාභ අලාභ ප්‍රකාශය 55

විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශය 56

ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය 57

මුදල් ප්‍රවාහ ප්‍රකාශය 58

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් 59

# අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

සීමාසහිත ශ්‍රීලංකන් එයාර් ලයින්ස් සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2020 මාර්තු 31 වැනි දිනෙන් අවසන් වූ වසර සඳහා වන වාර්ෂික වාර්තාව මෙසේ ඉදිරිපත් කරනුයේ ඉමහත් සතුටිනි.

**ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ව්‍යාපාරික කටයුතු සමාලෝචනය**

සමාගමෙහි ප්‍රධාන ව්‍යාපාරික ක්‍රියාකාරකම් වනුයේ ශ්‍රී ලංකාවේ නිල ගුවන් සේවය වශයෙන් මගීන්, භාණ්ඩ හා තැපැල් ප්‍රවාහනය සඳහා සංවිධිත/අසංවිධිත ජාත්‍යන්තර ගුවන් සේවා සම්පාදනයයි. සමාගමෙහි සෙසු ප්‍රධාන ක්‍රියාකාරකම් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ (“BIA”) සහ මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ (“MRIA”) වලදී ගුවන් පර්යන්ත සේවාවන් සැපයීම, ගුවන් මගීන් වෙත තීරු බදු රහිත භාණ්ඩ අලෙවි කිරීම, දේශීය හා ජාත්‍යන්තර නිවාඩු ගත කිරීමේ සැලසුම් අලෙවි කිරීම යනාදියෙන් සමන්විත වේ. සමාගමෙහි සහායක කාර්යයන් අතරට තෙවන පාර්ශ්වීය ගුවන් යානා නඩත්තු සේවා සම්පාදනය, ගුවන් යානා මෙහෙයුම් සේවා සැපයීම සහ ගුවන් සේවා ආශ්‍රිත පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම එක් වේ. මූල්‍ය වර්ෂය තුළදී සමාගමෙහි ක්‍රියාකාරකම් වල කිසිදු කැපී පෙනෙන වෙනසක් සිදු නොවීය. සමූහය, සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගම සහ එහි පූර්ණ හිමිකාරීත්වය සහිත පරිපාලිතය වන, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ (“BIA”) සහ මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ (“MRIA”) ඔස්සේ මෙහෙයුම් සිදුකරන්නා වූ ගුවන් සේවාවන් වෙත යානාස්ථ ආහාරපාන සේවාවන් සැපයීම ප්‍රමුඛ කාර්යභාරය කොටගත් සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සමාගම යන ආයතනයන්ගෙන් සමන්විත වේ. සෙසු සහායක සේවාවන් අතරට පොදු සහ මාර්ගස්ථ අවන්හල් මෙහෙයුම් කටයුතු, ලොන්ඩරි සේවාවන් සැපයීම සහ ගුවන් මගී මර්ගස්ථ හෝටලය කළමනාකරණය අයත් වේ.

**මූල්‍ය ප්‍රකාශන සහ විගණන වාර්තාව**

2020 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන, ප්‍රධාන මූල්‍ය නිලධාරීවරයා සහ අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු විසින් නිසි පරිදි අත්සන් තබන ලද මූල්‍යමය ප්‍රකාශනයන් සහ ඒ සඳහා වන විගණකවරුන්ගේ වාර්තාව මෙම වාර්තාව වෙත අමුණා ඇත.

**ගිණුම්කරණ ප්‍රමිතීන්**

මූල්‍යමය ප්‍රකාශනයන් සැකසීමේදී අනුගත කරන ලද ගිණුම්කරණ ප්‍රමිතීන් මෙම වාර්තාවේ පිටු අංක සිට 59 සිට 103 දක්වා ඉදිරිපත් කෙරේ.

**සමූහයේ පිරිවැටුම**

සමූහයේ පිරිවැටුම ශ්‍රී ලංකා රුපියල් මිලියන 183,532 ක් වශයෙන් දැක්විණි. (2018/2019: ශ්‍රී ලංකා රුපියල් මිලියන 184,097) සමූහ පිරිවැටුම පිළිබඳ විස්තරාත්මක විමර්ශනයක් මූල්‍යමය ප්‍රකාශයන් සඳහා වන සටහන 21 හි දක්වා ඇත. සමාගම සහ එහි පූර්ණ හිමිකාරීත්වය සහිත පරිපාලිත ආයතනය වන සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සමාගම අතර ගනුදෙනු සාධාරණ වෙළඳපොල මිළ ගණන් අනුව සිදුකරන ලදී.

**ප්‍රතිඵල**

සමූහයෙහි වසර සඳහා බදු වලට පසු ශුද්ධ අලාභය රුපියල් මිලියන 44,139 කි. (2018/19 : රුපියල් මිලියන 41,700) සමූහය විසින් රුපියල් මිලියන 35 ක (2018/2019 : රුපියල් මිලියන 73) බදුකරණ වියදමක් දරන ලදී. වසර සඳහා වන ලාභ අලාභ ප්‍රකාශනය පිටුව 55 හි දක්වා ඇත.

**සමූහයේ ආයෝජන**

වසර තුළදී දේපළ, පිරියත සහ උපකරණ මත සමූහයේ ප්‍රාග්ධන වියදම් රුපියල් මිලියන 662 ක් වශයෙන් දැක්විණි (2018/2019 : රුපියල් මිලියන 1,070).

**දේපළ පිරියත සහ උපකරණ**

වාර්තා කරනු ලබන දින වන විට සමූහයේ දේපළ පිරියත සහ උපකරණ වල ශුද්ධ පොත් අගය රුපියල් මිලියන 8,450 ක් වශයෙන් දැක්විණි. (2018/2019 : රුපියල් මිලියන 10,222 ) දේපළ පිරියත සහ උපකරණ සහ ඒවායේ සංචලනය සම්බන්ධ විස්තර මූල්‍යමය ප්‍රකාශනයන් සඳහා වන සටහන 4 හි දක්වා ඇත.

**ප්‍රකාශිත ප්‍රාග්ධනය**

සමාගමෙහි ප්‍රකාශිත ප්‍රාග්ධනය රුපියල් මිලියන 51,617.44 ක් වශයෙන් දැක්විණි (2018/2019 : රුපියල් මිලියන 51,617.44).

**සංචිත**

2020 මාර්තු 31 දින වන විට සමස්ත සමූහ සංචිත රුපියල් මිලියන 312,791 ක සෘණාත්මක අගයක් වශයෙන් දැක්විණි. (2018/19 : රුපියල් මිලියන 219,729 ක සෘණාත්මක අගයකි). මෙය රුපියල් මිලියන 316,478 ක සමුච්චිත අලාභයකින් (2018/19: රුපියල් මිලියන 223,489), රුපියල් මිලියන 3,687 ක ප්‍රාග්ධන සංචිත (2018/19 : රුපියල් මිලියන 3,760) වලින් සමන්විත වේ. මෙකී සංචිතයන්හි සංචලනය මූල්‍යමය ප්‍රකාශනයන්හි ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනයෙහි දැක්වේ.

**ආයතනික ප්‍රදානයන්**

සමූහය මගින් වසර තුළදී රුපියල් මිලියන 0.42 ක ප්‍රදානයන් සිදු කරන ලදී. (2018/19 : රුපියල් මිලියන 8.75).

**බදුකරණය**

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග වූ ගිවිසුම අනුව සමාගම වෙත 2013 මාර්තු 31 දින දක්වා බදු විරාමයක් හිමි විය. 2006 දේශීය ආදායම් පනත අංක 10 දරණ දේශීය අදායම් දෙපාර්තමේන්තුව විසින් සංශෝධනය කරනු ලැබීමෙන් අනතුරුව (සංශෝධිත) 2011 අංක 22 දරණ පනතෙහි විධිවිධාන අනුව සමාගම 2021 මාර්තු 31 වැනි දින තෙක් සිදුකරනු ලබන සියළුම ව්‍යාපාරික කටයුතු සම්බන්ධයෙන් සියළුම බදු වලින් නිදහස් කෙරිණි. කෙසේවුවද, 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනත ක්‍රියාත්මක වීමත් සමග සමාගම 2018 අප්‍රියෙල් 1 වැනි දින සිට සියළුම ස්වකීය ව්‍යාපාරික කටයුතු සම්බන්ධයෙන් සියළුම ආදායම් බදු ගෙවීමේ වගකීමෙන් බැඳී සිටී. මේ වන විට ද්විත්ව බදුකරණ ගිවිසුම් නොපවතින රටවල සිදුකරනු ලබන සිය විදේශගත මෙහෙයුම් සම්බන්ධයෙන් බදු මුදල් ගෙවීමට සමාගම බැඳී සිටී. ශ්‍රීලංකා ආයෝජන මණ්ඩලය සමග වූ ගිවිසුම අනුව පරිපාලිත ආයතනය වන සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සමාගම වෙත 2021 මැයි 30 දින දක්වා බදු විරාමයක් හිමි විය. වර්තමානය වන විට යානාස්ථ මුලුතැන් ගෙවල්වලින් (Flight Kitchen), මාර්ගස්ථ අවන්හල්වලින්, යානාස්ථ ලොන්ඩරි කටයුතු සහ EK පරිශ්‍රය ආශ්‍රිත මෙහෙයුම් මගින් උපයනු ලබන ශුද්ධ ලාභය 2021 මැයි 30 වැනි දින තෙක් සම්පූර්ණයෙන්ම ආදායම් බදු වලින් නිදහස් කොට ඇත. ඉන් අනතුරුව ශුද්ධ ලාභය 2029 මැයි 30 වැනි දින දක්වා තවදුරටත් වසර 8 සඳහා 15% ක සහන බදු අනුපාතයක් යටතේ වගකීමෙන් බැඳේ. පොදු අවන්හල, ''වැනිලා පොඩ්'' ආහාර වෙළඳසැල්, ''සෙමොන්ඩු'' අවන්හල සහ වෙනත් ලොන්ඩරි සේවා හා වෙනත් ආදායම් දැනට පවතින බදු අනුපාතය වන 28% ක ආදායම් බද්දකට යටත් වේ.

## කොටස් පිළිබඳ විස්තර

2020 මාර්තු 31 දින වන විට කොටස් පිළිබඳ විස්තර පහත දැක්වෙන පරිදි වේ:

| කොටස් හිමිකාරීත්වය | කොටස් සංඛ්‍යාව | % හිමිකාරීත්ව |
|---|---|---|
| ශ්‍රී ලංකා රජය | 511,574,169 | 99.11% |
| සේවක අර්ථසාධක අරමුදල | 1,863,676 | 0. 36% |
| වෙනත් | 2,736,510 | 0. 53% |

## නීතිරීති හා රෙගුලාසි වෙත අනුකූලතාවය

සමාගම සෑමවිටකම අදාළ නීතිරීති හා රෙගුලාසිවලට අනුකූලව කටයුතු කරන බවට තහවුරු කොට ඇත. අනුකූලතාවය සම්බන්ධයෙන් වගකිව යුතු කළමනාකරණ නිලධාරීන් විසින් විගණන කමිටුවේ කාර්තුමය රැස්වීම්වලදී අනුකූලතාවය සම්බන්ධ වාර්තාවක් සභාගත කරනු ලබයි.

## සම්බන්ධිත පාර්ශ්වීය ගනුදෙනු

සම්බන්ධිත පාර්ශ්වීය ගනුදෙනු පිළිබඳ විස්තර මූල්‍යමය ප්‍රකාශනයන්හි සටහන 30 හි දක්වා ඇත.

## අසම්භාව්‍ය වගකීම් සහ ප්‍රාග්ධන බැඳීම්

2020 මාර්තු 31 වැනි දිනට අසම්භාව්‍ය වගකීම් සහ එම දිනට ප්‍රාග්ධන වියදම් මත දරන ලද වගකීම් මූල්‍යමය ප්‍රකාශන සඳහා සටහන 27 හි ඉදිරිපත් කොට ඇත.

## වාර්තාකරණ දිනට පසු සිදුවීම්

මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන 29 හි දක්වා ඇති කරුණු හැරුනු විට ගැළපීමක් හෝ හෙළිදරව් කිරීමක් අවශ්‍ය වන ආකාරයේ කිසිදු තත්ත්වයක් වාර්තාකරණ දින සිට උද්ගතව නැත.

## මානව සම්පත්/සේවා නියුක්ති ප්‍රතිපත්ති

සමාගම අඛණ්ඩවම මානව සම්පත් සංවර්ධනය සඳහා ආයෝජන සිදුකරමින් ද නව්‍ය ව්‍යාපාරික ප්‍රමුඛතාවන්ට සරිලන පරිදි ඵලදායී ශ්‍රම බලකායක් සේවයේ යොදවමින් ද සමාගමෙහි අනාගත සාර්ථකත්වය සඳහා සිය සේවකයින්ගේ නිපුණතා සහ දැනුම වර්ධනය කරවමින් කටයුතු කරන බවට තහවුරු කරයි.

සමූහයේ සේවා නියුක්ති ප්‍රතිපත්තීන් මගින් පුද්ගලයින් වෙත නිසි ගරුත්වය ලබාදෙමින් ඔවුන්ගේ ස්ත්‍රී පුරුෂභාවය, ජාතිය හෝ ආගම පිළිබඳව නොසළකා හරිමින් සියලුදෙනා හට සමාන රැකියා අවස්ථා පිරිනමනු ලැබේ. වෘත්තීයමය සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ තත්ව සම්මතයන් කෙරෙහි කැපී පෙනෙන අවධානයක් යොමු කෙරේ. වසර අවසානයේදී සමාගම මගින් සේවයේ යොදවනු ලැබ ඇති පුද්ගලයින් සංඛ්‍යාව 6,693 ක් (2018/19 : 6,794) සහ පරිපාලිතයෙහි සේවක සංඛ්‍යාව 1,008 ක් (2018/2019 : 1,050) විය.

## ව්‍යවස්ථාපිත ගෙවීම්

අධ්‍යක්ෂකවරුන් ඔවුන්ගේ පරම දැනුම සහ විශ්වාසය අනුව, සේවකයින් සහ ශ්‍රී ලංකා රජය සම්බන්ධ සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් නිසි කලට සිදු කරනු ලැබ ඇති බවට සෑහීමකට පත් වේ.

## පරිසර සංරක්ෂණය

සමූහයේ ව්‍යාපාරික කටයුතු මගින් පරිසරය වෙත සෘජු හා වක්‍ර බලපෑම් ඇති කළ හැකි වේ. එහිදී සමූහයේ ප්‍රතිපත්තිය වනුයේ පරිසරය කෙරෙහි ඇති වන අහිතකර බලපෑම් අවම මට්ටමක තබා ගනිමින්, අදාළ අධිකාරීන් හා රෙගුලාසි වෙත සහයෝගය දැක්වීම සහ අනුකූලතාවය ඉහළ නැංවීමයි.

## සාංගමික පාලනය සහ අභ්‍යන්තර පාලනය

නිසි යහපාලන ක්‍රමවේදයන් යොදාගැනීම වර්තමාන ආයතනික ලෝකය තුළ අත්‍යාවශ්‍ය අංගයක් බවට පත්ව තිබේ. සමූහයේ අභ්‍යන්තර පාලන පද්ධතිය සම්බන්ධව ස්වකීය වගකීම අධ්‍යක්ෂකවරුන් විසින් දරනු ලැබේ. මෙම පද්ධතිය සකසනු ලැබ ඇත්තේ වත්කම්වල සුරක්ෂිතභාවය සම්බන්ධ විශ්වසනීයත්වය, අන්තර් සමෝධානය, නිසි ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සහ උත්පාදනය කරනු ලබන මූල්‍යමය තොරතුරු වල නිරවද්‍යතාවය තහවුරු කිරීම උදෙසාය. කෙසේ වුවද ඕනෑම පද්ධතියක් මගින් පරිපූර්ණ වශයෙන් විශ්වසනීයභාවය තහවුරු නොකෙරෙන අතර, කිසියම් සාධාරණ මට්ටමක නිරවද්‍යතාවය සපයනු ලබන බැවින් දෝෂ සහ අක්‍රමිකතා වළකාලීම හෝ සාධාරණ කාලයක් තුළ හඳුනාගැනීම සිදු කෙරේ. අධ්‍යක්ෂක මණ්ඩල විගණන කමිටු වාර්තාව මගින් මෙම වාර්ෂික වාර්තාවේ කොටසක් නිර්මාණය වේ. අධ්‍යක්ෂක මණ්ඩලය, මූල්‍යමය ප්‍රකාශනයන් අත්සන් තබනු ලබන දින දක්වා වන කාලපරිච්ඡේදය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියෙහි බලාත්මකභාවය පිළිබඳව සෑහීමකට පත් වේ.

## අඛණ්ඩ පැවැත්ම

අධ්‍යක්ෂකවරුන්ගේ වගකීම් ප්‍රකාශනයෙහි දක්වා ඇති පරිදි අධ්‍යක්ෂකවරුන් විසින් මූල්‍යමය ප්‍රකාශනයන් සැකසීමේදී අඛණ්ඩ පැවැත්ම පදනම ආදේශ කර ගනු ලැබ ඇත.

## අධ්‍යක්ෂ මණ්ඩලය

සමාගමෙහි සාංගමික ලේඛණයන්හි 79 වගන්තිය ප්‍රකාරව සියළුම අධ්‍යක්ෂකවරුන් ශ්‍රී ලංකා රජය විසින් පත් කරනු ලැබේ. වර්තමාන අධ්‍යක්‍ෂක මණ්ඩලයේ සංක්ෂිප්ත හඳුන්වාදීමක් වාර්ෂික වාර්තාවේ පිටු අංක 10 සිට 11 දක්වා ඉදිරිපත් කෙරේ.

| | |
|---|---|
| අසෝක කාරියවසම් පතිරගේ මහතා (සභාපති) | 2019 දෙසැම්බර් 16 දින සිට බලපැවැත්වෙන පරිදි පත් කෙරිණි. |
| මොහමඩ් අෂ්රොෆ් ඕමාර් මහතා | 2020 ජනවාරි 08 දින සිට බලපැවැත්වෙන පරිදි පත් කෙරිණි. |
| මලික් ප්‍රනාන්දු මහතා | 2020 ජනවාරි 08 දින සිට බලපැවැත්වෙන පරිදි පත් කෙරිණි. |
| ජනාධිපති නීතිඥ මනෝහර ආර්. ද සිල්වා මහතා | 2020 ජනවාරි 08 දින සිට බලපැවැත්වෙන පරිදි පත් කෙරිණි. |
| ජනාධිපති නීතිඥ සමන්ත රත්වත්ත මහතා | 2020 ජනවාරි 08 දින සිට බලපැවැත්වෙන පරිදි පත් කෙරිණි. |
| ශ්‍රීධීර් සාරිපුත්ත හංස විජයසූරිය මහතා | 2020 ජනවාරි 23 දින සිට බලපැවැත්වෙන පරිදි පත් කෙරිණි. |
| සංජය මොහොට්ටාල මහතා | 2020 පෙබරවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි පත් කෙරිණි. |

# අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සබැඳේ.

### හිටපු අධ්‍යක්ෂවරුන්

මෙම අධ්‍යක්ෂවරුන් පහත දැක්වෙන දිනයන්හිදී අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ඉල්ලා අස්වන තුරු 2019 අප්‍රියෙල් 01 දිනෙන් ඇරඹි මූල්‍ය වර්ෂය තුළ අධ්‍යක්ෂ ධූරයන් දැරූහ:

| | ඉල්ලා අස්වුනු දිනය |
|---|---|
| වෛද්‍ය රොෂාන් පෙරේරා මිය | 2019 ජූනි 21 |
| එයාර් චීෆ් මාර්ෂල් (විශ්‍රාමික) කපිල ජයම්පති | 2019 අගෝස්තු 22 |
| සුසන්ත කටුගම්පළ මහතා | 2019 සැප්තැම්බර් 12 |
| විදානලාගේ දේශාල් ප්‍රවීන් ද මෙල් | 2019 නොවැම්බර් 17 |
| ගනේගම සේන විතානගේ | 2019 නොවැම්බර් 18 |
| සෙල්ලම්පොල ගෙදර සේනාරත්න | 2019 දෙසැම්බර් 09 |
| සරෝජින් ජොහාන් විජේසිංහ | 2020 ජනවාරි 08 |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය අර්ජුන ප්‍රියදර්ශින් ද සිල්වා | 2020 ජනවාරි 08 |
| ඒ එම් පී එම් බී අතපත්තු මහතා | 2020 ජනවාරි 08 |
| ඒ කේ ඩී ඩී ඩී අරන්දර මහතා | 2020 ජනවාරි 08 |
| වජිර කුලතිලක මහතා | 2020 ජනවාරි 08 |

### මානව සම්පත් හා සේවක පාරිශ්‍රමික කමිටුව

සේවක පාරිශ්‍රමික කමිටුවේ මූලික අරමුණ නම්, වේතන ප්‍රතිපත්තියක් සැකසීම උදෙසා නිල හා විනිවිදභාවයෙන් යුතු ක්‍රියාපටිපාටියක් ස්ථාපනය කිරීම සඳහා නියමු කාර්යභාරය ඉටු කිරීම සහ වේතන ව්‍යුහයක් ස්ථාපනය කිරීමයි.

වෙළඳපොල හා ක්ෂේත්‍ර සාධක සහ සමූහයේ සියලු සමාගම්වල පුද්ගල කාර්යසාධනය මත පදනම්ව වේතන ප්‍රතිපත්තියක් සකසනු ලැබ ඇත. මානව මානව සම්පත් සහ සේවක පාරිශ්‍රමික කමිටුව සෑම කාර්තුවකදීම රැස්වේ.

පහත සඳහන් අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයින් සමාගමෙහි මානව සම්පත් සහ සේවක පාරිශ්‍රමික කමිටුව සඳහා පත් කොට ඇත.

මොහමඩ් අෂ්රොෆ් ඕමාර් මහතා (සභාපති)
මලික් ප්‍රනාන්දු මහතා
ජනාධිපති නීතිඥ මනෝහර ආර්. ද සිල්වා මහතා
ජනාධිපති නීතිඥ සමන්ත රත්වත්ත මහතා
සංජය මොහොට්ටාල මහතා

### විගණන කමිටු සාමාජිකයින්

එස් ජී සේනාරත්න මහතා 2019 දෙසැම්බර් 09 වන දින ඉල්ලා අස්වන තෙක් වූ මූල්‍ය වර්ෂය තුළ විගණන කමිටුවේ සභාපතිවරයා විය. විගණන කමිටුව පහත දැක්වෙන සාමාජිකයින්ගෙන් සැදුම්ලත් වේ.

සංජය මොහොට්ටාල මහතා/තාවකාලික සභාපති
මලික් ප්‍රනාන්දු මහතා
ජනාධිපති නීතිඥ මනෝහර ආර්. ද සිල්වා මහතා
ජනාධිපති නීතිඥ සමන්ත රත්වත්ත මහතා
ආචාර්ය හංස විජයසූරිය

විගණන කමිටු වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 48 හි දක්වා ඇත.

### රැස්වීම් සඳහා අධ්‍යක්ෂකවරුන්ගේ සහභාගීත්වය

මූල්‍ය වර්ෂය තුළ අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් 15 ක් හදිසි රැස්වීම් දෙකක් සහ එක් විශේෂ රැස්වීමක්ද ඇතුළුව) පැවැත්වුණු අතර ඒ සඳහා අධ්‍යක්ෂකවරුන්ගේ පැමිණීම පහත දැක්වෙන පරිදි වේ.

| 2019/2020 මූල්‍ය වර්ෂය තුළ අධ්‍යක්ෂවරයාගේ නම | අධ්‍යක්ෂ ධූරය දැරූ කාලසීමාව තුළ සහභාගී වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සංඛ්‍යාව |
|---|---|
| අසෝක පතිරගේ මහතා (සභාපති) | 3/3 |
| අෂ්රොෆ් ඕමාර් මහතා | 3/3 |
| මලික් ප්‍රනාන්දු මහතා | 3/3 |
| ජනාධිපති නීතිඥ මනෝහර ආර්. ද සිල්වා මහතා | 3/3 |
| ජනාධිපති නීතිඥ සමන්ත රත්වත්ත මහතා | 3/3 |
| ආචාර්ය හංස විජයසූරිය | 3/3 |
| සංජය මොහොට්ටාල මහතා | 2/2 |
| සුසන්ත කටුගම්පළ මහතා (2019 සැප්තැම්බර් 12 දින සිට බලපැවැත්වෙන පරිදි ධූර කාලය අවසන් විය) | 8/10 |
| එයාර් චීෆ් මාර්ෂල් (විශ්‍රාමික) කපිල ජයම්පති | 8/10 |
| වෛද්‍ය රොෂාන් පෙරේරා මිය | 6/6 |
| දේශාල් ද මෙල් මහතා | 3/3 |
| ජී එස් විතානගේ මහතා | 12/12 |
| එස් ජී සේනාරත්න මහතා | 10/12 |
| ජොහාන් විජේසිංහ මහතා | 10/12 |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය අර්ජුන ද සිල්වා මහතා | 9/12 |
| ඒ එම් පී එම් බී අතපත්තු මහතා | 2/3 |
| ඒ කේ ඩී ඩී ඩී අරන්දර මහතා | 1/2 |
| වජිර කුලතිලක මහතා | 1/1 |

### සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලය

සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සමාගමෙහි වත්මන් අධ්‍යක්ෂ මණ්ඩලය පහත දැක්වේ:

| | |
|---|---|
| අසෝක කාරියවසම් පතිරගේ මහතා (සභාපති) | 2020 ජනවාරි 24 දින සිට බලපැවැත්වෙන පරිදි පත් කෙරිණි. |
| මොහමඩ් අෂ්රොෆ් ඕමාර් මහතා | 2020 ජනවාරි 24 දින සිට බලපැවැත්වෙන පරිදි පත් කෙරිණි. |
| මලික් ප්‍රනාන්දු මහතා | 2020 ජනවාරි 24 දින සිට බලපැවැත්වෙන පරිදි පත් කෙරිණි. |
| ජනාධිපති නීතිඥ මනෝහර ආර්. ද සිල්වා මහතා | 2020 ජනවාරි 24 දින සිට බලපැවැත්වෙන පරිදි පත් කෙරිණි. |
| ජනාධිපති නීතිඥ සමන්ත රත්වත්ත මහතා | 2020 ජනවාරි 24 දින සිට බලපැවැත්වෙන පරිදි පත් කෙරිණි. |
| සංජය මොහොට්ටාල මහතා | 2020 පෙබරවාරි 1 දින සිට බලපැවැත්වෙන පරිදි පත් කෙරිණි. |

මෙම අධ්‍යක්ෂවරුන් පහත දැක්වෙන දිනයන්හිදී අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ඉල්ලා අස්වන තුරු 2019 අප්‍රියෙල් 01 දින ඇරඹි මූල්‍ය වර්ෂය තුළ අධ්‍යක්ෂ ධූරයන් දැරූහ:

| | ඉල්ලා අස්වුනු දිනය |
|---|---|
| වෛද්‍ය රොෂාන් පෙරේරා මිය | 2019 ජූනි 21 |
| එයාර් වයිස් මාර්ෂල් (විශ්‍රාමික) කපිල ජයම්පති | 2019 අගෝස්තු 22 |
| සුසන්ත කටුගම්පළ මහතා | 2019 සැප්තැම්බර් 12 |
| විදානලාගේ දේශාල් ප්‍රවීන් ද මෙල් | 2019 නොවැමබර් 17 |
| ගනේගම සේන විතානගේ | 2019 නොවැම්බර් 18 |
| සෙල්ලම්පොල ගෙදර සේනාරත්න | 2019 දෙසැම්බර් 09 |
| සරෝජින් ජොහාන් විජේසිංහ | 2020 ජනවාරි 24 |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය අර්ජුන ප්‍රියදර්ශින් ද සිල්වා | 2020 ජනවාරි 24 |
| ඒ එම් පී එම් බී අතපත්තු මහතා | 2020 ජනවාරි 24 |
| ඒ කේ ඩී ඩී ඩී අරන්දර මහතා | 2020 ජනවාරි 24 |

### අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික

2007 අංක 7 දරණ සමාගම් පනතෙහි 168 (1) (එෆ්) වගන්තිය ප්‍රකාරව සමාගමෙහි විධායක නොවන අධ්‍යක්ෂකවරුන් වෙත ගෙවන ලද සමුච්චිත වේතන මෙම වාර්තාවේ 96 පිටුවෙහි සටහන 30 යටතේ දැක්වේ.

### අධ්‍යක්ෂවරුන්ගේ කොටස් හිමිකාරීත්වය

තමන් විසින් දරනු ලබන තනතුරෙහි නිල බලය අනුව ශ්‍රී ලංකා රජය මගින් යෝජනා කරන ලද නාමයෝජක අධ්‍යක්ෂ ඒ කේ පතිරගේ මහතා සමාගමෙහි සාමාන්‍ය කොටස් 3 ක හිමිකාරීත්වය දරයි.

### සබඳතා ලේඛනය

2007 අංක 7 දරන සමාගම් පනතේ විධිවිධානය අනුව සමාගම මගින් සබඳතා ලේඛනයක් පවත්වාගෙන යනු ලබයි. සියලුම අධ්‍යක්ෂවරුන් තමන් වෙනත් සමාගම් වල පවත්වාගෙන යන සබඳතා පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අනාවරණය කොට ඇත. 2007 අංක 7 දරන සමාගම් පනතෙහි අංක 191 (1) සහ 192 (2) යන වගන්ති ප්‍රකාරව අදාළ සබඳතා පිළිබඳව අධ්‍යක්ෂකවරුන්ගේ සබදතා ලේඛනයෙහි වාර්තා කොට ඇත.

2007 අංක 7 දරන සමාගම් පනත මගින් නියම කොට ඇති පරිදි එම සබඳතා ලේඛනය පරීක්ෂා කිරීම සඳහා ලබා ගත හැකි වේ.

### අධ්‍යක්ෂකවරුන්ගේ ගිවිසුම් සබඳතා

සමාගමෙහි ව්‍යාපාරික කටයුතු වලට අදාළ කිසිදු ගිවිසුමක් හෝ යෝජිත ගිවිසුමක් සම්බන්ධයෙන් අධ්‍යක්ෂකවරුන් කිසිදු සෘජු හෝ වක්‍ර සම්බන්ධතාවයක් නොමැත. මෙය මූල්‍ය ප්‍රකාශන සටහන් අංක 30 හි සඳහන් වේ.

### වාර්ෂික මහා සභා රැස්වීම

සමාගමෙහි හතළිස් දෙවැනි වැනි වාර්ෂික මහා සභා රැස්වීම, කොළඹ 7, බෞද්ධාලෝක මාවතේ පිහිටි බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ (BMICH) 'ලෝටස්' ශාලා පරිශ්‍රයේදී 2020 සැප්තැම්බර් 25 වන සිකුරාදා දින පෙරවරු 10.00 ට පවත්වනු ලැබේ.

මහා සභා රැස්වීම දැනුම්දීම වාර්ෂික වර්තාවේ පිටු අංක 113 හි දැක්වේ.

### විගණක

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහනම වැනි සංශෝධනයේ 36 වැනි වගන්තිය ප්‍රකාරව සමාගමෙහි විගණක වශයෙන් විගණකාධිපතිවරයා මෙයින් පත් කරනු ලැබේ. විගණක ගාස්තු පිළිබඳව මූල්‍ය ප්‍රකාශයන් සඳහා සටහන 23 හි දක්වා ඇත. සමාගම හෝ එහි පරිපාලිත ආයතනය සමග (විගණකවරයකු වශයෙන් පවතින සම්බන්ධය හැරුණු විට) විගණකවරුන්ගේ කිසිදු සබඳතාවයක් නොමැත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

**අසෝක පතිරගේ**
*සභාපති*

**සංජය මොහොට්ටාල**
*අධ්‍යක්ෂ*

**ඩැල්රීන් තිරුකුමාර්**
*සමාගම් ලේකම්/ආයතනික ලේකම් සේවා ප්‍රධානි*

2020 ජූලි 31
කටුනායක

# අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව 2019/20

### කාර්යභාරය හා වගකීම්

ශ්‍රීලංකන් ගුවන් සමාගමේ අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුවේ විෂය පථය හා වගකීම් අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටු ප්‍රඥප්තිය ප්‍රකාරව පාලනය කරනු ලැබේ. අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුවේ ප්‍රධාන අරමුණ වනුයේ ශ්‍රීලංකන් එයාර්ලයින්ස් හි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහාය වීමයි. ස්වකීය කාර්යභාරයන් වනුයේ අභ්‍යන්තර පාලන පද්ධතිය, මූල්‍ය වාර්තාකරණ ක්‍රියාපටිපාටි, අවදානම් කළමණාකරන ක්‍රියාපටිපාටි, පාලන ක්‍රියාපටිපාටි, විගණන ක්‍රියාපටිපාටි, නීති හා රෙගුලාසි සමඟ අනුකූලතාවය නිරීක්‍ෂණය කිරීම සඳහා සමාග මේ ක්‍රියාපටිපාටි සහ චර්යා ධර්ම සංග්‍රහය වැනි ක්ෂේත්‍ර වලට අදාළ වගකීම් ඉෂ්ට කිරීමයි.

### කමිටුවෙහි සංයුතිය

2020 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා අධ්‍යක්ෂ මණ්ඩල විගණණ කමිටුවෙහි සේවය කරන ලද අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් වූයේ, වෛද්‍ය. රොෂාන් පෙරේරා මිය (සාමාජික, 2019 ජූනි 21 දින ඉල්ලා අස්විය), එයාර් චීෆ් මාර්ෂල් (විශ්‍රාමික) කේ. ජයම්පති (සාමාජික, 2019 අගෝස්තු 22 දින ඉල්ලා අස්විය), එස්. කටුගම්පොළ මහතා (සාමාජික, 2019 සැප්තැම්බර් 12 දින ධූර කාලය අවසන් විය), ඩී. ද මෙල් මහතා (සාමාජික, 2019 අගෝස්තු 22 දින පත් කරනු ලදුව 2019 නොවැම්බර් 17 දින ඉල්ලා අස්විය), එස්. ජී . සේනාරත්න මහතා (වැඩබලන සභාපති, 2019 දෙසැම්බර් 9 දින ඉල්ලා අස්විය), මහාචාර්ය අර්ජුන පී ද සිල්වා (සාමාජික, 2020 ජනවාරි 8 දින ඉල්ලා අස්විය), ඒ එම් පී එම් බී අතපත්තු මහතා (සාමාජික, 2019 අගෝස්තු 22 දින පත් කරනු ලදුව 2020 ජනවාරි 8 දින ඉල්ලා අස්විය), ඒ කේ ඩී ඩී ඩී අරන්දර මහතා ( සාමාජික, 2019 සැප්තැම්බර් 12 දින පත් කරනු ලදුව 2020 ජනවාරි 8 දින ඉල්ලා අස්විය), එස් මොහොට්ටාල මහතා (තාවකාලික සභාපති, 2020 පෙබරවාරි 1 දින පත් කරන ලදී), එම් ප්‍රනාන්දු මහතා (සාමාජික, 2020 ජනවාරි 24 දින පත් කරන ලදී), ජනාධිපති නීතිඥ එස් රත්වත්ත මහතා (සාමාජික, 2020 ජනවාරි 24 දින පත් කරන ලදී), ජනාධිපති නීතිඥ එම් ද සිල්වා මහතා (සාමාජික, 2020 ජනවාරි 24 දින පත් කරන ලදී), ආචාර්ය හංස විජයසූරිය (සාමාජික, 2020 ජනවාරි 24 දින පත් කරන ලදී), ඒ ඩී දිල්රුක්ෂි මිය, විගණන අධීක්ෂිකා ස්වාධීන නිරීක්ෂිකාවක් වශයෙන් කමිටුවට සහභාගී වේ.

### රැස්වීම්

2020 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීම් පහක් (5) පැවැත්විණි. නිශ්චිත කරුණු පිලිබඳව අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුවට පැහැදිලි කිරීම සඳහා සමාගමේ කළමනාකරණ සාමාජිකයින් ආරාධනා මත රැස්වීම්වලට සහභාගී විය.

### සමූහ සහතිකකරණ හා උපදේශක සේවා අංශය

ශ්‍රීලංකන් ගුවන් සමාගමේ සමූහ සහතිකකරණ හා උපදේශක සේවා අංශය විසින් අභ්‍යන්තර විගණනයන් පවත්වන ලබන අතර අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුව වෙත සෘජුවම වාර්තා කරයි. ව්‍යාපාර අවදානම් කළමනාකරණ රාමුව ස්ථාපිත කිරීම සඳහා පහසුකම් සැපයීම සහ කිරීමේලා තොරතුරු පද්ධති/ තොරතුරු තාක්ෂණ පාලන ඇතුළුව අභ්‍යන්තර පාලන පද්ධතිවල ප්‍රමාණවත්භාවය, කාර්යක්ෂමතාව හා එලදායිතාවය පිලිබඳ ස්වාධීන හා විෂය මූලික තක්සේරුවක් සමූහ සහතිකවීම් හා උපදේශක සේවා අංශය මඟින් සලසා දෙයි. ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණය,පාලනය සහ අනුකූලතා පද්ධති මත කළමණාකරණය වෙත උපදේශක සේවා සැපයීම ද සහතිකවීම් හා උපදේශක සේවා අංශය සිදුකරයි.

### මූල්‍ය වර්ෂය තුල අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුවේ ප්‍රධාන ක්‍රියාකාරකම්

- තොරතුරු පද්ධති/තොරතුරු තාක්ෂණ පාලනයන් සහ විගණන නිර්දේශවල තත්ත්වය ස්ථාපිත කිරීම ඇතුළුව අභ්‍යන්තර පාලන පද්ධති මත වාර්ෂික විගණන සැලැස්ම ස්ථාපිත කිරීම සහ වාර්ෂික විගණන සොයාගැනීම් සමාලෝචනය කිරීම.
- ව්‍යාපාර අවදානම් හඳුනාගැනීම, ඇගයීම හා කළමනාකරණය සඳහා කළමනාකාරීත්වය විසින් ආදේශ කරගනු ලැබූ අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන් හා ක්‍රියාපටිපාටි සමාලෝචනය කිරීම.
- සියලුම අදාළ නීති හා රෙගුලාසි වලට අනුකූලව කටයුතු කර ඇති බවට සාධාරණ සහතික වීමක් ලබාදී ඇති බවට නිශ්චය කිරීම සඳහා සමාගමේ අනුකූලතා රාමුව සමාලෝචනය කිරීම.
- ව්‍යාපාර බාධාවීම්/අපදාවන් මත වූ අවදානම් වල බලපෑම් අවම කිරීම සඳහා ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් ක්‍රියාත්මක කිරීම පිළිබඳව සමාලෝචනය කිරීම.
- බාහිර විගණනයේ ස්වභාවය, විෂයපථය හා ප්‍රවේශය දැනගැනීම සඳහා බාහිර විගණකයින් සමග සාකච්ඡා කිරීම සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ කිරීමට පෙර විගණිත මූල්‍ය ප්‍රකාශ සමාලෝචනය කිරීම.
- කාලානුරූපීව සුදුසු ක්‍රියාමාර්ගයන් ගෙන ඇති බවට සෑහීමකට පත්වීම උදෙසා, බාහිර විගණකගේ කළමණාකරන ලිපිය සහ විශේෂ කොට දක්වා ඇති ගැටළු සඳහා කළමනාකාරීත්වයේ ප්‍රතිචාරයන් සමාලෝචනය කිරීම.
- එහි වාර්තාකරණ වගකීම් සම්බන්ධ ස්වාධීනත්වය හා අධිකාරීත්වය ඇතුළුව සමූහ සහතිකකරණ හා උපදේශන සේවාවන්හි ක්‍රියාකාරකම් හා අභ්‍යන්තර විගණන සැලසුම සමාලෝචනය කිරීම.
- බාහිර විගණකගේ ස්වාධීනත්වය ඇගයුමට ලක් කිරීම හා බාහිර විගණන කටයුතු නිරීක්ෂණය කිරීම.

**එස්. මොහොට්ටාල**
*වැඩබලන සභාපති*

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව
2020 ජූලි 31

# අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශය

සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශනවලට අදාළව අධ්‍යක්ෂවරුන්ගේ වගකීම්, 52 වන පිටුවේ ඇති වාර්තාවේ අන්තර්ගත විගණකවරුන්ගේ වගකීම් වලින් වෙනස් වේ.

2007 අංක 07 දරන සමාගම් පනතේ අවශ්‍යතාවය ප්‍රකාරව මූල්‍ය වර්ෂය අවසාන දිනට සමාගමේ සහ සමූහයේ කටයුතුවල තත්ත්වය පිළිබඳව හා අදාළ මූල්‍ය වර්ෂය තුළ සමාගමේ සහ සමූහයේ ලාභය හෝ අලාභය පිළිබඳව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් නිරූපනය වන පරිදි එක් එක් මූල්‍ය වර්ෂය වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශ අධ්‍යක්ෂවරුන් විසින් පිළියෙල කළ යුතුය. මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීමෙහිදී ගැලපෙන ගිණුම්කරණ ප්‍රමිතීන් තෝරාගැනීම හා ඒවා අනුගත අයුරින් යොදාගැනීම හා සාධාරණ සහ විචක්ෂණශීලි විනිශ්චයන් මත කටයුතු කිරීම සිදුකරනු ලැබ ඇති අතර අදාළ වන්නා වූ ගිණුම්කරණ ප්‍රමිතීන් අනුගමනය කරනු ලැබ ඇත.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඉදිරිපත් කර ඇති බවට සහ 2007 අංක 07 දරන සමාගම් පනතින් නියමකර ඇති තොරතුරු සම්පාදනය කරන බවට සහතික කිරීම සඳහා සමාග මේ සහ සමූහයේ මූල්‍ය තත්ත්වය සාධාරණ නිරවද්‍යතාවයකින් යුක්තව හෙළිදරව් කිරීමට සමාගම සහ එහි පරිපාලිත සමාගම ප්‍රමාණවත් ගිණුම් වාර්තා තබා ගැනීම සහතික කිරීම අධ්‍යක්ෂවරුන්ගේ වගකීම වේ. සමූහයේ වත්කම් ආරක්ෂා කරගැනීම සඳහා සාධාරණ ක්‍රියාමාර්ග ගැනීමේ වගකීමද ඔවුන් විසින් දරනු ලබන අතර, එම තත්ත්වය තුළ වංචා හා අක්‍රමිකතා සිදුවීම හඳුනාගැනීමට හා වැළැක්වීම සඳහා ගැලපෙන අභ්‍යන්තර පාලන ක්‍රම ස්ථාපනය කිරීම වෙනුවෙන් නිසි සැලකිල්ලක් දැක්විය යුතුය.

බැංකු ණය පහසුකම් ලබාගැනීම සඳහා සහනශීලී ලිපි/රජයේ සහතිකවීම මාර්ග යෙන් ශ්‍රී ලංකා රජය විසින් ලබාදෙන අඛණ්ඩ සහයෝගය සැලකීමෙන් අනතුරුව, මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමෙහිදී "අඛණ්ඩ පැවැත්ම" පදනම යොදාගැනීම අධ්‍යක්ෂවරු තවදුරටත් සිදුකර ඇත. තවද, මූල්‍ය සටහන් වල 3 වන සටහන යටතේ විස්තර කර ඇති පරිදි යෝජිත ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කරන තෙක් "අඛණ්ඩ පැවැත්ම" පදනම යටතේ මෙහෙයුම් කටයුතු අඛණ්ඩව සිදුකිරීමට අවශ්‍ය මූල්‍ය අනුග්‍රහය තවදුරටත් ශ්‍රී ලංකා රජය විසින් සපයනු ලබන බවට 2020 ජූනි 17 වන දිනැති කැබිනට් මණ්ඩල අනුමැතියක් හරහා ශ්‍රී ලංකා රජය විසින් තහවුරු කර ඇත (2020 ජූනි 29 දින භාණ්ඩාගාරික ලේකම් විසින් ලිපිය නිකුත් කර ඇත).

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ ඔවුන්ගේ මතය ගොඩනගා ගැනීම සඳහා සුදුසු වේ යැයි සලකනු ලබන කවර හෝ පරීක්ෂාවක් සිදු කිරීමට විගණකවරුන්ට සෑම අවස්ථාවක්ම සලසා ඇති බවට සහතික වීම සඳහා අධ්‍යක්ෂවරුන් විසින් අවශ්‍ය පියවර ගනු ලැබ ඇත.

ගිණුම් වාර්තා කරනු ලබන දිනට සමාගමට සහ එහි පරිපාලිත සමාගමට අදාළ සියලු බදු, අයකිරීම් හා මූල්‍ය බැඳීම් ගෙවා හෝ ඊට අදාළ ප්‍රමාණවත් ප්‍රතිපාදනය මූල්‍ය ප්‍රකාශ තුළ සිදුකර ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්වකීය උපරිම දැනුමට අනුව තහවුරු කරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

**ඩැල්රින් තිරුකුමාර්**
*සමාගම් ලේකම්*

2020 ජූලි 31

# ස්වාධීන විගණකගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. AVA/C/SLAL/06/19/111    ඔබේ අංකය / உமது இல. / Your No.    දිනය / திகதி / Date 19 August 2020

**සභාපති**

**සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගම 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව, 2020 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සීමාසහිත ශ්‍රීලංකන් එයාලයින්ස් සමාගමේ සහ එහි පරිපාලිත සමාගමේ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව**

## 1. මූල්‍ය ප්‍රකාශ

### *1.1 මතය*

සී/ස ශ්‍රී ලන්කන් එයාර්ලයින්ස් සමාගමේ ("සමාගම") සහ එහි පරිපාලිතයේ ("සමූහය") 2020 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ හා විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව පාර්ලිමේන්තුවට මා විසින්ඉදිරිපත් කළ යුතු වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ඇත. මෙම විගණනය සිදු කිරීම සඳහා ප්‍රසිද්ධ වෘත්තියේ නියුතු වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයක් මට සහාය විය.

මූල්‍ය ප්‍රකාශනවලින් 2020 මාර්තු 31 දිනට සමාගමේ හා සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### *1.2 මතය සඳහා පදනම*

මම මගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (SLAuSs) අනුකූලව සිදු කළෙමි. එම ප්‍රමිති යටතේ මගේ වගකීම් මගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකගේ වගකීම් යටතේ තවදුරටත් විස්තර කෙරේ. මා ලබාගත් විගණන සාක්ෂි මගේ මතයට පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ සුදුසු යැයි මම විශ්වාස කරමි.

### *1.3 කාරණා අවධාරණය කිරීම*

**අ) අඛණ්ඩ පැවැත්ම පිළිබඳව ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාව**

සටහන 3 වෙත මම අවධානය යොමු කරමි, එයින් ඇඟවෙන්නේ 2020 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළදී සමාගමට රුපියල් මිලියන 47,197.86 ක ශුද්ධ අලාභයක් සිදුවී ඇති බවත්, ඒ අනුව රුපියල් මිලියන 326,341.48 ක සමුච්චිත අලාභයක් ඇති බවත්, ඒ වන විට සමාගමේ ජංගම බැරකම් ජංගම වත්කම් ඉක්මවා ඇති බවත්, මුළු බැරකම් මුළු වත්කම් ඉක්මවා ඇති බවත් එම ඉක්මවීම් පිළිවෙලින් රුපියල් මිලියන 211,645.13 හා රුපියල් මිලියන 273,369.08 ක් බවත් පෙන්නුම් කෙරිනි. තවද 2020 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළදී සමූහයට රුපියල් මිලියන 44,139.40 ක අලාභයක් සිදුවී ඇති බවත්, ඒ අනුව රුපියල් මිලියන 316,477.65 ක සමුච්චිත අලාභයක් ඇති බවත්, ඒ වන විට සමාගමේ ජංගම බැරකම් ජංගම වත්කම් ඉක්මවා ඇති බවත්, මුළු බැරකම් මුළු වත්කම් ඉක්මවා ඇති බවත් එම ඉක්මවීම් පිළිවෙලින් රුපියල් මිලියන 200,878.32 හා රුපියල් මිලියන 261,173.54 ක් බවත් පෙන්නුම් කෙරිනි.

සටහන 3 හි සඳහන් කර ඇති පරිදි, මෙම සිදුවීම් සහ කොන්දේසි, සටහන 3 හි දක්වා ඇති අනෙකුත් කාරණා සමඟ, ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පෙන්නුම් කරන අතර එමඟින් සමූහයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව පිළිබඳව සැලකිය යුතු සැකයක් මතු විය හැකිය.

දිවයින තුළ කෝවිඩ් 19 වසංගතය පැතිරීමෙන් අනතුරුව, රජය විසින් පනවන ලද ගමනාග මන සීමාවන්, පියවීම් ප්‍රමාදවීම් සහ ණාය හා ද්‍රවශීලතා අවදානම හේතුවෙන්, සමූහයෙහි/සමාගමෙහි ආදායම වෙත අහිතකර බලපෑමක් ඇති විය.

මූල්‍ය ප්‍රකාශයන්හි 2.1 සටහන මඟින්, සමූහයෙහි/සමාගමෙහි අනාගත වර්ධනයන්, කාර්යසාධනය සහ මුදල් ප්‍රවාහ කෙරෙහි කෝවිඩ් 19 හි බලපෑම විස්තර කරයි. මෙම මූල්‍ය ප්‍රකාශයන් සම්බන්ධයෙන් අවසන් එකඟත්වයට පත්වන මොහොතේදීද වසංගතය පැවතීමේ තත්ත්වය තුළ මෙකී සිදුවීම් හා තත්ත්වයන් සම්බන්ධයෙන් කටයුතු කරන ආකාර පිළිබඳ කළමනාකාරීත්වය විසින් පැහැදිලි කරනු ලැබ ඇත.

සටහන අංක 3 හි දක්වා ඇති අවම කිරීමේ සාධක සහ 2020 ජූනි 17 දින කැබිනට් අනුමැතිය සහ 2020 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ව්‍යවස්ථාපිත විගණනය සඳහා ලබාගත්, භාණ්ඩාගාර ලේකම් විසින් 2020 ජූනි 29 දින නිකුත් කරන ලද ලිපිය සැලකිල්ලට

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව    இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.    No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34    +94 11 2 88 72 23    ag@auditorgeneral.gov.lk    www.naosl.gov.lk

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

ගනිමින්, ශ්‍රී ලංකා රජය (GOSL) සමාගම වෙත “අඛණ්ඩ පැවැත්ම” සහිත සමාගමක් වශයෙන් සිය මෙහෙයුම් පවත්වා ගෙන යාම සඳහා සහයෝගය තහවුරු කරන ලද අතර, මෙම මූල්‍ය ප්‍රකාශ අඛණ්ඩ පැවැත්ම පදනම භාවිත කරමින් පිළියෙල කොට ඇත.

**ආ) A350-900 පූර්ව ලබාගැනීමේ ගෙවීම්**
සටහන 6 වෙත මාගේ අවධානය යොමු වන අතර, ඒමගින් 2020 සහ 2021 දී Airbus A350-900 යානා හතරක් ලබාගැනීම සඳහා සිදුකරන ලද රු. මිලියන 2,528.12 (ඇ.ඩො. මිලියන 19.21) ක වටිනාකමකින් යුතු පූර්ව ලබාගැනීමේ ගෙවීම් ඇතුළු 2020 මාර්තු 31 දිනට පූර්ව ලබාගැනීමේ ගෙවීම් දැක්වෙන අතර, 2020 මාර්තු 31 දිනට එයාර්බස් සමාගම වෙත නොගෙවන ලද ඇ.ඩො. මිලියන 207.89 ක පූර්ව ලබාගැනීමේ ගෙවීම් පැවතිණි.

සටහන 6 හි දැක්වෙන පරිදි, සමාගම එයාර්බස් සමග ගිවිසුම පිළිබඳ නැවත සාකච්ඡාවන් සිදුකරමින් පවතින අතර ඒමනිසා අදාළ නැවත සාකච්ඡා කිරීම් තුළින් පූර්ව ලබාගැනීමේ ගෙවීම් අහිමිවීමක් හෝ දඩ මුදල් අධ්‍යක්ෂ මණ්ඩලය අපේක්ෂා නොකරයි. කෙසේවුවද, 2020 ජූලි 30 දින වන විටත් මේ සම්බන්ධයෙන් අවසන් තීරණයකට එළඹ නොතිබිණි.

මෙකී කරුණු සම්බන්ධයෙන් මාගේ මතය සංශෝධනය නොකෙරිණි.

### *1.4 වෙනත් තොරතුරු*
වෙනත් තොරතුරු සම්බන්ධයෙන් කළමනාකාරීත්වය වගකීමෙන් බැඳේ. වෙනත් තොරතුරු වාර්ෂික වාර්තාවේ ඇතුළත් තොරතුරු වලින් සමන්විත වන අතර, එයට මූල්‍ය ප්‍රකාශ සහ ඒ සම්බන්ධ මාගේ විගණකගේ වාර්තාව ඇතුළත් නොවේ. මෙම මූල්‍ය ප්‍රකාශ වෙනත් තොරතුරු වලින් සමන්විත නොවේ.

මූල්‍ය ප්‍රකාශ සම්බන්ධ මාගේ මතය මගින් වෙනත් තොරතුරු ආවරනය නොවන අතර ඒ සම්බන්ධයෙන් මවිසින් කිසිදු ආකාරයක තහවුරුවක් හෝ නිගමනයක් සපයනු නොලැබේ.

මූල්‍ය ප්‍රකාශ විගණනය සම්බන්ධයෙන්, මාගේ වගකීම වනුයේ වෙනත් තොරතුරු කියවා බැලීම වන අතර එහිදී, වෙනත් තොරතුරු හා මූල්‍ය ප්‍රකාශ අතර ප්‍රමාණාත්මක නොගැළපීමක් පවතීද, විගණනයේදී අප ලද දැනුම අනුව හෝ වෙනත් ආකාරයකින් කිසියම් ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් සිදුවී ඇතිද යන්න සොයා බැලේ. එසේ නම්, අප විසින් සිදුකරන ලද කාර්යය මත පදනම්ව, මෙම වෙනත් තොරතුරු වල ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් ඇතැයි අප විසින් නිගමනය කළහොත්, මවිසින් එය වාර්තා කළ යුතු වේ. මේ සම්බන්ධයෙන් වාර්තා කිරීමට මා හට කිසිදු කරුණක් නොමැත.

### *1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්*
මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකාරීත්වයෙහි වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකාරීත්වයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකාරීත්වයේ වගකීමකි.

සමාගමේ සහ සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා පාලනයේ වගකීම ඇති අය වගකිව යුතුය.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16 (1) වගන්තියට අනුව, වාර්ෂික සහ වාරාන්තරව සමාගමෙහි හා සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා සමාගම සහ සමූහය විසින් සිය ආදායම, වියදම්, වත්කම් සහ වගකීම් පිළිබඳ නිසි පොත් සහ වාර්තා පවත්වා ගෙන යා යුතුය.

### *1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකවරුන්ගේ වගකීම්*
සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශන අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශන ඇතිවිය හැකි අතර, මෙම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

# ස්වාධීන විගණකගේ වාර්තාව සබැඳේ.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය විචක්ෂණ භාවයෙන් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද මවිසින්,

- වංචා හෝ දෝෂයක් හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණාත්මක වැරදි අර්ථකථනයක අවදානම හඳුනාගෙන ඒවා තක්සේරු කිරීම, එම අවදානම් වලට ප්‍රතිචාර දක්වන විගණන ක්‍රියා පටිපාටි සැලසුම් කිරීම සහ ඉටු කිරීම සහ මාගේ මතයට පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම සිදුකරමි. වංචාවේ ප්‍රතිඵලයක් ලෙස ප්‍රමාණාත්මක වැරදි අර්ථකථනයක් හඳුනා නොගැනීමේ අවදානම වැරැද්දක ප්‍රතිඵලයක් ලෙස එසේ හඳුනානොග ැනීමට වඩා වැඩි ය, මන්ද වංචාවක් තුළ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සෑදීම, හිතාමතා ඌනතා ඇතිකිරීම, වැරදි ලෙස නිරූපණය කිරීම හෝ අභ්‍යන්තර පාලනය ඉක්මවා යාම ඇතුළත් විය හැකි බැවිනි.
- අවස්ථාවෝචිතව සුදුසු විගණන ක්‍රියාපටිපාටි සැලසුම් කිරීම සඳහා විගණනයට අදාළ අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගනිමි, නමුත් එසේ සිදුකරන්නේ සමාගමේ ඵලදායීතාවය සහ සමූහයේ අභ්‍යන්තර පාලනය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අරමුණින් නොවේ.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල යෝග්‍යතාවය සහ කළමනාකාරීත්වය විසින් කරන ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා ඊට සම්බන්ධ අනාවරණය කිරීම්වල සාධාරණත්වය ඇගයීම සිදු කරමි.
- කළමනාකාරීත්වය ගිණුම්කරණයේ අඛණ්ඩ පැවැත්ම පදනම භාවිතා කිරීමේ යෝග්‍යතාවය පිළිබඳව නිගමනය කරන අතර, ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව, සමූහයට අඛණ්ඩ පැවැත්මක් ඇතිවීමේ හැකියාව පිළිබඳ සැලකිය යුතු සැකයක් ඇති කරන සිදුවීම් හෝ කොන්දේසි වලට අදාළව ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවතින්නේද යන්න තීරණය කරමි. ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවතින බවට මා නිගමනය කරන්නේ නම්, මූල්‍ය ප්‍රකාශනවල
- අදාළ අනාවරණයන් පිළිබඳව මවිසින් මගේ විගණක වාර්තාවේ අවධානය යොමු කිරීම අවශ්‍ය වන අතර, නැතහොත් එවැනි අනාවරණය කිරීම් ප්‍රමාණවත් නොවේ නම්, මගේ මතය වෙනස් කිරීම සිදු කළ යුතුය. මගේ නිගමන පදනම් වී ඇත්තේ මගේ වාර්තාවේ දිනය දක්වා ලබාගත් විගණන සාක්ෂි මත ය. කෙසේ වෙතත්, අනාගත සිදුවීම් හෝ තත්වයන් මඟින් සමූහය අඛණ්ඩව පැවැත්ම නැවැත්වීමට හේතු විය හැක.
- අනාවරණය කිරීම් ඇතුළුව මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය තක්සේරු කිරීම සහ මූල්‍ය ප්‍රකාශන මඟින් එහි ඇතුළත් ගනුදෙනු සහ සිදුවීම් පිළිබඳ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමක් නියෝජනය කරන්නේද යන්න තක්සේරු කරමි.
- ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා සමූහය තුළ ඇති ආයතනවල හෝ ව්‍යාපාරික ක්‍රියාකාරකම්වල මූල්‍ය තොරතුරු පිළිබඳ ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම සිදුකරමි. කණ්ඩායම් විගණනයේ මෙහෙයවීම, අධීක්ෂණය සහ කාර්ය සාධනය සඳහා මම වගකිව යුතුය. මගේ විගණන මතයට මම සම්පූර්ණයෙන්ම වගකිව යුතුය.

මගේ විගණනයේදී මා හඳුනා ගන්නා අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු අඩුපාඩු ද ඇතුළුව විගණනයේ සැලසුම්ගත විෂයපථය සහ වේලාව සහ සැලකිය යුතු විගණන සොයා ගැනීම් සම්බන්ධයෙන් පාලනය භාරව සිටින අය සමඟ මම සන්නිවේදනය කරමි.

### 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ සහ 2007 අංක 07 දරණ සමාගම් පනතේ පහත සඳහන අවශ්‍යතා සඳහා නිශ්චිත විධිවිධාන ඇතුළත්ය:

- විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මවිසින් ලබාගෙන ඇති අතර, මගේ විභාගයෙන් පෙනෙන පරිදි සමාගම හා සමූහය විසින් 2007 අංක 7 දරන සමාගම් පනතේ 163(1) (ඈ) වගන්තිය අනුව සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තිය අනුව නිසි පරිදි ගිණුම් වාර්තා තබා ඇත්තේය.
- සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරණ සමාගම් පනතේ 151 වගන්තියේ නියමයන්ට අනුකූල වේ.
- ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ නියමයන්ට අනුව පෙර වර්ෂය හා සංගත වේ.
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ නියමයන්ට අනුව ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයන්හි මා විසින් පසුගිය වර්ෂය සඳහා සිදුකරන ලද සියළුම නිර්දේශ කිරීම් අන්තර්ගත වේ.

තවද,

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ නියමයට අනුව සමාගම විසින් අත්සන් කරන ලද ඕනෑම කොන්ත්‍රාත්තුවක් පිළිබඳව ව්‍යාපාරයේ සාමාන්‍ය හේතුවට පිටින් ඇති සෘජු හෝ වක්‍ර උනන්දුවක් සමාගමේ පාලක මණ්ඩලයේ ඕනෑම සාමාජිකයෙකුට ඇති බව සඳහන් කිරීමට,

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ නියමයට අනුව සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද අදාළ වන ඕනෑම ලිඛිත නීතියක්, සාමාන්‍ය සහ විශේෂ උපදෙස් වලට සමාගම අනුකූල වී නොමැති බව සඳහන් කිරීමට
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ නියමයට අනුව සමාගම සිය බලතල, කාර්යයන් සහ යුතුකම් අනුව කටයුතු කර නොමැති බව සඳහන් කිරීමට
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ නියමයට අනුව සමාගමේ සම්පත් කාල රාමුව තුළ සහ අදාළ නීතිවලට අනුකූලව සකසුරුවම් සහිත ලෙස, කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ප්‍රසම්පාදනය හා උපයෝජනය කර නොමැති බවට සඳහන් කිරීමට,

කිසිවක්, සිදු කරන ලද ක්‍රියා පටිපාටි සහ ලබාගත් ප්‍රමාණාත්මක කරුණු වලට පමණක් සීමා වූ සාක්ෂි අනුව මගේ අවධානයට යොමු වී නැත.

**ඩබ්.පී.සී. වික්‍රමරත්න**
*විගණකාධිපති*

# මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| මාර්තු 31 දිනට | සටහන | සමූහය 2020 රු. මිලියන | සමූහය 2019 රු. මිලියන | සමාගම 2020 රු. මිලියන | සමාගම 2019 රු. මිලියන |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| දේපළ පිරියත සහ උපකරණ | 4 | 8,449.51 | 10,221.90 | 5,767.28 | 7,542.19 |
| භාවිත හිමිකම් වත්කම් (ROU) | 5 | 119,083.74 | - | 118,751.75 | - |
| ගුවන් යානා ඇණවුම් කිරීමේ පූර්ව ගෙවීම් | 6 | 2,528.12 | 2,528.12 | 2,528.12 | 2,528.12 |
| ගුවන් යානා නඩත්තු සංචිතය | 7 | 18,603.60 | 19,981.17 | 18,603.60 | 19,981.17 |
| ගුවන් යානා සහ අතිරේක එන්ජින් තැන්පතු | | 4,241.81 | 6,403.16 | 4,241.81 | 6,403.16 |
| අස්පෘශ්‍ය වත්කම් | 8 | 103.92 | 131.98 | 78.50 | 99.51 |
| ආයෝජන | 9 | 0.40 | 0.40 | 42.44 | 42.44 |
| | | 153,011.10 | 39,266.73 | 150,013.50 | 36,596.59 |
| **ජංගම වත්කම්** | | | | | |
| තොග | 10 | 5,128.63 | 5,191.55 | 4,813.41 | 4,849.87 |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ | 11 | 8,820.33 | 20,604.31 | 7,683.59 | 19,570.39 |
| ගුවන් යානා නඩත්තු සංචිතය | 7 | 16,290.06 | 13,747.07 | 16,290.06 | 13,747.07 |
| ගුවන් යානා සහ අතිරේක එන්ජින් තැන්පතු | | 542.22 | 303.60 | 542.22 | 303.60 |
| ආයෝජන | 9.1 | 1,039.24 | 922.45 | 613.64 | 590.45 |
| මුදල් හා බැංකු ශේෂයන් | 12 | 1,596.98 | 2,212.02 | 1,233.18 | 1,681.03 |
| | | 33,417.46 | 42,981.00 | 31,176.10 | 40,742.41 |
| **මුළු වත්කම්** | | 186,428.56 | 82,247.73 | 181,189.60 | 77,339.00 |
| **හිමිකම් හා වගකීම්** | | | | | |
| **හිමිකම්** | | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 13 | 51,617.44 | 51,617.44 | 51,617.44 | 51,617.44 |
| සංචිත | 14 | 3,686.67 | 3,759.59 | 1,354.96 | 1,416.40 |
| සමුච්චිත අලාභ | | (316,477.65) | (223,488.73) | (326,341.48) | (230,590.07) |
| **මුළු ස්කන්ධ** | | (261,173.54) | (168,111.70) | (273,369.08) | (177,556.23) |
| **වර්තමාන නොවන බැරකම්** | | | | | |
| වරණීය කොටස් | 15 | - | 1,000.00 | - | - |
| පොලී දරන වගකීම් | 16 | 191,315.43 | 10,321.02 | 190,480.17 | 10,234.42 |
| වෙනත් දිගු කාලීන වගකීම් | 17 | 21,990.89 | 18,332.01 | 21,257.28 | 17,579.14 |
| | | 213,306.32 | 29,653.03 | 211,737.45 | 27,813.56 |
| **ජංගම වගකීම්** | | | | | |
| වරණීය කොටස් | 15 | 1,000.00 | - | - | - |
| ගුවන් ප්‍රවාහන පූර්ව විකුණුම් | 18 | 17,835.18 | 25,316.76 | 17,835.18 | 25,316.76 |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ | 19 | 108,386.45 | 82,152.15 | 118,086.76 | 88,676.41 |
| ගෙවිය යුතු ආදායම් බදු | | 212.57 | 201.24 | 175.45 | 175.45 |
| පොලී දරන වගකීම් | 16 | 106,861.58 | 113,036.25 | 106,723.84 | 112,913.05 |
| | | 234,295.78 | 220,706.40 | 242,821.23 | 227,081.67 |
| **මුළු වගකීම්** | | 447,602.10 | 250,359.43 | 454,558.68 | 254,895.23 |
| **මුළු හිමිකම් හා වගකීම්** | | 186,428.56 | 82,247.73 | 181,189.60 | 77,339.00 |

මෙම මූල්‍ය ප්‍රකාශ 2007 අංක 7 දරණ සමාගම් පනතෙහි අවශ්‍යතාවන්ට අනුකූලව පිළියෙල කරනු ලැබ ඇත.

**ශමින්ද සමරවීර**
*ප්‍රධාන මූල්‍ය නිලධාරී*

මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමෙන් බැඳේ. අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සහ ඒ වෙනුවෙන් අත්සන් තබන ලද්දේ:

**අසෝක පතිරගේ**
*අධ්‍යක්ෂ*

**සංජය මොහොට්ටාල**
*අධ්‍යක්ෂ*

පිටු අංක 59 සිට 103 දක්වා ඉදිරිපත් කොට ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වලට අදාළ කොටසකි.

2020 ජූලි 27
කොළඹ

# ලාභ අලාභ ප්‍රකාශය

| | | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|---|
| **මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා** | **සටහන** | 2020<br>රු. මිලියන | 2019<br>රු. මිලියන | 2020<br>රු. මිලියන | 2019<br>රු. මිලියන |
| **ආදායම** | 21 | **183,531.82** | 184,097.04 | **180,151.02** | 180,340.32 |
| **වියදම** | | | | | |
| ගුවන් යානා ඉන්ධන පිරිවැය | | **(55,327.75)** | (60,672.78) | **(55,327.75)** | (60,672.78) |
| සේවක පිරිවැය | | **(22,903.06)** | (21,927.63) | **(21,205.44)** | (20,368.42) |
| ගුවන් තොටුපළ ගමන් සහ මඟී වියදම් | | **(25,276.94)** | (25,813.06) | **(29,217.18)** | (29,779.59) |
| ගුවන් යානා නඩත්තු හා පිරිවැඩියා පිරිවැය | | **(22,820.26)** | (26,333.09) | **(22,820.26)** | (26,333.09) |
| ක්ෂයවීම්/ක්‍රමක්ෂය | 2.3.1.1 | **(1,544.60)** | (1,567.61) | **(1,214.05)** | (1,349.28) |
| විකිණුම් අලෙවි හා ප්‍රවර්ධන වියදම් | | **(14,549.74)** | (15,785.68) | **(14,540.51)** | (15,775.49) |
| ගුවන් කාර්ය මණ්ඩල වියදම් | | **(6,557.11)** | (6,581.52) | **(6,557.11)** | (6,581.52) |
| වෙනත් මෙහෙයුම් වියදම් | 23.1 | **(14,906.24)** | (15,380.71) | **(13,835.87)** | (14,301.56) |
| විනිමය අලාභය | | **(5,270.29)** | (2,328.28) | **(6,118.51)** | (3,414.22) |
| **SLFRS 16 වෙත ගැළපුමට පෙර මෙහෙයුම් ලාභය - භාවිත හිමිකම් වත්කම්** | 23 | **14,375.83** | 7,706.68 | **9,314.34** | 1,764.37 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් මත SLFRS 16 පළමු වරට ආදේශ කරගැනීමේ බලපෑම | 2.3.1.1 | **(19,543.07)** | (30,931.17) | **(19,485.02)** | (30,768.71) |
| **මෙහෙයුම් අලාභය** | | **(5,167.24)** | (23,224.49) | **(10,170.68)** | (29,004.34) |
| වෙනත් ආදායම් සහ ලාභ | 22 | **1,351.51** | 952.19 | **3,046.13** | 4,222.74 |
| මූල්‍ය ආදායම | 24.1 | **377.88** | 128.61 | **317.28** | 89.72 |
| මූල්‍ය ක්‍රියාකාරකම් මත SLFRS 16 පළමු වරට ආදේශ කරගැනීමේ බලපෑම | 24.2 | **(23,643.08)** | (164.91) | **(23,514.38)** | (164.91) |
| වෙනත් මූල්‍ය පිරිවැය | 24.2 | **(17,023.79)** | (19,318.31) | **(16,876.21)** | (19,165.88) |
| **මුළු මූල්‍ය පිරිවැය** | | **(40,666.87)** | (19,483.22) | **(40,390.59)** | (19,330.79) |
| **බදුකරණයට පෙර අලාභය** | | **(44,104.72)** | (41,626.91) | **(47,197.86)** | (44,022.67) |
| **ආදායම් බදු වියදම** | 26 | **(34.68)** | (73.42) | **-** | - |
| **වසර සඳහා අලාභය** | | **(44,139.40)** | (41,700.33) | **(47,197.86)** | (44,022.67) |

පිටු අංක 59 සිට 103 දක්වා ඉදිරිපත් කොට ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වලට අදාළ කොටසකි.

# විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශය

| මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | සටහන | සමූහය 2020 රු. මිලියන | සමූහය 2019 රු. මිලියන | සමාගම 2020 රු. මිලියන | සමාගම 2019 රු. මිලියන |
|---|---|---|---|---|---|
| **වසර සඳහා අලාභය** | | (44,139.40) | (41,700.33) | (47,197.86) | (44,022.67) |
| **වෙනත් විස්තීර්ණ ආදායම/(අලාභය)** | | | | | |
| **පසු කාලපරිච්ඡේදයන්හිදී ලාභ හෝ (අලාභ) වෙත ප්‍රතිවර්ගීකරණය නොකෙරෙන වෙනත් විස්තීර්ණ ආදායම හෝ අලාභ (බදුපසු)** | | | | | |
| විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම මත ආයුගණන ලැබීම්/(අලාභය) | 17.2 | (20.86) | 25.92 | (8.87) | 29.10 |
| දේපළ පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණනය | | - | 602.82 | - | - |
| වෙනත් විස්තීර්ණ ආදායමෙහි හඳුනාගත් අයිතමයන්හි විලම්බිත බදු වගකීම | | - | (90.90) | - | - |
| | | (20.86) | 537.84 | (8.87) | 29.10 |
| **පසු කාලපරිච්ඡේදයන්හිදී ලාභ හෝ අලාභ වෙත ප්‍රතිවර්ගීකරණය කෙරෙන වෙනත් විස්තීර්ණ ආදායම හෝ අලාභ (බදු පසු)** | | | | | |
| මුදල් ප්‍රවාහ සුරැකුම් මත ශුද්ධ සංචලනය | | (61.44) | (1,366.32) | (61.44) | (1,366.32) |
| | | (61.44) | (1,366.32) | (61.44) | (1,366.32) |
| **වසර සඳහා මුළු වෙනත් විස්තීර්ණ ආදායම/(අලාභය) - ශුද්ධ බදු** | | (82.30) | (828.48) | (70.31) | (1,337.22) |
| **වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම/(අලාභය) - ශුද්ධ බදු** | - | (44,221.70) | (42,528.81) | (47,268.17) | (45,359.89) |

පිටු අංක 59 සිට 103 දක්වා ඉදිරිපත් කොට ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වලට අදාළ කොටසකි.

# ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය

| සමූහය<br>මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | ප්‍රකාශිත ප්‍රාග්ධනය<br>රු. මිලියන | ප්‍රත්‍යාගණන සංචිතය<br>රු. මිලියන | මුදල් ප්‍රවාහ සීමා සංචිතය<br>රු. මිලියන | සමුච්චිත අලාභ<br>රු. මිලියන | එකතුව<br>රු. මිලියන |
|---|---|---|---|---|---|
| **2018 මාර්තු 31 දිනට ශේෂය** | 51,617.44 | 4,953.48 | (333.10) | (181,820.71) | (125,582.89) |
| වසර තුළදී බැහැර කිරීම් හේතුවෙන් ප්‍රත්‍යාගණනය මත අතිරික්තය ආපසු හැරවීම | - | (6.39) | - | 6.39 | - |
| වසර සඳහා අලාභය | - | - | - | (41,700.33) | (41,700.33) |
| වෙනත් විස්තීර්ණ ආදායම | - | 602.82 | (1,366.32) | 25.92 | (737.58) |
| වෙනත් විස්තීර්ණ ආදායමෙහි හඳුනාගත් අයිතමයන්හි විලම්බිත බදු වගකීම | - | (90.90) | - | - | (90.90) |
| **මුළු විස්තීර්ණ ආදායම/(අලාභය)** | - | 511.92 | (1,366.32) | (41,674.41) | (42,528.81) |
| **2019 මාර්තු 31 දිනට ශේෂය** | 51,617.44 | 5,459.01 | (1,699.42) | (223,488.73) | (168,111.70) |
| SLFRS 16 හි පරිවර්තනීය බලපෑම (සටහන 2.3.1.1.) | - | - | - | (48,840.14) | (48,840.14) |
| **2019 අප්‍රියෙල් 01 දිනට ගළපන ලද ශේෂය** | 51,617.44 | 5,459.01 | (1,699.42) | (272,328.87) | (216,951.84) |
| වසර තුළදී බැහැර කිරීම් හේතුවෙන් ප්‍රත්‍යාගණනය මත අතිරික්තය ආපසු හැරවීම | - | (11.48) | - | 11.48 | - |
| වසර සඳහා අලාභය | - | - | - | (44,139.40) | (44,139.40) |
| වෙනත් විස්තීර්ණ ආදායම | - | - | (61.44) | (20.86) | (82.30) |
| **මුළු විස්තීර්ණ ආදායම/(අලාභය)** | - | - | (61.44) | (44,160.26) | (44,221.70) |
| **2020 මාර්තු 31 දිනට ශේෂය** | 51,617.44 | 5,447.53 | (1,760.86) | (316,477.65) | (261,173.54) |

| සමාගම<br>මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | ප්‍රකාශිත ප්‍රාග්ධනය<br>රු. මිලියන | ප්‍රත්‍යාගණන සංචිතය<br>රු. මිලියන | මුදල් ප්‍රවාහ සීමා සංචිතය<br>රු. මිලියන | සමුච්චිත අලාභ<br>රු. මිලියන | මුළු<br>රු. මිලියන |
|---|---|---|---|---|---|
| **2018 මාර්තු 31 දිනට ශේෂය** | 51,617.44 | 3,115.82 | (333.10) | (186,596.50) | (132,196.34) |
| වසර සඳහා අලාභය | - | - | - | (44,022.67) | (44,022.67) |
| වෙනත් විස්තීර්ණ ආදායම | - | - | (1,366.32) | 29.10 | (1,337.22) |
| **මුළු විස්තීර්ණ ආදායම/(අලාභය)** | - | - | (1,366.32) | (43,993.57) | (45,359.89) |
| **2019 මාර්තු 31 දිනට ශේෂය** | 51,617.44 | 3,115.82 | (1,699.42) | (230,590.07) | (177,556.23) |
| SLFRS 16 හි පරිවර්තනීය බලපෑම (සටහන 2.3.1.1.) | - | - | - | (48,544.68) | (48,544.68) |
| **2019 අප්‍රියෙල් 01 දිනට ගළපන ලද ශේෂය** | 51,617.44 | 3,115.82 | (1,699.42) | (279,134.75) | (226,100.91) |
| වසර සඳහා අලාභය | - | - | - | (47,197.86) | (47,197.86) |
| වෙනත් විස්තීර්ණ ආදායම | - | - | (61.44) | (8.87) | (70.31) |
| **මුළු විස්තීර්ණ ආදායම/(අලාභය)** | - | - | (61.44) | (47,206.73) | (47,268.17) |
| **2020 මාර්තු 31 දිනට ශේෂය** | 51,617.44 | 3,115.82 | (1,760.86) | (326,341.48) | (273,369.08) |

පිටු අංක 59 සිට 103 දක්වා ඉදිරිපත් කොට ඇති ගිණුම්කරණ ප්‍රමිතීන් සහ සටහන් මෙම වාර්ෂික වාර්තාවේ සාධනීය කොටසක් නිර්මාණය කරයි.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|---|
| **මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා** | සටහන | 2020<br>රු. මිලියන | 2019<br>රු. මිලියන | 2020<br>රු. මිලියන | 2019<br>රු. මිලියන |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වෙතින් /(භාවිත කළ) මුදල් ප්‍රවාහ** | | | | | |
| ආදායම් බදු වියදමට පෙර අලාභය | | (44,104.72) | (41,626.91) | (47,197.86) | (44,022.67) |
| **ගැළපුම්** | | | | | |
| ක්ෂයවීම්/ක්‍රමක්ෂය/හානිකරණය | | 19,391.52 | 1,868.40 | 19,013.81 | 1,643.67 |
| මූල්‍ය පිරිවැය | 24.2 | 40,666.87 | 19,483.22 | 40,390.59 | 19,330.79 |
| දේපළ පිරියත සහ උපකරණ හා අස්පෘශ්‍ය වත්කම් බැහැර කිරීමෙන් ලද අලාභය/(ලැබීම්) | | 8.71 | (2.29) | (3.49) | (3.41) |
| මූල්‍ය ආදායම | 24.1 | (377.88) | (128.61) | (317.28) | (89.72) |
| ලැබිය යුතු දෑ හානිකරණය සඳහා ප්‍රතිපාදනය | 11.2 | 37.35 | 327.83 | 32.94 | 319.79 |
| මන්දගාමීව චලනය වන තොග සඳහා ප්‍රතිපාදනය | 9.1 | 113.58 | 214.47 | 91.75 | 223.32 |
| නඩත්තු සංචිතය හානිකරණය සඳහා ප්‍රතිපාදනය | 6.2 | 4,349.64 | 4,797.17 | 4,349.64 | 4,797.17 |
| උපලබ්ධි නොවන ලද විනිමය අලාභයෙහි බලපෑම | | 4,330.87 | 2,819.29 | 5,045.97 | 3,618.66 |
| පූර්ව විකුණුම් ආපසු ලැබීම් | | (1,818.01) | (1,342.87) | (1,818.01) | (1,342.87) |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම | 17.2 | 1,126.34 | 891.80 | 1,031.33 | 807.74 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් අලාභය** | | 23,724.27 | (12,698.50) | 20,619.39 | (14,717.53) |
| තොග වල පහළයාම/(ඉහළයාම) | | (50.66) | (650.04) | (55.29) | (651.67) |
| පූර්ව ප්‍රවාහන විකුණුම් වල (පහළයාම)/ඉහළයාම | | (5,663.49) | 3,022.23 | (5,663.49) | 3,022.23 |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ වල (ඉහළයාම)/පහළයාම | | 10,584.47 | (3,096.35) | 10,718.09 | (3,007.90) |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ වල ඉහළයාම/(පහළයාම) | | 27,056.52 | 35,858.47 | 29,361.49 | 37,074.78 |
| නඩත්තු සංචිත වල (ඉහළයාම)/පහළයාම | | (6,367.39) | (7,194.00) | (6,367.39) | (7,194.00) |
| ගුවන්යානා සුරැකුම් තැන්පතු වල පහළයාම/(ඉහළයාම) | | 132.68 | (109.55) | 132.68 | (109.55) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලදී භාවිත කෙරුනු ශුද්ධ මුදල් ප්‍රවාහ** | | 49,416.40 | 15,132.26 | 48,745.48 | 14,416.36 |
| ගෙවන ලද මූල්‍ය පිරිවැය | | (22,699.41) | (11,088.21) | (22,432.00) | (10,948.93) |
| ගෙවන ලද පාරිතෝෂිකය | 17.2 | (587.07) | (721.06) | (543.52) | (664.92) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ** | | 26,129.92 | 3,322.99 | 25,769.96 | 2,802.51 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වෙතින්/(භාවිත කරන ලද) මුදල් ප්‍රවාහ** | | | | | |
| ලද පොලිය | | 132.57 | 108.93 | 88.57 | 73.68 |
| දේපළ පිරියත සහ උපකරණ අත්පත් කරගැනීම | | (735.56) | (1,040.34) | (399.28) | (940.02) |
| කෙටි කාලීන ආයෝජන/තැන්පතු උපලබ්ධි වීම | | (72.08) | (88.22) | 4.92 | 79.78 |
| අස්පෘශ්‍ය වත්කම් අත්පත් කරගැනීම | | (23.44) | (51.93) | (20.26) | (50.88) |
| දේපළ පිරියත සහ උපකරණ හා අස්පෘශ්‍ය වත්කම බැහැර කිරීමෙන් ලද මුදල් | | 5.10 | 5.01 | 3.84 | 3.47 |
| ආයෝජන ක්‍රියාකාරකම් වලදී භාවිත කෙරුනු ශුද්ධ මුදල් ප්‍රවාහ | | (693.41) | (1,066.55) | (322.21) | (833.97) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වෙතින්/(භාවිත කරන ලද) මුදල් ප්‍රවාහ** | | | | | |
| පොලී දරන වගකීම් ආපසු ගෙවීම | | (39,704.62) | (8,940.53) | (39,579.34) | (8,823.21) |
| කල්බදු වගකීම ආපසු ගෙවීම | | (19,452.56) | (320.57) | (19,421.89) | (320.57) |
| පොලී දරන ණය හා ණය ලබාගැනීම් වෙතින් මුදල් | | 30,556.46 | - | 30,556.46 | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලදී භාවිත කෙරුනු ශුද්ධ මුදල්** | | (28,600.72) | (9,261.10) | (28,444.77) | (9,143.78) |
| මුදල් හා මුදල් සමාන දෑ වල ඉහළයාම/(පහළයාම) | | (3,164.21) | (7,004.66) | (2,997.02) | (7,175.24) |
| වසර ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ | 12 | (6,920.22) | 84.44 | (7,451.21) | (275.97) |
| **වසර අවසානයේදී මුදල් හා මුදල් සමාන දෑ** | 12 | (10,084.43) | (6,920.22) | (10,448.23) | (7,451.21) |

පිටු අංක 59 සිට 103 දක්වා ඉදිරිපත් කොට ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වලට අදාළ කොටසකි.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## 1. සාංගමික තොරතුරු

### 1.1 සාමාන්‍ය තොරතුරු

**සමාගම**
සීමාසහිත ශ්‍රීලංකන් එයාර් ලයින්ස් සමාගම ('සමාගම') ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සීමාසහිත වගකීම් සහිත සමාගමකි. සමාගමෙහි ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය ශ්‍රී ලංකාව, කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ, ගුවන් සේවා මධ්‍යස්ථානයේ පිහිටා ඇත.

### 1.2 මූලික ක්‍රියාකාරකම් හා මෙහෙයුම්වල ස්වභාවය

**සමාගම**
මගීන්, ගුවන් භාණ්ඩ හා ගුවන් තැපැල් ප්‍රවාහනය සඳහා ජාත්‍යන්තර වශයෙන් නිශ්චිත කාලසටහන් සහිතව සහ රහිතව ශ්‍රී ලංකාව තුළ ගුවන් ප්‍රවාහකයා වශයෙන් ගුවන් සේවා ක්‍රියාත්මක කිරීම සමාගමේ මූලික ක්‍රියාකාරකම් වේ. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ සහ මත්තල රාජපක්ෂ ගුවන්තොටුපළේ ගුවන් පර්යන්ත සේවා සැපයීම, ගුවන් යානා තුළ තීරුබදු රහිත භාණ්ඩ විකිණීම, අභ්‍යන්තර හා බාහිර සංචාරක නිවාඩු පැකේජ අලෙවි කිරීම සමාග මේ අනෙකුත් ප්‍රධාන කටයුතු අතර වේ. සමාගමේ සහායක සේවා කටයුතු සමන්විත වනුයේ තෙවන පාර්ශවවලට නඩත්තු සේවා සැපයීමත්, ගුවන්යානා මෙහෙයුම් සේවා සලසා දීමත්, ගුවන් සේවා ආශ්‍රිත පුහුණු වැඩසටහන් මෙහෙයවීමත් ආදියෙනි.

**පරිපාලිතය-සීමාසහිත ශ්‍රීලංකන් කේටරින්**
සීමාසහිත ශ්‍රීලංකන් කේටරින් සමාගමෙහි (පරිපාලිතය) මූලික ක්‍රියාකාරකම් වනුයේ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ සහ මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙන් මෙහෙයවනු ලබන ගුවන් සේවාවන් සඳහා ගුවන්යානා තුළ ආහාරපාන සේවාවන් සැපයුම් සේවාවන් ලබාදීමයි. වෙනත් සහායක ක්‍රියාකාරකම් අතර මහජන සහ අතරමැදි මගී අවන්හල් පවත්වාගෙන යාම, ලොන්ඩරි සේවාවන් ලබාදීම සහ අතරමැදි මගී හෝටලය කළමනාකරණය කිරීම සමන්විත වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබාදුන් දිනය
2020 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මූල්‍ය ප්‍රකාශයන් නිකුත් කිරීම සඳහා 2020 ජූලි 27 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමැතිය ලබාදෙන ලදී.

## 2. පොදු ගිණුම්කරණ ප්‍රමිතීන්

### 2.1 පිළියෙල කිරීමේ පදනම
සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කරනු ලැබ ඇත්තේ උපචිත පදනම මත සහ සාධාරණ වටිනාකමක් මත මිනුම් කරනු ලබන ඉඩම් හා ගොඩනැගිලි සහ ගුවන්යානාස්ථ මුළුතැන්ගෙයි උපකරණ හැරුණු විට ඓතිහාසික පිරිවැය පදනම මතය.

මෙය SLFRS-16 'කල්බදු' ආදේශ කරගනු ලැබූ පළමු මූල්‍ය ප්‍රකාශ කාණ්ඩය වේ. සැලකියයුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට සිදුකළ වෙනස්කම් 2.4 සටහනෙහි විස්තර කර ඇත.

වෙනත් අයුරකින් සඳහන් කර නොමැති විට හැර, සියළුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත්කොට ආසන්නතම රුපියල් මිලියනයට වටයා ඇත.

2020 දී කෝවිඩ් 19 වසංගතය ලොව පුරා සීඝ්‍රයෙන් පැතිරෙමින් පැවති අතර එහිදී ලෝක ආර්ථික ක්‍රියාකාරකම් අඩපණ කරමින් ගුවන්මගී සංචරයන් ද සීමා කෙරිණ. මෙහිදී ලෝක ව්‍යාප්තව ගුවන්සේවා වෙළඳපොළ, කෙටිකාලීනව කැපී පෙනෙන අර්බුදයකට ලක්විය. ගමනාගමන සීමාවන් ලිහිල් වීමත් සමඟ මෙම අර්බුදය කෙමෙන් විසඳෙනු ඇති බවට අපේක්ෂා කෙරේ. ගුවන් සේවාවක් වශයෙන්, සමාගම සම්පූර්ණ මගී සේවාවන් මෙහෙයවීමට අපොහොසත් වූ අතර මෙම වසංගතය හේතුවෙන් සමාගමේ ආදායම අහිතකර බලපෑමකට ලක්විය. මෙහි පූර්ණ බලපෑම සහ කාල සීමාව විශ්වාසනීය ලෙස පුරෝකථනය කළ නොහැක.

සමූහය මගින් නව ආදායම් උත්පාදන අවස්ථා නිර්මාණය, පිරිවැය ඉතුරුම් පියවර ක්‍රියාවට නැංවීම, ප්‍රාග්ධන වියදම් නිසි පරිදි අවම කිරීම සහ අමතර කාර්ය ප්‍රාග්ධන පහසුකම් සඳහා සාකච්ඡා පැවැත්වීම ඇතුළු විවිධ පියවර ඔස්සේ මෙම අර්බුදය මධ්‍යයේ ව්‍යාපාරය කළමනාකරණය කිරීමට කටයුතු කරන ලදී. මෙම පියවර අතරට අඛණ්ඩ පැවැත්ම සටහනෙහි දක්වා ඇති පරිදි ශ්‍රී ලංකා රජය වෙතින් සහය ලබාගැනීම ද ඇතුළත් වේ.

ඉහත කරුණු මත පදනම්ව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශයන් අඛණ්ඩ පැවැත්ම පදනම මත සකසන ලදී.

තවද, සමූහය වෙත කෝවිඩ් 19 හි බලපෑම හේතුවෙන්, හානිකරණ පරීක්ෂාවක් සිදුකරන ලද අතර, කෙසේවුවද කිසිදු හානිකරණ අලාභයක් හඳුනා නොගැණුනි. ස්වකීය අඛණ්ඩ බලපෑම් තක්සේරුවෙහි කොටසක් වශයෙන් කළමනාකාරීත්වය දිගින් දිගටම කෝවිඩ් 19 තත්වය පිළිබඳ දැඩි අවධානයෙන් පසුවේ.

#### 2.1.1 අනුකූලතා ප්‍රකාශය
සමාගමෙහි සහ සමූහයෙහි මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය මගින් නිකුත් කරනු ලැබ ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකසනු ලැබ ඇත. මෙකී මූල්‍ය ප්‍රකාශ සැකසීම හා ඉදිරිපත්කිරීම 2007 අංක 7 දරණ සමාගම් පනතට අනුකූලව සිදුකොට ඇත.

#### 2.1.2 සංසන්දනාත්මක තොරතුරු
වඩාත් යහපත් ඉදිරිපත්කිරීමක් සඳහා සහ වර්තමාන වසර සමඟ ඒවා සංසන්දනය කරනු හැකිවනු පිණිස අදාළ අවස්ථාවන්හිදී පසුගිය වසර වල මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම සහ වර්ගීකරණය සංශෝධනයන්ට ලක්කර ඇත. සංසන්දනාත්මක තොරතුරු සටහන 32 හි දක්වා ඇති පරිදි ප්‍රතිවර්ගීකරණය කරනු ලැබ ඇත.

### 2.2 ඒකාබද්ධකරණයෙහි පදනම
ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන වල සමාගමේ හා එහි පරිපාලිත සමාගමේ 2020 මාර්තු මස 31 වන දින දක්වා වූ මූල්‍ය ප්‍රකාශන අඩංගු වේ. ආයෝජිතයා සමඟ සමූහය විසින් පවත්වාගෙන යනු ලබන කටයුතු නිසා උද්ගතවන විචල්‍ය ප්‍රතිලාභ සඳහා සමූහය නිරාවරණය වීම හෝ ඒ සඳහා හිමිකමක් මත සහ එහි බලය මඟින් අදාළ අයෝජනලාභී සමාගමෙහි ප්‍රතිලාභ කෙරෙහි බලපෑමට සමූහයට ඇති හැකියාව මත පාලනය අත්පත් කරගත හැක. ව්‍යාපාර සමාගම සතුව පහත සඳහන් දෑ ඇත්නම්, සහ ඇත්නම් පමණක් සමාගම විසින් ආයෝජනලාභියකු නිශ්චිතවම පාලනය කරනු ලබයි.

- ආයෝජිතයා කෙරෙහි වූ බලය / (එනම් ආයෝජිතයාගේ අදාළ කටයුතු මෙහෙයවීම සඳහා සමාගමට ප්‍රවර්තන හැකියාව ලබාදෙන දැනට පවතින හිමිකම්)
- ආයෝජිතයා සමඟ සිදුකරන ව්‍යාපාර කටයුතු නිසා උද්ගතවන විචල්‍ය ප්‍රතිලාභ කෙරෙහි නිරාවරණය හෝ හිමිකම

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් සබැඳේ.

- අදාළ ප්‍රතිලාභ කෙරෙහි බලපෑම් සිදු කිරීම සඳහා ආයෝජිතයා සම්බන්ධයෙන් බලය පාවිච්චි කිරීමේ හැකියාව.

පාලනයේ මූලික අංග තුනෙන් එකකට හෝ ඊට වැඩි ගණනකට වෙනස්කම් සිදුව ඇති බවට අදාළ සාධක හෝ පවතින තත්වයන් ආශ්‍රයෙන් හැඟීයයි නම්, සමූහය විසින් ආයෝජිතයකු පාලනය කරන්නේද නොකරන්නේද යන්න තීරණය කිරීමට සමූහය විසින් ප්‍රති ඇගයුමක් සිදු කෙරේ. සමූහය පරිපාලිත සමාගමක පාලනය ලබාගත් කල්හි පරිපාලිත සමාගමේ ඒකාබද්ධ වීම ආරම්භ වන අතර සමාගමට පරිපාලිත සමාගම සම්බන්ධයෙන් පවත්නා පාලනය අහිමිවූ විට ඒකාබද්ධ වීම අවසන් වේ.

ලාභය හෝ අලාභය සහ වෙනත් විස්තීර්ණ ආදායමට අයත් එක් එක් අංග සමාගමේ කොටස් හිමියන් වෙත ආරෝපණය කෙරේ. අවශ්‍ය අවස්ථාවන්හිදී, සමූහයේ ගිණුම් ප්‍රතිපත්ති හා පරිපාලිත සමාගමේ ගිණුම් ප්‍රතිපත්ති අනුරූප කිරීම සඳහා පරිපාලිත සමාගමේ මූල්‍ය ප්‍රකාශවලට ගැලපුම් සිදුකෙරේ. සියලු අන්තර් සමූහ වත්කම් හා වගකීම්, හිමිකම, ආදායම්, වියදම් හා සමූහයට අයත් සාමාජිකයින් අතර ගණුදෙනුවලට අදාළ මුදල් ප්‍රවාහ ඒකාබද්ධකරණයේදී සම්පූර්ණයෙන්ම ඉවත් කරනු ලබයි.

පරිපාලිත සමාගමක පාලනය අහිමිවී යාමකින් තොරව හිමිකාරීත්වය වෙනස් වේ නම් එය හිමිකම් ගණුදෙනුවක් ලෙස ගිණුම්ගත කෙරේ.

පරිපාලිත සමාගමක පාලනය අහිමිවේ නම්, අදාළ වත්කම්, වගකීම් හා හිමිකමෙහි වෙනත් අංග හඳුනා නොගන්නා අතර ඒ නිසා උද්ගතවන යම් ලාභයක් හෝ අලාභයක් වේතොත් ඒවා ලාභයෙහි හෝ අලාභයෙහි හඳුනාගැනේ, රඳවා ගනු ලබන ආයෝජනයක් වේතොත්, එය සාධාරණ අගයක් මත හඳුනාගැනේ.

## *2.3 සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රමිතීන්*

පහත දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති සියලුම කාල පරිච්ඡේදයන්ට අදාළව අඛණ්ඩව භාවිත කර ඇත.

### 2.3.1. ගිණුම්කරණ ප්‍රමිතීන්හි වෙනස්වීම්

සමාගම මගින් පළමු වරට 2019 අප්‍රේල් 01 වැනි දින හෝ ඉන් අනතුරුව ඇරඹෙන වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදයන් සඳහා බලපැවැත්වෙන පරිදි SLFRS 16 - ''කල්බදු'' සහ IFRIC අර්ථදැක්වීම 23 - ''ආදායම් බදු කර්තව්‍යය සම්බන්ධ අවිනිශ්චිතතාව'' යන ප්‍රමිතීන් ආදේශ කර ගනු ලැබිනි. සමූහය මගින් නිකුත්කරන ලද එහෙත් බලාත්මක නොවූ කිසිදු ප්‍රමිතියක්, අර්ථදැක්වීමක් හෝ සංශෝධනයක් කලින් ආදේශ කරගනු ලැබ නොමැත.

පහත දැක්වෙන වෙනස්වීම් හැරුනු විට, සමූහය මගින් පහත සඳහන් කොට ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම මූල්‍ය ප්‍රකාශයන්හි ඉදිරිපත් කෙරෙන සියළුම කාලපරිච්ඡේදයන්ට අදාළව අඛණ්ඩව භාවිත කරනු ලැබ ඇත.

### 2.3.1.1. SLFRS 16 - "කල්බදු" වෙත සංක්‍රමණය සහ එහි බලපෑම

සමූහය මගින් 2019 අප්‍රේල් 01 වැනි දින සිට නවීකරණය කරන ලද අතීතයට බලපාන ලෙස SLFRS 16 ප්‍රමිතිය ආදේශ කර ගනු ලැබූ අතර එමනිසා සංසන්දනාත්මක තොරතුරු ප්‍රතිප්‍රකාශය සිදු නොකොට අඛණ්ඩවම LKAS 17 සහ IFRIC 4 ප්‍රමිතීන් යටතේ වාර්තා කරනු ලැබේ. SLFRS 16 වෙතින් වෙනස් වන්නේ නම්, LKAS 17 සහ IFRIC 4 ප්‍රමිතීන් යටතේ වන විස්තර වෙනම හෙළිදරව් කරනු ලැබ ඇති අතර බලපෑම ආශ්‍රිත වෙනස්වීම් සටහන 2.4.5. හි දක්වා ඇත.

SLFRS 16 වෙත සංක්‍රමණය වීමත් සමග, සමූහය මගින් ප්‍රයෝගික ක්‍රියාමාර්ගය යොදාග නු ලැබූ අතර SLFRS 16 යටතේ කල්බදු වශයෙන් අදාළ වන ගිවිසුම්ගත සැකසුම් ප්‍රතිඇගයුමට ලක් නොකිරීමට අදහස් කෙරිණි. එමගින් ඉහතදී LKAS 17 සහ IFRIC 4 ප්‍රමිතීන් යටතේ කල්බදු වශයෙන් හඳුනාග නු ලැබූ ගිවිසුම් වෙත පමණක් SLFRS 16 හි සංක්‍රමණිත නීතිරීති යොදා ගන්නා ලදී. SLFRS 16 යටතේ කල්බදු පිළිබඳ වන නිර්වචනය සංක්‍රමණ දින හෝ ඉන් පසු අතුළත් වූ හෝ වෙනස්කම් වලට භාජනය කරන ලද ගිවිසුම් කෙරෙහි පමණක් අදාළ කර ගැනුනි. තවද, සමාගම මගින් කල්බද්දෙන් කල්බද්දට පදනමක් මත පහත දැක්වෙන අනුමත ප්‍රායෝගික ක්‍රියාමාර්ග යොදා ගැනුනි.

- සාධාරණ ලෙස සමාන ගති ලක්ෂණ සහිත කල්බදු කළඹකට ඒකල වට්ටම් අනුපාතයක් යොදා ගැනුනි:
- සංක්‍රමණ දිනයේ සිට මාස 12ක් ඇතුළත කල් ඉකුත් වන්නා වූ කල්බදු වෙත නව කල්බදු මිනුම් නීතිරීති අදාළ කර නොගැනුනු අතර ඒවා කෙටි කාලීන කල්බදු වශයෙන් ගිණුම්ගත කෙරිණි.
- භාවිත හිමිකම් වත්කමෙහි මිනුම්ගත කිරීමේදී කල්බදු සම්බන්ධ මූලික සෘජු පිරිවැය බැහැර කෙරුනු අතර :
- කාලය දිගු කිරීමේ/අවසන් කිරීමේ වරණයන් සහිත ගිවිසුම් වල කල්බදු කාලසීමාව නිර්ණය කිරීමේ පසු දැක්ම ක්‍රමවේදය යොදා ගැනුනි.

ඉහතදී LKAS 17 යොදාගැනීමේදී මූල්‍ය කල්බදු වශයෙන් වර්ගීකරණය කෙරුනු කල්බදු ආශ්‍රිත, සංක්‍රමණ දිනය වන විට භාවිත හිමිකම් වත්කම්වල ධාරන වටිනාකම සහ කල්බදු වගකීම නොවෙනස්ව පැවතිණි. එවැනි වත්කම් ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙන් දේපළ, පිරියත සහ උපකරණ වෙතින් භාවිත හිමිකම් වත්කම් වෙත ප්‍රති වර්ගීකරණය කෙරිණි.

SLFRS 16 මගින් ශේෂ පත්‍රයෙන් පිටත වත්කම් හා වගකීම් ශේෂ පත්‍රය තුළට ගෙන එන බැවින් එමගින් සමූහයේ මූල්‍ය ප්‍රකාශයන් වෙත සැළකිය යුතු බලපෑමක් ඇත කෙරේ. කල්බදු වර්ගය සහ එහි බලපෑම හඳුනාගැනීම හා මිනුම්කරණය මෙම සටහනෙහි සාරාංශගත කොට දක්වා ඇත.

ඒකාබද්ධ ලාභ අලාභ ප්‍රකාශය සම්බන්ධයෙන්, මෙහෙයුම් කල්බදු වගකීම භාවිත හිමකම් වත්කමෙහි ක්ෂයවීම හා කල්බදු වගකීම මත පොලිය මගින් ප්‍රතිස්ථාපනය කරනු ලැබ ඇති අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් කල්බදු වල කලින් වසර වල මුළු වියදම ඉහළ යන අතර පසු වසර වල එය පහළ යනු ඇත.

මෙහෙයුම් කල්බදු වශයෙන් වර්ගීකරණය කොට ඇති කල්බදු සඳහා කල්බදු වගකීම මිනුම්කරණයේදී, සමාගම 2019 අප්‍රියෙල් 1 වැනි දිනට එහි වර්ධනීය ණයට ගැනීමේ අනුපාතය භාවිත කරමින් කල්බදු ගෙවීම් වට්ටම්ගත කොට ඇත. එක් එක් කල්බදු වත්කම් කාණ්ඩයන් වෙත අදාළ කරගනු ලබන බරතබන ලද සාමානයය අනුපාතයන් පහත දැක්වේ.

- ගුවන්යානා/ගොඩනැගිලි (ඇ.ඩො.) - 6 %
- රථවාහන/ ගොඩනැගිලි (රු.) - 14.3%

ප්‍රමිතිය ආරම්භක දිනයේ සිටම යොදා ගන්නා ලද බවට සළකමින් භාවිත හිමිකම් වත්කම් ඒවායේ ධාරන වටිනාකමට මිනුම්ගත කෙරෙන අතර, මූලික යෙදවුම් දිනයේ අනුපාතය යොදාගනිමින් වට්ටම්ගත කෙරේ.

කල්බදු මත ලාභ අලාභ ප්‍රකාශය වෙත බලපෑම පහත දැක්වෙන පරිදි වේ:

| | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|
| | 2020 මාර්තු 31 අවසන් වූ වසර රු. මිලියන | 2019 මාර්තු 31 අවසන් වූ වසර රු. මිලියන | 2020 මාර්තු 31 අවසන් වූ වසර රු. මිලියන | 2019 මාර්තු 31 අවසන් වූ වසර රු. මිලියන |
| කල්බදු යටතේ වන ගුවන්යානා වල කුලී | (1,393.67) | (29,099.13) | (1,393.67) | (29,099.13) |
| නඩත්තු පිරිවැය (ආපසු යැවීමේ පිරිවැය) | - | (620.19) | - | (620.19) |
| භාවිත හිමිකම් (ROU) වත්කම් වල ක්ෂයවීම් | (17,304.95) | - | (17,304.95) | - |
| කල්බදු වගකීම් වල මූල්‍ය පිරිවැය | (10,246.84) | - | (10,246.84) | - |
| කල්බදු වගකීම් මත විනිමය අලාභය | (12,879.86) | - | (12,879.86) | - |
| | (41,825.32) | (29,719.32) | (41,825.32) | (29,719.32) |
| කල්බදු යටතේ වන ගොඩනැගිලි වල කුලී | (291.08) | (866.03) | (282.20) | (704.82) |
| භාවිත හිමිකම් (ROU) වත්කම් වල ක්ෂයවීම් | (228.54) | - | (181.37) | - |
| කල්බදු වගකීම් වල මූල්‍ය පිරිවැය | (341.88) | - | (213.18) | - |
| කල්බදු වගකීම් මත විනිමය අලාභය | (25.49) | - | (25.49) | - |
| | (886.99) | (866.03) | (702.23) | (704.82) |
| කල්බදු යටතේ වන රථවාහන වල කුලී | (11.37) | (51.43) | (9.38) | (50.18) |
| භාවිත හිමිකම් (ROU) වත්කම් වල ක්ෂයවීම් | (41.05) | - | (41.05) | - |
| කල්බදු වගකීම් වල මූල්‍ය පිරිවැය | (9.06) | - | (9.06) | - |
| | (61.48) | (51.43) | (59.49) | (50.18) |
| **LKAS 17 යටතේ මූල්‍ය කල්බදු වශයෙන් වර්ගීකරණය කරන ලද කල්බදු වල බලපෑම** | | | | |
| ක්ෂයවීම් | (272.40) | (294.39) | (272.40) | (294.39) |
| කල්බදු වගකීම් වල මූල්‍ය පිරිවැය | (84.72) | (106.80) | (84.72) | (106.80) |
| කල්බදු වගකීම් මත විනිමය අලාභය | (55.23) | (58.11) | (55.23) | (58.11) |
| | (412.34) | (459.30) | (412.34) | (459.30) |
| **සමස්ත බලපෑම** | (43,186.13) | (31,096.08) | (42,999.39) | (30,933.61) |
| ක්ෂයවීම් | (17,846.95) | (294.39) | (17,799.77) | (294.39) |
| නඩත්තු පිරිවැය (ආපසු යැවීම පිරිවැය) | - | (620.19) | - | (620.19) |
| කල්බදු යටතේ වන වත්කම් වල කුලී | (1,696.12) | (30,016.59) | (1,685.25) | (29,854.13) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් කෙරෙහි බලපෑම** | (19,543.07) | (30,931.17) | (19,485.02) | (30,768.71) |
| කල්බදු වගකීම් වල මූල්‍ය පිරිවැය | (10,682.53) | (106.80) | (10,553.83) | (106.80) |
| කල්බදු වගකීම් මත විනිමය අලාභය | (12,960.55) | (58.11) | (12,960.55) | (58.11) |
| **මූල්‍යමය ක්‍රියාකාරකම් කෙරෙහි බලපෑම** | (23,643.08) | (164.91) | (23,514.38) | (164.91) |
| | (43,186.13) | (31,096.08) | (42,999.39) | (30,933.61) |

භාවිත හිමිකම් (ROU) වත්කම් ඒකාබද්ධ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි වෙනම රේඛීය අයිතමයක් වශයෙන් ඉදිරිපත් කෙරෙන අතර ආශ්‍රිත කල්බදු වගකීම් 'පොලී දරන වගකීම්' යටතේ ඇතුළත් කෙරේ (සටහන 16).

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් සබැඳේ.

සංක්‍රමණ දිනයේදී (2019 අප්‍රියෙල් 1), සමූහයේ හා සමාගමෙහි රඳවාගත් ඉපැයුම් මත SLFRS 16 - කල්බදු ආදේශ කරගැනීමේ සංක්‍රමණිත බලපෑම පහත දැක්වෙන අයුරින් වේ.

| | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|
| **2019 මාර්තු 31 දිනට වාර්තාගත සමුච්චිත අලාභය** | | (223,488.73) | | (230,590.07) |
| **SLFRS 16 ආදේශ කරගැනීමේ බලපෑම** | | | | |
| ගුවන් යානා වල බලපෑම | (48,032.95) | | (48,032.95) | |
| කල්බදු යටතේ වන ගොඩනැගිලි වල බලපෑම | (807.19) | | (511.73) | |
| | | (48,840.14) | | (48,544.68) |
| SLFRS 16 ආදේශ කරගැනීමෙන් පසු 2019 අප්‍රියෙල් 01 දිනට වාර්තාගත සමුච්චිත අලාභය | | (272,328.87) | | (279,134.75) |

### 2.3.1.2. IFRIC අර්ථ දැක්වීම 23 - ''ආදායම් බදු කාර්තව්‍යයන් මත අවිනිශ්චිතතාවය''

මෙම අර්ථදැක්වීම මගින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති LKAS 12 - ''ආදායම් බදු'' යොදාගැනීම කෙරෙහි බලපාන අයුරින් බදු කර්තව්‍යයන් අවිනිශ්චිතතාවයන් සහිත වන විට ආදායම් බදු සඳහා ගිණුම් තැබීම පිළිබඳ තත්ත්වයන් කෙරෙහි අවධානය යොමු කෙරේ. එය LKAS 12 හි විෂයපථයෙන් බැහැර බදු හෝ ගාස්තු සඳහා අදාළ නොවන අතර, එහිදී අවිනිශ්චිත බදු කර්තවයයන් හා සම්බන්ධිත පොලී සහ දඩ මුදල් ආශ්‍රිත අවශ්‍යතාවයන්ද විශේෂිතව ඇතුළත් නොවේ. අර්ථදැක්වීම මගින් පහත සඳහන් කරුණු විශේෂිතව අවධානය යොමු කෙරේ.

- කිසියම් සමාගමක් විසින් අවිනිශ්චිත බදු කර්තව්‍යයන් වෙනම සළකා බැලෙන්නේ ද යන්න
- බදු පරීක්ෂාව පිළිබඳ කිසියම් සමාගමක් විසින් සිදුකරනු ලබන උපකල්පන
- කිසියම් සමාගමක් මගින් බදු වලට යටත් වන ලාභය (හෝ අලාභය), බදු පදනම්, භාවිත නොකල බදු අලාභයන්, භාවිත නොකළ බදු බැර සහ බදු අනුපාතයන් නිර්ණය කරනු ලබන ආකාරය
- කිසියම් සමාගමක් සාධක හා තත්ත්වයන් හි වෙනස්වීම් සළකා බලනු ලබන ආකාරය

සමූහය මගින් ආදායම් බදු කර්තව්‍යයන් සම්බන්ධ අවිනිශ්චිතතා හඳුනාගැනීමේදී සැළකිය යුතු විනිසුමක් යොදා ගැනේ. එහි බදු අනුකූලතා මත පදනම්ව ස්වකීය බදු කර්තවයයන් බදු අධිකාරීන් විසින් පිළිගනු ලබනු ඇතැයි සමූහය තීරණය කරයි. සමූහයෙහි මූල්‍ය ප්‍රකාශ කෙරෙහි අර්ථදැක්වීමෙහි බලපෑමක් නොමැත.

### 2.3.2 සැලකියයුතු ගිණුම්කරන ඇස්තමේන්තු, උපකල්පන සහ විනිශ්චයන්

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා වූ ගණන් ප්‍රමාණ කෙරෙහි හා අදාළ වාර්තා කරන දිනයට සිදුකරන හෙළිදරව් කිරීම් කෙරෙහි බලපෑම් කල හැකි විනිශ්චයන්ට, ඇස්තමේන්තුවලට හා උපකල්පනයන්ට එළඹීමට කළමනාකරණයට සිදුවේ. ප්‍රධාන විනිශ්චයන්, ඇස්තමේන්තු හා ඒ හා බැඳුණු උපකල්පනයන් නිරන්තරව ක්‍රියාත්මක වන පදනමක් මත ඇගයීමට ලක් කෙරෙන අතර ඒවා ඓතිහාසික අත්දැකීම් මතද, අවස්ථානුකූලව සාධාරණ යැයි විශ්වාස කරන අනාගත සිදුවීම් පිළිබඳ අපේක්ෂාවන් ද ඇතුළත් වෙනත් සාධක මතද පදනම් වේ.

විෂයානුබද්ධ මෙන්ම මූල්‍ය ප්‍රකාශන තුල හඳුනා ගැනෙන අගයන් මත වැදගත් බලපෑමක් ඇති කරන්නාවූ අනෙකුත් දෑ අතර පහත දැක්වෙන විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පන යොදා ගනු ලැබේ.

#### *(අ) විනිශ්චයන්*

**(i) අඛණ්ඩ පැවැත්ම**

3 වන සටහනෙහි අනාවරණය කර ඇති පරිදි මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කර සහ ඉදිරිපත් කර ඇත්තේ අඛණ්ඩ පැවැත්ම පදනම මතය.

**(ii) අසම්භාව්‍ය වගකීම් - නඩු කටයුතු**

වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානය වන විට විවිධ පාර්ශවකරුවන් සමඟ සමූහය නඩු කටයුතු ගණනාවකට එළඹ ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය සමාගමේ නීතිඥයන්ගේ උපදෙස් විමසා බැලීමෙන් අනතුරුව එක් එක් නඩු කටයුතු වල තත්ත්වය ඇගයුමට ලක් කරන අතර අනාගතයේදී සම්පත් ගලායෑමක් පවතී යයි නිශ්චය කළහොත් ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සිදු කරනු ලබයි.

ගනුදෙනුකරුවන්, සැපයුම්කරුවන් සහ සේවකයින් විසින් සමූහයට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග, වෙනත් හිමිකම් ඉල්ලීමක් සහ විභව හිමිකම් ඉල්ලීම් සම්බන්ධයෙන්, සමාගමේ ව්‍යාපාර කටයුතුවලට සැලකිය යුතු බලපෑමක් අධ්‍යක්ෂවරුන් අපේක්ෂා නොකරන කාරණා සඳහා, අදාළ මුදල් ප්‍රමාණයන් සටහන 26 හි හෙළිදරව් කර ඇත.

**(iii) කල්බදු (2019 අප්‍රේල් 01 දිනට පසු අදාළ වන ප්‍රමිතිය)**

කොන්ත්‍රාත්තුවක් කල්බදු වේද නැතහොත් එහි කල්බදු ඇතුළත් වේද යන්න සම්බන්ධයෙන් කොන්ත්‍රාත්තුවක් ඇගයුමට ලක් කෙරේ. කොන්ත්‍රාත්තුව මගින් හිලව්වකට හුවමාරු වශයෙන් කිසියම් කාලපරිච්ඡේදයක් සඳහා හඳුනාගත් වත්කමක් භාවිතය පාලනය කිරීමේ හිමිකම පවරනු ලබන්නේ නම් එම කොන්ත්‍රාත්තුව කල්බදු හෝ එහි කල්බදු ඇතුළත් වේ. කිසියම් කොන්ත්‍රාත්තුවක් මගින් හඳුනාගත් වත්කමක් භාවිතය පාලනය කිරමේ හිමිකම පවරනු ලබන්නේද යන්න ඇගයුමට ලක් කිරීමේදී පහත දැක්වෙන කරුණු සළකා බැලේ : කොන්ත්‍රාත්තුව තුළ හඳුනාගත් වත්කමක් පවතීද යන්න, භාවිත කරනු ලබන කාලපරිච්ඡේදය පුරා අදාළ වත්කම භාවිතයෙන් සියළුම ආර්ථික ප්‍රතිලාභ ප්‍රමාණවත් ආකාරයෙන් ලබාගැනීමේ හිමිකම සමූහය සතු වේද යන්න, වත්කමෙහි භාවිතය නියම කිරීමේ හිමිකම සමූහය සතු වේද යන්න.

**(iv) මූල්‍ය හා මෙහෙයුම් කල්බදු (2019 අප්‍රේල් 01 දිනට පෙර අදාළ වන ප්‍රමිතිය)**

සියලු අවදානම් වල හා ප්‍රතිලාභවල හිමිකාරීත්වය සමූහය වෙත මාරු වන කල්බදු වර්ගීකරණය කෙරෙනුයේ මූල්‍ය කල්බදු වශයෙනි. අදාළ වර්ගීකරණය තීරණය කිරීමෙහිලා සලකා බැලෙනුයේ අදාළ ගනුදෙනුව සිදුවන ආකාරය නොව එහි හරයයි. පහත සඳහන් සාධක අන්තර්ගත වන නමුත් එම සාධක වලට පමණක් සීමා නොවේ. වත්කමෙහි අයිතිය කල්බදුකරු විසින් කල්බදු කාලසීමාව අවසානයේදී කල්බදු ලාභියා වෙත පවරා දී ඇත්ද යන වග, ක්‍රියාකාරීවන දිනයේදී සාධාරණ අගයට වඩා ප්‍රමාණවත් අඩු අපේක්ෂිත මිලකට වත්කම් මිලදී ගැනීම සඳහා කල්බදුලාභියා වෙත විකල්පයක් ඇත්ද යන බව, වත්කමෙහි හිමිකම පවරා නොමැති වුවද එහි ආර්ථික ආයු කාලයෙහි වැඩි ප්‍රමාණයක් කල්බදු කාලසීමාව වීම සහ අවම කල්බදු ගෙවීමෙහි වර්තමාන වටිනාකම අවම වශයෙන් සියළුම කල්බදු වත්කම් වල සාධාරණ අගයෙහි වටිනාකම වේද යන බව.

### *(ආ) ඇස්තමේන්තු*

**(i) දේපළ, පිරියත හා උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම් ක්ෂය වීම/ක්‍රමක්ෂය**

දේපළ, පිරියත හා උපකරණ යන වත්කම්වල අපේක්ෂිත ප්‍රයෝජනය හා ආර්ථික ආයුකාලය පදනම් කර ගනිමින් ඒවාට යම් ඵලදායී ජීවකාලයක් හා අවශේෂ වටිනාකමක් කළමනාකරණය විසින් පවරනු ලබයි. දේපළ, පිරියත හා උපකරණ යනාදියට අයත් අවශේෂ අගය සහ ඵලදායී ජීවකාලයද එක් එක් වාර්තා කරන දිනට ඒවායේ ක්ෂයවීම්/ක්‍රමක්ෂය ක්‍රමයද කළමනාකරණය විසින් සමාලෝචනය කරන අතර, මෙම වත්කම් සඳහා පෙර සිදුකළ ඇස්තමේන්තු හා ඒවායේ අයිතමයන් තුළ අඩංගු ආර්ථික ප්‍රතිලාභවල පරිභෝජන රටාව සමඟ එය අනුගතවන බවටද සහතික කරනු ලබයි. මෙම වත්කම්වල ඵලදායී ජීවකාලය හා අවශේෂ වටිනාකම් වල වෙනස්කම් අනාගත ක්ෂය අයකිරීම්හි සංශෝධන වලට හේතුවිය හැකිය. (2.4.3 (ආ) සහ 2.4.4 ප්‍රතිපත්ති විමසා බලන්න)

**(ii) නිරන්තර පියාසර වැඩසටහන "Frequent Flyer Programme"**

ලකුණු ප්‍රදානයන් (Award Credits) ආදායමෙහි වෙනම හඳුනාගැනෙන සංරචකයක් වශයෙන් ගිණුම්ගත කෙරේ. ලකුණු ප්‍රදාන සඳහා වෙන්කළ අදාළ ප්‍රතිෂ්ඨාව ඒවායේ සාධාරණ අගය මත පදනම්ව වෙන්කරනු ලබන අතර ඒකාබද්ධ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි වගකීමක් (විලම්භිත ආදායමක්) ලෙස ගිණුම්ගත කෙරේ.

සැතපුම් ලකුණු ප්‍රදාන (Mile Credits) වල සාධාරණ අගය නිශ්චය කිරීම සඳහා ඇස්තමේන්තුකරණ ශිල්ප ක්‍රම භාවිතා කරන අතර අංශයක් (Sector) සඳහා ගාස්තුව, ඉහළ පංතියක ආසනයක් ලබාගැනීම හා හවුල්කාර ප්‍රදාන වැනි සාධක ගණනාවක් සඳහා බර තැබූ සාමාන්‍යයක් පෙන්නුම් කෙරේ. සාධාරණ අගය ගණනයට අදාළ පදනම වශයෙන් ඓතිහාසික ප්‍රවණතාවන් යොදා ගැනේ.

සාමාජික සාමාජිකාවන් විසින් නිදහස් කරගනු ලැබෙතැයි අපේක්ෂා නොකරන සැතපුම් සඳහා සහ කල් ඉකුත් සැතපුම් සඳහා, සැතපුම්වල සාධාරණ අගය වෙනුවෙන් ගැළපුම් සිදුකෙරේ.

සැතපුම් වල සාධාරණ අගය නිශ්චය කිරීමෙහිලා යොදාගැනෙන යෙදවුම්වල විවිධත්වය නිසා කළමනාකරණ විනිශ්චයන් ක්‍රියාවට නංවනු ලැබේ.

**(iii) නඩත්තු සංචිතය**

නඩත්තු සම්බන්ධයෙන් වූ එකඟත්වයට පත් කොන්දේසි මත පදනම්ව, මෙහෙයුම් කල්බදු යටතේ පවත්නා ගුවන් යානා හා එන්ජින් කීපයක් වෙනුවෙන් අදාළ බදුකරුවන්ට සමාගම විසින් මාසික ගෙවීම් සිදු කරයි. මෙම මාසික ගෙවීම් පදනම් වනුයේ පියාසර කරන ලද පැය සහ චක්‍ර ගණන අනුවය. ආපසු අයකර හැකි වටිනාකම් වල වඩාත් යෝග්‍ය ඇස්තමේන්තු මත පදනම්ව එකී ගෙවීම් වල ආපසු අයකර ගැනීමේ හැකියාව පිලිබඳව කළමනාකරණය කලින් කල ඇගයීම් සිදු කරයි. කිසියම් වත්කමක ධාරණ අගය එහි ආපසු අයකර ගතහැකි මුදල ඉක්මවන විට එම වත්කම හානිකරණය වූ වත්කමක් සේ සලකා එය ආපසු අයකර ගත හැකි වටිනාකම දක්වා ලියා පහත දමයි (සටහන 6 විමසා බලන්න).

**(iv) ගුවන් යානා නඩත්තු සහ අළුත්වැඩියා පිරිවැය සඳහා වෙන්කිරීම**

නඩත්තු කටයුතු සදහා එකඟත්වයට පත් කල්බදු ගිවිසුම් කොන්දේසිවලට අනුව ගුවන්යානා බඳ, ගුවන්යානා එන්ජින් හා ඒවායේ ගොඩබැසුම් උපකරණ සම්බන්ධ විශාල නඩත්තු කටයුතු ඉටු කිරීමට සමාගම බැඳී සිටී. පිරික්සුමේ ස්වාභාවය මත කාලය යෙදවීම හා භාවිතය මත පදනම්ව මූල්‍ය ප්‍රකාශන තුළ විශාල නඩත්තු කටයුතු ආශ්‍රිත පිරිවැය සඳහා වන ප්‍රතිපාදන සිදුකරයි. මෙම ප්‍රතිපාදන තීරණය කිරීමෙහිදී, අදාළ පරික්ෂා කිරීම සිදු කිරීමේ අවස්ථාවේදී පවත්නා වත්කම්වල ඇස්තමේන්තුගත තත්ත්වය මත, යෙදවිය යුතු අමුද්‍රව්‍ය හා දැරිය යුතු පොදුකාර්ය පිරිවැය මත සහ අදාළ පරික්ෂා කිරීම් සිදු කළ යුතු වන්නාවූ අවස්ථාව මත සුදුසු උපකල්පනවලට එළඹේ. මෙම උපකල්පනවලට එළඹෙනුයේ අතීත අත්දැකීම් මත වන අතර ඒවා සත්‍ය මට්ටමට ආසන්න බව තහවුරු කරගැනීම සඳහා නිරන්තර සමාලෝචනයට ලක්කරනු ලැබේ. ප්‍රතිපාදන කෙරෙහි සැලකිය යුතු අයුරින් බලපෑම් ඇතිකරන උපකල්පන හා ඇස්තමේන්තු කිරීම් තුළ සිදුවන යම් සංශෝධන වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශන තුළ ගැලපීම් සිදුකරනු ලැබේ.

**(v) ගුවන් ප්‍රවාහන සේවා ආශ්‍රිත සෘජු මෙහෙයුම් වියදම් සඳහා වෙන්කිරීම**

ගුවන් ප්‍රවාහන සේවා මෙහෙයුම් කාර්ය වලදී ඉන්ධන ගාස්තු, ගොඩබිම් මෙහෙයුම් සේවා සඳහා ගාස්තු, ගොඩබෑම් හා නවතා තැබීමේ ගාස්තු, ගුවන්යානා තුළ ආහාර පාන, ප්‍රවේශපත් වෙන්කරවා ගැනීමේ පද්ධති ගාස්තු සහ තොරතුරු තාක්ෂණය ආශ්‍රිත ගාස්තු වැනි සෘජු වියදම් සම්බන්ධයෙන්වූ විවිධ ප්‍රතිපාදන වෙන්කිරීමට අනිවාර්යයෙන්ම සිදුවේ. ඊට අදාළ ඇස්තමේන්තු හා ඒ ආශ්‍රිතව යොදා ගැනෙන උපකල්පන අතීත අත්දැකීම් මතද, අවස්ථානුකූල පරිදි සාධාරණ වේයැයි විශ්වාස කෙරෙන බොහෝ අනිකුත් සාධක මතද පදනම් වන අතර ඉන් උද්ගත වන ප්‍රතිඵල වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේදී වගකීම්වල ධාරණ අගය මත ප්‍රතිපාදන වෙන් කිරීම සිදුවේ.

**(vi) තොග**

සමාගම විසින් අඛණ්ඩ තොග ගණනය සිදුකිරීම මගින් තොග වල පැවැත්ම හා ප්‍රයෝජනවත්භාවය, සමාලෝචනය කරයි. කල් ඉකුත් වූ තොග සහ/හෝ තොගවල ආපසු අයකරගත හැකි වටිනාකමෙහි අඩුවීමක් සම්බන්ධයෙන් කළමනාකරණය තීරණය කල විට ඒ සඳහා ප්‍රතිපාදන සිදුකරයි.

**(vii) මූල්‍ය නොවන වත්කම් හානිකරණය**

යම් වත්කමක් හානිකරණයට පත්වී ඇති බවට යම් සාක්ෂි තිබේදැයි සොයා බැලීමට එක් එක්

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් සබැඳේ.

වාර්තා කරන දිනට සමූහය විසින් තක්සේරු කරයි. නොගෙවා ඇති කාල සීමාව සහ ඒවා ආපසු අයකර ගැනීමට ඇති හැකියාවේ අවිනිශ්චිතභාවය සම්බන්ධයෙන් පවත්නා කළමනාකරණය දන්නා වෙනත් සාධක මත එම හානිකරණය ඇස්තමේන්තු කිරීමට සිය විනිසුම කළමනාකරණය විසින් භාවිතා කරනු ලබයි.

**(viii) මූල්‍ය වත්කම් හානිකරණය**

යම් මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිකරණයට පත්වී ඇති බවට වාස්තවික සාක්ෂි තිබේදැයි එක් එක් වාර්තා කරන දිනට සමූහය විසින් තක්සේරු කරයි. නොගෙවා ඇති කාල සීමාව සහ ඒවා ආපසු අයකර ගැනීමට ඇති හැකියාවේ අවිනිශ්චිතභාවය සම්බන්ධයෙන් පවත්නා කළමනාකරණය දන්නා වෙනත් සාධක මත එම හානිකරණය ඇස්තමේන්තු කිරීමට කළමනාකරණය විසින් සිය විනිසුම භාවිතා කරනු ලබයි.

### *(ඇ) උපකල්පන*

**(i) නිර්වචනිත ප්‍රතිලාභ සැලැස්ම**

ශ්‍රී ලංකාවේ සිට සේවය කරන කාර්ය මණ්ඩලවලට අයත් විශ්‍රාම ප්‍රතිලාභ සැලැස්මෙහි පිරිවැය තීරණය කෙරෙනුයේ ආයුගණන තක්සේරුවක් ආශ්‍රයෙනි. එම ආයුගණක තක්සේරුව පදනම් වනුයේ පොළී අනුපාතය, වැටුප් වර්ධන අනුපාතය, විශේෂ වාරික, විශ්‍රාම ගැනීමේ වයස හා සමාගමේ අඛණ්ඩ පැවැත්ම යන කරුණුවලට අදාළ උපකල්පන මතය. සැලසුමෙහි පවත්නා දිගු කාලීන ස්වභාවය හේතුවෙන් එබඳු ඇස්තමේන්තු සැලකිය යුතු මට්ටමේ අවිනිශ්චිතතා වලට යටත් වේ. (2.4.16 සටහන විමසා බලන්න.)

**(ii) දේපළ, පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණනය**

ස්වාධීන සුදුසුකම් ලත් තක්සේරුකරුවෙකුගේ සේවය ලබා ගනිමින් ඉඩම් සහ ගොඩනැගිලිවල සහ ගුවන් යානා මුළුතැන්ගෙයි උපකරණ ප්‍රත්‍යාගණන අගය මත මිනිනු ලැබේ. සාධාරණ අගය තීරණය කිරීම පිණිස එකී තක්සේරුකරු විසින් උපකල්පන සහ තක්සේරු ශිල්ප ක්‍රම භාවිතා කරනු ලැබේ. අදාළ තක්සේරු කිරීමේ පදනම සටහන 4 හි හෙළිදරව් කර ඇත.

## *2.4 සැළකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති ආශ්‍රිත සාරාංශය*

2.4.1 විදේශ ව්‍යවහාර මුදල් පරිවර්තනය

සමූහයේ ක්‍රියාත්මක වන හා ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල වන ශ්‍රී ලංකා රුපියල් වලින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත. විදේශ ව්‍යවහාර මුදලින් සිදුවන ගනුදෙනු ඒවා සිදුවන දිනයට වලංගු ක්‍රියාත්මක ව්‍යවහාර මුදල් අනුපාතයට අනුව මූලික වශයෙන් වාර්තා කරයි. විදේශ ව්‍යවහාර මුදලින් ඇති මූල්‍ය වත්කම් හා වගකීම් වාර්තා කරන දිනයට වලංගු ක්‍රියාත්මක ව්‍යවහාර මුදල් අනුපාතයට නැවත පරිවර්තනය කරනු ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස ඇතිවන ලාභ සහ අලාභ, ලාභ හෝ අලාභ ප්‍රකාශනය තුළ හඳුනා ගනු ලැබේ. විදේශ ව්‍යවහාර මුදලක ඓතිහාසික පිරිවැයට ගණනය කෙරෙන මූල්‍යමය නොවන අයිතම අදාළ මුල් ගනුදෙනුව සිදුවූ දිනයේ පැවති විනිමය අනුපාත භාවිතයට ගනිමින් පරිවර්තනය කරනු ලැබේ.

2.4.2 බදුකරණය

**(i) ප්‍රවර්තන ආදායම් බදු**

**සමාගම**

### *(අ) දේශීය බදුකරණය*

2011 අංක 22 දරන දේශීය ආදායම් (සංශෝධන) පනතින් සංශෝධිත 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන යටතේ 2011 අප්‍රේල් 01 දින සිට 2021 මාර්තු 31 දින දක්වා ක්‍රියාත්මක වන දස අවුරුදු බදු නිදහස් කාලයක් සඳහා සමාගම සුදුසුකම් ලැබීය. කෙසේ වෙතත් 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත බලාත්මක වීම සමඟ 2018 අප්‍රේල් 01 දින සිට බලපැවැත්වෙන පරිදි සියළුම ව්‍යාපාර කටයුතු සඳහා ආදායම් බදු ගෙවීමේ වගකීමක් සමාගම සතු වේ.

### *(ආ) විදේශීය බදුකරණය*

ද්විත්ව බදු ගිවිසුම් ක්‍රියාත්මක නොවන රටවල් තුල තම මෙහෙයුම් කටයුතු මත බදු ගෙවීමේ වගකීමට සමාගම යටත් වේ. කෙසේ වුවද, සමාගමට ඇති ඉදිරියට ගෙන ගිය බදු අලාභ හේතුවෙන් ප්‍රවර්තන වර්ෂය තුළ බදු සම්බන්ධ කිසිදු වගකීමක් සමාගමට නොමැත.

**පරිපාලිත සමාගම - ශ්‍රීලංකන් කේටරින් සමාගම**

ආදායම් බදු වියදම් තුළ ප්‍රවර්තන හා විලම්භිත බදු අඩංගුවේ. හිමිකම තුළ හඳුනාගත යුතු හිමිකම තුළ සෘජුවම හඳුනා ගැනෙන අයිතමයන් හැර ආදායම් බදු වියදම ලාභය හෝ අලාභය තුල හඳුනා ගැනේ.

ආයෝජන මණ්ඩලය (BOI) සමඟ ඇතිකර ගත් ගිවිසුම අනුව, ගුවන් යානාස්ථ ආහාර සැපයුම හා ගුවන් මගී මාර්ගස්ථ අවන්හලෙන් උපයන ආදායම 2021 මැයි මස 31 දින දක්වා ආදායම් බද්දෙන් නිදහස් වේ. වෙනත් මූලයන් වෙතින් උපයන ආදායම සාමාන්‍ය බදු අනුපාත යටතේ බදු වගකීමෙන් බැඳේ.

**(ii) විලම්භිත ආදායම් බදු**

වත්කම් හා වගකීම් වල බදු පදනමේ හා ඒවායේ මූල්‍යමය වාර්තාකරණ කාර්යයන් සඳහා වූ ධාරණ අගයන් අතර වාර්තා කරන දිනට පවත්නා තාවකාලික වෙනස්කම් පිලිබඳ වගකීම් ක්‍රමවේදය භාවිතා කරමින් විලම්භිත ආදායම් බදු සම්පාදනය කෙරේ.

2.4.3 දේපළ, පිරියත හා උපකරණ

### *(අ) පිරිවැය හා තක්සේරු කිරීම*

දේපළ, පිරියත හා උපකරණ වල සියලුම අයිතම මූලික වශයෙන් පිරිවැයට වාර්තා කරනු ලබයි. අත්පත්කර ගැනීම් හෝ ඉදිකිරීම සඳහා සෘජුව ආරෝපණය කල හැකි වියදම් පිරිවැයට ඇතුලත්වේ. ඉඩම් හා ගොඩනැගිලි සහ ගුවන්යානා මුළුතැන්ගෙයි උපකරණ යනාදිය පසුකාලීනව ප්‍රත්‍යාගණනය කරනු ලබන අතර එම ප්‍රත්‍යාගණිත දේපළ, පිරියත හා උපකරණ යම් ක්ෂයවීම් හා හානිකරණයන් අඩුකළ ප්‍රත්‍යාගණිත අගයට ඉදිරියට ගෙන යනු ලැබේ. අනෙකුත් සියලු දේපළ, පිරියත හා උපකරණ ක්ෂයවීම් හා/හෝ සමුච්චිත හානිකරණ අලාභ ඇතොත් ඒවාද අඩුකළ ඓතිහාසික පිරිවැය මත වාර්තා කරයි.

සමාන වත්කමකට අයත් මීට පෙර ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි හඳුනාගෙන ඇති ප්‍රත්‍යාගණන අඩුවීමක් කරා එය ප්‍රතිවර්තනය වනතාක් දුරකට හැරුණුවිට, ඉඩම් හා ගොඩනැගිලි සහ ගුවන් යානාස්ථ මුළුතැන්ගෙහි උපකරණ ප්‍රත්‍යාගණන අගයට මිනුම්කරණය කරන අතර ඕනෑම ප්‍රත්‍යාගණන

අතිරික්තයක් වෙනත් විස්තීරණ ආදායම් තුල හඳුනාගන්නා අතර සහ හිමිකම තුළ වූ ප්‍රත්‍යාගණන සංචිතය තුළ සමුච්චිත කරනු ලැබේ. ප්‍රත්‍යාගණන ඌනතාවයක් ලාභ හෝ අලාභ ප්‍රකාශ තුළ හඳුනා ගැනෙනුයේ, වත්කම් ප්‍රත්‍යාගණන සංචිත තුල හඳුනා ගනු ලබා ඇති එම වත්කමට අදාළ දැනටමත් පවත්නා අතිරික්තයක් එය හිලව් කළපසු ඉතිරියටය.

ප්‍රත්‍යාගණිත වත්කමක සාධාරණ අගය එහි ධාරණ අගයට විශාල වෙනසක් සිදුනොකරනු ලබන බවට සහතික වනු පිණිස වත්කම් තක්සේරු කටයුතු ප්‍රමාණවත් වාර ගණනක් සිදු කෙරේ. අදාළ අයිතමය ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගම වෙත ගලා ඒ නම් හෝ අදාළ පිරිවැය විශ්වාසදායක අයුරින් මැනිය හැකි නම් පසුව ඇතිවන පිරිවැය අදාළ වත්කමෙහි ධාරණ අගය තුළ අන්තර්ගත කිරීම හෝ වෙනමම වත්කමක් ලෙස හඳුනාගැනීම සිදුකෙරේ.

අලුත්වැඩියා හා නඩත්තු පිරිවැය ඒවා දරන ලද කාලපරිච්ඡේදය තුළ ලාභ හෝ අලාභ ප්‍රකාශනයට අය කෙරේ.

දේපළ, පිරියත හා උපකරණ තුළ පහත සඳහන් වෙනත් දෑ ඇතුලත් වේ:

**(i) ගුවන්යානා භ්‍රමණමය අමතර කොටස් (Aircraft Rotable Spares)**

ස්පෘශ්‍ය වත්කම් ලෙස සැලකෙන ගුවන්යානා භ්‍රමණමය අමතර කොටස් මූලික වශයෙන් පිරිවැය මත වාර්තා කර එහි ඇස්තමේන්තුගත ඵලදායී ජීවකාලය පුරා ක්ෂය කරනු ලබයි. මෙම අයිතමය "ගුවන්යානා ආශ්‍රිත උපකරණ" යටතේ වර්ග කර ඇත.

**(ii) නොනිමි ප්‍රාග්ධනය**

නොනිමි ප්‍රාග්ධනය ඒවා අත්කරගත් දිනයේ සිට වැඩ ස්ථාපිත දිනය දක්වා දරන ලද සියලු වියදම් ඇතුළත් පිරිවැයට වාර්තා කෙරෙයි. වැඩ ස්ථාපනය කළ විට නොනිමි ප්‍රාග්ධනය දේපළ, පිරියත හා උපකරණ යටතේ සුදුසු කාණ්ඩය වෙත මාරු කර එහි ඇස්තමේන්තු ගත ඵලදායී ජීවකාලය පුරා ක්ෂය කරනු ලබයි.

***(ආ) ක්ෂයවීම***

සින්නක්කර ඉඩම් හැරුණු විට, සියලුම දේපළ, පිරියත හා උපකරණ යනාදියෙහි පිරිවැය හෝ තක්සේරුව මත සරල මාර්ග ක්‍රමවේදය යොදා ගනිමින් පහත දැක්වෙන ඇස්තමේන්තුගත ඵලදායී ජීවකාලය පුරා සමාන වාරිකවලින් කපා හරිමින් ක්ෂයවීම් සඳහා වූ වෙන්කිරීම් ගණනය කෙරේ.

| | |
|---|---|
| ගුවන් යානා ආශ්‍රිත උපකරණ | වසර 08 ක් හෝ කල්බදු කාල සීමාව යන කාල දෙකෙන් අඩු කාල සීමාව පුරා |
| පිරියත හා උපකරණ | උපකරණයේ වර්ගීකරණය/ස්වභාවය මත පදනම්ව වසර 3-10 දක්වා කාලපරිච්ඡේදය පුරා |
| ගොඩනැගිලි | වසර 15 සිට 50 දක්වා වූ අපේක්ෂිත ප්‍රයෝජ්‍ය ජීවකාලය පුරා |

මෙහෙයුම් කල්බදු මත වූ ගුවන්යානා වැඩිදියුණු කිරීම් - වසර 10 ක් හෝ කල්බදු කාල සීමාව යන කාල දෙකෙන් අඩු කාල සීමාව පුරා ක්ෂය කරනු ලබයි.

අවශේෂ වටිනාකම/සුන්බුන් අගය, ඵලදායී ජීවකාලය හා ක්ෂය කිරීමේ ක්‍රමය එක් එක් වාර්තාකරණ දිනට සමාලෝචනය කෙරෙන අතර සුදුසු පරිදි අදාළ ගැලපීම් සිදුකෙරේ.

ඉහත සඳහන් ක්ෂයවීමේ අනුපාත ඉදිරිපත් කළ සියළුම කාලපරිච්ඡේදවලට අදාළ වේ.

***(ඇ) හඳුනාගැනීමෙන් බැහැර කිරීම (De-recognition)***

කිසියම් දේපළ,පිරියත හා උපකරණ අයිතමයක් එහි භාවිතයෙන් හෝ ඉවත් කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ ඇති නොවන විට හෝ එය මූල්‍ය ප්‍රකාශන වලදී හඳුනාගැනීමෙන් බැහැර කරනු ලැබේ. යම් වත්කමක් එසේ බැහැර කිරීමෙන් ඇතිවන ඕනෑම ලාභයක් හෝ අලාභයක් (බැහැර කිරීමෙන් ලද ශුද්ධ මුදල සහ වත්කමේ ධාරණ අගය අතර වෙනස ලෙස ගණනය කළ) අදාළ වත්කම බැහැර කරනු ලබන වර්ෂයේ ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි ඇතුළත් කෙරේ.

### 2.4.4 අස්පෘශ්‍ය වත්කම්

කිසියම් වත්කමක් නිසා ඇතිවන අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලාඒම සහ එවැනි වත්කම්වල පිරිවැය විශ්වාසදායක ලෙස ගණනය කල හැකි නම් ඒවා අස්පෘශ්‍ය වත්කම් වශයෙන් හඳුනාගනු ලැබේ. ඒ අනුව සමුච්චිත ක්‍රමක්ෂය හා සමුච්චිත හානිකරණ අලාභ අඩුකළ පිරිවැය මත මෙම වත්කම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි වාර්තා කෙරේ.

අදාළ දෘඩාංග අයිතමයකින් වෙන්කරගත හැකි පරිගණක මෘදුකාංගයක් අත්පත්කර ගැනීමේ හෝ සැකසීමේ පිරිවැය වෙන් වෙන් වශයෙන් ප්‍රාග්ධනීකරණය කරනු ලබන අතර එය සරල රේඛීය පදනම මත වසර 05 කට නොවැඩි කාලයක් පුරා ක්‍රමක්ෂය කරනු ලැබේ. ක්‍රමක්ෂය කාලච්ඡේදය හා ක්‍රමක්ෂය කිරීමේ ක්‍රමය එක් එක් වාර්තා කරන දිනට විමර්ශනයට ලක් කරනු ලබයි. මෙම වත්කමේ ධාරණ අගය ආපසු අයකර ගත නොහැකි බව යම් අවස්ථානුකූල සිදුවීම් හා වෙනස්කම් අනුව පෙනී යන්නේ නම් හානිකරණය සඳහා එම වත්කමේ ධාරණ අගය එක් එක් වාර්තාකරණ දිනයකදීම සමාලෝචනය කරනු ලැබේ.

### 2.4.5. කල්බදු

**2019 අප්‍රේල් 1 සිට අදාළ වන ප්‍රමිතිය**

කොන්ත්‍රාත්තුවක් ආරම්භ කිරීමේදී, එය කල්බදු වේද නැතහොත් එහි කල්බදු ඇතුළත් වේද යන්න සම්බන්ධයෙන් කොන්ත්‍රාත්තුවක් ඇගයුමට ලක් කෙරේ. කොන්ත්‍රාත්තුව මගින් හිලව්වකට හුවමාරු වශයෙන් කිසියම් කාලපරිච්ඡේදයක් සඳහා හඳුනාගත් වත්කමක් භාවිතය පාලනය කිරීමේ හිමිකම පවරනු ලබන්නේ නම් එම කොන්ත්‍රාත්තුව කල්බදු හෝ එහි කල්බදු ඇතුළත් වේ. කිසියම් කොන්ත්‍රාත්තුවක් මගින් හඳුනාගත් වත්කමක් භාවිතය පාලනය කිරමේ හිමිකම පවරනු ලබන්නේද යන්න ඇගයුමට ලක් කිරීමේදී සමූහය මගින් පහත දැක්වෙන කරුණු සළකා බැලේ :

- කොන්ත්‍රාත්තුව තුළ හඳුනාගත් වත්කමක් පවතීද යන්න - මෙය පැහැදිලිව හා නිසැකව විශේෂ කොට දැක්විය යුතු වන අතර එහිදී අදාළ වත්කම භෞතිකව අනන්‍ය ස්වභාවයෙන් යුතු වීම හෝ එහි සම්පූර්ණ ධාරිතාව ප්‍රමාණවත් අයුරින් නියෝජනය විය යුතු වීම අවශ්‍ය වේ.
- භාවිත කරනු ලබන කාලපරිච්ඡේදය පුරා අදාළ වත්කම භාවිතයෙන් සියළුම ආර්ථික ප්‍රතිලාභ ප්‍රමාණවත් ආකාරයෙන් ලබාගැනීමේ හිමිකම සමූහය සතු වේද යන්න සහ
- වත්කමෙහි භාවිතය නියම කිරීමේ හිමිකම සමූහය සතු වේද යන්න. අදාළ වත්කම කෙසේ කුමන අරමුණු අරභයා භාවිත කෙරෙන්නේද යන්න පිළිබඳ වෙනස් කිරීම් වලට වඩාත්ම අදාළව තීරණ ගැනීමේ අයිතිය පවතින විටකදී මෙම හිමිකම

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් සබැඳේ.

සමූහය සතු වේ. වත්කම කෙසේ කුමන අරමුණු අරභයා භාවිත කෙරෙන්නේද යන්න පිළිබඳව තීරණය පූර්ව නිශ්චිත වූ දුර්ලභ අවස්ථාවන්හිදී, පහත සඳහන් තත්ත්ව යටතේ වත්කමෙහි භාවිතය නියම කිරීමේ හිමිකම සමූහය සතු වේ:

- o වත්කම මෙහෙයවීමේ හිමිකම සමූහය සතු වේ නම්: හෝ
- o සමූහය මගින් අදාළ වත්කම කෙසේ කුමන අරමුණු අරභයා භාවිත කෙරෙන්නේද යන්න පූර්ව නිශ්චය කළ හැකි ආකාරයෙන් සකසා ඇති නම්.

මෙම ප්‍රමිතිය 2019 අප්‍රියෙල් 1 වැනි දින හෝ ඉන් අනතුරුව ඇතුළත් වුනු, හෝ වෙනස් කරන ලද කොන්ත්‍රාත් සඳහා අදාළ වේ.

ආරම්භයේදී හෝ කල්බදු සංරචකයක් සහිත කොන්ත්‍රාත්තුවක් ප්‍රතිඇගයුමට ලක් කිරීමෙන් අනතුරුව, සමූහය විසින් ඒවායේ සාපේක්ෂ තනි මිළ ගණන් මත පදනම්ව එක් එක් කල්බදු සංරචකය සඳහා කොන්ත්‍රාත්තුව තුළ ප්‍රතිෂ්ඨාව වෙන් කරනු ලැබේ.

කෙසේවුවද, එය බදුකරු වන ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධ කල්බදු වලදී, සමූහය මගින් කල්බදු නොවන සංරචකයන් වෙන් කිරීමට අදහස් නොකරන ලද අතර කල්බදු සහ කල්බදු නොවන සංරචකයන් තනි කල්බදු සංරචකයක් වශයෙන් ගිනුම්ගත කරන ලදී.

**භාවිත හිමිකම් වත්කම් (ROU)**

සමූහය මගින් කල්බදු ඇරඹෙන දිනයේදී භාවිත හිමිකම් වත්කමක් සහ කල්බදු වගකීම හඳුනාගැනේ. භාවිත හිමිකම් වත්කම මූලිකව පිරිවැයට ගිනුම්ගත කෙරෙන අතර, එය ලද කවර හෝ කල්බදු දීමනා අඩු කොට, ආරම්භක දිනයේදී හෝ එයට පෙර සිදුකරන ලද කවර හෝ කල්බදු ගෙවීම් වෙත ගළපන ලද කල්බදු වගකීමෙහි මූලික වටිනාකම සහ දරන ලද කවර හෝ මූලික සෘජු පිරිවැයක් සහ පාදක වන වත්කම ඉවත් කිරීමට හෝ ගලවා දැමීමට හෝ පාදක වන වත්කම හෝ අදාළ වත්කම පිහිටා ඇති පරිශ්‍රය ප්‍රතිස්ථාපනය කිරීම සම්බන්ධ පිරිවැය ආශ්‍රිත ඇස්තමේන්තුවකින් සමන්විත වේ.

***(අ) ගුවන්යානා සහ අමතර එන්ජින් කල්බදු ගැනීම***

සමාගම මගින් සිය යානා සමූහය සඳහා ගුවන්යානා සහ එන්ජින් කල්බදු ගැනීම සිදුකෙරේ. ගුවන්යානා සහ එන්ජින් කල්බදු වල කාලසීමාව සාමාන්‍යයෙන් වසර 4 සිට 12 දක්වා වේ.

ගුවන්යානා කල්බදු වල ගුවන්යානාවේ ආපසු ලබාදෙන තත්ත්වය සඳහා වෙන්කිරීමක් ඇතුළත් වේ: එය වගකීම නිර්මාණය කරනු ලබන අවස්ථාවේදී, භාවිත හිමිකම් වත්කම (Right ofUse Asset) වෙත කල්බදු ආශ්‍රිත නීතිරීති හා කොන්දේසි මගින් ඉල්ලා සිටින පරිදි පාදක වන වත්කම යථා තත්ත්වයට ප්‍රතිස්ථාපනය කිරීම සඳහා බදුකරු විසින් දරනු ලබන පිරිවැය පිළිබඳ ඇස්තමේන්තුවකි. සෙසු ගුවන්යානා නඩත්තු හා අළුත්වැඩියා වියදම් (ගුවන්යානා බරපතල නඩත්තු, එන්ජින් අළුත්වැඩියා සහ ගියර් අළුත්වැඩියා හැර) දරන ලද පදනමක් මත සිදුකෙරෙන අතර, අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තිය සටහන අංක 2.4.15. හි දක්වා ඇත.

කල්බදු ඇරඹුමේදී තැන්පතුව ගෙවීම සහ සෙසු කල්බදු ගෙවීම් වන සියල්ල එකම ගනුදෙනුවකින් ආරම්භ වේ. එමනිසා, ප්‍රවර්තන වටිනාකම සහ අරම්භයේදී ගෙවනු ලබන මූලික මුදල අතර වෙනස බදුකරු විසින් ගෙවිය යුතු අමතර මුදලක් වශයෙන් සැළකේ.

තැන්පතුව SLFRS 9 හි විෂයපථය ඇතුළත පවතින අතර මූලික සාධාරණ අගයට ගිණුම්ගත කළ යුතු වන අතර මූලික මුදල හා තැන්පතුව අතර අතිරික්තය එහි සාධාරණ අගය මත SLFRS 16 - කල්බදු හි විෂයපථයට ඇතුළත් වේ. තැන්පතු සඳහා වන ගිණුම්කරණ ප්‍රතිපත්තිය සටහන 2.4.9. හි දැක්වේ.

2019 අප්‍රියෙල් 1 දින සිට මාස 12 ක් ඇතුළත අවසන් වන කල්බදු කාලසීමාවන් සහිත ගුවන්යානාවන්හි කල්බදු සැළකිල්ලට නොග ැනුනු අතර ඒවා කෙටි කාලීන කල්බදු ආකාරයෙන්ම ගිණුම්ගත කොට ලාභ අලාභ ප්‍රකාශයෙහි කල්බදු ගුවන්යානා මත කුලිය යටතේ ඇතුළත් කොට හෙළිදරව් කරනු ලැබ ඇත.

***(ආ) ඉඩම් හා ගොඩනැගිලි ආශ්‍රිත කල්බදු***

සමූහය මගින් ශ්‍රී ලංකාව තුළ සහ විදේශයන්හි ඉඩම් හා ගොඩනැගිලි කල්බදු පදනමට ගනු ලැබේ. ඉඩම් හා ගොඩනැගිලි කල්බදු වල කාලසීමාව සාමාන්‍යයෙන් වසර 2 සිට 9 දක්වා වේ. ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධ ඇතැම් කල්බදු වල, අවලංගු කළ නොහැකි ගිවිසුම් කාලසීමාව අවසන් වීමට පෙරාතුව සමූහයට සිදුකල හැකි කාලසීමා දිගු කිරීමේ වරණයන් ඇතුළත් වේ. අදාළ අවස්ථාවන්හිදී, සමූහය මගින් මෙහෙයුම් නම්‍යශීලීත්වය ලබාගැනීමේ අරමුණින් යුතුව නව කල්බදු ගිවිසුම් තුළ කාලසීමා දිගු කිරීමේ වරණයන් ඇතුළත් කිරීම කෙරෙහි අවධානය යොමු කෙරේ. පවතින කාලසීමා දිගු කිරීම් වරණයන් භාවිත කළ හැකි වන්නේ සමූහයට පමණකි වන අතර බදු හිමියන්ට නොවේ.

සමූහය මගින් කල්බදු ආරම්භයේදී කාලසීමා දිගු කිරීමේ වරණයන් භාවිත කිරීම සාධාරණ ලෙස ස්ථිරද යන්න පිළිබඳ ඇගයුමක් සිදු කෙරේ. සැළකිය යුතු සිදුවීමක් හෝ තත්ත්වයන්හි සැළකිය යුතු වෙනසක් සිය පාලනය තුළ පවතී නම් අදාළ වරණයන් භාවිත කිරීම සාධාරණ ලෙස ස්ථිරද යන්න පිළිබඳව සමූහය මගින් ප්‍රතිඇගයුමක් සිදු කරනු ලැබේ.

***(ඇ) රථවාහන ආශ්‍රිත කල්බදු***

සමූහය මගින් වසර 2 සිට 5 දක්වා කාලසීමා යටතේ රථවාහන කල්බදු පදනමට ලබා ගැනේ.

***(ඈ) තොරතුරු තාක්ෂණ හා වෙනත් උපකරණ ආශ්‍රිත කල්බදු***

සමූහය මගින් වසර එකේ සිට තුන දක්වා කොන්ත්‍රාත් කොන්දේසි සහිතව තොරතුරු තාක්ෂණ උපකරණ හා සෙසු යන්ත්‍ර කල්බදු පදනමට ලබාගැනේ. මෙම කල්බදු කෙටි කාලීන වන සහ/හෝ අඩු වටිනාකමකින් යුතු කල්බදු අයිතම වේ. සමාගම මගින් මෙම කල්බදු සඳහා භාවිත හිමිකම් වත්කම් හා කල්බදු වගකීම් හඳුනානොගැනීමට තීරණය කෙරිණි. අදාළ කල්බදු ගෙවීම් ලාභ අලාභ ප්‍රකාශයෙහි ඇතුළත් කරන ලදී.

**භාවිත හිමිකම් වත්කම් ක්ෂයවීම**

භාවිත හිමිකම් වත්කම් සරල මාර්ග ක්‍රමවේදයට අනුව පසුව ක්ෂය කෙරෙනුයේ ආරම්භක දිනයේ සිට භාවිත හිමිකම් වත්කමෙහි ප්‍රයෝජ්‍ය ජීව කාලය අවසන් වීම

හෝ කල්බදු කාලසීමාව අවසන් වීම යන දෙකෙන් වඩාත් කලින් එළඹෙන දිනය දක්වාය. භාවිත හිමිකම් වත්කම් වල ඵලදායී ජීව කාලය නිර්ණය කිරීමේදී දේපල හා උපකරණ සම්බන්ධයෙන් යොදාගත් පදනම භාවිත කෙරේ. එයට අමතරව, භාවිත හිමිකම් වත්කම් සම්බන්ධ හානිකරණ අලාභයන් වෙතොත් ඒ සඳහා අඩු කෙරෙන අතර, කල්බදු වගකීමෙහි ඇතැම් ප්‍රතිමිනුම්ගත කිරීම් සඳහා ගලපනු ලැබේ.

**කල්බදු වගකීම**

කල්බදු වගකීම මූලිකව ආරම්භක දිනයේදී නොගෙවන ලද කල්බදු ගෙවීම් වල ප්‍රවර්තන වටිනාකමට මිනුම්ගත කෙරෙන අතර, කල්බදු වල පැහැදිලි පොලී අනුපාතය භාවිත කරමින් හෝ එම අගය නිසි පරිදි නිර්ණය කළ නොහැකි වේ නම්, සමූහයේ වර්ධනීය ණය ලබාගැනීමේ අනුපාතය යොදා ගනිමින් වට්ටම් කෙරේ.

කල්බදු වගකීම් මිනුම්කරණයේදී ඇතුළත් කරන ලද කල්බදු ගෙවීම් පහත දැක්වේ:

- ද්‍රව්‍යමය ස්ථාවර ගෙවීම්ද ඇතුළුව ස්ථාවර ගෙවීම්
- ආරම්භක දිනයේදී අදාළ දර්ශකය හෝ අනුපාතය යොදාගනිමින් මනින ලද, දර්ශකයක් හෝ අනුපාතයක් මත පදනම් වූ විචල්‍ය කල්බදු ගෙවීම්
- අවශේෂ වටිනාකම් ඇපකරයක් යටතේ ගෙවිය යුතු යැයි අපේක්ෂිත මුදල් ප5මාණයන් සහ
- ක්‍රියාවට නංවන බවට සමූහය සාධාරණ ලෙස ස්ථිර කොටගත් මිළදී ගැනීමේ වරණයක් යටතේ යෙදවුම් මිළ, කාලසීමා දිගු කිරීමේ වරණයක් ක්‍රියාවට නංවන බවට සමූහය සාධාරණ ලෙස ස්ථිර කොට ගත්තේ නම් වෛකල්පිත නැවත අළුත්කිරීමේ කාලසීමාවක කල්බදු ගෙවීම්, සහ කලින් අවසන් කිරීමට සමූහය සාධාරණ ලෙස ස්ථිර කොට නොගත්තේ නැතිනම් කල්බදු ගිවිසුමක් කලින් අවසන් කිරීම සඳහා වන දඩ මුදල්

කල්බදු වගකීම සඵල පොලී අනුපාත ක්‍රමවේදය යොදාගනිමින් ක්‍රමක්ෂය පිරිවැයට මිනුම්ගත කෙරේ. කිසියම් දර්ශකයක හෝ අනුපාතයක වෙනස්වීමක් හේතුවෙන් අනාගත කල්බදු ගෙවීම් වල වෙනසක් උද්ගත වන විටකදී, අවශේෂ වටිනාකම් ඇපකරයක් යටතේ ගෙවිය යුතු යැයි අපේක්ෂිත මුදල් ප්‍රමාණය සම්බන්ධ සමූහයේ ඇස්තමේන්තුවේ වෙනසක් පවතින විටකදී, හෝ සමූහය මගින් මිළදී ගැනීමක්, කාලසීමා දිගු කිරීමක් හෝ අවසන් කිරීමේ වරණයක් තෝරාගන්නේද යන්න පිළිබඳ ස්වකීය ඇගයුම වෙනස් කරන ලද විටකදී එය ප්‍රතිමිනුම්ගත කෙරේ.

මේ අයුරින් කල්බදු වගකීම මිනුම්ගත කල විටකදී, භාවිත හිමිකම් වත්කමෙහි ධාරණ අගය වෙත අනුරූපී ගැලපුමක් සිදු කරනු ලබන අතර, භාවිත හිමිකම් වත්කමෙහි ධාරණ අගය ශූන්‍ය දක්වා පහත වැටී ඇත්නම් එය ලාභ අලාභ ප්‍රකාශයෙහි වාර්තාගත කෙරේ.

**කෙටි කාලීන කල්බදු සහ පහළ වටිනාකම් සහිත වත්කම් ආශ්‍රිත කල්බදු**

තොරතුරු තාක්ෂණ උපකරණ ඇතුළු මාස 12 ට අඩු කල්බදු කාලසීමාවන් සහිත කෙටි කාලීන කල්බදු සහ පහළ වටිනාකම් සහිත වත්කම් ආශ්‍රිත කල්බදු සඳහා භාවිත හිමිකම් වත්කම් හෝ කල්බදු වගකීම් හඳුනානොගැනීමට සමූහය තීරණය කලේය. සමූහය මගින් මෙකී කල්බදු ආශ්‍රිත කල්බදු ගෙවීම් කල්බදු කාලසීමාව පුරා සරල මාර්ග පදනමක් මත වියදමක් වශයෙන් හඳුනාගැනේ.

**2019 අප්‍රියෙල් 1 දිනට පෙර අදාළ වන ප්‍රමිතිය**

***(අ) මෙහෙයුම් කල්බදු***

කල්බදු කාලසීමාව තුළ සියලුම අවදානම් හා ප්‍රතිලාභ වල හිමිකාරීත්වය ප්‍රමාණවත්ව කල්බදු හිමිකරු විසින් ක්‍රියාකාරීව රඳවා ගන්නා කල්බදු, මෙහෙයුම් කල්බදු ලෙස සැලකේ. වෙනත් ක්‍රමවත් පදනමක් තුලින් භාවිතා කරන්නන්ගේ ප්‍රතිලාභ කාල රටාව සම්බන්ධයෙන් වඩාත් සුදුසු ඉදිරිපත්කිරීමක් සිදුනොකරන්නේ නම් හැර මෙහෙයුම් කල්බදු ගෙවීම්, කල්බදු කාල සීමාව පුරා සරල රේඛීය පදනමක් මත ලාභ හෝ අලාභ ප්‍රකාශනය තුළ මෙහෙයුම් වියදමක් ලෙස හඳුනාගනී.

මෙහෙයුම් කල්බදු යටතේ වත්කම් නැවත සකස් කිරීමේ පිරිවැයන් (Reconfiguration) ප්‍රාග්ධනීකරණය කරනු ලබන අතර ඵලදායී ජීවකාලය හෝ ඉතිරි කල්බදු කාලය යන දෙකෙන් අඩු කාලසීමාව පුරා ක්ෂය කරනු ලැබේ. 2.4.3 දරන ගිණුම්කරණ ප්‍රතිපත්තිය විමසා බලන්න.

***(ආ) මූල්‍ය කල්බදු***

කල්බදු අයිතමයේ සියලුම අවදානම් හා ප්‍රතිලාභ හිමිකාරීත්වය සමූහයට පවරනු ලබන කල්බදු දේපළෙහි සාධාරණ අගය හෝ ඊට වඩා අඩු අගයක් ගන්නේ නම් අවම කල්බදු ගෙවීම් වල සාධාරණ අගය හෝ අවම කල්බදු ගෙවීම් වල වර්තමාන වටිනාකම කල්බද්දේ ආරම්භක අවස්ථාවේදීම ප්‍රාග්ධනිත කෙරේ. ඉතිරි වගකීම් ශේෂය මත ස්ථාවර පොළී අනුපාතයක් අත්කර ගැනීමට මූල්‍ය ගාස්තු සහ කල්බදු වගකීමේ අඩුවීම අතර කල්බදු ගෙවීම් විභජනය කරයි. මූල්‍ය ගාස්තු ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි මූල්‍ය පිරිවැය තුල හඳුනාගනී.

ප්‍රාග්ධනිත කල්බදු වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හෙළිදරව් කරන අතර කල්බදු වත්කම භාවිතා කිරීමෙන් සමූහය ප්‍රතිලාභ අපේක්ෂා කරන කාලසීමාව පුරා ක්ෂය කරනු ලබයි. 2.4.3 දරන ගිණුම්කරණ ප්‍රතිපත්තිය විමසා බලන්න.

***(ඇ) විකිණීම හා ආපසු බදු ගැනීම***

මෙහෙයුම් කල්බද්දක ප්‍රතිඵලයක් ලෙස විකුණුම් හා ආපසු බදුගැනීම් සම්බන්ධ ගණුදෙනු නිසා ඇතිවන ලාභ, විකුණුම් වලින් ලැබෙන මුදල් ප්‍රමාණය අදාළ වත්කම් වල සාධාරණ අගය නොඉක්මවන තෙක් එසැනින් ලාභ හෝ අලාභ ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

**2.4.6 තොග**

ගුවන් යානා හා ගුවන් පර්යන්ත සේවා ආශ්‍රිත තොග, අමුද්‍රව්‍ය සහ පාරිභෝජන ද්‍රව්‍ය යනාදියෙන් තොග සමන්විත වේ.

තොග වාර්තා කරනුයේ පිරිවැය අගය හා ශුද්ධ උපලබ්ධි කළ හැකි අගය යන දෙකෙන් අඩු අගය මතය. තොග වල පිරිවැය යනු සියලු ගැනුම් පිරිවැය, පරිවර්තන පිරිවැය හා එම තොග වර්තමාන තත්ත්වයට ගෙන ඒම සඳහා දරන ලද අනෙකුත් වියදම්ය.

තොග වල පිරිවැය ගණනය කිරීම සඳහා බර තැබූ සාමාන්‍ය පිරිවැය ක්‍රමය යොදා ගැනේ. සියලුම ඇස්තමේන්තුගත සම්පූර්ණ කිරීමේ පිරිවැය හා විකුණුමක් සිදුකිරීම සඳහා අවශ්‍යවන්නා වූ පිරිවැය අඩුකරන ලද ඇස්තමේන්තුගත විකුණුම් මිල ශුද්ධ උපලබ්ධි අගය නියෝජනය කරයි.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් සබැඳේ.

**2.4.7 මූල්‍යමය නොවන වත්කම් හානිකරණය**
කිසියම් වත්කමක් හානිකරණය වූ බවට පෙන්නුම් කිරීමක් ඇත්දැයි පරීක්ෂා කිරීමට සමූහය විසින් එක් එක් වාර්තා කරන දිනට තක්සේරුවක් සිදුකරයි. එබඳු යම් පෙන්නුම් කිරීමක් වුවහොත් හෝ යම් වත්කමක් සඳහා වාර්ෂික හානිකරණය පරීක්ෂණයක් අවශ්‍ය වන විට හෝ වත්කමෙහි ආපසු අයකරගත මුදල පිළිබඳව සමූහය විසින් තක්සේරුවක් සිදුකෙරේ. වත්කමක ධාරණ අගය එහි ආපසු අයකරගත හැකි අගයෙහි ප්‍රමාණය ඉක්මවන්නේ නම් වත්කම හානිකරණයට පත්ව ඇතැයි සලකන අතර එය ආපසු අයකරගත හැකි අගය දක්වා කපා හැරේ.

කෝවිඩ් 19 වසංගතය පැතිරීමෙන් අනතුරුව, සමූහය මගින් වාර්තාකරණ දිනය වන විට මූල්‍යමය නොවන වත්කම් වල (භාවිත හිමිකම් වත්කම්ද ඇතුළුව) කවර හෝ ප්‍රමාණාත්මක හානිකරණයක් පවතීද යන්න සළකා බැලීම සඳහා විශ්ලේෂණයක් සිදු කරන ලදී. අදාළ විශ්ලේෂණය මත පදනම්ව, 2020 මාර්තු 31 දිනට කිසිදු හානිකරණයක් හඳුනානොගැනුනි.

**2.4.8 සාධාරණ අගය මිනුම්කරණය**
සමූහය විසින් ඉඩම් හා ගොඩනැගිලි සහ ගුවන්යානා මුළුතැන්ගෙයි උපකරණ සාධාරණ අගය අනුව මිනුම්කරණය කරයි. සාධාරණ අගය ආශ්‍රිත හෙළිදරව් කිරීම් සටහන 4 හි සිදුකර ඇත.

සාධාරණ අගය යනු එය මනිනු ලබන දිනකදී වෙළෙඳපොලේ සහභාගීවන්නන් අතර විධිමත් ගණුදෙනුවක් තුළින් වත්කමක් විකිණීම සඳහා ලැබිය හැකි හෝ වගකීමක් පැවරීම සඳහා ගෙවනු ලබන මිලයි. සාධාරණ අගය මැනීමේ පදනම වනුයේ යම් වත්කමක් විකිණීම හෝ යම් වගකීමක් පැවරීම:

- වත්කම් හෝ වගකීම් සඳහා මූලික වෙළෙඳපොළකදී හෝ
- මූලික වෙළෙඳපොළක් නොමැති විට, අදාළ වත්කම හෝ වගකීම සඳහා වන වඩාත් වාසි සහගතම වෙළෙඳපොළකදී සිදුවේ යැයි යන උපකල්පනය මතය.

සමූහයට මූලික වෙළෙඳපොළ හෝ වඩාත් වාසි සහගතම වෙළෙඳපොළ වෙත ප්‍රවේශය සලසා ගත හැකි විය යුතුය.

එබඳු වත්කම්වල සාධාරණ අගය මිනුම්කරණය කරනුයේ වෙළෙඳපොළ සහභාගිවන්නන් සිය ප්‍රශස්ත ආර්ථික අපේක්ෂාවන් ඔස්සේ ක්‍රියා කරනු ඇතැයි උපකල්පනය කරමින් අදාළ වත්කම හෝ වගකීම මිල කිරීමේදී වෙළෙඳපොළ සහභාගිවන්නන් භාවිත කරනු ඇතැයි යන උපකල්පන භාවිතා කරමිනි.

මූල්‍ය නොවන වත්කමක සාධාරණ අගය මිනුම්කරණයේදී වත්කමක එහි ඉහළම සහ ප්‍රශස්තතම භාවිතය සිදුකළ හැකි වෙළෙඳපොළ සහභාගිවන්නකුට විකිණීමෙන් හෝ ඉහළම සහ ප්‍රශස්තතම භාවිතය සිදුකළ හැකි පරිදි භාවිතයෙන් ආර්ථික ප්‍රතිලාභ උත්පාදනය කිරීමෙහිලා වෙළෙඳපොළ සහභාගිවන්නකුට ඇති හැකියාව පිළිබඳ සැලකිල්ල යොමු කරයි.

සාධාරණ අගය මැනීමට, අදාළ පරිදි නිරීක්ෂණය කල හැකි යෙදවුම්වල භාවිතය උපරිම මට්ටමට ගෙන ඒමට සහ නිරීක්ෂණය කල නොහැකි යෙදවුම්වල භාවිතය අවම තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය ප්‍රමාණවත් දත්ත පවතින අතර අවස්ථානුකූලව ගැලපෙන මිනුම්කරණ ශිල්ප ක්‍රම සමූහය විසින් යොදා ගනු ලබයි.

සමස්තයක් වශයෙන් සාධාරණ අගය මිනුම්කරණයේදී වැදගත්වන අඩුම මට්ටමේ යෙදවුම් මත පදනම්ව සාධාරණ අගය මනිනු ලබන සියලු වත්කම් සාධාරණ අගය ආශ්‍රිත ධුරාවලිය තුළ පහත විස්තර කර ඇති පරිදි වර්ගීකරණය කෙරේ.

- 01 වන මට්ටම - සමාන වත්කම් හෝ වගකීම් සඳහා සක්‍රීය වෙළෙඳපොලවල් තුළ වූ ලැයිස්තුගත (නොගළපන ලද) වෙළෙඳපොළ මිල ගණන්
- 02 වන මට්ටම - සෘජුව හෝ වක්‍රව නිරීක්ෂණය කළ හැකි සාධාරණ අගය මැනීම සඳහා වැදගත් වන අඩුම මට්ටමේ යෙදවුම් සඳහා තක්සේරු ශිල්ප ක්‍රම
- 03 වන මට්ටම - නිරීක්ෂණය කළ නොහැකි සාධාරණ අගය මැනීම සඳහා වැදගත් වන අඩුම මට්ටමේ යෙදවුම් සඳහා තක්සේරු ශිල්ප ක්‍රම

පුනරාවර්තන පදනමක් මත මූල්‍ය ප්‍රකාශනවල හඳුනා ගැනෙන වත්කම් හා වගකීම් සඳහා එක් එක් වාර්තාකරණ කාලපරිච්ඡේදයන් අවසානයේ වර්ගීකරණය නැවත තක්සේරුවක් (සමස්තයක් වශයෙන් සාධාරණ අගය මැනීම සඳහා වැදගත් වන අඩුම මට්ටමේ යෙදවුම් මත පදනම්ව) මගින් ධුරාවලියෙහි මට්ටම අතර මාරුවීම් සිදුවී ඇත්ද යන්න සමූහය තීරණය කරනු ලබයි.

දේපළ, පිරියත හා උපකරණ වැනි සැලකිය යුතු වත්කම් තක්සේරු කිරීම සඳහා බාහිර තක්සේරුකරුවන් සම්බන්ධ වේ. බාහිර තක්සේරුකරුවන් තෝරාගැනීමේ නිර්ණායකවල වෙළෙඳපොළ දැනුම, කීර්තිමත්භාවය, ස්වාධීනත්වය සහ වෘත්තීය ප්‍රමිතීන්ට අනුව කටයුතු ඉටු කරන්නේද යන දෑ ඇතුලත් වේ. බාහිර තක්සේරුකරුවන් සමඟ සාකච්ඡා කිරීමෙන් පසුව එක් එක් කාරණය සම්බන්ධයෙන් කුමන ශිල්ප ක්‍රමය සහ යෙදවුම භාවිතයට ගන්නේද යන්න පිළිබඳව සමූහය මගින් තීරණය කරනු ලැබේ.

සාධාරණ අගය හෙළිදරව් කිරීමේ අරමුණ සඳහා වත්කමට හෝ වගකීමට අදාළ ස්වභාවය, ගති ලක්ෂණ හා අවදානම් මෙන්ම ඉහත විස්තර කර ඇති පරිදි සාධාරණ අගය ධුරාවලියේ මට්ටම යන කරුණු මත පදනම්ව සමූහය විසින් වත්කම් හා වගකීම් වල කාණ්ඩය තීරණය කරනු ලැබේ.

**2.4.9 මූල්‍ය උපකරණ**

2.4.9.1 මූල්‍ය වත්කම්

**මූලික හඳුනාගැනීම සහ මිනුම්කරණය**
මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැය, වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ වටිනාකම (FVOCI) සහ ලාභය හෝ අලාභය ඔස්සේ සාධාරණ වටිනාකම (FVTPL) වශයෙන් වර්ගීකරණය කර ඇත.

මූල්‍ය වත්කම් (ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමකින් නම් කරන ලද වත්කම් ඇතුළුව) මුලින් හඳුනාගනු ලබන්නේ සමූහය උපකරණයේ ගිවිසුම්ගත විධිවිධානවල පාර්ශවකරුවෙකු වන වෙළඳාම සිදුවන දිනයේදීය.

මූල්‍ය වත්කමක් මුලින් මනිනු ලබන්නේ සාධාරණ අගය අනුවය. ලාභය හෝ අලාභ හරහා සාධාරණ අගයක් නොමැති අයිතමයක් සඳහා එය අත්පත් කර ගැනීම හෝ නිකුත් කිරීම සඳහා සෘජුවම ආරෝපණය වන ගනුදෙනු පිරිවැය සලකා බලනු ලැබේ.

**පසු මිනුම**

මූල්‍ය වත්කම් වර්ගීකරණය සාමාන්‍යයෙන් පදනම් වන්නේ මූල්‍ය වත්කමක් කළමනාකරණය කරන ව්‍යාපාර ආකෘතිය සහ එහි ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලක්ෂණ මත ය.

මූල්‍ය වත්කමක් පහත සඳහන් කොන්දේසි දෙකම සපුරාලන්නේ නම් සහ ලාභය හෝ අලාභය ඔස්සේ සාධාරණ වටිනාකම (FVTPL) වශයෙන් නම් කර නොමැති නම් එය ක්‍රමක්ෂය පිරිවැයකින් මනිනු ලැබේ:

- වත්කම් රඳවාගෙන ඇත්තේ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම සඳහා වත්කම් තබා ගැනීම අරමුණු කරගත් ව්‍යාපාර ආකෘතියක් තුළ; සහ
- මූල්‍ය වත්කම්වල ගිවිසුම්ගත නියමයන් මඟින් නිශ්චිත දිනයන්හි, ලැබිය යුතු මූලික මුදලේ වාරික කොටස් සහ හිඟ මූලික මුදල මත පොළියට අදාළ වන මුදල් ප්‍රවාහ ජනිත කරයි.

වෙළඳාම සඳහා නොපවතින කොටස් ආයෝජනයක් මුලින් හඳුනාගැනීමෙන් පසු,වෙනත් විස්තීර්ණ ආදායමෙහි (OCI) සාධාරණ වටිනාකමෙහි පසුකාලීන වෙනස්කම් ඉදිරිපත් කිරීමට සමූහය විසින් ආපසු අවලංගු කළ නොහැකි ලෙස තෝරා ගත හැකිය. උපකරණයක් උපකරණයක් පාසා (instrument-by-instrument) මෙම තෝරාගැනීම සිදු කරනු ලබයි.

වෙළඳ හා වෙනත් අය විය යුතු දෑ, ගුවන් යානා නඩත්තු සංචිතය, ගුවන් යානා අමතර එන්ජින් තැන්පතු, ආයෝජන, මුදල සහ බැංකු මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලබන අතර පසුකාලීනව ක්‍රමක්ෂය පිරිවැය ක්‍රමය මත මනිනු ලැබේ.

**හඳුනාගැනීමෙන් බැහැර කිරීම**

මූල්‍ය වත්කම් වලින් ලැබෙන මුදල් ප්‍රවාහයන් සඳහා වන ගිවිසුම්ගත අයිතිවාසිකම් කල් ඉකුත් වූ විට සමූහය මූල්‍ය වත්කමක් හඳුනාගැනීමෙන් බැහැර කරයි, නැතහොත් ගනුදෙනුවක දී ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් ලැබීමේ අයිතිය මාරු කරන අතර එමඟින් සැලකිය යුතු ලෙස මූල්‍ය වත්කම්වල හිමිකාරිත්වයෙහි සියලු අවදානම් සහ ප්‍රතිලාභ පැවරීම හෝ සමූහය විසින් හිමිකාරිත්වයේ සියලු අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස මාරු කිරීම හෝ රඳවා ගැනීම සිදු නොකරන අතර එය මූල්‍ය වත්කම්වල පාලනය රඳවා නොගනී.

මූල්‍ය වත්කමක් හඳුනාගැනීමෙන් බැහර කිරීමේදී, වත්කමෙහි ධාරණ අගය (හෝ හඳුනාගැනීමෙන් බැහැර කරන ලද වත්කම් කොටසට අදාළ ධාරණ අගය සහ:

(i) ලද ප්‍රතිශ්ඨාව (අත් කරගත් නව වත්කම් වලින් අත් කරගත් ඕනෑම නව වගකීමක් අඩු කර ඒවාද ඇතුළත් කර) සහ
(ii) වෙනත් විස්තීර්ණ ආදායම් වලින් හඳුනාගෙන ඇති කවර හෝ සමුච්චිත ලාභය හෝ අලාභය යන ඒවායේ එකතුව ලාභ සහ අලාභ වල හඳුනාගෙන ඇත.

**මූල්‍ය වත්කම් හානිකරණය**

ක්‍රමක්ෂය පිරිවැයකින් හෝ වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ වටිනාකමකින් මනිනු ලබන මූල්‍ය වත්කම්වල අපේක්ෂිත ණය අලාභ සඳහා අලාභ දීමනාවක් සමූහය විසින් හඳුනාගනු ලැබේ.

සියළුම වෙළඳ සහ වෙනත් අය විය යුතු දෑ සඳහා ජීවිත කාලය පුරාම අපේක්ෂිත අලාභ දීමනාවක් භාවිතා කරන අපේක්ෂිත ණය පාඩු මැනීම සඳහා සමූහය මඟින් සරල ප්‍රවේශයක් භාවිතා කරනු ලැබේ.

සමූහය විසින් මූල්‍ය උපකරණයක අපේක්ෂිත ණය අලාභ මැන බලන්නේ පහත සඳහන් කරුණු නිරූපනය වන අයුරිනි;

(අ) සම්භාවිතාවක් සහිත ප්‍රතිඵල පරාසයක් ඇගයීමෙන් තීරණය කරනු ලබන අපක්ෂපාතී හා සම්භාවිතාව මත බර තැබූ අගයක්;
ආ) මුදල්වල කාල වටිනාකම; සහ
ඇ) අතීත සිදුවීම්, වර්තමාන තත්වයන් සහ අනාගත ආර්ථික තත්ත්වයන්ගේ පුරෝකථනයන් පිළිබඳ වාර්තා කිරීමේ දිනයේදී අයුතු පිරිවැයක් හෝ උත්සාහයක් නොමැතිව ලබා ගත හැකි සාධාරණ සහ සහාය විය හැකි තොරතුරු.

ක්‍රමක්ෂය පිරිවැය යටතේ මනිනු ලබන මූල්‍ය වත්කම් සඳහා වන අලාභ දීමනා රැගෙන යන දළ වත්කම් ප්‍රමාණයේ ධාරණ අගයෙන් අඩු කරනු ලැබේ.

ලෝක ආර්ථිකය වෙත කෝවිඩ් 19 හි බලපෑම හමුවේ රජයයන්, ව්‍යාපාරයන් සහ පාරිභෝගිකයින් ඒ සඳහා ප්‍රතිචාර දක්වන ආකාරය අවිනිශ්චිත වේ. මෙම අවිනිශ්චිතතාව කළමානකරණ විනිශ්චයන් සහ ඇස්තමේන්තු රැසකට යටත් වන ස්වකීය ණය කළඹෙන් අපේක්ෂිත ණය අලාභ ආශ්‍රිත සමූහයේ ඇගයුම තුළින් පිළිබිඹු වේ.

මෙම විනිශ්චයන් හා ආශ්‍රිත උපකල්පනයන් කෝවිඩ් 19 හි බලපෑම් සන්දර්භය තුළ සිදුකරන ලද අතර, ඒවා මගින් පවතින තත්ත්වයන් යටතේ සාධාරණ යැයි විශ්වාස කළ හැකි අනාගත සිදුවීම් සම්බන්ධ අපේක්ෂාවන්ද ඇතුළුව අදාළ යැයි සැළකෙන ඓතිහාසික අත්දැකීම් හා සෙසු සාධක පිළිබිඹු වේ.

### 2.4.9.2 මූල්‍ය වගකීම්

**මූලික හඳුනාගැනීම සහ මිනුම්කරණය**

සියළුම මූල්‍ය වගකීම් (ලාභය හෝ අලාභය ඔස්සේ සාධාරණ වටිනාකමකින් (FVTPL) නම් කරන ලද වගකීම් ඇතුළුව) මුලින් හඳුනාගෙන ඇත්තේ සමූහය උපකරණයේ ගිවිසුම්ගත විධිවිධානවල පාර්ශවකරුවෙකු වන වෙළඳ දිනයේදීය.

වගකීම අත්පත් කර ගත් අරමුණ මත පදනම්ව සමාගම සිය මූල්‍ය වගකීම් පහත කාණ්ඩ දෙකෙන් එකකට වර්ග කරයි; ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ වටිනාකම (FVTPL) හෝ වෙනත් මූල්‍ය වගකීම් යනු එම කාණ්ඩ දෙක වේ.

මූල්‍ය වගකීමක් මුලින් මනිනු ලබන්නේ සාධාරණ අගය අනුවය. ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයක් නොමැති භාණ්ඩයක් සඳහා, එය අත්පත් කර ගැනීමට හෝ නිකුත් කිරීමට සෘජුවම ආරෝපණය වන ගනුදෙනු පිරිවැය සලකා බලනු ලැබේ.

**පසු මිනුම්කරණය**

සමූහයට මූල්‍ය වගකීම් ලෙස වර්ගීකරණය කරන ලද පොලී දරණ ණය සහ ණය ගැනීම්, ගුවන් යානා නඩත්තු කිරීම සහ අලුත්වැඩියා කිරීමේ පිරිවැය, වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ පවතී.

මූලික පිළිගැනීමෙන් අනතුරුව, මූල්‍ය වගකීම් ක්‍රමක්ෂය පිරිවැය ක්‍රමයට මනිනු ලැබේ.

මූල්‍ය වගකීමක ක්‍රමක්ෂය පිරිවැය යනු මූලික හඳුනාගැනීමේදී මූල්‍ය වගකීම මනිනු ලබන ප්‍රමාණයෙන්, මූලික ආපසු ගෙවීම් අඩු කර හඳුනාගත් ආරම්භක මුදල හා කල්පිරීමේ මුදල අතර ඇති කිසියම් වෙනසක් සඳහා සඵල

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් සබැඳේ.

පොලී අනුපාතික ක්‍රමයක් භාවිතා කරමින් සමුච්චිත ක්‍රමක්ෂය එකතු කර හෝ අඩු කර ඉන් හානිකරණය අඩු කිරීමෙන් ලැබෙන අගයයි.

**හඳුනාගැනීමෙන් බැහැර කිරීම**
වගකීම යටතේ ඇති බැඳීම මුදා හැරීමේදී හෝ අවලංගු කරන විට හෝ කල් ඉකුත් වූ විට මූල්‍ය වගකීමක් හඳුනාගැනීමෙන් බැහැර කෙරේ.

එකම ණය දෙන්නාගෙන් පවත්නා මූල්‍ය වගකීමක් වෙනත් වගකීමක් විසින් සැලකිය යුතු ලෙස වෙනස් කොන්දේසි මත ප්‍රතිස්ථාපනය කරන විට හෝ පවත්නා වගකීමක කොන්දේසි සැලකිය යුතු ලෙස වෙනස් කරන විට, එවැනි හුවමාරුවක් හෝ වෙනස් කිරීමක් මුල් වගකීම හඳුනා ගැනීමෙන් බැහැර කිරීම ලෙස සහ නව වගකීමක් හඳුනා ගැනීම ලෙස සලකනු ලැබේ. අදාළ ධාරණ අගයයන්හි වෙනස ලාභ හෝ අලාභ ප්‍රකාශයෙහි හඳුනාගැනේ.

### 2.4.9.3 මූල්‍ය උපකරණ හිලව්කිරීම
මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් හිලව් කර, ශුද්ධ අගය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ හඳුනාගනුයේ:

- හඳුනාගත් මුදල් පියවා ගැනීම සඳහා දැනට බලාත්මක කළ හැකි නීතිමය හිමිකමක් පවතී නම් සහ
- ශුද්ධ පදනමක් මත පියවීමට හෝ වත්කම් උපලබ්ධි කර වගකීම් එකවර පියවා ගැනීමට අභිලාෂයක් පවතී නම් පමණි.

### 2.4.9.4 මුදල් ප්‍රවාහ සුරැකුම් (Hedge) සංචිතය
හඳුනාගන්නා ලද ස්වකීය විදේශ ව්‍යවහාර මුදල් ණය ප්‍රමාණයන්, ඉහළ සම්භාවිතාවක් සහිතව විශේෂයෙන් හඳුනාගත් ස්වකීය විදේශ ව්‍යවහාර මුදල් ආශ්‍රිතව ඉපැයුම් අනාගත ආදායම් වලට එරෙහිව සුරැකුම් උපකරණයක් ලෙස සමාගම විසින් නම්කර ඇත. විදේශ විනිමය අනුපාත තුළ සිදුවන උච්චාවචන හේතුවෙන් හඳුනාගත් විදේශ ව්‍යවහාර මුදල් ණය අගයන් වෙනස්වීමෙහි අවදානම හරහා සමාගම සුරැකුම් කරන ලදී.

සුරැකුම් උපකරණය මත සිදුවන ලාභය හෝ අලාභයේ ඵලදායී කොටස් අයත් වෙනත් විස්තීර්ණ ආදායමෙහි මුදල් ප්‍රවාහ සුරක්ෂාකරණ සංචිතයෙහි සෘජුවම හඳුනා ගැනෙන අතර යම් ඵලදායී නොවන කොටසක් වේතොත් එය වෙනත් මෙහෙයුම් ලෙස ලාභ අලාභ ප්‍රකාශනය තුල වහා හඳුනාගැනේ. වෙනත් විස්තීර්ණ ආදායම ලෙස හඳුනාගත් අගයන් මුදල් ප්‍රවාහ සුරැකුම් ගණුදෙනුව සිදුවන විට (පුරෝකථනය කරන ලද ආදායම උපලබ්ධි වන විට) ලාභ අලාභ ප්‍රකාශනය වෙත මාරු කරනු ලැබේ.

පුරෝකථනය කරන ලද ගණුදෙනුව සිදුවනු ඇතැයි තවදුරටත් අපේක්ෂා නොකරන්නේ නම් වෙනත් විස්තීර්ණ ආදායම තුළ කලින් හඳුනා ගත් සමුච්චිත ලාභය හෝ අලාභය ලාභ අලාභ ප්‍රකාශනය වෙත මාරු කරයි. සුරැකුම් උපකරණ කල් ඉකුත් වුවහොත් හෝ විකුණනු ලැබුවහොත් හෝ අවසන් කර දමන ලද හොත් හෝ ප්‍රතිසම්පාදනයකින් හෝ නැවත දීර්ඝ කිරීමකින් තොරව ක්‍රියාත්මක කරනු ලැබුවහොත් හෝ අවලංගු කල සුරැකුමක් වශයෙන් නම්කරයි නම් වෙනත් විස්තීර්ණ ආදායම තුළ කලින් හඳුනා ගත් යම් සමුච්චිත ලාභ හෝ අලාභ අදාළ සුරැකුම් ගිවිසුමට අනුව පුරෝකථනය කරන ලද ගනුදෙනුව සිදුවන තෙක් හිමිකම තුළ රඳවා ගනී.

කොවිඩ් 19 හි බලපෑම අඩාල වූ මෙහෙයුම් හේතුවෙන් විදේශ මුදල් වලින් ලැබෙන අනාගත ආදායම සහ ප්‍රතිසැකසුම් සිදුකරන ලද විදේශ විනිමය ණය යන කරුණු දෙක කෙරෙහිම එල්ල වූ අතර ඒ අනුව සුරැකුමෙහි බලාත්මක නොවන කොටස ලාභ අලාභ ප්‍රකාශයෙහි හඳුනාගනු ලැබ ඇත.

**2.4.10 ගුවන්යානා නඩත්තු සංචිතය**
මෙහෙයුම් කල්බදු ගිවිසුම් අනුව ගුවන් යානා එන්ජින්, ගුවන්යානා සැකිලි සහ ගුවන්යානා අංගෝපාංග යනාදියෙහි අළුත්වැඩියාවන් සඳහා මාසික පදනමක් මත කල්බදුහිමිකරුවන් වෙත කරනු ලබන ගෙවීම් වලින් ගුවන්යානා නඩත්තු සංචිතය සමන්විත වේ. ගුවන්යානා එන්ජින්, ගුවන්යානා සැකිලි සහ ගුවන්යානා අංගෝපාංග පිරිවැඩියා සඳහා දරන ලද වියදම (මෙතෙක් සංචිතයට ගෙවූ ප්‍රමාණයන් දක්වා) අදාළ නඩත්තු කටයුතු නිමවීමෙන් පසුව එකී සංචිත හරහා කල්බදුකරුවන් වෙතින් සමාගම ආපසු අය කර ගනී.

එහි ස්වභාවය මත පදනම්ව ගුවන්යානා නඩත්තු සංචිතය ණය සහ ලැබිය යුතු දෑ යටතේ වර්ගීකරණය කරනු ලැබ ඇති අතර මෙම මූල්‍යමය වත්කම් කාණ්ඩය සඳහා අදාළ හිණුම්කරණ ප්‍රතිපත්තිය ඉහත සටහන 2.4.9.1. හි දැක්වේ.

**2.4.11 වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු දෑ**
තැන්පතු සහ වෙනත් ණය ගැතියන් ඇතුලත් වෙළෙඳ ණයගැතියන් (පිරිවැයට මිනුම්කරණය කොට ඇති තැන්පතු හා වෙනත් ලැබිය යුතු දෑ යටතේ වර්ගීකරණය කරන ලද මූල්‍ය නොවන වත්කම් හැර) වර්ගීකරණය කර ගිණුම්ගත කෙරෙනුයේ ණය සහ ලැබිය යුතු දෑ වශයෙනි. එහි ස්වභාවය මත පදනම්ව මෙම මූල්‍යමය වත්කම් කාණ්ඩය සඳහා අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තිය ඉහත සටහන 2.4.9.1. (අ) හි දැක්වේ.

**2.4.12 ආයෝජන**

**පරිපාලිත සමාගමෙහි ආයොජන**
සමාගමේ මූල්‍ය ප්‍රකාශ තුළ පරිපාලිත සමාගම ආශ්‍රිතව සිදුකෙරෙනු ආයෝජන තාවකාලිකව අගය අවප්‍රමාණ වීම් නොවන හානිකරණයන් ගැලපීමෙන් අනතුරුව ශුද්ධ පිරිවැයට ගිණුම් ගත කරනු ලැබ ඇත.

**2.4.13 කෙටි කාලීන ආයෝජන**
මාස 03 ට වැඩි කල්පිරීමක් සහිත බැංකු වල පවතින ස්ථාවර වත්කම් කෙටි කාලීන ආයෝජන වේ. ඒවායේ ක්‍රමක්ෂය පිරිවැය මත කෙටි කාලීන ආයෝජන මිනුම්කරණය කරනු ලැබේ.

**2.4.14 මුදල් සහ මුදල් සමාන දෑ**
බැංකුවේ පවතින මුදල්, අතැති මුදල් හා ඉල්ලුම් තැන්පතු සහ දන්නා මුදල් ප්‍රමාණ වලට වහා පරිවර්තනය කළ හැකි හා අගය වෙනස්වීමේ අඩු අවදානමක් ඇති කෙටිකාලීන අධි ද්‍රවශීල ආයෝජන මුදල් සහ මුදල් සමාන දෑ ලෙස සළකනු ලැබේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි මුදල් හා මුදල් සමාන දෑ වලට බැංකුවේ හා අතැති මුදල් ද, ඉල්ලුම් තැන්පතු ද, හිඟහිටි බැංකු අයිරා සහ අවහිර කළ මුදල් ගැලපූ පසු ඇතුළත් වේ. කෙටි කල් පිරීමේ කාලයක් සහිත අයෝජනද (එනම් අත්කර ගැනීමේ දිනයේ සිට තෙමසක් කාලයක් හෝ ඊට අඩු) මුදල් සමාන දෑ ලෙස සැලකේ. බැංකු අයිරා අනාවරණය කරනු ලබන්නේ මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය තුල පොළී දරණ වගකීම් යටතේය.

**2.4.15 වෙන්කිරීම්**

**(i) සාමාන්‍ය**
වෙන්කිරීම් හඳුනාගැනෙනුයේ කිසියම් අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස සමූහය සතුව

කිසියම් ප්‍රවර්තන බැඳීමක් (නෛතික හෝ සම්ප්‍රයුක්ත) පවතින අවස්ථාවකදී එය බේරුම් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ වල අන්තර්ගත යම් සම්පත් ගලායෑමක් අවශ්‍ය වන සහ එකී බැඳීමේ වටිනාකම විශ්වාසදායක ඇස්තමේන්තුවක් සිදුකල හැකි විටය. වෙන්කිරීම් සමහරක් හෝ සියල්ලම ප්‍රතිපූර්ණය කල යුතු යැයි සමූහය අපේක්ෂා කරන්නේ නම් වෙනමම වත්කමක් ලෙස එකී ප්‍රතිපූර්ණය හඳුනා ගැනෙන මුත් එය එසේ කෙරෙනුයේ අදාළ ප්‍රතිපූර්ණය සැබවින්ම නිශ්චිත වූ විට පමණි. ප්‍රතිපූරණයන්ට ශුද්ධව මොනයම් හෝ වෙන්කිමකට අදාළ වියදම් ලාභ හෝ අලාභ ප්‍රකාශනය තුළ ඉදිරිපත් කරනු ලැබේ.

#### (ii) ගුවන්යානා නඩත්තු හා අළුත්වැඩියා වියදම්

ගුවන්යානා නඩත්තු හා අළුත්වැඩියා වියදම් (ගුවන්යානා වල විශාල නඩත්තු කිරීම්, ගුවන්යානා එන්ජින් සහ ගොඩබැසුම් උපකරණවලට කෙරෙන අළුත්වැඩියා කිරීම් හැර) සමූහය විසින් හඳුනාගැනෙනුයේ ඒ සඳහා වියදම් දැරූ පදනමක් මතය. ගුවන්යානා වල විශාල නඩත්තු කිරීම්, ගුවන්යානා එන්ජින් සහ ගොඩබැසුම් උපකරණවලට කෙරෙන පිරිවැඩියා කිරීම් 2.3.2 (ආ)(iv) වන සටහනෙහි සඳහන් කර ඇති පරිදි ගිණුම්ගත කර ඇත. "පැය ගණනට අනුව බලශක්තිය" තෙවන පාර්ශව නඩත්තු ගිවිසුම් මඟින් ආවරණය කල එන්ජින් පිරිවැඩියා පිරිවැයන් සඳහා අදාළ ගිවිසුම් කාලසීමාව මුළුල්ලේ පැය ගණනට අනුව ගණනය කර එකඟත්වයට පත් ස්ථිර මිල ප්‍රමාණයක් අනුව පිරිවැය ලාභ හෝ අලාභ ප්‍රකාශනයට ලියා හරියි.

### 2.4.16 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

#### *(අ) නිර්වචනිත ප්‍රතිලාභ සැලසුම*

පාර්තෝෂිකය, අදාළ අණපනත් ප්‍රකාරව සමාගම සහ පර්පාලිත සමාගම විසින් ගෙවිය යුතු නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මකි. අදාළ නීතීන් යටතේ ඇස්තමේන්තු කරනු ලබන විද්දේශීය මධ්‍යස්ථාන සඳහා හැර නිර්ණය කරන ලද ප්‍රතිලාභ සැලසුම්වල වර්තමාන අගය සෑම වසරකම ආයුගණකවරයකුගේ උපදෙස් සහිතව අනුමානකල ඒකක ණය ක්‍රමය යොදාගනිමින් සමූහය විසින් ගණනය කරනු ලබයි.

සමූහය විසින් නිර්වචනිත ප්‍රතිලාභ සැලසුම් වලින් ඇතිවන ආයුගණක ලාභ/අලාභ වෙනත් විස්තීර්ණ ආදායම තුළ හඳුනාගන්නා අතර නිර්ණය කරන ලද ප්‍රතිලාභ සැලසුම් වලට අදාළ වියදම් ලාභ හෝ අලාභ ප්‍රකාශනය තුළ හඳුනාගනී.

පාර්තෝෂික වගකීම් බාහිර වත්කම් වල ආයෝජනය කර නොමැත. මෙම අයිතම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි වෙනත් දිගුකාලීන වගකීම් යටතේ වර්ග කර ඇත. එතෙර ස්ථානගතව රැකියාවේ නිරත සේවක සේවිකාවන් ආවරණය වනුයේ ඔවුන් පදිංචි සත්කාරක රටවලට අදාළ සමාජ ආරක්ෂණ යෝජනාක්‍රම යටතේය.

#### *(ආ) නිර්වචනිත දායකත්ව සැලැසුම් - සේවක අර්ථසාදක අරමුදල සහ සේවා නියුක්තිභාර අරමුදල*

ශ්‍රී ලංකාව තුළ සේවයේ නියුතු සේවා නියුක්තිකයන් අදාළ අණපනත් හා රෙගුලාසි ප්‍රකාරව සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වයන්ට සහ සේවා නියුක්තිභාර අරමුදලේ දායකත්වයන්ට සුදුසුකම් ලබා සිටී. සේවක දළ පාරිශ්‍රමික ප්‍රමාණයෙන් 15% ක් හා 3% ක ප්‍රමාණයක් පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිභාර අරමුදලට සමාගම විසින්ද 12% ක් හා 3% ක් වූ ප්‍රමාණය පර්පාලිත සමාගම විසින්ද දායක කරනු ලැබේ.

### 2.4.17 "Frequent Flyer" වැඩසටහන

'FlySmiLes' යනුවෙන් හඳුන්වනු ලබන නිරන්තර පියාසර වැඩසටහනක් සමාගම විසින් ක්‍රියාත්මක කරනු ලබන අතර එමගින් වැඩසටහනේ සාමාජිකයින්ට සමුච්චිත සැතපුම් ප්‍රමාණය පදනම් කරගනිමින් සංචාරක සම්මාන ප්‍රදානය කරයි. මෙම 'FlySmiLes' වැඩසටහනේ ප්‍රතිලාභවලට අදාළ මගී ආදායමෙන් කොටසක් ඒවා උපයෝජනයට ගනු ලබන තෙක් විලම්භනය කර තැබේ. ආදායම් කල් දැමීම ඇස්තමේන්තු කරනුයේ නිදහස් කරගැනීමේ ඓතිහාසික ප්‍රවනතාවය මත පිහිටා වන අතර එය එකී ප්‍රතිලාභවලට අදාළ අපේක්ෂිත උපයෝජනය පුරෝකතනය කිරීම පිණිස යොදා ගෙන ඇත. ප්‍රදානය කරනු ලබන බැරෙහි සාධාරණ වටිනාකම ඇස්තමේන්තු කෙරෙනුයේ ප්‍රදානය කරනු ලබන බැර නිදහස් කරගත හැකි සේවාවල බර තැබූ සාමාන්‍ය අගය සලකමිනි. මෙම ඇස්තමේන්තු එක් එක් වාර්තා කරන දිනට සමාලෝචනය කරනු ලබන අතර අදාළ වගකීම් ඒ අනුව ගලපනු ලැබේ. වැඩසටහන් හවුල්කරුවන්ගේ සේවා භාවිතය හරහා උපචිත වන්නා වූ සහ සහභාගී හවුල්කරුවන් විසින් ගෙවනු ලබන්නා වූ සැතපුම් ප්‍රමාණද ඒවා භාවිතා කරන තෙක් විලම්භිත ආදායම ලෙස ගණනය කරයි. කල් ඉකුත්වීම අපේක්ෂිත සැතපුම් ප්‍රමාණ සඳහා වූ වගකීම හඳුනා නොගැනේ.

### 2.4.18 ආදායම් හඳුනාගැනීම

ගනුදෙනුකරුවන් සමඟ ගිවිසුම් වලින් ලැබෙන ආදායම, සමූහය විසින් පියවර පහක ආකෘතියක් පදනම් කරගනිමින් හඳුනාගනී.

ආදායම හඳුනාගනු ලබන්නේ, භාණ්ඩ හෝ සේවාවක් පාරිභෝගිකයෙක් වෙත මාරු කිරීම සඳහා යම් ආයතනයක් හිමිකම් ලැබීමට අපේක්ෂා කරන ප්‍රතිශ්ඨාව පිළිබිඹු වන වටිනාකම අනුවය.

#### *(අ) ගුවන් සේවාවේ ආදායම*

ප්‍රධාන වශයෙන් ආදායම ජනනය කරනුයේ මගී ප්‍රවාහනය, ගුවන් බඩු, අතිරික්ත ගමන් මළු හා තැපැල් ප්‍රවාහන, ගුවන්තොටුපල පර්යන්ත සේවා සැපයීම, ඉංජිනේරු සේවා සැපයීම, ගුවන්යානා කුලී පදනම මත සැපයීම හා ආශ්‍රිත සේවා යනාදියෙනි.

(i) ගුවන් මගී, ගුවන් බඩු හා අතිරික්ත ගමන් මළු විකුණුම් සහ අනෙකුත් අදාළ ගාස්තු හඳුනාගැනෙනුයේ ප්‍රවාහනය/පහසුකම් සපයාදෙන අවස්ථාවේදී ජනිත වන මෙහෙයුම් ආදායම වශයෙනි.

(ii) භාවිතයට නොගත් ගුවන් ප්‍රවේශ පත්‍ර හා ගුවන් මාර්ග බිල්පත්වල අගය ප්‍රවාහන පූර්ව විකුණුම් ලෙස ජංගම වගකීම් වල ඇතුලත් කෙරේ. භාවිතයට නොගත් ගුවන් ප්‍රවේශ පත්‍ර හා ගුවන් මාර්ග බිල්පත් එක් වසරකට පසුව කල් ඉකුත් වී සහ භාවිතයට නොගෙන පවතින්නේ නම් ආදායම වශයෙන් හඳුනාගැනේ.

(iii) ගුවන්තොටුපළ පර්යන්ත සේවා මත ආදායම හඳුනාගැනෙනුයේ අදාල සේවා සැපයීමෙන් පසුවය.

(iv) තෙවන පාර්ශව නඩත්තු සේවා මත ආදායම හඳුනාගැනෙනුයේ එකී කටයුතු නිමවීමෙන් අනතුරුවය.

(v) ගුවන් ගමන් මෙහෙයුම් සේවා මත උපයන ආදායම හඳුනාගැනෙනුයේ අදාල සේවා සැපයීමෙන් පසුවය.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් සබැඳේ.

***(ආ) ගුවන් සේවා ආහාරපාන සේවා වලින් ආදායම***

**භාණ්ඩ විකිණීම**

හිමිකාරිත්වයට අදාළ සැලකිය යුතු අවදානම් හා ප්‍රතිලාභ ගැණුම්කරු වෙත පැවරෙන විට ආදායම හඳුනාගැනේ. අගය එකතු කල විකුණුම් බදු ආදායමට අන්තර්ගත නොවන අතර ආදායම වෙළෙඳ වට්ටම් අඩු කිරීමෙන් පසු අගයට තීරණය වේ. හිඟ මුදල් ආපසු අයකර ගැනීම සම්බන්ධයෙන්, අදාළ වියදම් හෝ සිදුවිය හැකි භාණ්ඩ හැරවුම් සහ භාණ්ඩ පිළිබඳ අඛණ්ඩ කළමණාකරන සම්බන්ධයෙන් සැලකිය යුතු අවිනිශ්චිතතාවයක් ඇත්නම් ආදායම් කිසිවක් හඳුනා නොගැනේ.

***(ඇ) ලාභාංශ ආදායම***

කොටස් හිමියන්ට අදාළ ගෙවීම් ලැබීමට ඇති අයිතිය තහවුරු කරනු ලැබූ විට ලාභාංශ ආදායම ගිණුම්ගත කෙරේ.

***(ඈ) කුළී ආදායම***

කුළී ආදායම හඳුනා ගනු ලබන්නේ උපචිත පදනම මතය.

***(ඉ) පොළී ආදායම***

ක්‍රමක්ෂය පිරිවැයට මිනුම් කළ සියළුම මූල්‍ය උපකරණ සඳහා, පොළී ආදායම හෝ වියදම වාර්තා කරනුයේ සඵල පොළි අනුපාතය යොදා ගනිමිනි.

***(ඊ) වෙනත් ආදායම්***

වෙනත් ආදායම් හඳුනා ගනු ලබන්නේ උපචිත පදනම මතය.

**2.4.19 වියදම් හඳුනාගැනීම**

නිශ්චිත ආදායම් අයිතම වල ඉපැයුම් සහ දරන ලද පිරිවැය අතර පවත්නා සෘජු සම්බන්ධතාවක පදනම මත ලාභ හෝ අලාභ පිළිබඳ ප්‍රකාශනය තුළ වියදම් හඳුනාගනු ලැබේ. ව්‍යාපාරය පවත්වාගැනීම යාම සහ දේපළ, පිරියත හා උපකරන කාර්යක්ෂම මට්ටමකින් පවත්වාගැනීම සඳහා දරන ලද සියළුම වියදම් ලාභ හෝ අලාභ පිළිබඳ ප්‍රකාශනයට අය කරයි. ලාභ හෝ අලාභ පිළිබඳ ප්‍රකාශනය ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා " වියදම් වල ස්වභාවය" නැමැති ක්‍රමය අනුගමනය කර ඇති අතර එය අනුගමනය කර ඇත්තේ සමූහයේ කාර්යය සාධනය පිළිබඳව අංග සාධාරණ අයුරින් ඉදිරිපත් කිරීමේ පදනම මතය.

**2.4.20 ණය ගැනුම් පිරිවැය**

අපේක්ෂිත භාවිතයට හා විකිණීම සඳහා සැලකිය යුතු කාලසීමාවක් වැයවන කිසියම් වත්කමක් අත්කර ගැනීමක්, ඉදිකිරීමක් හෝ නිපදවීමක් සඳහා සෘජුවම වෙන්කළ හැකි ණය ලබාගැනීමේ පිරිවැය සහ වත්කමේ කොටසක් ලෙස ප්‍රාග්ධනීකරණය කරනු ලබන ඒවා හැර අනෙක් ණය ගැනුම් පිරිවැය ඒවා දරන ලබන කාලසීමාව තුළ වියදමක් ලෙස හඳුනාගැනේ.

**2.4.21 ආංශික වාර්තාකරණය**

ඛණ්ඩයක් යනු සමූහය සම්බන්ධයෙන් හඳුනාග නු ලැබිය හැකි වික්තරා අංශයක් වන අතර අනෙකුත් අංශවලට වඩා වෙනස් ස්වරූපයක් ගත් අවදානම් හා ප්‍රතිලාභ වලට යටත් විශේෂිත ආර්ථික පරිසරයක් තුළ සේවා සැපයීමේ නිරත වේ.

සමාගමේ අවදානම හා ප්‍රතිලාභ අනුපාතය කෙරෙහි සමාගම විවිධ රටවල් තුළ ස්වකීය ක්‍රියාකාරකම් ඉටුකිරීම යන සාධකය බලපෑම් ඇතිකරන බැවින් එකී මෙහෙයුම් කටයුතු වල භූගෝලීය පැතිරයාම මත පදනම්ව අදාළ මූලික අංශයන් තීරණය කරනු ලැබේ. විකුණුම් මඟින් සැකසෙන පිරිවැටුමෙහි විශ්ලේෂණය ලබා ගැනෙනුයේ විකුණුම් සිදුකළ කලාපය වෙත ආදායම වෙන්කිරීම මඟිනි. කිසියම් විශේෂ ඛණ්ඩයකට සෘජුවම හඳුනාගත නොහැකි වියදම් වෙන්කර දැක්වීමක් හෝ හෙළිදරව් කිරීමක් සිදු නොවේ.

භූගෝලීය අංශ වෙත වත්කම් හා අදාළ වගකීම් වෙන්කිරීම සඳහා කිසිදු සුදුසු පදනමක් නොපවතින බවට කළමණාකරණය අදහස් කරයි. ඒ අනුව ඛණ්ඩමය වත්කම්, ඛණ්ඩමය වගකීම් සහ ගෝලීය ඛණ්ඩ ආශ්‍රිත තොරතුරු යනාදිය සම්බන්ධයෙන් හෙළිදරව් නොකෙරේ.

ව්‍යාපාරික ඛණ්ඩය අනුව ද්විතීයික වාර්තාකරණය පදනම් වනුයේ සමූහය විසින් සලසනු ලබන සේවාවන්හි ස්වභාවය මතය. සමූහය ප්‍රධාන ව්‍යාපාර අංශ දෙකක නිරතව අතර ඒවා නම් ගුවන් ප්‍රවාහන කටයුතු වල සහ සිය පර්පාලිත සමාගම ඔස්සේ ගුවන්යානස්ථ ආහාරපාන සේවා සැපයීමේ කටයුතු වලයි.

***2.5 නිකුත් කළ නමුත් මේ දක්වා ක්‍රියාත්මක නොවන ගිණුම්කරන ප්‍රමිති.***

වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය මගින් 2020 ජනවාරි 01 දිනෙන් ඇරඹී අනාගත මූල්‍යමය කාලපරිච්ඡේදයන් සඳහා අදාළ බවට පත්වන පහත දැක්වෙන නව ගිණුම්කරන ප්‍රමිතීන් (SLFRS/LKAS) නිකුත් කරනු ලැබ ඇත. ඒ අනුව, මෙම නව ප්‍රමිතීන් මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී යොදා නොමැත.

පහත දැක්වෙන සංශෝධිත ප්‍රමිතීන් සමූහයේ මූල්‍ය ප්‍රකාශයන් වෙත සැළකිය යුතු බලපෑමක් සිදු කරනු ලබන බවට අපේක්ෂා නොකෙරේ.

- ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්හි සංකල්පීය ආකෘතිය වෙත විමර්ශන සඳහා සංශෝධන
- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති LKAS 1 - ''මූල්‍ය ප්‍රකාශයන් ඉදිරිපත් කිරීම'' සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති LKAS 8 - ''ගිණුම්කරණ ප්‍රමිතීන්, ගිණුම්කරණ ඇස්තමේන්තු වල වෙනස්වීම් සහ දෝෂ'' වෙත සංශෝධන
- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති SLFRS 3 - ''ව්‍යාපාර සංයෝජන'' වෙත සංශෝධන
- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති SLFRS 9, LKAS 39,SLFRS 7 - '' පොලී අනුපාත කඩඉම් ප්‍රතිසංස්කරණ'' වෙත සංශෝධන

## 3. අඛණ්ඩ පැවැත්ම

ප්‍රවර්තන වර්ෂය තුළ සමාගම රු. මිලියන 47,197.86 ක (2019 - රු. මිලියන 44,022.67) අලාභයක් සමඟ 2020 මාර්තු 31 වන විට රු. මිලියන 326,341.48 (2019 - රු. මිලියන 230,590.07) ක සමුච්චිත අලාභයක් වාර්තා කළේය. තවද, සමාගමේ වර්තමාන වගකීම් රු. මිලියන 211,645.13 (2019 - රු. මිලියන 186,329.26) කින් එහි වර්තමාන වත්කම් ඉක්මවා ඇති අතර වාර්තා කරන දිනය වන විට සමාගමේ මුළු හිමිකම් සෘණාත්මක රු. මිලියන 273,369.08 (2019 - සෘණාත්මක රු. මිලියන 177,556.23) දක්වා පහත වැටී ඇත.

2020 මාර්තු 31 වන විට සමූහය රු. මිලියන 44,139.40 (2019 - රු. මිලියන 41,700.33) ක අලාභයක් සමග රු. මිලියන 316,477.65 ක (2019 - රු. මිලියන 223,488.73) සමුච්චිත අලාභයක් වාර්තා කළේය. තවද, සමූහයේ වර්තමාන වගකීම් රු. මිලියන 200,878.32 (2019 - රු. මිලියන 177,725.40) කින් එහි වර්තමාන වත්කම් ඉක්මවා ඇති අතර වාර්තා කරන දිනය වන විට සමාගමේ මුළු හිමිකම් සෘණාත්මක රු. මිලියන 261,173.54 (2019 - සෘණාත්මක රු. මිලියන 168,111.70) දක්වා පහත වැටී ඇත.

| | වත්කම් 2020 රු. මිලියන | වත්කම් 2019 රු. මිලියන | වගකීම් 2020 රු. මිලියන | වගකීම් 2019 රු. මිලියන | ශුද්ධ වත්කම්/(වගකීම්) 2020 රු. මිලියන | ශුද්ධ වත්කම්/(වගකීම්) 2019 රු. මිලියන |
|---|---|---|---|---|---|---|
| දේපළ පිරියත සහ උපකරණ | - | - | (697.98) | (616.61) | (697.98) | (616.61) |
| ඉඩම ප්‍රත්‍යාගණනය - කොළඹ | - | - | (171.67) | (171.67) | (171.67) | (171.67) |
| ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය | - | - | (700.76) | (700.76) | (700.76) | (700.76) |
| භාවිත හිමිකම් (ROU) වත්කම් | 15,874.83 | - | - | - | 15,874.83 | - |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම | 1,628.42 | 1,489.35 | - | - | 1,628.42 | 1,489.35 |
| මන්දගාමීව චලනය වන තොග සඳහා වෙන් කිරීම | 673.45 | 657.18 | - | - | 673.45 | 657.18 |
| ලැබිය යුතු දෑ හානිකරණය සඳහා වෙන් කිරීම | 436.27 | 443.85 | - | - | 436.27 | 443.85 |
| ගුවන්යානා නඩත්තු හා අළුත්වැඩියා පිරිවැය සඳහා වෙන් කිරීම | 9,527.39 | 10,460.71 | - | - | 9,527.39 | 10,460.71 |
| | 28,140.36 | 13,051.09 | (1,570.41) | (1,489.04) | 26,569.95 | 11,562.05 |

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් සබැඳේ.

### 26.2 විලම්බිත බදු (සබැඳේ)

වසර තුළදී විලම්බිත බදු සංචලනය

| | 2018 මාර්තු 31 දිනට ශේෂය රු. මිලියන | වසර තුළදී සංචලනය රු. මිලියන | 2019 මාර්තු 31 දිනට ශේෂය රු. මිලියන | වසර තුළදී සංචලනය රු. මිලියන | 2020 මාර්තු 31 දිනට ශේෂය රු. මිලියන |
|---|---|---|---|---|---|
| දේපළ පිරියත සහ උපකරණ | (1,029.53) | 412.92 | (616.61) | (81.37) | **(697.98)** |
| ඉඩම ප්‍රත්‍යාගණනය - කොළඹ | (171.67) | - | (171.67) | - | **(171.67)** |
| ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය | (700.76) | - | (700.76) | - | **(700.76)** |
| භාවිත හිමිකම් (ROU) වත්කම් | - | - | - | 15,874.83 | **15,874.83** |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම | 1,457.50 | 31.85 | 1,489.35 | 139.07 | **1,628.42** |
| මන්දගාමීව චලනය වන තොග සඳහා වෙන් කිරීම | 609.68 | 47.50 | 657.18 | 16.27 | **673.45** |
| ලැබිය යුතු දෑ හානිකරණය සඳහා වෙන් කිරීම | 307.65 | 136.20 | 443.85 | - | **436.27** |
| ගුවන්යානා නඩත්තු හා අළුත්වැඩියා පිරිවැය සඳහා වෙන් කිරීම | 7,559.28 | 2,901.43 | 10,460.71 | (933.32) | **9,527.39** |
| | 8,032.15 | 3,529.90 | 11,562.05 | 15,015.48 | **26,569.95** |

**සමාගම**

වාර්තාකරණ දින වන විට ක්‍රියාත්මක බදු නීතිරීති වලට අනුව ආපසු හැරවීමේදී, තාවකාලික වෙනස්වීම් වලට යෙදීමට අපේක්ෂිත බදු අනුපාතය වනුයේ භාවිත කරන ලද බදු අනුපාතය වන 28% වේ. අනාවැකි පල කල හැකි අන්දමේ අනාගත කාලයක් තුළ පවතින විලම්බිත බදු වත්කම් භාවිත කිරීම සඳහා අනාගත බදු වලට යටත් වන ලාභ ප්‍රමාණවත් නොවිය හැකි බැවින්, 2020 මාර්තු 31 දිනට ඒ අයුරින් හඳුනාගත් රුපියල් මිලියන 26,569.95 ක වටිනාකමින් යුතු විලම්බිත බදු වත්කම මූල්‍ය ප්‍රකාශයන්හි හඳුනානොගැනිනි.

වසර සඳහා ඉදිරියට ගෙන ආ බදු අලාභය මත ගණනය නොකෙරුනු විලම්බිත බදු වගකීම රුපියල් මිලියන 51,460.96 වේ.

**පාර්පාලිතය**

විලම්බිත බදු වගකීම ගණනය කරනු ලබන්නේ 15% සහ 28% වන එක් එක් කාණ්ඩයට අදාළ වන බදු අනුපාත මත පදනම්වය.

## 27. බැඳීම් සහ අසම්භාව්‍යයන්

### 27.1 ප්‍රාග්ධන වියදම් බැඳීම

සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලදී අනුෂාංගික කරුණක් වන දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කරගැනීම කෙරෙහි සමූහයෙහි සහ සමාගමෙහි වන වගකීම පහත දැක්වෙන ආකාරයෙන් විය:

| | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|
| | 2020 රු. මිලියන | 2019 රු. මිලියන | 2020 රු. මිලියන | 2019 රු. මිලියන |
| අනුමත කළ සහ ගිවිසුම්ගත නමුත් ප්‍රතිපාදනය නොකළ | | | | |
| ස්පෘශ්‍ය* | **206,952.68** | 189,464.21 | **206,925.08** | 189,460.18 |
| අස්පෘශ්‍ය | **10.12** | 4.56 | **10.12** | 4.56 |
| | **206,962.80** | 189,468.77 | **206,935.20** | 189,464.74 |
| අනුමත කළ නමුත් ගිවිසුම්ගත නොවූ | | | | |
| ස්පෘශ්‍ය | **745.68** | 484.49 | **745.68** | 484.49 |
| අස්පෘශ්‍ය | **161.88** | 2.29 | **161.88** | 2.29 |
| | **907.56** | 486.78 | **907.56** | 486.78 |
| | **207,870.36** | 189,955.55 | **207,842.76** | 189,951.52 |

* 2020 මාර්තු 31 දින වන විට A 350 – 900 ගුවන්යානා හතරක් මිළදී ගැනීම සඳහා කවර හෝ අමතර විශේෂාංගයක් හෝ ණය හැර ලැයිස්තුගත මිළ නියෝජනය කළ රුපියල් මිලියන 204,224.80 (ඇ.ඩො. මිලියන 1,076) (2019 - රුපියල් මිලියන 189,422.46 (ඇ.ඩො. මිලියන 1,076) ප්‍රාග්ධන වගකීම යටතේ සැළකිල්ලට ගන්නා ලදී . මේ සම්බන්ධව වැඩිදුර තොරතුරු සඳහා සටහන 6 බලන්න.

## 27. බැඳීම් සහ අසම්භාවයයන් (සබැඳේ)

### 27.2 අසම්භාවයයන්

**සමාගම**
අසම්භාව්‍ය වගකීම් 2020 මාර්තු 31 දිනට සිදුකරන ලද රුපියල් මිලියන 6328.10 (2019: රුපියල් මිලියන 16,444.50) ක හිමිකම්පෑම් මත පදනම් වේ. අසම්භාව්‍ය වගකීම් ගුවන්යානා කල්බදු ගිවිසුම් අවලංගු වීම හේතුවෙන් ගුවන්යානා කොටස් සැපයුම්කරුවන් කිහිපදෙනෙකු විසින් සිදුකරන ලද රුපියල් මිලියන 2,299.90 (ඇ.ඩො. මිලියන 11.11 සහ යුරෝ මිලියන 0.91) හිමිකම්පෑම විදේශ බදු අධිකාරියක විසින් නියම කරන ලද රුපියල් මිලියන 477.87 ක දඩ මුදල, ගිවිසුම අත්හිටුවීම හේතුවෙන් සැපයුම්කරුවකු විසින් සිදුකරන ලද රුපියල් මිලියන 1,563.29 (ඇ.ඩො. මිලියන 8.24) හිමිකම්පෑම සහ විදේශ බදු අධිකාරියක් සමග සේවා බදු අර්බුදයක් හේතුවෙන් නියම කරන ලද රුපියල් මිලියන 1,532.43 ක බදු මුදල සහ රුපියල් මිලියන 239.15 ක සේවකයින් ආශ්‍රිත හිමිකම්පෑම් වලින් සමන්විත වේ.

සමාගමෙහි ව්‍යාපාරික කටයුතු සිදුකෙරෙන අතරතුර සමාගමට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගනුදෙනුකරුවන් සැපයුම්කරුවන් හෝ සේවකයින් විසින් වෙනත් හිමිකම්පෑම් හෝ අනාගත හිමිකම්පෑම් සිදුකිරීම හේතුවෙන් කවර හෝ අසම්භාව්‍ය වගකිමක් ආශ්‍රිත කිසිදු සැළකිය යුතු වගකීමක් උද්ගත වේ. යැයි අධ්‍යක්ෂවරුන් විසින් අපේක්ෂා නොකෙරෙන බැවින් මෙම මූල්‍ය ප්‍රකාශයන්හි කිසිදු ප්‍රතිපාදනයක් සිදුකොට නොමැත.

**පරිපාලිතය**
සමාගමෙහි නීතිඥවරුන්ගේ මතය අනුව සමාගමෙහි අනාගත මෙහෙයුම් වල වාර්තාකරන ලද ප්‍රතිඵලයන් කෙරෙහි බලපෑමක් ඇති කරන්නා වූ පහත දැක්වෙන නඩු කටයුත්ත හැරුණුවිට සමාගමට එරෙහිව කිසිදු අසම්පූර්ණ නඩු කටයුත්තක් නොමැත.

සිමාසහිත ශ්‍රීලංකන් කේටරින් ට එරෙහිව කේ ඩී එල් ජේ කමල්පෙම් කම්කරු උසාවි නඩුව (නඩු අංක: 21/337/2015) විභාග වෙමින් පවතී. තවද වාර්තා කරනු ලබන දින වන විට සමාගම මගින් අභියාචනා ඉදිරිපත් කරන ලද නඩු කටයුතු 4 ක් පවතී අදාළ අභියාචනා ඉදිරිපත් කරන ලද නඩු කටයුතු වෙනුවෙන් රුපියල් මිලියන 5.2 ක් තැන්පත් කරනු ලැබ ඇත.

## 28. ඇපයට තබන ලද වත්කම්

**සමාගම/සමූහය**
ලබාගත් පහසුකම් වෙනුවෙන් ඇපයට තබන ලද වත්කම් පිළිබඳ විස්තර සඳහා සටහන 16.2 බලන්න.

## 29. වාර්තාකරණ දිනයෙන් පසු සිදුවූ සිදුවීම්

### 29.1 සමාගම

- භාණ්ඩාගාර ඇපකර ලබාදීමේ කැබිනට් අනුමැතිය මත රාජ්‍ය බැංකු දෙක විසින් කාර්ය ප්‍රාග්ධනය සඳහා ඇ.ඩො. මිලියන 75 ක නව පහසුකමක් අනුමත කරනු ලැබ ඇති අතර මෙම මූල්‍ය ප්‍රකාශ අත්සන් තබන දිනය වන විට එයින් ඇ.ඩො. මිලියන 28.10 භාවිත කරනු ලැබ ඇත.
- 2018 අප්‍රියෙල් 1 දින සිය අතීතයට බලපාන පරිදි සියළුම විදේශ ගෙවීම් රඳවාගැනීමේ බද්දෙන් නිදහස් කරමින් සමාගම වෙත කැබිනට් අනුමැතිය හිමි විය (සටහන 23.1 බලන්න).

**පරිපාලිතය**
මූල්‍ය ප්‍රකාශයන් තුළ ගැළපුම් හෝ හෙළිදරව් කිරීම අවශ්‍ය වන ආකාරයේ කිසිදු සිදුවීමක් වාර්තාකරණ දිනට පසු සිදු වී නොමැත.

## 30. සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව් කිරීම්

### 30.1 සමූහය සහ සමාගම

#### 30.1.1 ප්‍රමුඛ කළමනාකරණ වෘත්තිකයින් සමග ගනුදෙනු
සම්බන්ධිත පාර්ශ්වයන් අතරට සමාගමෙහි සහ එහි පරිපාලිතයෙහි ක්‍රියාකාරකම් සැලසුම්කරණය නියම කිරීම සහ මෙහෙයවීමේ අධිකාරීත්වය හා වගකීම සහිත පුද්ගලයින් වශයෙන් නිර්වචනය කෙරෙන ප්‍රමුඛ කළමනාකරණ වෘත්තිකයින් ඇතුළත් වේ. එවැනි වෘත්තිකයින් අතරට සමූහයේ අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රධාන විධායක නිලධාරී සහ ඉහත දක්වන ලද ක්‍රියාපටිපාටිය සපුරාලනු ලබන ජ්‍යෙෂ්ට කළමනාකරණ විධායක නිලධාරීන් ඇතුළත් වේ.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් සබැඳේ.

## 30. සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව් කිරීම් (සබැඳේ)

### 30.1.1 ප්‍රමුඛ කළමනාකරණ වෘතිකයින් සමඟ ගනුදෙනු (KMP) (සබැඳේ)

සමාගම සහ සම්බන්ධිත පාර්ශ්වයක් (සමාගමෙහි සම්බන්ධිතයන් අධ්‍යක්ෂවරුන් සේවකයින් හෝ සමාගම පිළිබඳ උන්නදු සහගත ඔවුන්ගේ සමීප පවුලේ සාමාජිකයින් අතර කවර හෝ ගනුදෙනුවක් වෙතොත් එය හෙළිදරව් කළ යුතුය යන සමූහයෙහි/සමාගමෙහි ප්‍රතිපත්තියට අනුකූලව ප්‍රමුඛ කළමනාකරණ වෘත්තිකයනී විසින් සිදුකරන ලද පහත දැක්වෙන ප්‍රකාශයන් සළකා බලන ලදී.

(අ) වාර්තාකරණ කාලපරිච්ඡේදය තුළදී ප්‍රමුඛ කළමනාකරණ වෘත්තිකයින් විසින් ව්‍යාපාරයෙහි සාමාන්‍ය ක්‍රියාකාරකම් වලදී සිදුකරන ලද කැපී පෙනෙන ගනුදෙනු පහත දැක්වේ;

| | 2020<br>රු. මිලියන | 2019<br>රු. මිලියන |
|---|---|---|
| කෙටි කාලීන ප්‍රතිලාභ | 361.88 | 276.33 |
| පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ | 53.81 | 41.84 |
| සේවය අවසන් කිරීමේ ප්‍රතිලාභ | 4.30 | 16.35 |

ඉහත දැක්වෙන කෙටි කාලීන ප්‍රතිලාභ අතරට රුපියල් මිලියන 3.49 ක වටිනාකමින් යුතු ගෙවන ලද අධ්‍යක්ෂ ගාස්තු ඇතුළත් වේ. එක් ඉහළ පන්තියකට මාරුකිරීමක් හැරුණුවිට වසර 2019/2020 තුළදී අධ්‍යක්ෂවරුන් වෙත කිසිදු වරප්‍රසාදයක් සහ වෙනත් ස්ථිර ගුවන් ටිකට්පත් ලබාදී නොමැත (2019 දී අධ්‍යක්ෂවරුන්ගේ ගාස්තුව රුපියල් මිලියන 0.85) ආසන පවතින පදනම මත ප්‍රමුඛ කළමනාකරණ වෘත්තිකයින් ඔවුන්ගේ කලත්‍රයින් සහ යැපෙන දරුවන් නොමිලේ ගුවන් ටිකට්පත් ලබාගැනීමේ සුදුසුකම් ලබති.

(ආ) ප්‍රමුඛ කළමනාකාරණ වෘත්තිකයින් වසර තුළදී සමූහ සමග වෙළඳ ගනුදෙනු සිදුකරන ලද වෙනත් සමාගම් වල ධූරයන් දරන අතර එම ගනුදෙනු පහත දැක්වෙන පරිදි හඳුනාගැනේ;

- සමූහයෙහි සභාපති අසෝක පතිරගේ මහතා පිළිවෙලින් සොෆ්ට්ලොජික් හෝල්ඩින්ග්ස් පීඑල්සී සහ පරිපාලිතයන්හි, ආසිරි හොස්පිට්ල් හෝල්ඩින්ග්ස් පීඑල්සී සහ එහි පරිපාලිතයන්හි සහ ඔඩෙල් පීඑල්සී සහ එහි පරිපාලිතයන්හි සභාපති/කළමනාකාර අධ්‍යක්ෂ/අධ්‍යක්ෂවරයකු වශයෙන් කටයුතු කරයි. වසර තුළදී සමූහය මගින් සොෆ්ට්ලොජික් හෝල්ඩින්ග්ස් පීඑල්සී සහ පරිපාලිතයන් සමග රුපියල් මිලියන 16.75 ක සහ ආසිරි හොස්පිට්ල් හෝල්ඩින්ග්ස් පීඑල්සී සමග රුපියල් මිලියන 5.05 ක වටිනාකමින් යුතු ගනුදෙනු සිදුකරනු ලැබ ඇත.
- සමාගමෙහි අධ්‍යක්ෂවරයකු වන මලික් ප්‍රනාන්දු මහතා එම්ජේඑෆ් ටීස් පුද්ගලික සමාගම සහ පරිපාලිතයන්හි අධ්‍යක්ෂවරයකු වශයෙන් සේවය කරයි. වසර තුළදී සමූහය මගින් එම්ජේඑෆ් ටීස් පුද්ගලික සමාගම සමග රුපියල් මිලියන 0.36 ක වටිනාකමින් යුතු ගනුදෙනු සිදුකරනු ලැබ ඇත.
- සමාගමෙහි අධ්‍යක්ෂවරයකු වන ආචාර්ය හාන්ස් විජේසූරිය ඩයලොග් ආසියාටා සමූහ සමාගමෙහිද අධ්‍යක්ෂ/කළමනාකාර අධ්‍යක්ෂ සහ ප්‍රධාන විධායක නිලධාරීවරයා වශයෙන් කටයුතු කරයි. වසර තුළදී සමාගම මගින් ඩයලොග් ආසියාටා පීඑල්සී ඩයලොග් බ්‍රෝඩ්බෑන්ඩ් නෙට්වර්ක් සමාගම සහ ඩයලොග් ටෙලිවිෂන් සමාගම සමග රුපියල් මිලියන 1.13 ක වටිනාකමින් යුතු ගනුදෙනු සිදුකරනු ලැබ ඇත.
- සමාගමෙහි අධ්‍යක්ෂවරයකු වන මොහොමඩ් අෂ්රොෆ් ඕමාර් මහතා බ්‍රැන්ඩික්ස් සමූහයෙහි සහ ෆීනික්ස් සමූහ සමාගමෙහිද අධ්‍යක්ෂවරයකු වශයෙන් සේවය කරයි. වසර තුළදී සමූහය මගින් ෆීනික්ස් සමාගම සමඟ රුපියල් මිලියන 0.14 ක වටිනාකමින් යුතු ගනුදෙනු සිදුකරනු ලැබ ඇත.

### *30.2 සමූහය*

සමාගමෙහි ප්‍රධාන කොටස් හිමිකරු වශයෙන් සමූහය සම්බන්ධ පාලන බලය ශ්‍රී ලංකා රජය සතු වේ.

සාමාන්‍ය ව්‍යාපාරික ක්‍රියාකාරකම් වලදී ශ්‍රී ලංකා රජය මගින් පාලනය කරනු ලබන ආයතනයන් සමග පහත දැක්වෙන සැළකිය යුතු ගනුදෙනු සිදු කෙරිණි.

| සමාගමෙහි නම | සබඳතාවය | ගනුදෙනු වල ස්වභාවය | ගනුදෙනු වටිනාකම 2020 රු. මිලියන | ගනුදෙනු වටිනාකම 2019 රු. මිලියන | ලැබිය යුතු/(ගෙවිය යුතු) ශේෂය 2020 රු. මිලියන | ලැබිය යුතු/(ගෙවිය යුතු) ශේෂය 2019 රු. මිලියන |
|---|---|---|---|---|---|---|
| ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාව | රජයට අයත් | ඉන්ධන | (30,362.20) | (34,033.36) | (51,437.52) | (26,826.20) |
| | | කල්තැබූ සේවා ගෙවීම් | - | - | (3,148.50) | (5,695.94) |
| | | හිඟ හිමි ගෙවීම් මත මූල්‍ය පිරිවැය | (2,174.30) | (1,007.55) | (2,332.04) | (551.50) |

| සමාගමෙහි නම | සබඳතාවය | ගනුදෙනු වල ස්වභාවය | ගනුදෙනු වටිනාකම 2020 රු. මිලියන | ගනුදෙනු වටිනාකම 2019 රු. මිලියන | ලැබිය යුතු/ (ගෙවිය යුතු) ශේෂය 2020 රු. මිලියන | ලැබිය යුතු/ (ගෙවිය යුතු) ශේෂය 2019 රු. මිලියන |
|---|---|---|---|---|---|---|
| ගුවන් තොටුපළ හා ගුවන් සේවා සමාගම | රජයට අයත් | ගොඩබෑම, ගාල් කිරීම, ගුවන් පාළම, විවේකාගාරය, කුලිය,අධිකාරිත්ව ගාස්තු සහ අපද්‍රව්‍ය බැහැරකිරීමේ ගාස්තු | (2,498.19) | (3,689.48) | (2,114.69) | (1,214.16) |
| සිවිල් ගුවන් සේවා අධිකාරිය | රජය මගින් පාලනය කෙරෙන | බලපත්‍ර, අවසර පත්‍ර සහ ගාස්තු | (10,593.35) | (11,771.42) | (943.68) | (0.01) |
| මිහින් ලංකා පුද්ගලික සමාගම | රජයට අයත් | ගබඩා කුලිය | 2.01 | 23.36 | 835.64 | 768.79 |
| ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | රජයට අයත් | රක්ෂණ සේවා | (365.36) | (511.38) | - | - |
| ලංකා බැංකුව | රජයට අයත් | ණය ආපසු ගෙවීම් | (125.29) | (117.32) | - | - |
| | | ලැබුනු ණය | - | 146.01 | - | - |
| | | ණය | - | - | (31,973.40) | (30,290.19) |
| | | කෙටි කාලීන තැන්පතු | - | - | 599.96 | 811.47 |
| | | පොලිය | (3,087.13) | (3,148.06) | - | - |
| | | බැංකු අයිරා | - | - | (11,681.41) | (9,132.24) |
| | | කුලිය | (0.66) | (1.99) | - | - |
| මහජන බැංකුව | රජයට අයත් | ලැබුනු ණය/පොලී ප්‍රාග්ධනීකරණය | - | 2,299.23 | - | - |
| | | ණය | - | - | (34,703.51) | (33,249.23) |
| | | පොලිය | (3,476.75) | (3,442.88) | - | - |
| සේවක අර්ථසාධක අරමුදල | කොටස් හිමිකරුවෙකි | වරණීය කොටස් ලාභාංශ | 130.10 | 130.10 | (64.87) | (64.87) |
| | | 13.01% ඡන්ද බලය රහිත ආපසු ලබාගත හැකි සමුච්චිත (වසර 5) වරණීය කොටස් | - | - | (1,000.00) | (1,000.00) |

වාර්තාකරණ දිනය වන විට සමූහය මගින් ලංකා බැංකුවෙන් රුපියල් මිලියන 2,079.18 (2019 - රුපියල් මිලියන 2,333.14) බැංකු ඇපකර පහසුකම් භාවිත කරනු ලැබ ඇත.

රජයේ පාලනය යටතේ පවතින ආයතනයන් වෙතින්/වෙත ශේෂයන් මූල්‍ය ප්‍රකාශශයන්හි වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ/ගෙවිය යුතු දෑ සහ පොලී දරන වගකීම් යටතේ දක්වා ඇත.

වාර්තාකරණ දින වන විට සම්බන්ධිත පාර්ශ්වයන් ආශ්‍රිත හානිකරණය සඳහා වෙන්කිරීම රුපියල් මිලියන 959.02 ක් (2019 - රුපියල් මිලියන 932.57) විය.

සියළුම රජය මගින් පාලනය කෙරෙන/ආශ්‍රිත ආයතනයන් සමග සිදුකරන ලද සියළු ගනුදෙනු හසුකරගැනීමේ සහ හෙළිදරව් කිරීමේ ප්‍රයෝගික ගැටළුව සහ ඒවායේ විශාලත්වය හේතුවෙන් ඒකලව සැළකිය යුතු ගනුදෙනු සඳහා LKAS 24 - 'සම්බන්ධිත පාර්ශ්වීය හෙළිදරව් කිරීම්' යටතේ සීමිත හෙළිදරව් කිරීම් සිදු කෙරිනි.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් සබැඳේ.

### 30. සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව් කිරීම් (සබැඳේ)

### 30.2 සමූහය (සබැඳේ)

වර්ෂය තුළ සමූහය සමඟ ගනුදෙනු කර ඇති වෙනත් රජය විසින් පාලන කරන/ ආශ්‍රිත ආයතන කිහිපයක් පහත දැක්වේ:

- ලංකා විදුලිබල මණ්ඩලය
- දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
- රාජ්‍ය ඖෂධ සංස්ථාව
- විදේශ කටයුතු අමාත්‍යාංශය
- ශ්‍රී ලංකා ගුවන් හමුදාව
- ශ්‍රී ලංකා හමුදාව
- ශ්‍රී ලංකා නාවික හමුදාව
- ශ්‍රී ලංකා තැපැල් අධිකාරිය
- ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය

සේවක විශ්‍රාම ප්‍රතිලාභ සඳහා වන දායක මුදල් සම්බන්ධ වැඩිදුර ගනුදෙනු සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවක භාර අරමුදල (ETF) වලට අදාළ ප්‍රතිපත්ති හා රෙගුලාසි වලට අනුකූලව සිදු කරනු ලැබේ.

සම්බන්ධිත පාර්ශවයන් සමඟ ගනුදෙනු සිදු වූයේ වාණිජමය කොන්දේසි යටතේය.

### *30.3 සමාගම*

පහත දැක්වෙන කරුණු ඇතුළුව සැලකිය යුතු ගනුදෙනු පරිපාලිතය සහ ශ්‍රී ලංකා රජය විසින් පාලනය කරනු ලබන උප සමාගම් සහ ආයතන සමඟ සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී සිදු කර ඇත.

| සමාගමේ නම | සම්බන්ධතාවය | ගනුදෙනු වල ස්වභාවය | ගනුදෙනුවේ වටිනාකම | | ලැබිය යුතු / (ගෙවිය යුතු) ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | | | 2020 රු. මිලියන | 2019 රු. මිලියන | 2020 රු. මිලියන | 2019 රු. මිලියන |
| ශ්‍රීලංකන් කේටරින් සමාගම | පරිපාලිතය | භාණ්ඩ ප්‍රවාහන සේවා | 16.85 | 25.48 | - | - |
| | | යානාස්ථ ආහාරපාන සැපයීම සහ වෙනත් සේවාවන් | (5,340.65) | (5,696.05) | (9,459.41) | (7,638.70) |
| | | ලාභාංශ | 1,701.25 | 3,280.18 | - | - |
| ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | රජයට අයත් | ඉන්ධන | (30,463.50) | (33,909.42) | (51,437.52) | (26,826.20) |
| | | විලම්බිත සැපයුම්කාර ගෙවීම් | - | - | (3,148.50) | (5,695.94) |
| | | ප්‍රමාද වූ මූල්‍ය පිරිවැය | (2,174.30) | (1,007.55) | (2,332.04) | (551.50) |
| එයාර්පෝට් ඇන්ඩ් ඒවියේශන් සර්විසස් පුද් සමාගම | රජයට අයත් | ගොඩබෑම්, නවතා තැබීම්, ගුවන් පාලම්, මගී විවේකාගාර කුලියට දීම, බලයලත් නියෝජිත ගාස්තු සහ කසළ නාශක ගාස්තු | (3,027.54) | (3,069.72) | (2,239.95) | (1,823.57) |
| සිවිල් ගුවන් සේවා අධිකාරිය | රජයයෙන් පාලනය වන | බලපත්‍ර, අවසර පත්‍ර සහ බදු | (10,593.35) | (11,771.42) | (943.68) | (0.01) |
| මිහින් ලංකා (පුද්) සමාගම | රජයට අයත් | ගබඩාව කුලියට දීම | 2.01 | 23.36 | 770.79 | 768.79 |
| ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | රජයට අයත් | රක්ෂණ සේවා | (365.36) | (511.38) | - | - |
| ලංකා බැංකුව | රජයට අයත් | ණය | - | - | (31,880.00) | (30,500.00) |
| | | කෙටිකාලීන තැන්පතු | - | - | 599.96 | 491.47 |
| | | පොලිය | (3,087.13) | (3,148.06) | - | - |
| | | බැංකු අයිරා | - | - | (11,681.41) | (9,132.24) |
| | | කුලිය | (0.66) | (1.99) | - | - |

| සමාගමේ නම | සම්බන්ධතාවය | ගනුදෙනු වල ස්වභාවය | ගනුදෙනුවේ වටිනාකම | | ලැබිය යුතු / (ගෙවිය යුතු) ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | | | 2020 රු. මිලියන | 2019 රු. මිලියන | 2020 රු. මිලියන | 2019 රු. මිලියන |
| මහජන බැංකුව | රජයට අයත් | ණය ලැබීම / පොලී ප්‍රාග්ධනීකරණය | - | 2,299.23 | - | - |
| | | ණය | - | - | (34,703.51) | (33,249.23) |
| | | පොළිය | (3,476.75) | (3,442.88) | - | - |

වාර්තා කිරීමේ දිනය වන විට සමූහය විසින් බැංකුවේ රු. මිලියන 2,059.64 ක (2019 - රු. මිලියන 2,313.60) බැංකු ඇපකර පහසුකම භාවිතා කර ඇත.

ශ්‍රී ලංකා රජය විසින් පාලනය කරනු ලබන ආයතනවල සිට / දක්වා ඇති ශේෂයන් වෙළඳ හා වෙනත් ලැබිය යුතු දේ / ගෙවිය යුතු මුදල් සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ පොලී දරණ වගකීම් යටතේ දැක්වේ.

වාර්තාකරණ දින වන විට සම්බන්ධිත පාර්ශ්වයන් ආශ්‍රිත හානිකරණය සඳහා වෙන්කිරීම රුපියල් මිලියන 894.16 ක් (2019 - රුපියල් මිලියන 872.12) විය.

සියළුම රජය මගින් පාලනය කෙරෙන/ආශ්‍රිත ආයතනයන් සමග සිදුකරන ලද සියළු ගනුදෙනු හසුකරගැනීමේ සහ හෙළිදරව් කිරීමේ ප්‍රයෝගික ගැටළුව සහ ඒවායේ විශාලත්වය හේතුවෙන් ඒකලව සැළකිය යුතු ගනුදෙනු සඳහා LKAS 24 - 'සම්බන්ධිත පාර්ශ්වීය හෙළදරව් කිරීම්' යටතේ සීමිත හෙළිදරව් කිරීම් සිදු කෙරිනි.

වර්ෂය තුළ සමූහය සමඟ ගනුදෙනු කර ඇති වෙනත් රජය විසින් පාලන කරන/ ආශ්‍රිත ආයතන කිහිපයක් පහත දැක්වේ:

- ලංකා විදුලිබල මණ්ඩලය
- දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
- රාජ්‍ය ඖෂධ සංස්ථාව
- විදේශ කටයුතු අමාත්‍යාංශය
- ශ්‍රී ලංකා ගුවන් හමුදාව
- ශ්‍රී ලංකා හමුදාව
- ශ්‍රී ලංකා නාවික හමුදාව
- ශ්‍රී ලංකා තැපැල් අධිකාරිය
- ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය

සේවක විශ්‍රාම ප්‍රතිලාභ සඳහා වන දායක මුදල් සම්බන්ධ වැඩිදුර ගනුදෙනු සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවක භාර අරමුදල (ETF) වලට අදාළ ප්‍රතිපත්ති හා රෙගුලාසි වලට අනුකූලව සිදු කරනු ලැබේ.

සම්බන්ධිත පාර්ශවයන් සමඟ ගනුදෙනු සිදු වූයේ වාණිජමය කොන්දේසි යටතේය.

## 31. මූල්‍ය අවදානම් කළමනාකරණ අරමුණු සහ ප්‍රතිපත්ති

සමූහයේ ප්‍රධාන මූල්‍ය වගකීම් සමන්විත වනුයේ ණය සහ ණය ගැනීම්, වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ සහ වෙනත් මූල්‍ය වගකීම් වලිනි. මෙම මූල්‍ය වගකීම්වල ප්‍රධාන අරමුණ වන්නේ සමූහයේ මෙහෙයුම් සඳහා මූල්‍ය සම්පාදනයයි. සමූහයේ මූල්‍ය වත්කම් වලින් සමන්විත වන්නේ වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ සහ එහි මෙහෙයුම් වලින් සෘජුව ලබාගත් මුදල් සහ කෙටිකාලීන තැන්පතු වලිනි.

සාංගමික කළමනාකරණය වරින් වර, පුළුල් අවදානම් කළමනාකරණ අනුකෘතිය විමර්ශනය කර යාවත්කාලීන කරන අතර සැලකිය යුතු බලපෑමක් ඇති පහත සඳහන් මූල්‍ය අවදානම් හඳුනාගෙන ඇත.

(i) වෙළඳපොළ අවදානම
- පොලී අනුපාත අවදානම
- විනිමය අවදානම

(ii) ද්‍රවශීලතා අවදානම

(iii) ණය අවදානම

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් සබැඳේ.

## 31. මූල්‍ය අවදානම් කළමනාකරණ අරමුණු සහ ප්‍රතිපත්ති (සබැඳේ).

වෙළඳපළවල වෙනස්වීම් සහ අනෙකුත් මූල්‍යමය අවදානම් සහිත ක්‍රියාකාරකම් වල වෙනස්කම් පිළිබිඹු වන පරිදි සමූහය සිය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි නිරන්තරයෙන් සමාලෝචනය කරනු ලබන අතර මේවා නියම ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටිවලට අනුකූලව අවදානම් හඳුනාගෙන මැනීම සහ කළමනාකරණය කිරීම සහතික කිරීම සඳහා සුදුසු ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි මගින් පාලනය වේ.

### (i) වෙළඳපොළ අවදානම

**පොලී අනුපාත අවදානම**

පොලී අනුපාත අවදානම යනු වෙළඳපළ පොලී අනුපාතවල වෙනස්වීම් හේතුවෙන් මූල්‍ය උපකරණයක අනාගත මුදල් ප්‍රවාහවල සාධාරණ වටිනාකම උච්චාවචනය වීමේ අවදානමයි. වෙළඳපළ පොලී අනුපාතවල වෙනස් වීමේ අවදානමට සමූහය නිරාවරණය වීම මූලික වශයෙන් පාවෙන පොලී අනුපාත සමඟ සමූහයේ දිගුකාලීන ණය බැඳීම් හා සම්බන්ධ වේ.

පොලී අනුපාත උච්චාවචනයන්හි බලපෑම අවම කිරීම සඳහා ගුවන් යානා කල්බදු ඇතුළු ස්ථාවර හා විචල්‍ය අනුපාත ණය ගැනීම් අතර ප්‍රශස්ත සමබරතාවයක් පවත්වා ගැනීම සමූහයේ ප්‍රතිපත්තියයි.

ණය සහ ණය ගැනීම් සඳහා පොලී අනුපාතවල සාධාරණ ලෙස වෙනස් විය හැකි සංවේදීතාව පහත වගුවේ ඉදිරිපත් කෙරේ. අනෙකුත් සියලුම විචල්‍යයන් නියතව පැවතුනහොත්, පහත සඳහන් පරිදි පාවෙන අනුපාත ණය ගැනීම් සඳහා වන බලපෑම මගින් බදු වලට පෙර සමූහ / සමාගම් අලාභයට බලපානු ඇත.

| | 2020 බදු වලට පෙර අලාභය මත බලපෑම | | 2019 බදු වලට පෙර අලාභය මත බලපෑම | |
|---|---|---|---|---|
| | සමූහය රු. මිලියන | සමාගම රු. මිලියන | සමූහය රු. මිලියන | සමාගම රු. මිලියන |
| පොලී අනුපාත ඉහළයාම/(පහළයාම) | | | | |
| +1% | 773.61 | 772.01 | 779.53 | 777.53 |
| -1% | (773.61) | (772.01) | (779.53) | (777.53) |

* පොලී අනුපාත ඉහළයාම අලාභ ඉහළයාම කෙරෙහි හේතු වේ.

**විදේශ විනිමය අනුපාත අවදානම**

විදේශ මුදල් අවදානම යනු විදේශ විනිමය අනුපාතවල වෙනස්වීම් හේතුවෙන් මූල්‍ය උපකරණයක අනාගත මුදල් ප්‍රවාහවල සාධාරණ වටිනාකම උච්චාවචනය වීමේ අවදානමයි. එහි විදේශ මුදල් ඒකක මගින් ආදායම, වියදම්, ණය ගැනීම් සහ වෙනත් මූල්‍ය උපකරණ නියම කර ඇති බැවින් සමූහය විදේශ විනිමය අනුපාතයේ උච්චාවචනයන්හි බලපෑමට නිරාවරණය වී ඇත.

සමූහය සිය විදේශ විනිමය නිරාවරණය කළමනාකරණය කරන්නේ හැකිතාක් දුරට ගැලපෙන ප්‍රතිපත්තියක්, අදාල මුදල් ඒකක වලින්ම රිසිට්පත් තැබීම සහ ගෙවීම මඟින් වන අතර හඳුනාගත් විදේශ මුදල් ණය ආරක්ෂා කර ගැනීම සඳහා එහි හෙජිං වලින් හඳුනාගෙන ඇති විදේශ මුදල් ණය, එහි ඉහළ සම්භාවිතාවට, විදේශ මුදල්වල අනාගත ආදායමට විශේෂයෙන් හඳුනාගෙන ඇත.

පහත දැක්වෙන වගුව මඟින් එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ රුපියලෙහි සාධාරණ ලෙස වෙනස් විය හැකි සංවේදීතාව පෙන්නුම් කරන අතර සෙසු සියලුම විචල්‍යයන් නියතව පවතී. (වාර්තා කරන දිනය වන විට මූල්‍ය තත්ත්වය ප්‍රකාශ කිරීමේදී වාර්තා වී ඇති හිඟ මුදල් වත්කම් සහ වගකීම්වල සාධාරණ අගයෙහි වෙනස්වීම් හේතුවෙන්). අනෙකුත් සියලුම මුදල් සඳහා සමූහය විදේශ මුදල් වෙනස්වීම් වලට නිරාවරණය වීම ප්‍රමාණාත්මක බලපෑමක් ඇති නොකරයි.

| | 2020 | | | | 2019 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | වෙනත් විස්තීර්ණ ආදායම මත බලපෑම | | බදු වලට පෙර ලාභය මත බලපෑම | | වෙනත් විස්තීර්ණ ආදායම මත බලපෑම | | බදු වලට පෙර ලාභය මත බලපෑම | |
| | සමූහය රු. මිලියන | සමාගම රු. මිලියන | සමූහය රු. මිලියන | සමාගම රු. මිලියන | සමූහය රු. මිලියන | සමාගම රු. මිලියන | සමූහය රු. මිලියන | සමාගම රු. මිලියන |
| රුපියලට සාපේක්ෂව ඇ.ඩො. අගය ඉහළයාම/(පහළයාම) | | | | | | | | |
| +3% | 273.54 | 273.54 | 8,439.40 | 8,791.32 | 553.93 | 553.93 | 2,701.83 | 2,726.15 |
| -3% | (273.54) | (273.54) | (8,439.40) | (8,791.32) | (553.93) | (553.93) | (2,701.83) | (2,726.15) |

* ඇමරිකන් ඩොලරයේ අගය ඉහළයාම අලාභයන් ඉහළයාම කෙරෙහි හේතු වේ.

### (ii) ද්‍රවශීලතා අවදානම

ද්‍රවශීලතා අවදානම යනු සමූහයට නියමිත හා වැටෙන විට එහි වර්තමාන හා අනාගත මුදල් බැඳීම් සපුරාලීමට නොහැකි වීමේ අවදානමයි. ද්‍රවශීලතා අවදානම යනු සමූහයට එහි වර්තමාන හා අනාගත මුදල් බැඳීම් ගෙවිය යුතු දිනය පසු වූ විට සපුරාලීමට නොහැකි වීමේ අවදානමයි. අවදානම අවම කිරීම සඳහා සමූහය දිගු කාලීන හා කෙටිකාලීන ණය, බැංකු අයිරා පහසුකම් සහ මූල්‍ය / මෙහෙයුම් කල්බදු ඇතුළු මූල්‍ය ආයතනවලින් විවිධ අරමුදල් ලබා ගනී.

ගිවිසුම්ගත වට්ටම් නොකළ ගෙවීම් මත පදනම්ව සමූහයේ / සමාගමේ මූල්‍ය වගකීම් වල කල්පිරීමේ පැතිකඩ පහත දැක්වෙන වගුවෙහි සාරාංශගත කොට දැක්වේ.

| | 2020 | | | | | |
|---|---|---|---|---|---|---|
| **සමූහය** | ඉල්ලීම මත රු. මිලියන | මාස 3ට අඩු රු. මිලියන | මාස 3 සිට මාස 12 දක්වා රු. මිලියන | වසර 1 සිට 5 දක්වා රු. මිලියන | වසර 5 ට වැඩි රු. මිලියන | එකතුව රු. මිලියන |
| පොලී දරණ වගකීම් | 11,681.41 | 4,031.93 | 74,760.35 | 42,416.77 | - | 132,890.46 |
| කල්බදු වගකීම් | 299.52 | 8,006.92 | 23,960.43 | 115,565.39 | 73,751.16 | 221,583.42 |
| ගුවන් යානා නඩත්තු කිරීම සහ අළුත්වැඩියා පිරිවැය | 5,227.08 | 513.63 | 12,844.16 | 13,743.50 | 1,698.01 | 34,026.38 |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ | - | 69,485.42 | - | - | - | 69,485.42 |
| වරණීය කොටස් | - | 65.05 | 1,065.05 | - | - | 1,130.10 |
| | 17,208.01 | 82,102.95 | 112,629.99 | 171,725.66 | 75,449.17 | 459,115.78 |
| **සමාගම** | | | | | | |
| පොලී දරණ වගකීම් | 11,681.41 | 3,998.33 | 74,700.56 | 42,416.77 | - | 132,797.07 |
| කල්බදු වගකීම් | 299.52 | 7,965.47 | 23,834.15 | 114,805.09 | 70,909.99 | 217,814.22 |
| ගුවන් යානා නඩත්තු කිරීම සහ අළුත්වැඩියා පිරිවැය | 5,227.08 | 513.63 | 12,844.16 | 13,743.50 | 1,698.01 | 34,026.38 |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ | - | 79,185.71 | - | - | - | 79,185.71 |
| | 17,208.01 | 91,663.14 | 111,378.87 | 170,965.36 | 72,608.00 | 463,823.38 |

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් සබැඳේ.

### 31. මූල්‍ය අවදානම් කළමනාකරණ අරමුණු සහ ප්‍රතිපත්ති (සබැඳේ)

| | | | | 2019 | | |
|---|---|---|---|---|---|---|
| **සමූහය** | **ඉල්ලීම මත රු. මිලියන** | **මාස 3ට අඩු රු. මිලියන** | **මාස 3 සිට මාස 12 දක්වා රු. මිලියන** | **වසර 1 සිට 5 දක්වා රු. මිලියන** | **වසර 5 ට වැඩි රු. මිලියන** | **එකතුව රු. මිලියන** |
| පොලී දරණ වගකීම් | 9,132.24 | 34,212.30 | 71,517.72 | 10,777.73 | - | 125,639.99 |
| ගුවන් යානා නඩත්තු කිරීම සහ අළුත්වැඩියා පිරිවැය | 1,512.34 | 3,338.83 | 20,085.52 | 9,217.61 | 3,195.90 | 37,350.20 |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ | - | 51,589.43 | - | - | - | 51,589.43 |
| වරණීය කොටස් | - | 65.05 | 65.05 | 1,195.15 | - | 1,325.25 |
| | 10,644.58 | 89,205.62 | 91,668.29 | 21,190.49 | 3,195.90 | 215,904.88 |
| **සමාගම** | | | | | | |
| පොලී දරණ වගකීම් | 9,132.24 | 34,180.45 | 71,423.13 | 10,690.42 | - | 125,426.24 |
| ගුවන් යානා නඩත්තු කිරීම සහ අළුත්වැඩියා පිරිවැය | 1,512.34 | 3,338.83 | 20,085.52 | 9,217.61 | 3,195.90 | 37,350.20 |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ | - | 58,178.53 | - | - | - | 58,178.53 |
| | 10,644.58 | 95,697.82 | 91,508.65 | 19,908.03 | 3,195.90 | 220,954.97 |

**(iii) ණය අවදානම**

ණය අවදානම යනු මූල්‍ය අලාභයකට හේතුවන අයුරින් මූල්‍ය උපකරණයක් හෝ සේවාදායක ගිවිසුමක් යටතේ ප්‍රති පාර්ශ්වයක් විසින් තමන්ගේ බැඳීම් ඉටු නොකිරීමේ අවදානමයි. සමූහය ප්‍රධාන වශයෙන් එහි මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් (මූලික වශයෙන් වෙළඳ ලැබිය යුතු දේ)ණය අවදානමට නිරාවරණය වේ.

ගුවන් මගී විකුණුම් හා ගුවන් භාණ්ඩ ප්‍රවාහනය මූලික වශයෙන් අන්තර්ජාතික ගුවන් ප්‍රවාහන සංගමයේ (IATA) බලයලත් අලෙවි නියෝජිතයන් හරහා සිදුකෙරේ. පුළුල් විවිධාංගීකරණය හේතුවෙන් එවැනි විකුණුම්වල ණය අවදානම සාපේක්ෂව සුළුය. මෙම නියෝජිතයින්ගෙන් පියවීම්, අන්තර්ජාතික ගුවන් ප්‍රවාහන සංගමය (IATA) විසින් සිය ගුවන් මගී හා ගුවන් භාණ්ඩ බේරුම් කිරීමේ යෝජනා ක්‍රමය හරහා එකතු කරගනී. මෙම එක්රැස් කළ අරමුදල් අන්තර්ජාතික ගුවන් ප්‍රවාහන සංගමය (IATA) විසින් සෘජුවම ගුවන් සමාගමට පියවන අතර එමඟින් එකී නියෝජිතවරුන්ගේ ණය ගෙවීමේ හැකියාව පිළිබඳව වැඩි සහතිකකිරීමක් ලබා දෙනු ලැබේ.

ප්‍රධාන ගුවන් සමාගම් අතර ලැබිය යුතු දේ සහ ගෙවිය යුතු දේ මූලික වශයෙන් පියවනු ලබන්නේ අන්තර්ජාතික ගුවන් ප්‍රවාහන සංගමයේ නිෂ්කාශන මධ්‍යස්ථානය (IATA Clearing House) හරහාය. සාමාන්‍යයෙන් ලැබිය යුතු දෑ හා ගෙවිය යුතු දෑ හි ශුද්ධ අගය පියවනු ලබන්නේ සතියක කාල අන්තරයක් සහිතව වන අතර එහිදී ගෙවීම් කඩ කිරීමේ අවදානමෙහි පැහැදිලි අඩුවීමක් සිදුවේ.

වෙනත් සේවා සබඳතා සඳහා, සපයනු ලබන සේවාවන්හි ස්වභාවය සහ විෂය පථය අනුව ඇපකරයක් අවශ්‍ය වේ. ණය ගැතියන්ගේ එවැනි ඇපකරවලට බැංකු ඇපකර සහ සුරැකුම් තැන්පතු සහ වෙනත් යාන්ත්‍රණයන් ඇතුළත් වේ.

අවදානම් හඳුනාගත්විට අඩමාණ ලැබිය යුතු දෑ ගිණුම් සඳහා හානිකරණ ප්‍රතිපාදන සිදුකරයි.

**ප්‍රාග්ධන කළමනාකරණය**

මෙම මූල්‍ය ප්‍රකාශනවල සටහන 3 හි වඩාත් හොඳින් විස්තර කර ඇති ව්‍යාපාරික සැලැස්ම මත පදනම්ව, ණය මුදල් රැස් කිරීම සඳහා ස්වෛරී ඇපකර/ සහනදායී ලිපි මඟින් අවශ්‍ය අරමුදල් සම්පාදනය කිරීමට ශ්‍රී ලංකා රජය කැපවී සිටී.

## 32. සන්සන්දනාත්මක තොරතුරු

මනා ඉදිරිපත් කිරීමක් සාක්ෂාත් කර ගනු පිණිස ලාභ හෝ අලාභ ප්‍රකාශයෙහි සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි ඇතුළත් පහත දැක්වෙන අයිතමයන් ප්‍රතිවර්ගීකරණය කරන ලදී.

| | සමූහය 2019 | | | සමාගම 2019 | | |
|---|---|---|---|---|---|---|
| | වාර්තා කළ රු. මිලියන | ප්‍රතිවර්ගීකරණයන් රු. මිලියන | ප්‍රතිවර්ගීකරණය කරන ලද රු. මිලියන | වාර්තා කළ රු. මිලියන | ප්‍රතිවර්ගීකරණයන් රු. මිලියන | ප්‍රතිවර්ගීකරණය කරන ලද රු. මිලියන |
| **ලාභ හෝ අලාභ ප්‍රකාශය** | | | | | | |
| කල්බදු ගුවන්යානා මත කුලී ගෙවීම් | (29,099.13) | 29,099.13 | - | (29,099.13) | 29,099.13 | - |
| ගුවන්යානා නඩත්තු හා අළුත්වැඩියා පිරිවැය | (26,953.28) | 620.19 | (26,333.09) | (26,953.28) | 620.19 | (26,333.09) |
| ක්ෂයවීම්/ක්‍රමක්ෂය | (1,862.00) | 294.39 | (1,567.61) | (1,643.67) | 294.39 | (1,349.28) |
| වෙනත් මෙහෙයුම් වියදම් | (16,298.17) | 917.46 | (15,380.71) | (15,056.56) | 755.00 | (14,301.56) |
| SLFRS 16 ආදේශ කරගැනීමේ බලපෑම | - | (30,931.17) | (30,931.17) | - | (30,768.71) | (30,768.71) |
| | | - | | | - | |
| විනිමය හුවමාරු අලාභය | (10,732.40) | 8,404.12 | (2,328.28) | (11,805.18) | 8,390.96 | (3,414.22) |
| මූල්‍ය පිරිවැය | (11,079.10) | (8,404.12) | (19,483.22) | (10,939.83) | (8,390.96) | (19,330.79) |
| | | - | | | - | |
| **මුදල් ප්‍රවාහ ප්‍රකාශය** | | | | | | |
| මූල්‍ය පිරිවැය | 11,079.10 | 8,404.12 | 19,483.22 | 10,939.83 | 8,390.96 | 19,330.79 |
| උපලබ්ධි නොවූ විනිමය අලාභයෙහි බලපෑම | 11,223.41 | (8,404.12) | 2,819.29 | 12,009.62 | (8,390.96) | 3,618.66 |
| | | - | | | - | |

ප්‍රථම වරට SLFRS 16 ආදේශ කරගැනීම හේතුවෙන් කල්බදු කුලී ගෙවීම් ගලපන ලදී. මේ සමගම, වර්තමාන වසරේ කල්බදු මූල්‍ය පිරිවැය සහ ලාභ හෝ අලාභ ප්‍රකාශයෙහි කල්බදු වගකීම් වල විනිමය පරිවර්තන බලපෑම සන්සන්දනය කළ හැකි වනු පිණිස මූල්‍යමය ක්‍රියාකාරකම් ආශ්‍රිත විනිමය අලාභය ප්‍රතිවර්ගීකරණය කෙරිණි.

# පාරිභාෂික ශබ්ද මාලාව

**ලබාගත හැකි ආසන කිලෝමීටර් ප්‍රමාණය (ASK)**
අලෙවිය සඳහා පවතින ආසන ප්‍රමාණය සහ ඒවා ප්‍රවාහනය කරන දුර ප්‍රමාණයේ ගුණිතය වේ.

**ලබාගත හැකි ටොන් කිලෝමීටර් ප්‍රමාණය (ATK)**
මෙය ප්‍රවාහන නිෂ්පාදනයෙහි මිණුම වේ.ගුවන් යානාවක් විසින් නිපදවන ලබාගත හැකි ටොන් කිලෝමීටර ප්‍රමාණය වනුයේ, පියාසර කළ දුර ප්‍රමාණය, ටොන් ප්‍රමාණයෙන් ගුණ වීමෙන් ගණනය වන ගුවන් යානාවේ බර සඳහා ධාරිතාවයි.

**ආදායම් මගී කිලෝමීටර් ප්‍රමාණය (RPK)**
ප්‍රවාහනය කළ මගීන් සහ ඔවුන් ප්‍රවාහනය කළ දුර ප්‍රමාණයේ ගුණිතය වේ.

**ආදායම් ටොන් කිලෝමීටර ප්‍රමාණ (RTK)**
ටොන් වලින් ප්‍රවාහනය කල මගී සහ භාණ්ඩ නිෂ්පාදනය සහ ඒවා ප්‍රවාහනය කෙරෙන දුර ප්‍රමාණය.

**පැටවුම් සාධකය**
සැපයන ලද ධාරිතාවයට පැටවුමේ සබඳතාවය අනුව ප්‍රතිශතය.

මගී පැටවුම් සාධකය කෙරෙහි ASK සහ RPK අදාළ වන අතර සමස්ත පැටවුම් සාධකය කෙරෙහි RTK සහ ATK අදාළ වේ.

**ආදායම් මගී කිලෝමීටර් RPK ප්‍රමාණයට ආදායම**
ආදායම සහ ආදායම් මගී කිලෝමීටර් ප්‍රමාණය අතර සබඳතාවය වේ.

**ඒකක පිරිවැය**
ලබාගත හැකි ටොන් කිලෝමීටර් ප්‍රමාණයට (ATK) මූල්‍ය පිරිවැය හා රඳවාගැනීමේ බදු අඩුකළ පසු ගුවන්සේවා මෙහෙයුම් වල මුළු මෙහෙයුම් පිරිවැය ගැලපීමෙන් ඒකක පිරිවැය ගණනය කෙරේ.

**සමස්ත ඵලදාව**
ආදායම් ටොන් කිලෝමීටර් ප්‍රමාණයට (RTK) ශුද්ධ ප්‍රවාහන ආදායම ගැලපීමෙන් සමස්ත ඵලදාව ගණනය කෙරේ.

ශුද්ධ ප්‍රවාහන ආදායම යනු මගී, අතිරේක ගුවන් මළු, ගුවන් බඩු හා තැපැල් යන ඒවායේ, වැඩසටහන්ගත හා වැඩසටහන්ගත නොකළ සේවාවන් වල එකතුවයි.

**සමතුලන පැටවුම් සාධකය**
ගුවන් සමාගමේ මෙහෙයුම්වලින් ලබන ආදායම මෙහෙයුම් පිරිවැය සමච්ඡේදනය වීමට අවශ්‍ය පැටවුම් සාධකය.



# දස අවුරුදු සමාලෝචනය

| | | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|---|
| **ආදායම් ප්‍රකාශය** | | | | | |
| ආදායම | රු. මිලියන | 77,125.45 | 92,867.93 | 119,570.90 | 121,585.83 |
| මෙහෙයුම් වියදම් | රු. මිලියන | 81,334.34 | 111,775.88 | 146,700.24 | 150,389.46 |
| ශුද්ධ ලාභය/(පාඩු) | රු. මිලියන | (381.61) | (19,778.03) | (26,088.57) | (32,408.34) |
| **ශේෂපත්‍රය** | | | | | |
| කොටස් ප්‍රාග්ධනය / ප්‍රකාශිත ප්‍රාග්ධනය | රු. මිලියන | 5,146.35 | 19,432.67 | 32,032.75 | 51,617.44 |
| ජංගම නොවන වත්කම් | රු. මිලියන | 19,862.87 | 37,591.58 | 23,338.28 | 25,212.47 |
| ජංගම වත්කම් | රු. මිලියන | 18,276.59 | 22,072.71 | 54,905.22 | 37,154.23 |
| මුළු වත්කම් | රු. මිලියන | 38,139.46 | 59,664.29 | 78,243.50 | 62,366.70 |
| ජංගම වගකීම් | රු. මිලියන | 28,017.97 | 64,235.43 | 71,346.64 | 88,609.07 |
| **ප්‍රතිලාභය /ඒකක පිරිවැය** | | | | | |
| සමස්ත ඵලදාව (yield) | රු. tkm | 60.27 | 64.47 | 74.31 | 77.26 |
| ඒකක පිරිවැය | රු. tkm | 44.59 | 53.26 | 63.15 | 65.00 |
| සමච්ඡේද පැටවුම් සාධකය | % | 73.99 | 82.61 | 84.98 | 84.13 |
| ආදායම් මඟී කි.මී. 1 ක ආදායම | රු. RPK | 6.31 | 6.63 | 7.60 | 7.78 |
| **නිෂ්පාදනය** | | | | | |
| මඟී ධාරිතාවය | ASK මිලියන | 12,481.41 | 14,248.94 | 15,944.31 | 15,780.54 |
| සමස්ත ධාරිතාවය | ATK මිලියන | 1,755.23 | 1,978.33 | 2,186.96 | 2,187.18 |
| **ප්‍රවාහනය** | | | | | |
| ප්‍රවාහනය කළ මඟීන් | සංඛ්‍යාව දහස් | 2,867 | 3,459 | 4,255 | 4,175 |
| ප්‍රවාහනය කළ මඟීන් | RPK මිලියන | 9,584.02 | 11,270.23 | 12,968.74 | 12,810.95 |
| මඟී පැටවුම් සාධකය | % | 76.79 | 79.10 | 81.34 | 81.18 |
| ප්‍රවාහනය කළ භාණ්ඩ | ටොන් | 86,053 | 87,750 | 101,100 | 94,410 |
| ප්‍රවාහනය කළ භාණ්ඩ | RTK මිලියන | 332.98 | 345.67 | 377.75 | 355.59 |
| ගෙනගිය සමස්ත පැටවුම | RTK මිලියන | 1,184.13 | 1,338.30 | 1,513.70 | 1,466.74 |
| සමස්ත පැටවුම් සාධකය | % | 67.46 | 67.65 | 69.22 | 67.06 |
| **කාර්ය මණ්ඩලය** | | | | | |
| පිරිස් බලයේ සාමාන්‍යය | සංඛ්‍යාව | 4,998 | 5,594 | 6,359 | 6,578 |
| සේවකයෙකුගේ ආදායම | රු. | 15,431,263 | 16,601,346 | 18,803,412 | 18,483,708 |
| සේවකයෙකුගේ ධාරිතාව | ටොන්-කි.මී. | 351,186 | 353,652 | 343,916 | 332,499 |
| සේවකයෙකු සඳහා ප්‍රවාහනය කළ පැටවුම | ටොන්-කි.මී. | 236,922 | 239,238 | 238,041 | 222,976 |
| **ගුවන් යානා** | | | | | |
| A320-200 | සංඛ්‍යාව | 4 | 7 | 8 | 8 |
| A321-200 | සංඛ්‍යාව | - | - | - | - |
| A320neo | සංඛ්‍යාව | - | - | - | - |
| A321neo | සංඛ්‍යාව | - | - | - | - |
| A330-200 | සංඛ්‍යාව | 5 | 7 | 7 | 7 |
| A330-300 | සංඛ්‍යාව | - | - | - | - |
| A340-300 | සංඛ්‍යාව | 5 | 6 | 6 | 6 |
| Turbo Otter | සංඛ්‍යාව | 2 | 2 | 1 | - |
| වසර අවසානය වන විට සේවයේ යෙදවූ ගුවන් යානා | සංඛ්‍යාව | 16 | 22 | 22 | 21 |
| ගුවන්යානා භාවිතය | දිනකට පියාසර පැය | 14.05 | 13.48 | 12.82 | 12.76 |

| | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 |
|---|---|---|---|---|---|---|
| | 131,922.13 | 129,480.41 | 135,491.19 | 161,433.87 | 180,340.32 | **180,151.02** |
| | 145,983.35 | 137,311.44 | 146,760.80 | 175,883.85 | 209,344.66 | **190,321.69** |
| | (16,494.66) | (12,621.69) | (28,929.99) | (17,213.57) | (44,022.67) | **(47,197.86)** |
| | 51,617.44 | 51,617.44 | 51,617.44 | 51,617.44 | 51,617.44 | **51,617.44** |
| | 22,836.77 | 23,548.01 | 24,660.56 | 37,476.46 | 36,596.59 | **150,013.50** |
| | 49,721.49 | 26,901.02 | 26,973.07 | 30,090.50 | 40,742.41 | **31,176.10** |
| | 72,558.26 | 50,449.03 | 51,633.63 | 67,566.96 | 77,338.99 | **181,189.60** |
| | 103,414.31 | 100,334.44 | 126,302.55 | 130,358.61 | 227,081.67 | **242,821.23** |
| | 80.32 | 79.06 | 80.08 | 84.24 | 91.32 | **99.03** |
| | 62.00 | 58.72 | 61.61 | 65.74 | 74.31 | **74.22** |
| | 77.18 | 74.27 | 76.94 | 78.04 | 81.37 | **74.95** |
| | 8.22 | 8.17 | 8.45 | 8.62 | 9.43 | **10.15** |
| | 16,180.27 | 15,790.28 | 15,608.10 | 18,487.54 | 18,925.40 | **18,041.41** |
| | 2,224.87 | 2,165.21 | 2,167.92 | 2,549.88 | 2,577.53 | **2,454.30** |
| | 4,348 | 4,328 | 4,446 | 5,839 | 5,663 | **5,256** |
| | 12,963.71 | 12,727.66 | 12,455.05 | 15,280.78 | 15,689.19 | **14,547.97** |
| | 80.12 | 80.60 | 79.80 | 82.65 | 82.90 | **80.64** |
| | 101,878 | 102,082 | 116,221 | 132,958 | 125,753 | **113,971** |
| | 373.32 | 356.76 | 374.46 | 401.66 | 408.71 | **363.31** |
| | 1,519.93 | 1,484.77 | 1,475.29 | 1,749.14 | 1,806.58 | **1,664.49** |
| | 68.32 | 68.57 | 68.05 | 68.60 | 70.09 | **67.82** |
| | 6,987 | 6,959 | 7,021 | 7,019 | 6,794 | **6,693** |
| | 18,881,084 | 18,606,181 | 19,297,991 | 22,999,555 | 26,544,057 | **26,916,333** |
| | 318,430 | 311,139 | 308,776 | 363,283 | 379,383 | **366,697** |
| | 217,537 | 213,359 | 210,126 | 249,201 | 265,908 | **248,691** |
| | 6 | 6 | 6 | 5 | 5 | **5** |
| | 2 | 2 | 3 | 3 | 2 | **2** |
| | - | - | 2 | 2 | 2 | **2** |
| | - | - | - | 3 | 4 | **4** |
| | 7 | 6 | 6 | 6 | 7 | **5** |
| | 2 | 7 | 7 | 7 | 7 | **7** |
| | 4 | - | - | - | - | **-** |
| | - | - | - | - | - | **-** |
| | 21 | 21 | 24 | 26 | 27 | **25** |
| | 12.90 | 12.02 | 12.44 | 13.25 | 12.60 | **12.18** |

# ගුවන් මාර්ග සිතියම




දැනට ශ්‍රීලංකන් ගුවන් සමාගම යුරෝපය, මැද පෙරදිග, දකුණු ආසියාව, අග්නිදිග ආසියාව, ඈත පෙරදිග උතුරු ඇමෙරිකාව වැනි කලාප වල රටවල් 51 ක් පුරා ගමනාන්ත 116 ක් සඳහා සේවා සපයයි.


Oslo
Helsinki
Stockholm
Moscow
Edinburgh
Copenhagen
Manchester
Amsterdam
Dublin
Brussels
Prague
London
Düsseldorf
Frankfurt
Vienna
Paris
Munich
Geneva
Zurich
Turin
Venice
Milan
Belgrade
Sofia
Istanbul
Madrid
Barcelona
Rome
Thessaloniki
Palermo
Catania
Athens
Larnaca
Casablanca
Amman
Kuwait
Dammam
Bahrain
Riyadh
Karachi
Doha
Dubai
Jeddah
Abu Dhabi
Muscat
Lahore
Amritsar
New Delhi
Lucknow
Jaipur
Patna
Guwahati
Dhaka
Kolkata
Bhubaneswar
Mumbai
Bangalore
Hyderabad
Chennai
Coimbatore
Tiruchirappalli
Kochi
Madurai
Trivandrum
Colombo
Malé
Gan Island
Nairobi
Seychelles
Johannesburg
Cape Town
Beijing
Chitose
Tokyo (Narita)
Tokyo (Haneda)
Osaka (Itami)
Nagoya
Fukuoka
Osaka (Kansai)
Shanghai
Guangzhou
Hong Kong
Hanoi
Yangon
Bangkok
Phnom Penh
Ho Chi Minh
Phuket
Langkawi
Penang
Kuala Lumpur
Singapore
Jakarta
Darwin
Brisbane
Perth
Sydney
Adelaide
Melbourne
Auckland

# විශේෂ කඩඉම්

## 2009/2010

මෙහෙයුම් කල්බදු ගිවිසුමක් යටතේ සමාගම එයාර් බස් A320 ගුවන් යානා දෙකක් භාර ගත්තේය.

## 2010/2011

කල්බදු ගිවිසුමක් යටතේ සමාගම විසින් A320 ගුවන් යානයක් සහ එයාර් බස් A330 පුළුල් බඳ ගුවන් යානාවක් භාර ගත්තේය.

2010 ජූලි මාසයේදී එමිරේට්ස් සමාගම සතු 42.63% ක කොටස් මිලදී ගැනීමට ශ්‍රී ලංකා රජය විසින් පහසුකම් සපයන ලදී.

## 2011/2012

කල්බදු ගිවිසුමක් යටතේ සමාගම එයාර් බස් A320 ගුවන් යානා හතරක්, එයාර් බස් A330 පුළුල් බඳ ගුවන් යානා දෙකක් සහ එයාර් බස් A340 පුළුල් බඳ ගුවන් යානාවක් භාර ගත්තේය.

ගුවන් සේවය ප්‍රති ප්‍රාග්ධනීකරණය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් ඇමරිකානු ඩොලර් මිලියන 500 ක කොටස් ආයෝජනයක් සඳහා කැබිනට් අනුමැතිය හිමි විය.

## 2012/2013

එයාර් බස් A320 නියමුවන් පුහුණු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ පළමු A320 පියාසැරි සිමියුලේටරය දියත් කිරීම.

මෙහෙයුම් කල්බදු ගිවිසුමක් යටතේ සමාගම එක් එයාර් බස් A320 ගුවන් යානයක් භාර ගත්තේය

මත්තල ජාත්‍යන්තර ගුවන්තොටුපළෙන් ජාත්‍යන්තර ගුවන් ගමන් ආරම්භ කළේය.

2012 මැයි මාසයේදී සමාගම ඇමරිකානු ඩොලර් මිලියන 175 ක මූල්‍යකරණයක් ලබා ගැනීම සඳහා විදේශීය බැංකු සමූහයක් සමඟ මූල්‍යකරණ ගිවිසුමකට එළඹුණි.

## 2013/2014

එයාර් බස් A330 නියමුවන් පුහුණු කිරීම සඳහා පියාසැරි සිමියුලේටරය දියත් කිරීම

2013 දෙසැම්බරයේදී සමාගම මගී සේවා පද්ධතිය ඇමඩියස් ඇල්ටියා වෙතට මාරු කරන ලදී.

2014 මාර්තු මාසයේදී සමාගම මධ්‍ය කාලීන මූල්‍යකරණය සදහා ඇමරිකානු ඩොලර් මිලියන 150 ක් ලබා ගැනීම සඳහා බැංකු සමූහයක් සමඟ මූල්‍යකරණ ගිවිසුමකට එළැඹිනි.

## 2014/2015

සමාගම 2014 මැයි මාසයේදී වන්වර්ල්ඩ් එකමුතුව සමග ගිවිසුම්වලට එළඹුණි 2014 ජුනි මාසයේදී සමාගම පළමු වරට පස් අවුරුදු ජාත්‍යන්තර බැඳුම්කරයක් නිකුත් කළේය.

පුළුල් බඳ ගුවන් යානා නැවත ධාවනය කිරීමේ වැඩසටහනක කොටසක් ලෙස සමාගම විසින් පිළිවෙලින් 2014 ඔක්තෝබර් සහ 2015 මාර්තු මාසවලදී නවතම A330 - 300 ගුවන් යානා තුනක් ලබා ගැනුනි.

## 2015/2016

ගුවන් සේවාවන් හි කීර්තිමත් ගෞරවනාම හතරක් සඳහා ලැයිස්තුගත කර ලදී : එනම් ආසියානු සහ ඔස්ට්‍රේලියා හි කලාපීය හොඳම ගුවන් සේවය, හොඳම ගුවන් යානා තුළ ප්‍රකාශනය, 'හොඳම ගුවන් යානා තුළ (Inflight) වීඩියෝව' සහ ඇපෙක්ස් මගී තේරීම් සම්මාන 2015 හි හොඳම භූමි අත්දැකීම යනුවෙනි. ගුවන් සේවය කාණ්ඩ හතරක් සඳහා නම් කරන ලද පළමු අවස්ථාව මෙයයි. ආසියාවේ සහ ඔස්ට්‍රලේෂියාවේ හි මගී අත්දැකීම් සඳහා විශිෂ්ට ජයග්‍රහණ සම්මානය දිනා ගත්තේය. - 2015 සැප්තැම්බර් ඇපෙක්ස් පෝට්ලන්ඩ් ඔරේගන් සහ හොඳම පූර්ණ සේවා ගුවන් සේවා ත්‍යාගය, මධ්‍යම හා දකුණු ආසියාව - ආසියාවේ අනාගත සංචාරක අත්දැකීම් සම්මාන 2015, සිංගප්පූරුව

පුළුල් බඳ ගුවන් යානා නැවත ධාවනය කිරීමේ වැඩසටහනේ කොටසක් ලෙස සමාගම විසින් අගෝස්තු සහ නොවැම්බර් මාසවලදී අති නවීන A330-300 ගුවන් යානා හතරක් සහ 2015 දෙසැම්බර් මාසයේදී ගුවන් යානා දෙකක් ලබාගන්නා ලදී.

## 2016/2017

2017 පෙබරවාරි සහ 2017 මාර්තු මාසවලදී A320 නව ගුවන් යානා දෙකක් හඳුන්වා දීම - පළමු A320/A321 පවුලේ නව එන්ජින් විකල්ප ගුවන් යානා දෙක සමූහයට එක්විය.

ලාහෝර්, ජකර්තා, ඩකා, කල්කටා, මදුරෙයි, වරනාසි, බුද්ධගයා, මස්කට්, බහරේන්, සීෂෙල්ස් සහ ගාන් දූපත් යන ආකර්ෂණීය නව ගමනාන්ත එකොළහකට ශ්‍රීලංකන් මගින් සේවා අරඹන ලදී.

සමාගමට "දකුණු ආසියාවේ හොඳම ගුවන් සමාගම", ෆියුචර් ට්‍රැවල් එක්ස්පීරියන්ස් ඒෂියා 2016 හි අඛණ්ඩව දෙවන වරටත් "මධ්‍යම හා දකුණු ආසියාවේ හොඳම පූර්ණ සේවා ගුවන් සේවය" යන ඉහළම සංචාරක සම්මාන පිරිනමන ලදි. 7 වන ආසියා හාම්පුතුන්ගේ සන්නාම සම්මාන උළෙලේදී "පුහුණු විශිෂ්ටතා සම්මානය" සහ ව්‍යාපාරයට අනුකූලව හොඳම මානව සම්පත් ක්‍රමෝපාය සඳහා සම්මානයද ගුවන් සමාගම විසින් හිමිකර ගන්නා ලදී.

## 2017/2018

සමාගම විසින් ගුවන් යානා සමූහයේ කොටසක් ලෙස 2017 ජුනි, ඔක්තෝබර් සහ දෙසැම්බර් මාසවලදී නවතම එයාබස් A321neo නව ගුවන් යානා තුනක් ලබා ගන්නා ලදී.

ශ්‍රීලංකන් මගින් මෙල්බර්න්, හයිද්‍රාබාද්, කොයිම්බතූර් සහ විශාකාපට්නම් යන නව ගමනාන්ත හතරකට සේවා අරඹන ලදී.

ගුවන්සේවා මගී අත්දැකීම් සංගමයෙන් (ඇපෙක්ස්) තරු හතරේ විශිෂ්ටතා ශ්‍රේණිගත කිරීමක් ලබාගත් අතර, 2017 සිංගප්පූරුවේ අනාගත සංචාරක අත්දැකීම් සම්මාන උළෙලේදී ගුවන් සේවය පිට පිට
තෙවන වරටත් විශිෂ්ට සේවා සඳහා සම්මානය ලබා ගත්තේය.

සිංගප්පූරුවේ පැවති 2017 ආසියා පැසිෆික් සම්මාන උළෙලේදී "වාණිජ ගුවන් සේවා මැදිරිවල නවෝත්පාදන" සම්මානයද සමාගම දිනා ගත්තේය.

## 2018/2019

සමාගම විසින් 2018 ජුලි මාසයේදී තවත් නවතම එයාබස් A321neo ගුවන් යානයක් ලබා ගන්නා ලද අතර එමගින් නියෝ යානා සමූහයේ ආගමනය පූර්ණ විය.

පියාසැරි දත්ත විශ්ලේෂණ සමාගමක් වන ෆ්ලයිට්ස්ටැට්ස්.කොම් විසින් ශ්‍රේණිගත කරන ලද 'ගෝලීය ගුවන් සේවා' සහ'ප්‍රධාන ගුවන් සේවා' යන ප්‍රධාන කාණ්ඩ යටතේ ශ්‍රීලංකන් ගුවන් සේවය 2018 සැප්තැම්බර් මාසයේ දී ලෝකයේ අතිශයින්ම නියමිත වේලාවට කටයුතු කරන්නා වූ ගුවන් සේවය බවට පත්විය.

ශ්‍රීලංකන් ගුවන් සේවය විසින් ගුවන් මගී අත්දැකීම් සංගමයේ (ඇපෙක්ස්) අඛණ්ඩව දෙවන වරටත් ප්‍රධාන ගුවන් සේවා කාණ්ඩයේ තරු හතරේ ශ්‍රේණිගත කිරීමක් පවත්වා ගෙන ගිය අතර ජාත්‍යන්තර සම්මාන කිහිපයක් ද හිමි කර ගත්තේය. මේ අතර අඛණ්ඩව තෙවැනි වරටත් ඉන්දියානු සාගරයට ලොව ප්‍රමුඛ ගුවන් සේවය සම්මානය දිනා ගැනීම සහ අයි ටී බී බර්ලිනයේ ගෝල්ඩන් සිටි ගේට් සම්මාන තුනක් ඇතුළත් වේ.

## 2019/2020

ශ්‍රීලංකන් ගුවන් සේවය වසර 2019 දී සිය 40 වැනි සංවත්සරය සැමරීය. ජාතික ගුවන් සේවය වෙත ගුවන් මගී අත්දැකීම් සංගමය (APEX) මගින් ''විශිෂ්ටතම අලෙවි නව හඳුන්වාදීම'' සම්මානය පිරිනැමිනි. ශ්‍රීලංකන් ගුවන් සේවය විසින් අඛණ්ඩව තෙවන වරටත් ප්‍රධාන ගුවන් සේවා කාණ්ඩයේ තරු හතරේ ශ්‍රේණිගත කිරීමක් පවත්වා ගෙන යන ලදී.

2019 දී ශ්‍රීලංකන් ගුවන් සේවය විසින් 'Two Cities, One Spirit' ප්‍රචාරණ ව්‍යාපෘතිය වෙනුවෙන් ස්වර්ණ සම්මානය දිනා ගන්නා ලද අතර 2019 බර්ලින් ITB ගෝල්ඩ් සිටි සම්මාන උළෙලේදී සම්මාන ත්‍රිත්වයක් දිනා ගැනුනි.

2020 බර්ලින් ITB ගෝල්ඩ් සිටි සම්මාන උළෙලේදී සමාගම ප්‍රථම වරට කාණ්ඩ තුනකින් ("Airline International", "Music International" සහ "Campaign") තරු පහේ සම්මානයට පාත්‍ර විය.

ශ්‍රීලංකන් ගුවන් සේවය වර්ල්ඩ් ට්‍රැවල් අවෝර්ඩ්ස් ඒෂියා ඇන්ඩ් ඕෂනියා (ලෝක චාරිකා සම්මාන ආසියාව හා ඕෂනියාව) හිදී අග්‍රගන්‍ය 'ලොව විශිෂ්ටතම ගුවන් සේවය' සහ 'ඉන්දියාන් සාගරය ආශ්‍රිත ආසියාවේ ප්‍රමුඛතම ගුවන් සේවය' යන සම්මානයන්ගෙන් පිදුම් ලැබීය.

# සාංගමික තොරතුරු

**සමාගමේ නම**
සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගම

**සමාගමේ ලියාපදිංචි අංක**
පී බී 67

**නෛතිකභාවය**
සීමාසහිත පොදු සමාගමකි

**අධ්‍යක්ෂ මණ්ඩලය**
අසෝක කාරියවසම් පතිරගේ මහතා (සභාපති)
මොහොමඩ් අෂ්රොෆ් ඕමාර් මහතා
මලික් ප්‍රනාන්දු මහතා
ජනාධිපති නීතිඥ මනෝහර රත්නවිභූෂණ ද සිල්වා මහතා
ජනාධිපති නීතිඥ සමන්ත රත්වත්ත මහතා
ආචාර්ය ශ්‍රීධීර් සාරිපුත්ත හංස විජයසූරිය මහතා
සංජය මොහොට්ටාල මහතා

**අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව**
සංජය මොහොට්ටාල මහතා (තාවකාලික)
මලික් ප්‍රනාන්දු මහතා
ජනාධිපති නීතිඥ සමන්ත රත්වත්ත මහතා
ජනාධිපති නීතිඥ මනෝහර රත්නවිභූෂණ ද සිල්වා මහතා
ආචාර්ය ශ්‍රීධීර් සාරිපුත්ත හංස විජයසූරිය මහතා

**අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව**
මොහොමඩ් අෂ්රොෆ් ඕමාර් මහතා
මලික් ප්‍රනාන්දු මහතා
ජනාධිපති නීතිඥ සමන්ත රත්වත්ත මහතා
ජනාධිපති නීතිඥ මනෝහර රත්නවිභූෂණ ද සිල්වා මහතා
සංජය මොහොට්ටාල මහතා

**සමාගම් ලේකම්/ සාංගමික ලේකම් සේවා ප්‍රධානී**
ඩැල්රීන් තිරුකුමාර් මහත්මිය (ACIS)

**බැංකුකරුවන්**
ලංකා බැංකුව
මහජන බැංකුව
ස්ටෑන්ඩඩ් චාටර්ඩ් බැංකුව
සිටි බෑන්ක් එන් ඒ
සම්පත් බැංකුව
නේෂන්ස් ට්‍රස්ට් බැංකුව
හැටන් නැෂනල් බැංකුව
කොමර්ෂල් බැංකුව
අමානා බැංකුව
ක්‍රෙඩිට් සුයිස් ඒජී

**විගණක**
විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය
306/72
පොල්දූව පාර
බත්තරමුල්ල

**ලියාපදිංචි ප්‍රධාන කාර්යාලය**
ගුවන්සේවා මධ්‍යස්ථානය
බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල
කටුනායක
ශ්‍රී ලංකාව

**සාංගමික වෙබ් අඩවිය**
www.srilankan.com

optima
Designing Your Year!
Designed & Produced by
Optima Designs (Pvt) Ltd.
A full service design and print company.
www.optimadesigns.lk

# වාර්ෂික මහා සභා රැස්වීම් නිවේදනය

පහත දැක්වෙන අරමුණ පාදක කර ගනිමින්, සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ කොටස් හිමියන්ගේ හතළිස් දෙවන වාර්ෂික මහා සභා රැස්වීම 2020 සැප්තැම්බර් 25 වන, සිකුරාදා පෙ.ව. 10.00 ට කොළඹ 7, බෞද්ධාලෝක මාවතේ පිහිටි බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ (BMICH) 'ලෝටස් ශාලාව' පරිශ්‍රයේ පැවැත්වෙන බව මෙයින් දන්වා සිටියි.

1. 2020 මාර්තු මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන සමඟ, ඒ පිළිබඳ විගණකවරුන්ගේ වාර්තාව භාරගනු ලැබ සලකා බැලීම.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනයේ 36 වන වගන්තිය ප්‍රකාරව, විගණකාධිපතිවරයා විසින් සමාගම විගණනය කරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

**ඩැල්රින් තිරුකුමාර්**
සමාගම් ලේකම්

2020 අගෝස්තු 19
කටුනායක

**සටහන්:**

### 1. සෞඛ්‍ය හා සුරක්ෂිතතාව

රැස්වීමට සහභාගීවන්නන්ගේ සුරක්ෂිතතාව සහ යහ පැවැත්ම තහවුරු කරනු පිණිස සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය (සෞඛ්‍ය අමාත්‍යාංශය) නිකුත් කරනු ලැබ ඇති සෞඛ්‍ය හා සුරක්ෂිතතා මාර්ගෝපදේශයන්ට සහ අදාළ පරිශ්‍රය මගින් පනවනු ලැබ ඇති සම්මතයන්ට අනුකූලව රැස්වීම පැවැත්වේ. අදාළ මාර්ගෝපදේශයන් හා සම්මතයන් කෙරෙහි අනුකූලව:

අ). සියළුම සහභාගීවන්නන් හට ශරීර උෂ්ණත්ව පරීක්ෂාවකට සහභාගී වීමෙන් අනතුරුව විමසුම් තොරතුරු, අතීත හා වර්තමාන සෞඛ්‍ය තත්ත්වය, මෑතකදී සිදුකරන ලද විදේශ සංචාරයන් හා නිරාවරනයන් ඇතුළත් ප්‍රකාශයකට අත්සන් තැබීමට සිදුවේ.

ආ). සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් නියම කරන ලද තත්වයන්ට වඩා ඉහළ උෂ්ණත්වයක් වාර්තා කරනු ලබන පුද්ගලයන්ට රැස්වීමට සහභාගී වීමේ අවසර නොලැබේ.

ඇ). කැස්ස, උගුරේ ආබාධ, හෝ සමාන කවර හෝ වෙනත් සමාන රෝග ලක්ෂණ පෙන්නුම් කරන පුද්ගලයන්ට රැස්වීම් ශාලාවට ඇතුළුවීමට අවසර නොලැබේ.

ඈ). අතට අත දීම වැනි භෞතික ස්පර්ශයන් සහිත ක්‍රියාකාරකම් කෙරෙහි අවසර නොලැබෙන අතර සහභාගී වන්නන් හට රැස්වීමෙන් පසු එහි ගැවසීමේ හෝ රැඳී සිටීමේ අවසර හිමි නොවේ.

ඉ). මුව ආවරණයක් පැළඳීම හා අවම සමාජ දුරස්ථභාවය පවත්වා ගැනීම ඇතුළු සෞඛ්‍ය හා සුරක්ෂිතතා මාර්ගෝපදේශයන්ට අනුගත නොවන කවර හෝ පුද්ගලයකු රැස්වීමෙන් ඉවත් වීම අවශ්‍ය වේ.

### 2. පෙරකලාසිකරුවකු මාර්ගයෙන් ඡන්දය ප්‍රකාශ කිරීම

අපගේ සාමාජිකයින්ගේ සෞඛ්‍ය හා යහපැවැත්ම අප හට අතිශය වැදගත් වන අතර, තමන් නියෝජනය කරමින් තමන් වෙනුවෙන් ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු පත් කිරීම ඔස්සේ සාමාජිකයකු හට ඡන්දය දීමට පෙරකලාසිකරුවෙකු පත් කිරීමේ අයිතිය පවතියි. රැස්වීමේදී සාකච්ඡාවට භාජනය වීමට නියමිත විශේෂිත යෝජනා සම්බන්ධ ඔවුන්ගේ ඡන්ද වරණයන් සමගින් පෙරකලාසි පත්‍රය සම්පූර්ණ කොට පෙරකලාසි පත්‍රයේ පසුපිටෙහි දක්වා ඇති උපදෙස් පරිදි එය සමාගම වෙත භාරදෙන මෙන් සාමාජිකයින් හට උපදෙස් දෙනු ලැබේ.

### 3. රැස්වීමට සහභාගී වීම

කිසියම් සාමාජිකයකු තමන් විසින්ම හෝ පෙරකලාසිකරුවකු මාර්ගයෙන් රැස්වීමට සහභාගී වීමට අදහස් කරන්නේ නම් (සමාගමෙහි අධ්‍යක්ෂවරයකු නොවන අයෙකු), එවැනි සාමාජිකයකු ඔවුන්ගේ පෙරකලාසිකරු සම්බන්ධයෙන්:

අ). ලියාපදිංචි වීම, අනිවාර්ය සෞඛ්‍ය පරීක්ෂාවන් සිදුකිරීම සහ අවශ්‍ය අයදුම්පත් සම්පූර්ණ කිරීම හා පිරිස් තදබදය වළකාගැනීම සඳහා කල්තබා පැමිණීම:

ආ). රැස්වීමට සහභාගී වීමේදී සුදුසු මුව ආවරණයක් පැළඳීම : සහ

ඇ). රැස්වීමේදී, සෞඛ්‍ය හා සුරක්ෂිතතා පියවර ඡේදය (1) හි විස්තරාත්මකව දක්වා ඇති, සමාගම මගින් ක්‍රියාවට නංවනු ලබන සෞඛ්‍ය හා සුරක්ෂිතතා පියවර වෙත අනුකූලව කටයුතු කළ යුතු වන අතර ඒවා සිදුකෙරෙනුයේ රැස්වීමට සහභාගී වන සියළුම පුද්ගලයන්ගේ සුබසිද්ධිය වෙනුවෙනි.

තමන් නිසි සෞඛ්‍ය තත්ත්වයෙන් පසු නොවන බවට හැඟී යන්නේ නම්, කෝවිඩ්-19 රෝග ලක්ෂණ දක්වන්නේ නම් හෝ නිරෝධායනයට ලක් කර ඇත්නම් හෝ නිවසේ ස්වයං නිරෝධානය සිදුකරනු ලැබ ඇත්නම් රැස්වීමට සහභාගී නොවන මෙන් සාමාජිකයින්ගෙන් /පෙරකලාසිකරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

කෝවිඩ්-19 වසංගතය හේතුවෙන් රැස්වීමට සහභාගී වන්නන්ගේ සුබසිද්ධිය උදෙසා සහ/හෝ ශ්‍රී ලංකා රජය මගින් නිකුත් කරනු ලබන කවර හෝ සන්නිවේදනයන්, උපදෙස්, නියමයන් හෝ නියෝගයන් හේතුවෙන් සමාගමට රැස්වීම සම්බන්ධයෙන් කවර හෝ වැඩිදුර ක්‍රියාමාර්ගයක් ගැනීමට සිදුවුවහොත්, එවැනි ක්‍රියාමාර්ගයක් පිළිබඳ දැන්වීමක් සමාග මෙහි වෙබ් අඩවි www.srilankan.com හි සහ ඩේලි නිවුස්, සිළුමිණ සහ තිනකරන් පුවත්පත් වලද පළ කෙරේ.

# පෙරකලාසි පත්‍රය

සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගම

සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ සාමාජිකයකු/ සාමාජිකයින් වන ..........................................................................................................

..........................................................................................................................................................................................................

.......................................................................................................................................................................................... හි පදිංචි

..........................................................................................................................................................................................................

........................................................................ වන මම/අපි, 2020 සැප්තැම්බර් 25 වන, සිකුරාදා පෙ.ව. 10.00 ට කොළඹ 7, බෞද්ධාලෝක මාවතේ පිහිටි බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ (BMICH) 'ලෝටස් ශාලාව' පරිශ්‍රයේ පැවැත්වෙන සීමාසහිත ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගමේ කොටස් හිමියන්ගේ හතළිස් දෙවන වාර්ෂික මහා සභා රැස්වීමේදී හෝ එහි කිසියම් කල්තැබීමකදී මාගේ/අපගේ පෙරකලාසිකරු වශයෙන් මා/අප නියෝජනය කරමින් මා/අප
වෙනුවෙන් ඡන්දය භාවිතා කිරීමට ..........................................................................................................................................

..........................................................................................................................................................................................................

හි පදිංචි..................................................................................................................................................................................................

හෝ ඔහු/ඇය අපොහොසත් වන්නේ නම් පහත දැක්වෙන අධ්‍යක්‍ෂවරුන්ගෙන් එක් අයෙකු මෙයින් පත්කරමි/පත්කරමු.

අසෝක කාරියවසම් පතිරගේ මහතා (සභාපති)
මොහමඩ් අෂ්රොෆ් ඕමාර් මහතා
මලික් ප්‍රනාන්දු මහතා
ජනාධිපති නීතිඥ මනෝහර ආර්. ද සිල්වා මහතා
ජනාධිපති නීතිඥ සමන්ත රත්වත්ත මහතා
ශ්‍රීධර් සාරිපුත්ත හංස විජයසූරිය මහතා
සංජය මොහොට්ටාල මහතා

1. 2020 මාර්තු මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධ්‍යක්‍ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන සමඟ, ඒ පිළිබඳ විගණකවරුන්ගේ වාර්තාව භාරගනු ලැබ සලකා බැලීම.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනයේ 36 වන වගන්තිය ප්‍රකාරව, විගණකාධිපතිවරයා විසින් සමාගම විගණනය කරනු ලබයි.

දෙදහස් විස්සේ ............................................... මස ....................................... දින දී අත්සන් කරන ලදී.

...................................................
අත්සන/අත්සන්

**සටහන**:
(අ)* අනවශ්‍ය වචන කපා හරින්න
වචන කිසිවක් ඉවත් කර නොමැති නම් හෝ පෙරකලාසිකරු ඡන්දය භාවිතා කළයුතු ආකාරය පිළිබඳ එකී පෙරකලාසිකරු සැලකිල්ලට ගැනීමේදී (පෙරකලාසි පත්‍රය සම්පූර්ණ කිරීමේදී උපදෙස් ඇතුලත් කර ඇති ආකාරය සම්බන්ධව) යම් සැකයක් පවතී නම් පෙරකලාසිකරු යෝග්‍ය යැයි සිතන පරිදි ඡන්දය භාවිතා කරනු ඇත.

**පෙරකලාසි පත්‍රය සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්:**

1. සාමාජිකයෙකුට ඔහු / ඇය වෙනුවට සහභාගී වීමට හා ඡන්දය දීමට පෙරකලාසිකරුවෙකු පත් කිරීමේ අයිතිය පවතියි. එම පෙරකලාසිකරු සමාගමේ සාමාජිකයෙකු වීම අවශ්‍ය නොවේ.
2. පෙරකලාසි පත්‍රය සම්පූර්ණ කර, රැස්වීම පැවැත්වීමට යොදාගන්නා ලද වේලාවට පැය 48 කට පෙර එනම් 2020 සැප්තැම්බර් 23 වන දින පෙ.ව. 10.00 ට පෙර කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල, "ගුවන් සමාගම් මධ්‍යස්ථානයෙහි" පිහිටි ලියාපදිංචි කාර්යාලයෙහි තැන්පත් කළ යුතුය.
3. සමාගමක් නියෝජනය කරන තැනැත්තකු නම් ඔහුට හෝ ඇයට එම සමාගම නියෝජනය කරමින් ක්‍රියාකිරීමට අධිකාරිය සැපයූ යෝජනාවේ සහතික කළ පිටපතක් රැගෙන ආ යුතුය. නියෝජිතයකු සාමාජිකයකු වීම අවශ්‍ය නොවේ.

# සටහන්

# සටහන්

SriLankan Airlines

ගුවන් සමාගම් මධ්‍යස්ථානය, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ, කටුනායක, ශ්‍රී ලංකාව.

**www.srilankan.com**